# පුස්තකාල විද්‍යාව හා තොරතුරු සාක්ෂරතාව

ආනන්ද කරුණාරත්න උපහාර ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය


**ප්‍රධාන සංස්කාරක**

**යූ. ඒ. ලාල් පන්තිල**

**සහාය සංස්කාරකවරු**

ආචාර්ය කෝකිල රාමනායක

අයි. ඩී. කේ. එල්. ප්‍රනාන්දු



පුස්තකාලය

රුහුණ විශ්වවිද්‍යාලය

මාතර

ශ්‍රී ලංකාව

# A Collection of Essays in Library Science and Information Literacy

In honour of Ananda Karunaratna

**Editors**

U. A. Lal Pannila

Dr. Kokila Ramanayaka

I.D.K.L. Fernando

**Library**
**University of Ruhuna**
**Matara**
**Sri Lanka**

මෙහි අන්තර්ගත සියළු ලිපිවල අදහස් ඒ ඒ ලේඛකයන් සතු වන අතර සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සැලකුව මනාය. ග්‍රන්ථයේ අක්ෂර වින්‍යාස, ලකුණු ඇද පද, පද බෙදීම, ආදිය යෙදීම ඒ ඒ ලේඛකයන්ගේ අභිමතය ආරක්ෂා වන පරිදි සංස්කරණය කළ බව සැලකුව මනාය.

All rights reserved. No part of this book may be reproduced in any form or by any means, electronic or mechanical, including photocopy, recording or by any information storage or reterval system, without permission in writing from the publisher.

# පුස්තකාල විද්‍යාව හා තොරතුරු සාක්ෂරතාව

ආනන්ද කරුණාරත්න උපහාර ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

**A Collection of Essays in Library Science and Information Literacy:**
In honour of Ananda Karunaratna

© යූ. ඒ. ලාල් පන්නිල
ආචාර්ය කෝකිල රාමනායක
අයි. ඩී. කේ. එල්. ප්‍රනාන්දු

ISBN 978-955-1507-67-1
ප්‍රථම මුද්‍රණය - 2019

පිට කවරය : ජේ. ඒ. අජිත්
පිටු සැකසුම : ඩී. ජී. සෙව්වන්දි
මුද්‍රණය : නීට් ග්‍රැෆික්ස්, මාතර

**ප්‍රකාශනය**
පුස්තකාලය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

## උපදේශක මණ්ඩලය

ආචාර්ය පූජ්‍ය උණුවතුරබුබුලේ මහින්ද හිමි

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්. ඒ. වීරසූරිය

මහාචාර්ය පියදාස හේවගේ

සන්ධ්‍යා ගම්මන්පිල

නිමල් හෙට්ටිආරච්චි

ජගත් ගරුසිං ආරච්චි

කේ. ටී. එස්. පුෂ්පකුමාර

ටී. කුරුප්පු ආරච්චි

සී. පී. කේ. එදිරිසිංහ

**සංස්කාරකවරු**

**යූ. ඒ. ලාල් පන්නිල**

BA (Hons) (Peradeniya), MSSc (Kelaniya), Dip in Archeaology (PGIR)
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය

**ආචාර්ය කෝකිල රාමනායක**

BSc (Hons) (Ruhuna), MSSc (Kelaniya), PhD (Wuhan, China)
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය

**අයි. ඩී. කේ. එල්. ප්‍රනාන්දු**

BSc (Hons) (Ruhuna), M.ISM. (Colombo)
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය



රුහුණ විශ්වවිද්‍යාල සේවය

(1990- 2019)

## පටුන


**සංස්කාරක සටහන** xi

**Message from Senior Professor Sujeewa Amarasena** xv

Vice-Chancellor, University of Ruhuna

**Message from Senior Professor Gamini Senanyake** xvii

Former Vice-Chancellor, University of Ruhuna

**Message from Senior Professor Susirith Mendis** xix

Former Vice-Chancellor, University of Ruhuna

**ශුභාශිංසනයඃ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා** xxi

හිටපු උපකුලපති, රුහුණ විශ්වවිද්‍යාලය

**Biography of Mr. Ananda Karunaratna** xxiii

Professor P. Hewage

**ලේඛක තොරතුරු** xxvii

**පර්යේෂණ ලිපි**

**01. හතළිස් වසරක රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලයඃ ආරම්භය, විකාශය හා සංවර්ධනය** 01

යූ. ඒ. ලාල් පන්තිල, ජේ. ඒ. අජිත්, ජගති හෙම්මලි

**02. ප්‍රාථමික හා පර්යේෂණ මූලාශ්‍ර වශයෙන් පුස්කොළ පොත්වල ඇති වැදගත්කම** 13

ආචාර්ය චම්පා එන්. කේ. අලහකෝන්

**03.** **පුස්තකාල පාඨක අධ්‍යාපනයේ සිට තොරතුරු සාක්ෂරතාව දක්වාඃ මෙම පරිණාමීය ක්‍රියාවලියේ දී මතු වන කරුණු කීපයක්** 25

මයිකල් වූලිස්ක්‍රොෆ්ට්

පරිවර්තනය : උදිත අලහකෝන්

**04.** **ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයෙහි ලා පාදක සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක විවරණයක්** 51

ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස

**05.** **ශ්‍රී ලාංකීය පාසල් පුස්තකාල සහ ගුරු පුස්තකාලයාධිපතිත්වයේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමසීමක්** 75

පී. කේ. ජයසේකර

**06.** **යහපාලන රාජ්‍ය සංකල්පය (Good Governance) අර්ථාන්විත කිරීමෙහි ලා තොරතුරු දැන ගැනීමේ අයිතියෙහි සුවිශේෂීත්වය සහ එහි ප්‍රායෝගිකත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්** 89

ආචාර්ය සී. සී. ජයසුන්දර, අයි. කේ. ඩී. දිලිනි බෝධිනායක

**07.** **පුස්තකාල සූචිකරණ නීති පද්ධතියේ නව ප්‍රවණතා පිළිබඳ හැඳින්වීමක්** 113

ජී. ආර්. පද්මසිරි

**08.** **සහශ්‍රක ඉගෙනුම්කරුවන්ට ඵලදායී ලෙස පහසුකම් සැලසීම සඳහා අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන්ගේ කුසලතා සහ නිපුණතා පරිණාමනය කිරීම** 123

ආචාර්ය වත්මානෙල් සෙනවිරත්න

**09. විමර්ශන මූලාශ්‍රයක් ලෙස ශබ්දකෝෂවල වැදගත්කම හා එහි නූතන ප්‍රවණතා** 137
ආර්. ඒ. පී. සකුන්තලා සෙනෙවිරත්න

**10. අනුක්‍රමණිකාකරණය, ඒ ආශ්‍රිත සංකල්ප ප්‍රභේද සහ පද්ධති පිළිබඳ සරල අර්ථ නිරූපණයක්** 149
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්.ඒ. වීරසූරිය

**11. පුස්තකාල හා තාක්ෂණික සේවා** 159
ඩබ්ලිව්. එම්. තුසිතකුමාරි

**12. ථෙරවාද බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනයෙහි ලා පාලි වංස කතාවල උපයෝගීතාව පිළිබඳ විශ්ලේෂණාත්මක විමසුමක්** 185
ආචාර්ය ප්‍රදීපා විජේතුංග

**13. සිව්වැනි කාර්මික විප්ලවය සමයේ අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ භූමිකාව පිළිබඳ විමර්ශනාත්මක ඇගයුමක්** 203
අයි. ඩී. කේ. එල්. ප්‍රනාන්දු

**14. පුස්තකාල හා තොරතුරු සාක්ෂරතා විෂය සඳහා සිදුකළ හැකි පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනා ගැනීම පිළිබඳ කෙටි විමසුමක්** 227
යූ. ඒ. ලාල් පන්තිල, පී. ජී. නිශාන්ත

**15. තිරසර සංවර්ධනය සඳහා තොරතුරු සාක්ෂරතාව අත්‍යවශ්‍යද?** 239
මනෝරි සමරකෝන්

16. **A Biblometric Analysis on Research Output of the University of Peradeniya in Web of Science** 251

R. Maheswaran

17. **ග්‍රන්ථ විචාර** 263

යූ. ඒ. ලාල් පන්තිල

# සංස්කාරක සටහන

රුහුණ විශ්වවිද්‍යාලය වූ කලී රුහුණු පුරවරයට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම ශාස්ත්‍රීය නවෝදයක් උදාකර දුන් විශ්වවිද්‍යාලයකි. 1978 අගෝස්තු මස විසිනම වන දින ශ්‍රී ලංකා ආණ්ඩුවේ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට අනුව රුහුණ සරසවිය සිය ශාස්ත්‍රීය කාර්යභාරය ආරම්භ කළේය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ රුහුණ මණ්ඩපය නමින් ආරම්භ කළ සරසවිය මේ වන විට සිය වගකීම් භාරය වසර හතළිහක් සපුරා ඇත. එදා මෙදා තුර කාලය තුළ මෙරට සමාජ ආර්ථික ප්‍රවාහයට ප්‍රාදේශීය විශ්වවිද්‍යාලයක් වශයෙන් රුහුණ සරසවිය ජාතියට දායාද කළ දෑ බෙහෝ ය. 1977 වර්ෂයේ දී මහාචාර්ය එම්. බී. ආරියපාල මහතාගේ සභාපතිත්වයෙන් පත්කළ කමිටුවේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව කලා, විද්‍යා, කෘෂිකර්ම හා වෛද්‍ය යන පීඨ හතරකින් ඇරඹි රුහුණ සරසවිය සිය හතළිස් වසර සමරන මෙම වසර වන විට පශ්චාත් උපාධි පීඨයක් සමඟින් පීඨ දහයක් සහ අධ්‍යයනාංශ පනස් හතක් සහිත පිරිපුන් විශ්වවිද්‍යාලයක අභිමානය සනිටුහන් කර ඇත.

ගෙවුණු වසර හතළිහ දෙස ආපසු බලන අපට මෙම විශ්වවිද්‍යාලය අද පවත්නා තත්වයට ඔසවා තබන්නට සිය දහදිය කඳුළු වැපුරුවෝ බොහෝය. ඔවුන් අතුරින් ඇතැමෙකු උදෙසා උපහාර පුදන්නට හැකි වුව ද එසේ කිසිඳු ඇගයීමකට ලක් නොවී විසුම් ලැබූවෝ ද රාශියකි. එසේ වන්නට ඇත්තේ ඒ කාලවල ඇති වූ යම් යම් තත්ත්වයන් නිසා විය හැකිය. ඒ කෙසේ වෙතත් රුහුණ විශ්වවිද්‍යාලය වසර දහතුනක් පමණ ලාබාල වයසේ පසුවද්දී මෙම විශ්වවිද්‍යාල සේවයට එක් වූ ආනන්ද කරුණාරත්න මහතා පිළිබඳව අප අගයන්නේ සුවිශේෂී කරුණු රැසක් නිසාවෙනි. 1978 විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට අද දක්වා කාලය තුළ පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස සිට විශ්‍රාම ලබන පළමු පුස්තකාලයාධිපතිවරයා ඔහු වීම, ඔහුට මෙන්ම හතළිස් වසරක රුහුණ විශ්වවිද්‍යාල ඉතිහාසයට ද සුවිශේෂී ඓතිහාසික සිද්ධියකි. 1990 පූර්ණ කාලීන උපශාලාධිපතිවරයෙකු ලෙස රුහුණ විශ්වවිද්‍යාල සේවයට එක් වූ ආනන්ද මහතා පුස්තකාල වෘත්තියට පිවිසෙන්නේ 1991 දී ය. ඒ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙනි. 1990 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් සිය ප්‍රථම උපාධිය පංති සාමාර්ථයක් සහිතව හිමි කරගත් මෙතුමා මාතර

රාහුල විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකි. කැලණිය විශ්වවිද්‍යාලයෙන් පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා එම විෂය මාලාවෙන් ම සමාජීය විද්‍යාපති උපාධිය ලබාගත් මෙතුමා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වරලත් පුස්තකාල සාමාජිකත්වය ද දිනාගෙන සිටී. මෙතුමා විශ්‍රාම ලබන 2019 වසර වන විට රුහුණ විශ්වවිද්‍යාලයේ වසර තිහකට ආසන්න සේවා කාලයක් සපුරා ඇත.

ගෙවුණු වසර තිහ දෙස ආපසු බලන විට ආනන්ද කරුණාරත්න මහතා ගෙන් රුහුණ විශ්වවිද්‍යාලයට මෙන්ම පුස්තකාලයටත් පුස්තකාල වෘත්තියටත් ඉටු වූ මෙහෙය අතිවිශාලය. උපකුලපතිවරුන් කිහිපදෙනෙකු යටතේම සිය සේවය ඉටුකළ මෙතුමා ආචාර්යවරුන්, පරිපාලන, අනධ්‍යයන සහ ශිෂ්‍ය යන සෑම අංශයකම විශ්වවිද්‍යාල ප්‍රජාව සමග ඉතා සුහදශීලී පුද්ගලයෙකු ලෙස කටයුතු කළේය. වෘත්තීය සගයන් සමග ඉතා කුළුපගව කටයුතු කළ මෙතුමා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා සහ කළමනාකරණ හා මූල්‍ය පීඨ ආචාර්ය සංගමයේ උද්යෝගිමත් සාමාජිකයෙකු වශයෙන් පමණක් නොව නිලතල ද උසුලමින් සහෘද ආචාර්යවරුන්ගේ වෘත්තීය සටන් වලදී පෙරමුණේ සිටි සාමාජිකයෙකි. වසර තිහක විශ්වවිද්‍යාල සේවයෙන් සමු ගන්නා අවස්ථාවේ ආනන්ද කරුණාරත්න මහතා වෙනුවෙන් මෙවන් ශාස්ත්‍රීය කාර්යයක් සිදු කිරීම එතුමාට දක්වන සුදුසුම උපහාරය යයි අප කල්පනා කළෙමු.

මෙම සද්කාර්යය සඳහා මුල සිටම උපකාර කළෝ බොහෝය. පසුගිය වසර තිහ තුළ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරුන් ලෙස සිටි සියලු ජ්‍යෙෂ්ඨ මහාචාර්යතුමන්ලා මෙම කාර්යයට අපව උනන්දු කළහ. එසේම වත්මන් උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා මෙන්ම පාලක සභා සාමාජික භවතුන්ගෙන් ද මේ සඳහා උපරිම සහාය හිමි වූ බව සතුටින් සඳහන් කරමු. ලේඛකාධිකාරීතුමිය, මූල්‍යාධිකාරීතුමා ඇතුළු විශ්වවිද්‍යාලයේ සියළු දෙනාත් පුස්තකාල කාර්යය මණ්ඩලයේ සියලු දෙනාත් මෙම කාර්යය සඳහා සිය උපරිම දායකත්වය දැක්වූහ. මෙම උපහාර ග්‍රන්ථය මෙම වර්ගයේ වෙනත් උපහාර ග්‍රන්ථවලට වඩා වෙනස් ආකාරයකින් එළි දක්වන්නට අප මුල සිටම උත්සාහ කළහ. ඒ අනුව සාම්ප්‍රදායික උපහාර ග්‍රන්ථ සම්ප්‍රදායෙන් බැහැර වී පුස්තකාල වෘත්තිකයෙකු වෙනුවෙන් දක්වන උපහාරය හැකිතාක් එයට සුදුසු

ආකාරයට සිදුකරන්නට අප උත්සාහ කළෙමු. ඒ අනුව මෙම උපහාර ලිපි සංග්‍රහය සම්පූර්ණයෙන්ම පුස්තකාල හා විඥාපන විද්‍යාව විෂයක් ලෙස හදාරන සිසු සිසුවියන්ට මෙන් ම පුස්තකාල වෘත්තිකයන්ට පෙළ පොතක් ලෙස භාවිත කරන්නට හැකිවන සේ සකසන්නට අප උත්සාහ කළෙමු. ඒ අනුව දිවයිනේ රාජ්‍ය විශ්වවිද්‍යාල සියල්ලක්ම නියෝජනය වන ආකාරයට සෑම විශ්වවිද්‍යාලයකම ජ්‍යෙෂ්ඨ අධ්‍යයන පුස්තකාල වෘත්තිකයින් ලවා ශාස්ත්‍රීය ලිපි රචනා කරවා ගැනීමට අප උත්සාහ කළෙමු. එය බොහෝ දුරට සාර්ථකත්වයට පත්ව ඇතැයි ඔබට මෙම ලිපි සංග්‍රහය පරිශීලනයෙන් අවබෝධ වනු ඇත. ආනන්ද කරුණාරත්න මහතාට උපහාරයක් ලෙසත් වෘත්තීය සංවර්ධනයට අනුබලයක් ලෙසත් එම කාර්යය ඉටුකළ අපගේ සහෝදර පුස්තකාල වෘත්තිකයින් සියළු දෙනාට ම අප ස්තුතිවන්ත විය යුතුය. එසේම මෙම ශාස්ත්‍රීය සංග්‍රහය ප්‍රශස්ත නිමාවකින් මුද්‍රණය කර දුන් මාතර නීට් ග්‍රැෆික්ස් ආයතනයට ද, අලංකාර ලෙස පිට කවරය නිර්මාණය කළ ජේ. ඒ. අජිත් මහතාට ද, පරිගණක යතුරුලියන තාක්ෂණික කාර්යයන් ඉටු කළ ඩී. ජී. සෙව්වන්දි මෙනෙවියට සහ නන් අයුරින් සහය දුන් සහෘද සැමටත් අවසන් වශයෙන් අපගේ ගෞරවනීය ස්තූතිය පුදකරමු.

යූ. ඒ. ලාල් පන්නිල
**ප්‍රධාන සංස්කාරක**

**Message from Senior Professor Sujeewa Amarasena**

*Vice-Chancellor, University of Ruhuna*

It is a great privilege for me to record a glimpse of Mr. Ananda Karunaratna's, academic life, to honor and pay tribute for his 30 years of service to the University of Ruhuna. Mr. Ananda Karunaratna is the third Librarian of the University of Ruhuna. He started his career as a sub Warden in 1990. Gradually, he managed to progress in his career profile to reach one of the highest academic positions in the University. This is an example for all academics to learn how ascent in academic life could be achieved.

Throughout the 30 years of service, he established a reputation among all the fellow academics in the University library system as a collaborative personality with a sound coordinating power. He was a member of the Senate, SCOLIS, CVCD and many other boards and committees of the University. He also led the library academic and non-academic staff to fulfill scholarly needs and social responsibility. Mr. Ananda extended his services to expand the availability, accessibility and visibility of information gateways by adopting Integrated Library Management System, CONSAL Journal Consortium, Plagiarism prevention service platforms, establishing the Legal Deposit Collection, Institutional Repositories to the University of Ruhuna. He worked hard with University administration to expand the building facilities in main library, Faculty of Engineering, Faculty of Allied Health Sciences and newly established Faculty of Technology libraries.

He undertook a comprehensive human resource development plan for the University of Ruhuna library service by providing staff both local and international training, motivating staff to conduct postgraduate

courses and facilitated these through administrative network. This helped to uplift the reputation of University of Ruhuna library among the other university libraries.

Starting the carrier as a conventional librarian in a pre-technology era he was able to successfully transform the library service to the digital era facing the challenges of ever changing information eco system. That is a huge task. Mr. Ananda, pushed boundaries of the conventional ways of library operations together with his staff to provide the best library experience to its users in the modern digital age. Today he is leaving a legacy as a librarian who marked the transformation of Library of University of Ruhuna to the version of future libraries.

I wish Mr. Ananda Karunaratna a better healthy, wealthy and a busy retirement life.

**Senior Professor Sujeewa Amarasena**
*Vice-Chancellor*
*University of Ruhuna*

## Message from Senior Professor Gamini Senanyake

*Former Vice-Chancellor, University of Ruhuna*

I am happy to send this message to the felicitation volume of Mr. Ananda Karunaratna, retiring Librarian of University of Ruhuna. Most of fellow academics known him since he joined the University of Ruhuna as a sub warden in 1990, but I get to know him very well during my tenor as the Vice Chancellor of the University of Ruhuna since 2013.

Mr. Ananda embraces the reputation as a coordinator, organizer and a member of most University related endeavors. Some of such remarkable involvements of him are, organizing the 10$^{th}$ academic sessions and 9$^{th}$ Vice-Chancellors awards, 2015, organize the academic sessions of University librarian's association at the University of Ruhuna premises. Coordinating the Journal of the University of Ruhuna (online), Rohana Research Journal, drafting the History of University of Ruhuna volume, and coordinating the publication committee are some examples for his coordinating power. He contributed as a member of the University disciplinary boards, selections boards.

He has supported me to expand and extend the infrastructure capacity of the University library system by extending the library building at the main campus premises to facilitating a new reading area for students and the legal deposit collection. Further, he extends his support to me to construct a new library building for the Faculty of Engineering, Allied Health Sciences Libraries at Mahamodara & Uluvitike and the library facility at the Faculty of Technology. He eagerly stands with me to expand and diversify the library collection

with valuable scholarly materials. As a result of that I cloud be able to acquiring all the publications made in Sri Lanka since 1996 to establish the fifth legal deposit collection at the University of Ruhuna. Appreciatingly he provides provisions to accommodate library facilities to visually handicap students in the University by extending the library service equally among its patrons.

He extends his service as an academic librarian by guiding and training for students under the internships from different Library and Information Sciences undergraduate and Postgraduate degree programs. As the senior librarian who always optimistic about his staff, he trains and facilitate them to attend local and foreign training programs and drive them towards higher achievements *(1 PhD holder and 2 other readers now).*

I really appreciate is service as the Librarian of the University of Ruhuna and wish him a wonderful new life with his family and more energy for him to serve the nation further more.

**Senior Professor Gamini Senanyake**

*Former Vice-Chancellor, University of Ruhuna*

**Message from Senior Professor Susirith Mendis**

*Former Vice-Chancellor, University of Ruhuna*

It is my privilege and honour to send a message of felicitation on the occasion of the retirement of Mr. Ananda Karunaratna, the Librarian of the University of Ruhuna. I have known Mr. Ananda Karunaratna for about two decades. Since 2007, when I was appointed Vice-Chancellor, I was fortunate to associate with him very closely. He was the second Librarian of the University of Ruhuna. Mr. Karunaratna has shown remarkable abilities in coordinating university activities other than his specific contribution to academia as a Librarian.

Some of the major endeavors that he shouldered during my tenure as Vice-Chancellor was coordinating the Mahapola and *Deyata Kiruala* exhibitions held at Buttala in 2009. He has been the coordinator and an editorial member of '*Rohana*' the research journal of the University of Ruhuna. During my tenure, I revived the process of writing the history of University of Ruhuna – The '*Ruhuna vishva vidyalayiya Wansha Kathawa'*. We obtained the co-operation of pre-eminent former professors of the University of Ruhuna – Professors Sirimal Ranawella, Winnie Vitharana and M.U. de Silva for this onerous task. Mr. Karunaratne coordinated the project and tried his valiant best to keep it going.

He also held memberships in many critical committees appointed by the University Senate during my tenure. What I saw in him was his commitment to any task that he was given responsibility and the passion with which he got about doing it. His capacity for work for the betterment of the University was remarkable. I remember many a time when he was understandably emotional at Senate meetings

when he found that other academics who had been given parallel responsibility showed scant disregard for their assigned tasks.

As the Librarian, while performing to his usual duties, he has given the necessary leadership to deploy the first integrated library management system (ISURU) in 2008. This is the first of its kind in the history of a Sri Lankan University library. He has worked hard to acquire several valuable personal collections to the University Library by expanding the diversity of the library collection.  I was personally involved in acquiring a personal collection of books on Sinhala and Buddhism for the University of Ruhuna library in in or around 2005. Mr. Ananda Karunaratna was instrumental in organizing that special collection donated by Mr. Sunimal Yapa of Montreal, Canada. I am aware that Mr. Karunaratna has regularly guided students from the National institute of Library and Information Sciences (NILIS) in transforming them into professional librarians.

I am very appreciative of his dedicated service towards the growth and success of the University of Ruhuna library during his long years of service to the university. I wish him a health, contentment and a further active life after his retirement.

**Senior Professor Susirith Mendis**
*Emeritus Professor & Former Vice-Chancellor*
*University of Ruhuna*

## ශුභාශිංසනයයි!

රුහුණ විශ්වවිද්‍යාලයට අමිල සේවාවක් ඉටු කළ පුස්තකාලයාධිපති ආනන්ද කරුණාරත්න මහතා විශ්‍රාමයාම නිමිත්තෙන් පළ කෙරෙන සමරු කලාපයට මා ශුභාශිංසන පණිවුඩයක් නිකුත් කරන්නේ හද පිරි සොම්නසිනි. එසේම පුස්තකාලයේ වසර 30 කට ආසන්න සේවා කාලයක් තුළ ඒ මහතා විශ්වවිද්‍යාලයේ ප්‍රවර්ධනයට හා උන්නතියට ලබා දුන් සුවිශේෂී දායකත්වය ගැන සලකන විට ඒ පිළිබඳව කෙටියෙන් හෝ අදහස් ප්‍රකාශ කිරීම හා ඇගයීම මා සතු සදාචාරාත්මක වගකීමකි.

මා උපකුලපති වශයෙන් සේවය කළ කාලය තුළ විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉටු කරන ලද ශාස්ත්‍රීය, සංස්කෘතික හා ආගමික කටයුතු, යටිතළ පහසුකම් සංවර්ධනය සහ විවිධ ප්‍රජා සත්කාරයන්හි දී සරසවි ප්‍රජාවගෙන් ලැබුණ අත්වැල, පිටිවහල හා සහයෝගය ඉමහත්ය, සුවිශාලය. මේ අතරින් පුස්තකාලයාධිපති කේ. ආනන්ද මහතාගෙන් ලැබුණේ සුවිශේෂී අනුග්‍රහයකි. 2003 ඔක්තෝම්බර් මාසයේ දී ඉතා උත්කර්ෂවත් අයුරින් සැමරූ රුහුණ විශ්වවිද්‍යාලයේ රජත ජයන්ති උළෙලේ සංවිධායක කමිටුවේ ප්‍රබල සාමාජිකයෙකු ලෙස එතුමා සුවිශාල කාර්ය භාරයක් ඉටු කළේය. එසේම ඊට සමගාමීව පුස්තකාලය කේන්ද්‍රකොට ක්‍රියාත්මක වූ බහු මාධ්‍ය මධ්‍යස්ථානය, භාෂා විද්‍යාගාරය, පුස්තකාල ශ්‍රවණාගාරය සහ විශ්වවිද්‍යාල කෞතුකාගාරය ස්ථාපිත කොට පවත්වා ගෙන යාමේ දී එතුමා ඉටු කළ ඉමහත් කාර්යභාරය සිහිපත් කරන්නේ දැඩි කෘතවේදිත්වයෙනි.

මීට අමතරව පුස්තකාලයේ කාර්ය මණ්ඩලයෙහි හැකියාවන්, දක්ෂතා සහ නිපුණතා උපයෝගී කර ගනිමින් අන්තර්ජාල පහසුකම්, විද්‍යුත් තැපැල යනාදිය විධිමත් කොට වෙබ් අඩවියක් විවෘත කිරීම ද ආනන්ද මහතා ඉටු කළ සේවයන් අතර කැපී පෙනේ. විශ්වවිද්‍යාලයේ විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ද ඒ මහතා ඉටු කර ඇත්තේ විපුල සේවාවකි.

පුස්තකාලයේ පරිපාලනය හා සේවාවන් කාර්යක්ෂමව පවත්වා ගනිමින් සැමට ආදර්ශයක් ලබා දෙමින් නව තාක්ෂණික මෙවලම් උපයෝගී කොට ගෙන පුස්තකාලයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට ඒ මහතාගේ කැපවීම මෙහිදී අගය කළ යුතුය. ආචාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ප්‍රජාව සමඟ ද සුහද සම්බන්ධතා ගොඩනඟා ගත් ආනන්ද මහතා පුස්තකාලයේ දියුණුවට කර ඇත්තේ නොමැකෙන සේවාවකි.

අප විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආනන්ද කරුණාරත්න මහතාගේ විශ්‍රාම දිවියට මම මුළු හදවතින්ම සුභ පතන අතර තෙරුවන් සරණින් සියළු දෙවි රැකවරණින් එතුමාට නිරෝගී සහ ප්‍රීතිමත් විශ්‍රාම දිවියකට ආසිරි පතමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා**
හිටපු උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය

## Mr. Ananda Karunaratna: Retired Librarian, University of Ruhuna

I met Mr. Ananda Karunaratna, Librarian, University of Ruhuna as a colleague in the first year of our university education, at University of Colombo in 1976. Since then our friendship has lasted for almost 43 years up to now, and I consider it as a privilege for me to write a memoirs of him based on my personal knowledge.

At the University of Colombo, I recognized him as a hard working undergraduate, target-oriented personality and a good athlete. Mr. Ananda Karunaratna, born in Matara on 20th July 1954, was a brilliant student of Rahula College, Matara during the period of 1960 to 1974. He obtained BDS (Hons.) degree in Statistics from the University of Colombo in 1980, a Diploma in Library and Information Science from University of Kelaniya in 1996 and MSSc in Library and Information Science in 2004 also from the University of Kelaniya.

He joined the University of Ruhuna on January 15th, 1990 as a Sub-Warden and retired on September 30th, 2019 after completing a distinguished university career spanning over 29 years. Before that, he also served as a Graduate Teacher in Mathematics, at the Department of Education for eight years between 1982 and 1990. He was appointed to the post of Asst. Librarian in June 15th, 1991, Senior Asst. Librarian Grade II in September 01st, 1996 and Senior Asst. Librarian Grade I in September 01st, 2002. He was promoted to the post of Librarian on November 02nd, 2009 and served as the Librarian, University of Ruhuna until his retirement in 2019. Before he was appointed as the Librarian, he served as Acting Librarian for

about seven years from 2002. The vacancy occurred after the demise of Mr. Kapila, former Librarian.

During the early years of his career at the Library he actively contributed to the establishment and initiation of several development programmes. The establishment of the Multimedia Center and Auditorium of the Library, the establishment of the university museum at the Main Library, the establishment of the first reading room for patrons, the establishment of the Rohana Collection of the library in the Ceylon Room, the expansion of the internet and email services to all library staff, the designing of the ceremonial dress for the Librarian for the first time and launching of the website for the Library are some initiatives taken up by Mr. Ananda Karunaratna with the support of several Vice Chancellors.

Mr. Ananda Karunaratna was recognized as an exclusively important member to serve in various committees. He served as a Member of various committees within the university and within the university system offering his valuable service to the development of University of Ruhuna. Some of these positions are: Committee member of the Silver Jubilee event, Student counselor, the editorial committee member and coordinator of Rohana Journal, the member of UGC Standing Committee of Library and Information Science/ SCOLIS, the trainer for students under the internships of (NILIS, Library association, University of Kelaniya) for degree and Diploma holders and the disciplinary committee member. He was appointed as the coordinator and contributor for the Mahapola Exhibition, the coordinator of “Deyata Kiruala” exhibition.

He worked hard together with Mr. Nimal Hetitiarachchi, Senior Asst. Librarian to deploy the ISURU, integrated library management system for the first time in Sri Lanka's library history saving several millions of rupees to the University in 2008. He was appointed as Treasurer, Teachers Union, University of Ruhuna, long time member of Standing Committee of Library and Information Science, a member of Institutional review, University of Ruhuna, 2008, member of the Evaluation Panel for Institutional Review, University of Jaffna, editorial member of Rohana Research journal and Coordinator, member of the Committee for compiling History of University of Ruhuna, Guide and Trainer for students under the internships for Degree and Diploma holders of NILIS, Library Association and University of Kelaniya. In addition, he was selected as a member to serve in several Selection Committees and Disciplinary Committees. Mr Ananda Karunaratna secured the appreciation of organizing the 10$^{th}$ academic sessions and 9$^{th}$ Vice-Chancellors awards in 2015.

He contributed to the development of the Library in many ways. He provided his leadership for acquiring personal collections to the Library and for extending the library collection with diversity of reading materials. He always encouraged the development of the Library with a multidisciplinary learning culture. Mr. Ananda Karunaratna was instrumental in establishing the library collection for the Faculty of Technology, construction and merging of the library of Faculty of Technology at Karagoda Uyangoda. He was keen to provide facilities at the Library to visually handicap students, and extending the library building with a new reading area for students. He expanded the legal deposit collection with all the publications made in Sri Lanka since 1996, now reaching up to

260,000 artifacts. In 2015, he provided the leadership to organize the Academic Sessions of University Librarians Association, construction of the new library building for the Faculty of Engineering and establishing a new library branch for the AHSDP at Mahamodara and Uluvitike.

He was appointed as the coordinator for several publications sponsored by University of Ruhuna as specified below: The Journal of the University of Ruhuna (online), Rohana Research Journal and History of University of Ruhuna. His research interests basically focussed in the field of Library and Information Sciences. During his career in the field of Library, he disseminated his knowledge through several national and international publications. In addition, Mr. Ananda Karunaratna was frequently invited as a resource person in workshops and seminars related to information science. He has given his expertise when expanding the library facilities in all faculties. He has given an immense service in obtaining a higher level of recognition by the Library of University of Ruhuna. He rendered his service to many national institutions including government and non-governmental organizations.

Mr. Ananda Karunaratna's family life is also a story of success. He is a proud father of three children and a loving husband of a charming wife.

**I wish Mr. Ananda Karunaratna a productive and enjoyable retirement.**

Professor P. Hewage
Department of Geography
University of Ruhuna

## ලේඛක තොරතුරු

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්. ඒ. වීරසූරිය, BA (Hons) (Kelaniya), MLib, Ph.D. (Pune) පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

2. ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න, BA (Hons) (Kelaniya), MLS (Colombo), Dip. (LIS) (Colombo), Dip Com. (SLTC), PhD (Colombo), පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

3. ආචාර්ය ප්‍රදීපා විජේතුංග, BA (Hons) (Peradeniya), M.Lib (Wales), MIS (Knowledge Management) (Canberra), PhD (LIS Colombo), පුස්තකාලයාධිපති, කොළඹ විශ්වවිද්‍යාලය.

4. ජී.ආර්. පද්මසිරි BA (Hons) Kelaniya, MLS (Colombo), පුස්තකාලයාධිපති, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

5. උදිත අලහකෝන්, BA (Hons) (Peradeniya), MLS (Colombo), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය.

6. මනෝරි සමරකෝන්, BA (Hons) (Kelaniya), MSSc (Kelaniya), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

7. යූ. ඒ. ලාල් පන්නිල, BA (Hons) (Peradeniya), MSSc (Kelaniya) , ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය.

8. ආචාර්ය සී. සී. ජයසුන්දර, B.Stat (Ruhuna), MSc (Sheffield), DLitt (South Africa) පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය.

9. ආචාර්ය චම්පා. එන්. කේ. අලහකෝන්, BA (Hons) (Peradeniya), MLS (Colombo), PhD (Colombo), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ප්‍රධාන පුස්තකාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

10. ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස, BA (Hons), MSSc, PhD (Kelaniya), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

11. ඩබ්ලිව්. එම්. තුසිතකුමාරි, BA (Hons) Lib.Sci, MSSc (Kelaniya), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.

12. අයි. ඩී. කේ. එල්. ප්‍රනාන්දු, BSc (Hons) (Ruhuna), MLS. (Colombo), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය.

13. ආර්. ඒ. පී. සකුන්තලා සෙනෙවිරත්න, BA (Hons) Lib.Sci, MSSc (Kelaniya), Dip. in Journalism (Colombo), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය.

14. අයි. කේ. ඩී. දිලිනි බෝධිනායක, BA (Hons), MSSc (Kelaniya), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය.

15. පී. කේ. ජයසේකර, BSc (Hons) Agri (Ruhuna), MLS. (Colombo), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය.

16. පී. ජී. නිශාන්ත, BSc (Hons) (JPura.), MLS. (Colombo), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය.

17. ජේ. ඒ. අජිත්, BA (Hons), MA (JPura.), MIT (Colombo), සහකාර පුස්තකාලයාධිපති, රුහුණ විශ්වවිද්‍යාලය.

18. ආර්. මහේස්වරන්, BA (Hons) (Peradeniya), MLS. (Colombo), Dip. in Education (OUSL), Dip. in Sports (Singapore) පුස්තකාලයාධිපති (වැ. බ.), පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

19. ජගති හෙම්මලි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, රුහුණ විශ්වවිද්‍යාලය.

# හතළිස් වසරක රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලයඃ ආරම්භය, විකාශය හා සංවර්ධනය

යූ. ඒ. ලාල් පන්නිල, ජේ. ඒ. අජිත්, ජගති හෙම්මලි

## හැඳින්වීම

රුහුණු පුරවරයට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම ශාස්ත්‍රීය නවෝදයක් උදාකරමින් 1978 අගෝස්තු මස විසිනම වන දින ශ්‍රී ලංකා ආණ්ඩුවේ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට අනුව රුහුණ සරසවිය සිය ශාස්ත්‍රීය කාර්යභාරය ආරම්භ කළේය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ රුහුණ මණ්ඩපය නමින් ආරම්භ කළ සරසවිය මේ වන විට සිය කාර්යභාරය වසර හතළිහක් සපුරා ඇත. එදා මෙදා තුර කාලය තුළ මෙරට සමාජ ආර්ථික ප්‍රවාහයට ප්‍රාදේශීය විශ්වවිද්‍යාලයක් වශයෙන් රුහුණ සරසවිය ජාතියට දායාද කළ දෑ බෙහෝය. 1977 වර්ෂයේ දී මහාචාර්ය එම්. බී. ආරියපාල මහතාගේ සභාපතිත්වයෙන් පත්කළ කමිටුවේ සක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව කලා, විද්‍යා, කෘෂිකර්ම හා වෛද්‍ය යන පීඨ හතරකින් ඇරඹි රුහුණ සරසවිය සිය හතළිස් වසර සමරන මෙම වසර වන විට පශ්චාත් උපාධි පීඨයක් සමඟින් පීඨ දහයක් සහ අධ්‍යයනාංශ පනස් හතක් සහිත පිරිපුන් විශ්වවිද්‍යාලයක අභිමානය සනිටුහන් කර ඇත.

1978 අංක 16 දරණ පනතේ 24 වන වගන්තිය අනුව 1978 දෙසැම්බර් මස 29 වන දින නිකුත් කළ අංක 16/16 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව 1979 ජනවාරි මස 01 වන දින මැද්දවත්ත කාර්මික විද්‍යාලය පිහිටි ගොඩනැගිලි වල රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ වීමත් සමඟ පුස්තකාලය ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම සකස් විය. 1978 සිට විවිධ අඩුපාඩු මධ්‍යයේ මැද්දවත්තේ සහ එළියකන්දේ පවත්වාගෙන යනු ලැබූ විශ්වවිද්‍යාලයට ස්ථිර ගොඩනැගිලි පද්ධතියක් ඉදිකිරීම ආරම්භ වන්නේ 1980 දී ය. ඓතිහාසික දෙවුන්දර උපුල්වන් දෙවොල සමීපයේ වැල්ලමඩමේ අක්කර 71ක මනරම් භූමි භාගයක විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ගොඩනැගිලි ඉදිවිය. එවකට දිවයිනේ සිටි දක්ෂම ගෘහ නිර්මාණ ශිල්පියා වූ ජෙෆ්රි බාවා මහතාගේ සැලැස්මට

අනුව වැල්ලමඩම භූමියේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයත්, විද්‍යා පීඨයත්, ප්‍රධාන පරිපාලක ගොඩනැගිලි සංකීර්ණය හා පුස්තකාලය ඉදි කරන ලද්දේ නෙදර්ලන්ත සමාගමක් විසිනි. මීට සමගාමීව කඹුරුපිටිය මාපලානේ කෘෂි විද්‍යා පීඨය ගොඩ නංවන ලද අතර වෛද්‍ය පීඨය ගාල්ල කරාපිටියේ ඉදිකරන ලදී. එතෙක් මණ්ඩපයක් ලෙස හා විශ්වවිද්‍යාල විද්‍යායතනයක් වශයෙන් ක්‍රියාත්මක වූ රුහුණ සරසවිය නව ප්‍රබෝධයක් ලැබුවේ 1984 දී රුහුණ විශ්වවිද්‍යාලය බවට පත්වීමෙනි. විශ්වවිද්‍යාල විද්‍යායතනයක් වශයෙන් ආරම්භ වූ රුහුණ විශ්වවිද්‍යාලය 1984 දී විශ්වවිද්‍යාල තත්වයට ස්ථාපිත විය.

## රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය

1978 අගෝස්තු 27 වන දින මාතර මැද්දවත්ත මංසන්ධියේ වර්තමාන කාර්මික විද්‍යාලය පිහිටි භූමියේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන ලද අවස්ථාවේදී ම වර්තමාන කාර්මික විද්‍යාල පුස්තකාලය පිහිටි ස්ථානයේ ඉහළ මාලයේ පිහිටි කාර්මික විද්‍යාල පුස්තකාලය විශ්වවිද්‍යාල පුස්තකාලය බවට පත්විය. පුස්තකාලය ආරම්භ කළ 1978 වර්ෂයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කණිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සේනාධීර මහතා රුහුණ විශ්වවිද්‍යාල සේවයට පැමිණිය ද ඔහු එක් සතියක් පමණක් සේවය කොට ආපසු ඉවත්ව යයි. 1978 ඔක්තෝම්බර් මස එකදු පොතක් හෝ නොමැතිව පුස්තකාලය පී. එම්. සුමනදාස සහ වීරමන් යන පුස්තකාල සහකාරවරු දෙදෙනා සහ දයානන්ද කම්කරු මෙහි සේවය අරඹයි. මෙම වසරේම එම්. පී. ජයතිලක මහතා කණිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ලෙස සේවයට පැමිණෙයි. ඔහු එතැන් සිට රුහුණ විශ්වවිද්‍යාලයේ කාර්යභාර පුස්තකාලයාධිපතිවරයා බවට පත්වෙයි. 1979 වර්ෂයේ දී පුස්තකාලය විධිමත් කිරීමේ අරමුණින් කැළණිය විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති එල්. ඒ. ජයතිස්ස මහතාගේ සේවය කෙටිකලක් සඳහා තාවකාලිකව ලබාගැනීම විශේෂ සිදුවීමකි. මෙම වසරේම පුස්තකාලය සංවිධානය කිරීමේ අරමුණින් 1979 අගෝස්තු මස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති වි.බ. දොරකුඹුර මහතා විසින් රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතන

පුස්තකාලය සංවිධානය කිරීම පිළිබඳ උපදෙස් මාලාවක් සහිත චක්‍ර ලේඛනයක් එවා ඇත. එහි,

- ඇණවුම සහ ප්‍රතිග්‍රහණ සංවිධානය
- පුස්තකාල කමිටු ප්‍රතිෂ්ඨාපනය කිරීම එහි බලතල රෙගුලාසි පිළිබඳව
- සිංහල භාෂාව හා සිංහල සාහිත්‍ය විෂය සංවිධානය
- ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

සඳහා උපදෙස් ලබා දී තිබුණි. මෙම චක්‍රලේඛය එවකට පුස්තකාලය සංවිධානය කිරීම සඳහා ඉතා වැදගත් මූලික ලියවිල්ලක් විය. එතැන් සිට කලා පීඨයේ හා විද්‍යා පීඨයේ පුස්තකාල සේවා ආරම්භ වූ අතර කෘෂිකර්ම පීඨය සඳහා මාපලානෙහි පිහිටි එම පුස්තකාලයෙහි පොත් බැහැර දීම සහ විමර්ශනය සඳහා පහසුකම් සලසන ලදී. මෙම අවධියේ සේවක හිඟය මත පුස්තකාල සේවාව පවත්වාගෙන යාම අපහසු තත්ත්වයක පැවතුණි. මෙම වසරේ පුස්තකාලයට පොත් 8000 ක් ප්‍රතිග්‍රහණය කළ අතර, සඟරා 26 ක් සඳහා ද දායක වී ඇත. පුස්තකාල ගෘහ භාණ්ඩ හා අනෙකුත් පුස්තකාලය සඳහා අවශ්‍ය භෞතික සම්පත් ද සෙමෙන් සංවර්ධනය වන්නට විය. පුස්තකාලයට ලැබී ඇති සියලුම පොත් සඳහා වර්ග අංක යෙදීම, පුස්තකාල සම්පත් සංවිධානය කිරීම, සේවක හිඟතාව මත සුචිකරණ කටයුතු කිරීම අපහසු වුවත් කෘෂි පීඨයේ ඇති සියළු පොත් පත් සුචිගත කිරීම මෙම වසරේ අවසන් කරන ලදී. ඒ අනුව පුස්තකාලය සඳහා නව ප්‍රතිග්‍රහණ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීමට හැකි විය.

1980 වර්ෂයේ දී වෛද්‍ය පීඨ පුස්තකාලය ගාල්ල කරාපිටියේ ආරම්භ විය. තව ද සියළුම පොත් සඳහා ඇමතුම් අංක සහ වර්ග අංක ලබා දීම නිම කරන ලදී. අන්තර් පිරුළු සේවාව යටතේ වෙනත් පුස්තකාලවලින් පොත් ගෙන්වා ගැනීමට කටයුතු ආරම්භ කරන ලදී. මෙම කාලය තුළ ආසියානු පදනම, බ්‍රිතාන්‍ය කවුන්සිලය, කැනඩා මහකොමසාරිස් කාර්යාලය, නෙදර්ලන්ත ආධාර වැඩසටහන, ඉන්දීය රජය, ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන හා රටවල් විසින් අභිනවයෙන් ආරම්භ කළ රුහුණ විශ්වවිද්‍යාල

පුස්තකාලයට තොරතුරු සම්පත් මූලාශ්‍ර මෙන්ම විවිධ භෞතික ආධාර ලබා දෙන ලදී.

මාතර, මැද්දවත්තේ, එළියකන්දේ එවකට ගුරු අභ්‍යාස විද්‍යාලයක්ව පැවති ස්ථානයේ කලා පීඨය ආරම්භ වූ නමුත් එහි පුස්තකාලයක් ආරම්භ වන්නේ නැත. එහෙත් කලා පීඨ සිසුන් කාර්මික විද්‍යාල භූමියේ ඇති පුස්තකාලය භාවිත කිරීමට අකමැත්තක් දැක්වූ බැවින් කලා පීඨය සඳහා පුස්තකාලයක් එහි ආරම්භ කරන ලදී. එහි සහකාර පුස්තකාලයාධිපතිනිය ලෙස ආර්. එච්. එස්. රණසිංහ මහත්මිය පත්ව ආචාය. කාර්මික විද්‍යාල භූමියේ පිහිටි පුස්තකාලය විද්‍යා පීඨ පුස්තකාලය විය. පුස්තකාලයේ පරිපාලනය සිදුවන්නේ කාර්මික විද්‍යාල පරිශ්‍රයේ සිටයි. එහි කාර්යභාර පුස්තකාලයාධිපති එම්. පී. ජයතිලක මහතාට අමතරව ඩබ්. එම්. පී. වී. ගුණරත්න මහත්මිය සහකාර පුස්තකාලයාධිපති ලෙස සේවයේ යෙදී ඇත. කෘෂි විද්‍යා පීඨය සඳහා ද පුස්තකාලය මෙම කාර්මික විද්‍යාල භූමියේ පිහිටා තිබූ අතර 1980 දී කෘෂි විද්‍යා පීඨය මාපලානේ පැරණි රජයේ ගොවි පොළ පිහිටි ස්ථානයට රැගෙන ගිය අතර එම පීඨය සඳහා එහි පුස්තකාලයක් ස්ථාපිත කරන ලදී. පීඨ කාර්යාලයට අයත් ගොඩනැගිල්ලේ පුස්තකාලය සඳහා වෙන් කරන ලද කාමර දෙකක 1980 දී පුස්තකාලය ස්ථාපිත කර ඇත. එහි සේවයට එවකට විද්‍යා පීඨ පුස්තකාලයේ සේවය කළ පී. එම්. සුමනදාස මහතා අනුයුක්ත කරන ලදී. එහි පොත් 3245 ක් සහ සඟරා 1044 ක් තිබී ඇත. 1986 දී ඩබ්. ඩබ්. වීරසූරිය මහතා සහකාර පුස්තකාලයාධිපති ලෙස කෘෂි පීඨ පුස්තකාලයට පත් විය.

1980 දී මහමෝදර වෛද්‍ය විද්‍යා පීඨය ආරම්භ වන අතර එහි ද පුස්තකාලයක් ස්ථාපිත විය. එහි කණිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ලෙස කපිල ජයලාල් සිරිසේන මහතා සේවයට එක් විය . ඔහුගේ සහායට පුස්තකාල සහකාර ලෙස වීරමන් මහතා පත් කරන ලදී. එහි පුස්තකාල සේවකයෙකු ලෙස වික්‍රමසිංහ මහතා පත් විය. පසුව කරාපිටියේ ගොඩනැගිලි සංකීර්ණය ඉදිවන අතර පුස්තකාලය ද එම ස්ථානයට රැගෙන යන ලදී.

## 1986 වර්ෂයෙන් ආරම්භ වන අවධිය

1986 වර්ෂයෙන් ආරම්භ වන දශකය රුහුණ විශ්වවිද්‍යාලයටත් පුස්තකාලයටත් අතිශයින් වැදගත් කාලයකි. 1985 වර්ෂයේ දී මැද්දවත්ත කාර්මික විද්‍යාලයේ පවත්වාගෙන යනු ලැබූ පුස්තාකලය සහ විද්‍යා පීඨ පුස්තකාලය වැල්ලමඩම භූමියේ විද්‍යා පීඨ සංකීර්ණයේ ගොඩනැගිල්ලේ කොටසකටත්, එළියකන්ද ගුරු අභ්‍යාස විද්‍යාලයේ පැවති කලා පීඨ පුස්තකාලය වැල්ලමඩම භූමියේ කලා පීඨ ගොඩනැගිල්ලේ කොටසකටත් තාවකාලිකව ගෙන එන ලදී. මෙම වර්ෂයේ දී මුදල් අමාත්‍යංශයේ අනුග්‍රහය යටතේ ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් රුපියල් මි.3.3 මූල්‍යමය පරිත්‍යාගයක් ලබා දෙන ලදී. සහකාර පුස්තකාලයාධිපති කේ. ජේ. සිරිසේන මහතා විදේශගතව සිට පුස්තකාල විද්‍යා දර්ශනපති උපාධියත්, සහකාර පුස්තකාලයාධිපති ඩබ්. එම්. ටී. වී. ගුණරත්න මහත්මිය කැළණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා නැවත පුස්තකාලයේ වැඩ භාර ගන්නා ලදී. 1978 දී ආරම්භ කළ රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයේ ගොඩනැගිලිවලින් තෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කොට 1986 දී විවෘත කළ අතර, මේ වන විට විද්‍යා පීඨ පුස්තකාලය සහ මානව ශාස්ත්‍ර පීඨ පුස්තකාලය නව ගොඩනැගිලි සංකීර්ණයට ප්‍රවේශ විය. එතැන් සිට මෙම නව පුස්තකාලය රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය බවට පත් විය. එහි කාර්යභාර පුස්තකාලයාධිපතිවරයා ලෙස එම්. පී. ජයතිලක මහතා ද, සහකාර පුස්තකාලයාධිපතිවරයා ලෙස සුසිරිපාල මානවඩු මහතා ද සේවය කර ඇති අතර පුස්තකාලය සඳහා පුස්තකාල සහකාරවරු, පුස්තකාල සහායක, පුස්තකාල සේවක සහ පොත් බැඳුම්කරු යන කාර්ය මණ්ඩලයක් සහිතව නව පුස්තකාලය රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය ලෙස ස්ථාපිත කරන ලදී. එවකට උපශාලාධිපති ලෙස සේවය කරමින් සිටි ආනන්ද කරුණාරත්න මහතා 1991 ජුනි මස සහකාර පුස්තකාලයාධිපති ලෙස පත්වීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. නව ගොඩනැගිලි සංකීර්ණයට ප්‍රවේශ වී කටයුතු ආරම්භ වූ මෙම අවධිය තුළ කාර්යය බහුල තත්වයක් පැවතී ඇති බව පෙනී යයි. පුස්තකාලය විධිමත්ව සංවිධානය කිරීම, ගෘහ භාණ්ඩ

ඇතුළු සම්පත් අත්පත් කර ගැනීම ආදිය මෙහිලා ප්‍රමුඛ කාර්යය වී ඇත. මෙසේ 1996 දක්වා දශකය සෙමෙන් නමුත් ක්‍රමවත්ව සංවර්ධනය වෙමින් ආ පුස්තකාල සංවර්ධන ක්‍රියාවලියේ මීළඟ යුගය ආරම්භ වන්නේ 1996 වර්ෂයේ සිටයි.

පාඨක ඉල්ලීම අනුව පුස්තකාල පොත් වල අන්තර්ගත සිතියම්, රූප සටහන්, විශේෂ සටහන් ආදිය ඡායා පිටපත් ලබාදීම මෙකල ආරම්භ විය. සහකාර පුස්තකාලයාධිපති එම්. පී. ජයතිලක මහතා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වයක් මත විදේශගත වීම හේතුවෙන් සහකාර පුස්තකාලයාධිපති කේ.ජේ. සිරිසේන මහතා වැඩ බලන පුස්තකාලයාධිපති ලෙස කටයුතු කිරීම, සහකාර පුස්තකාලයාධිපති එස්. මානවඩු මහතා පුස්තකාල විද්‍යා පශ්චාත් උපාධිය සම්පූර්ණ කර සේවයට වාර්තා කිරීම ආදිය මෙම කාලය තුළ රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය සම්බන්ධයෙන් සිදුවූ වැදගත් සිදුවීම් ලෙස පෙන්වා දිය හැකිය. පුස්තකාලයේ සංවර්ධනය සම්බන්ධයෙන් සලකා බලන විට මෙම කාලය තුළ සිදුවූ විශේෂ සිදුවීම් ලෙස විවිධ එකතු අත්පත් කර ගැනීම, ලැබ්රෝයි එකතුව අත්පත් කර ගැනීම, පුස්තකාල සේවා සහකාර ලේඛකාධිකාරී තනතුරක් ලැබීම ආදිය මෙන්ම මෙම කාලයේ දී ලංකාව සම්බන්ධයෙන් ලියවී ඇති පොත් පත් තැන්පත් කිරීම සඳහා ප්‍රධාන පුස්තකාලයේ ලංකා ශාලාව නමින් වෙනම අංශයක් සංවිධානය කර එහි විශේෂ එකතු ලෙස රජයේ දෙපාර්තමේන්තු ප්‍රකාශන, අණ පනත්, නීති කෙටුම්පත් ආදිය තැන්පත් කර විමර්ශනය සඳහා පමණක් ලබා දීම සිදු කරන ලදී. පුස්කාලයේ ඇති පොත් වල විස්තර CDS/ISIS දත්ත පදනමකට ඇතුළත් කිරීම ආරම්භ කරන ලදී. ප්‍රධාන පුස්තකාලයේ පොත් පරිගණකගත කිරීම සඳහා වෙනම අංශයක් ස්ථාපිත කරන ලද අතර ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය මඟින් පවත්වාගෙන යනු ලබන ජාතික ඒකාබද්ධ සූචියට දායක වීමට ද රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලයට හැකි විය. මේ සඳහා එම වසරේ සිට පුස්තකාලයට ලැබෙන සෑම පොතකටම අමතර සූචි පත්‍රිකාවක් සකස් කර එය ඉහත සඳහන් ව්‍යාපෘතියට යවන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ පිටපතක් පරිත්‍යාග වශයෙන් අප වෙත ලබා ගැනීමට හැකි විය.

## 1996 වර්ෂයෙන් ආරම්භ වන අවධිය

මෙම දශකය ආරම්භ වන්නේ ස්ථිර පුස්තකාලයාධිපතිවරයෙකු නොමැතිවයි. එපමණක් නොව එවකට කාර්යභාර පුස්තකාලයාධිපතිවරයාව සිටි එම්. පී. ජයතිලක මහතා ද ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුරක් ලැබ 1995 වසරේ දෙසැම්බර් මස පේරාදෙණිය විශ්වවිද්‍යාලයට එක්විය. එසේම වෛද්‍ය පීඨ පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිව සිටි කපිල ජයලාල් සිරිසේන මහතා ද 1996 වසරේ සප්ත වාර්ෂික නිවාඩු ලබාගත්තේය. පුරප්පාඩු වන කාර්යභාර පුස්තකාලයාධිපති තනතුර සඳහා වැඩ ආවරණය කිරීමේ වගකීම පැවරෙන්නේ සහකාර පුස්තකාලයාධිපති ආනන්ද කරුණාරත්න මහතාටයි. සේවයේ යෙදී සිටි සහකාර පුස්තකාලයාධිපතිනියක් පුස්තකාල සේවයෙන් ඉවත්ව ආචාර්ය මණ්ඩලයට එක්විය. පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු සහ සහකාර පුස්තකාලයාධිපතිනියක් පමණක් ප්‍රධාන පුස්තකාලයේ සේවයේ යෙදී සිටි බැවින් 1996 වසරේ මාර්තු මාසයේ එකවර සහකාර පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු පත්වීම් ලැබූහ.

1998 වසරේ දී ප්‍රථම වරට රුහුණ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයට ස්ථිර පුස්තකාලයාධිපතිවරයා ලෙස එවකට කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පුස්තකාලයේ සේවය කරමින් සිටි ඩබ්. ආර්. ගාමිණී ද සිල්වා මහතා පත්විය. රුහුණ විශ්වවිද්‍යාලයට නව පීඨයක් වශයෙන් ඉංජිනේරු පීඨය ආරම්භ වන අතර එහි පුස්තකාල කාර්ය මණ්ඩලය පුළුල් කිරීම ද අරමුණු කරගෙන සහකාර පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු සහ පුස්තකාල සේවය සඳහා සහකාර ලේඛකාධිකාරීවරයෙකු සහ ලේඛකාධිකාරීවරයක් පත්වීම් ලබයි. එසේම පුස්තකාල සහකාර සේවය සඳහා ද එකවර තිදෙනෙකු ද පත්කර ගනු ලැබූහ.

## විසි එක්වන සියවසේ රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය

2003 වර්ෂයේ ගාමිණී ද සිල්වා මහතා සප්ත වාර්ෂික නිවාඩු ලැබ රජරට විශ්වවිද්‍යාලයට ගිය බැවින් වැඩ බලන පුස්තකාලයාධිපතිවරයා බවට පත්වන්නේ ආනන්ද කරුණාරත්න මහතායි. ඔහුගේ සේවා කාලය තුළ බහු මාධ්‍ය ඒකකය ඇරඹීම, පුස්තකාල ස්වයංක්‍රීයකරණය, රෝහණ එකතුව ඇරඹීම, නව කියවීම් ශාලාව ස්ථාපිත කිරීම වැනි පුස්තකාලයේ සංවර්ධන කටයුතු රාශියක් ආරම්භ කිරීම මෙම දශකය තුළ සිදුවූ සුවිශේෂී තත්වයකි. 2004 වර්ෂයේ නැවත ගාමිණී ද සිල්වා මහතා සේවයට එක් වුවද ඔහු 2005 වර්ෂයේ නැවත රුහුණ විශ්වවිද්‍යාලයෙන් ඉවත්ව රජරට විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිවරයා බවට පත්ව යයි. නැවත වැඩ බලන පුස්තකාලයාධිපතිවරයා බවට ආනන්ද කරුණාරත්න මහතා පත්විය.

ගාමිණී ද සිල්වා මහතාගෙන් ඇතිවන පුරප්පාඩුවට 2006 වසරේ රුහුණ විශ්වවිද්‍යාලයේ දෙවන ස්ථිර පුස්තකාලයාධිපතිවරයා වශයෙන් කපිල ජයලාල් සිරිසේන මහතා පත්වීම් ලබයි. එහෙත් අවාසනාවකට 2007 වසරේ දී ඔහු සේවයේ යෙදී සිටියදීම ජීවිතයෙන් සමුගන්නා අතර නැවත වැඩ බලන පුස්තකාලයාධිපතිවරයා බවට ආනන්ද කරුණාරත්න මහතා පත්වෙයි. 2009 වසර දක්වා වැඩ බලන පුස්තකාලයාධිපතිවරයා ලෙස සේවය කළ ආනන්ද කරුණාරත්න මහතා 2009 මැයි මස රුහුණ විශ්වවිද්‍යාලයේ තෙවන ස්ථිර පුස්තකාලයාධිපතිවරයා ලෙස පත්වීම් ලැබූහ.

මේ නිසා විසි එක්වන සියවසට අප පිය නගන විට එම පත්වීම නිසා නව ජවයකින් පුස්තකාල සේවා ඉදිරියට ගෙන යාහැකි විය. 2000 ආරම්භයත් සමග නව වැඩසටහන් කිහිපයක් ඇරඹිණි. මේ වන විට CDS/ISIS දත්ත පදනම භාවිත කරමින් ක්‍රියාත්මක වූ ස්වයංක්‍රීය කටයුතු නව මාවතකට යොමු කරමින් විවෘත ප්‍රභව මෘදුකාංගයක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම වසරේ ලැබූ තවත් ජයග්‍රහණයක් වන්නේ සමස්ථ විශ්වවිද්‍යාල පද්ධතියේම එවකට නොතිබූ ආකාරයේ සියලු නූතන පහසුකම් සහිත මධ්‍යස්ථානයක් රුහුණ විශ්වවිද්‍යාලයට ස්ථාපිත කිරීමට හැකි වීමයි. එවකට

උපකුලපතිවරයා ලෙස සිටි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් සේනාරත්න මහතාගේ මැදිහත් වීමෙන් මෙම ඒකකය ස්ථාපිත කළ අතර ඒ සඳහා රුපියල් මිලියන 7.5ක මුදලක් වැය කරන ලදී. 2002 නොවැම්බර් 05 දින ජපන් තානාපති හිෂුරෝ ඔට්සුකා මහතා විසින් මෙය (Resource Center for Information Service) Modern Language නමින් නිල වශයෙන් විවෘත කරන ලදී.

වසර 2002 දී එවකට සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස සේවය කළ නිමල් හෙට්ටිආරච්චි ප්‍රමුඛ පුස්තකාල කණ්ඩායම ලංකාවේ ප්‍රථම වරට විශ්වවිද්‍යාල පුස්තකාලයක් සඳහා විවෘත ප්‍රභව මෘදුකාංගයක් ලෙස ''කොහා'' මෘදුකාංගය හඳුන්වා දෙමින් රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ස්වයංක්‍රීය කටයුතු ආරම්භ කරන ලදී. අන්තර්ජාලය මඟින් නොමිලයේ ලබා ගන්නා ලද පුස්තකාල මෘදුකාංගයක් වන " Koha" වැඩි දියුණු කොට ISURu (Integrated Software University of Ruhuna) නමින් සකස් කර ගැනීමට හැකි වීම මෙම වසරේ ලැබූ තවත් විශේෂ ජයග්‍රහණයකි. එය (ISURu) නමින් නම් කොට නොබෝ දිනකින්ම බැහැර දීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයව සිදුකල හැකි තත්වයට පත්කිරීම රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය ලද විශිෂ්ඨ ජයග්‍රහණයකි. පුස්තකාලය සඳහා වෙනම වෙබ් අඩවියක් නිර්මාණය කිරීම, ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාල සම්පත් එකතුව අන්තර්ජාලය ඔස්සේ ගවේෂණය කිරීමට හැකි පරිදි සකස් කිරීම, මිලදී ගන්නා ලද සංවෘත තැටි පිළිබඳව ගවේෂණයට හැකිවීම ආදිය නිසා මෙම අවධිය රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය නවීන තාක්ෂණය භාවිතය වේගවත් කළ අවධියක් ලෙස පෙන්වා දිය හැකිය. පුස්තකාලය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කළ අතර එමගින් ජාත්‍යන්තර ලෝකයට ප්‍රවේශ වීම වේගවත් විය. පුස්තකාලයට අයත් වූ විද්‍යුත් පොත් (E-books) පුස්තකාල වෙබ් අඩවිය තුළින් පරිශීලනයට හැකි වන පරිදි සකස් කිරීම, අන්තර්ජාලය තුළින් විද්‍යුත් සඟරා (Electronic Periodicals) පිළිබඳ විස්තර ගවේෂණය සඳහා පහසුකම් සැලසීම ආදිය නිසා පාඨක ආකර්ශණය ඉහළ ගියේය. ප්‍රධාන පුස්තකාලයේ ඇති සියලුම පරිගණක ස්ථානීය ප්‍රදේශ ජාලයක් Local Area Network සකසා පුස්තකාල සේවා ව්‍යාප්තකරන ලදී. වෛද්‍ය පීඨ හා ඉංජිනේරු පීඨ

පුස්තකාල අභ්‍යන්තර සම්බන්ධතාත් Internal Dial Up මගින් සම්බන්ධ කළ අතර කෘෂි පීඨ පුස්තකාල තුළ LAN මගින් මෙම වසරේ දී සම්බන්ධ කරන ලදී. පුස්තකාල පද්ධතිය තව තවත් පුළුල් කරමින් අළුතින් ආරම්භ කළ තාක්ෂණ පීඨයේ පුස්තකාලයක් ස්ථාපිත කරන ලදී. නව සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු බඳවාගත් අතර පුස්තකාලයට සෙසු කාර්ය මණ්ඩලය ද පත්කරමින් මානව සම්පත් සංවර්ධනය සිදුකර ඇත. තාක්ෂණ පීඨ පුස්තකාලය ද ප්‍රධාන පුස්තකාලය හා ජාලගතව සම්බන්ධ කරන ලදී. ඒ අනුව සියළුම පීඨ ප්‍රධාන පුස්තකාලය හා සම්බන්ධ කර ඇති අතර සියළුම පීඨවල පාඨක ප්‍රජාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමට අද වන විට රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලයට හැකියාව ලැබී ඇත.

වාර්ෂිකව ප්‍රධාන පුස්තකාලය ඇතුළුව පීඨ පුස්තකාල සඳහා සැලකිය යුතු ප්‍රමාණයකින් තොරතුරු සම්පත් මූලාශ්‍ර එක්විය. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ එවකට උපකුලපතිවරයා ලෙස සිටි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී සේනානායක මහතාත්, පුස්තකාලයාධිපති ආනන්ද කරුණාරත්න මහතාත් අතර සිදු වූ සාකච්ඡා මාලාවකින් පසුව රුහුණ විශ්වවිද්‍යාලයට ද නීතිමය තැන්පත් එකතුව ලැබීම මෙම අවධියේ සිදුවූ ඉතා වැදගත් සිදුවීමකි. ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල වලින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පමණක් හිමිව තිබූ නීතිමය තැන්පතුවේ පුස්තකාල සම්පත් ලැබීමේ අවස්ථාව රුහුණ විශ්වවිද්‍යාලයට ද හිමිවීම රුහුණ විශ්වවිද්‍යාලයට පමණක් නොව සමස්ත දකුණු පළාතටම හිමි වූ ස්වර්ණමය අවස්ථාවක් ලෙස සැළකිය හැකිය.

විශ්වවිද්‍යාලයේ හදවත පුස්තකාලය බව මනාව අවබෝධ කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය දැනුම් මූලාශ්‍ර සංවිධානය කරන අතර නව දැනුම් මූලාශ්‍ර උත්පාදනය සඳහා ද පුස්තකාලයේ දායකත්වය නොඅඩුව සපයන ලදී. ජාතික සංවර්ධනයට අවශ්‍ය දැනුම සැපයීමේ අරමුණෙන් විශ්වවිද්‍යාල විද්වතුන් සිදුකරන අධ්‍යයන පර්යේෂණ කාර්ය සඳහා අවශ්‍ය දැනුම් මූලාශ්‍ර සැපයීමත් ඒ සඳහා යටිතල පහසුකම් ලබාදීමත් පුස්තකාලය විසින් පසුගිය දශක කීපය තුළම ඉතා ප්‍රශස්ථ ලෙස සිදුකරන ලදී. විශ්වවිද්‍යාල සිසුන්ගේ

තොරතුරු සාක්ෂරතාව ඉහළ නැංවීමේ අරමුණෙන් තොරතුරු සාක්ෂරතා පාඨමාලා හඳුන්වා දෙමින් 2009 වර්ෂයේ ආරම්භ කළ මෙම පාඨමාලා වර්තමානය වන විට සියළුම පීඨවල පාඨමාලා වලට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. ආරම්භයේ සිටම රෝහණ ශාස්ත්‍රීය සඟරාවේ ප්‍රකාශනයට දායකත්වය සැපයීම, රචනා චෞරත්වය (Plagiarism) අවම කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග එවත්වාගෙන යාම හා අවශ්‍ය උපදෙස් සැපයීම, පර්යේෂණ ප්‍රකාශන බෙදාහැරීම වැනි කාර්යයන් සිදුකරනු ලබන්නේ පුස්තකාලය විසිනි. විශ්වවිද්‍යාලයේ සිදුකරනු ලබන අධ්‍යයන, සාමාජීය හා අනෙකුත් කාර්යයන්වලදී ද පුස්තකාලයාධිපතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය සිය පූර්ණ සහාය නිරතුරුව ලබාදෙමින් සිටී. පුස්තකාලයට අවශ්‍ය ඉඩ පහසුකම් සංවර්ධනය සඳහා 2015 වසරේ ආරම්භ කළ නව ගොඩනැගිලි සංකීර්ණය 2019 වසරේ විවෘත වීම නිසා වඩාත් කාර්යක්ෂමව පුස්තකාල සේවා සැපයීමට අවස්ථාව උදාවී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රජාවට සේවා සැපයීමට අමතරව සමස්ත පළාතේම පාසල්, මහජන පුස්තකාල සහ රාජ්‍ය ආයතන පුස්තකාල සඳහා වෘත්තීය දැනුම සංවර්ධනය කිරීමේ අරමුණෙන් වැඩසටහන් රාශියක් පසුගිය කාලය තුළ ක්‍රියාත්මක කරන ලදී. ජාතික ආධුනිකත්ව මණ්ඩලය සහ වෘත්තිය පුහුණු අධිකාරියේ පුහුණුවන්නන්ට අමතරව ප්‍රදේශයේ පාසල් හා වෙනත් ආයතනයන්හි පුස්තකාලයාධිපතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් විශාල ප්‍රමාණයක් පවත්වා ගෙන යන ලදී. කැළණිය විශ්වවිද්‍යලයීය පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාව හදාරන සිසුන් සහ කොළඹ විශ්වවිද්‍යාලයීය ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය යන ආායතනයන්හි හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේත් පුස්තකාල හා විඥාපන විද්‍යා පාඨමාලා හදාරන සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු පාඨමාලා වලට පැමිණෙන සිසුන්ට සෑම වසරකම අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව අප විසින් ලබා දෙමින් සිටී.

## ආශ්‍රිත මූලාශ්‍ර හා ලේඛන

පඤ්ඤාසීහ මහා නාහිමි, මඩිහේ. (2003). රුහුණ විශ්වවිද්‍යාලයීය අභිනව බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කිරීමේ උත්සවයේ පැවති දේශනයේ මුද්‍රිත ප්‍රකාශනය.

තිලකරත්න, එස්. (1997). ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ පරිණාමය සහ එහි වත්මන් තත්ත්වය. ආර්ථික විමසුම, වෙළුම. 22, අංකය 10.

කොට්ටහච්චි, ධනපාලී. (1997). ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තියේ වෙනස්කම්, ආර්ථික විමසුම වෙළුම. 22, අංකය 10.

රුහුණ විශ්වවිද්‍යාලයීය ඉතිහාසය, 1978-2003

වාර්ෂික වාර්තා රුහුණ විශ්වවිද්‍යාලය.

# ප්‍රාථමික හා පර්යේෂණ මූලාශ්‍ර වශයෙන් පුස්කොළ පොත්වල ඇති වැදගත්කම

ආචාර්ය චම්පා එන්. කේ. අලහකෝන්

## හැඳින්වීම

අනාගතය හැඩගස්වා ගැනීමෙහිලා මිනිසා විසින් කලක් තිස්සේ එක් රැස් කරන ලද මතකයන් හා ස්මෘතීන් ඉතා වැදගත් වන අතර එය සංස්කෘතික අනන්‍යතාව මෙන්ම අතීතය හා වර්තමානය පිළිබඳව ද තොරතුරු රාශියක් ගෙන හැර දක්වයි. ඒ අනුව බලන කල පුස්තකාල, ලේඛනාගාර හා කෞතුකාගාරයන්හි තැන්පත් කර ඇති ලේඛන සමුච්ඡයන් හි එවන් වූ මතකයන් රැසක් තැන්පත් වී ඇත. එමඟින් මිනිසාගේ නානාවිධ වූ භාෂාවත්, සංස්කෘතියත්, ඇදහිලි විශ්වාස පිළිබඳව වූ සාධක සපයන අතර එම ලේඛන බොහෝමයක් අද වන විට කෙමෙන් වියැකෙමින් පවතී. එසේ වුවද පුස්තකාල, ලේඛනාගාර හා කෞතුකාගාර බිහිවීමෙහි ලා මෙම ලේඛනයන් සෘජුවම මෙන්ම වක්‍ර ලෙසද හේතු වී ඇති බව රහසක් නොවේ.

ලංකාවේ සාහිත්‍යමය හා වාග් විද්‍යාත්මක නිපුණතාව වර්ධනය කිරීම සඳහා පුස්කොළ පොත් බෙහෙවින් ඉවහල් වී ඇති අතර එය මධ්‍යකාලීන ලංකා සමාජයේ මිනිසුන්ගේ සාමාජීය වටිනාකම, චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි, විශ්වාස, ආකල්ප, හා ඔවුන්ගේ ජීවන තතු තීක්ෂණව විදහා දක්වන ලේඛන විශේෂයක් ලෙසද පෙන්වා දිය හැකිය. එපමණක් ද නොව, ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය හා පර්යේෂණ කිරීම සඳහා දැනට පවත්නා ප්‍රාථමික මූලාශ්‍රයන් ලෙස ද මනා වැදගත්කමක් මෙම පුස්තක සඳහා හිමි වී තිබේ. මෙය එක්තරා දුරකට ලංකා සමාජයේ මිනිසාගේ අධ්‍යාපනය, දැනුම හා සංස්කෘතිය පිළිබඳ දැනුම් ප්‍රවාහනය කරන්නා වූ වැදගත් මාධ්‍යයක් ලෙස ද හඳුන්වා දිය හැකිය.

වර්තමාන පුස්තකාලයන් හි තැන්පත් කර ඇති එකතූන් සම්බන්ධයෙන් සලකා බලන විට ඒවා බොහෝමයක් ද්විතීයික මුලාශ්‍ර වන අතර ග්‍රන්ථ, වාර සඟරා, ඉලෙක්ට්‍රොනික දත්ත, අන්තර්ජාල, විද්‍යුත් සඟරා, සංගත

තැටි, පටි වැනි දේ අඩංගු වේ. ඒ හා සමගාමීව, පුස්කොළ පොත් වැනි ප්‍රාථමික මට්ටමේ මූලාශ්‍ර මඟින් ලැබිය හැකි සාක්ෂි සාධක හා තථ්‍ය තොරතුරු ද ඉතා වැදගත් වේ. අධ්‍යයන කාර්යයෙහි යෙදී සිටින පර්යේෂකයින්ටත් ශ්‍රී ලාංකික උරුමය සොයා එන දේශ හිතෛෂී ගවේෂකයින්ටත් මෙම ඓතිහාසික පුස්කොළ අත් ලිපි එකතුව මහඟු මෙහෙවරක් ඉටු කරයි. එමෙන්ම සාවද්‍යයෙන් තොර සාධිකාරී සාධක, තොරතුරු පදනම් කර ගත් ඓතිහාසික, ශාස්ත්‍රීය හා වාග් විද්‍යාත්මක ඉතිහාසයක් ලියන විද්‍යාර්ත්ථීන්ට මෙම අත්ලිපි මඟින් ලැබිය හැකි ඵල ප්‍රයෝජන පෘථුලය.

පුස්කොළ ග්‍රන්ථ පිළිබඳව ජෝන් ඩේවි පවසා ඇති අදහස නම් ''ඔවුන්ගේ (අපගේ) ග්‍රන්ථ හුරුබුහුටිය හා සංඛ්‍යාත්මකව විශාලය. අපගේ (යුරෝපීයයන්ගේ) මුද්‍රිත ග්‍රන්ථවලට වඩා මිල අධික වුවත් මුද්‍රණ ශිල්පය බිහිවීමට පෙර යුරෝපයේ තිබෙන අත්පිටපත් වලට වඩා බෙහෙවින් මිල අඩුය.'' එසේ වුවද එම ග්‍රන්ථයන්හි පවත්නා සාහිත්‍යයමය අගය අද දක්වාත් නොනැසී පවතී.

## පුස්කොළ පොත් ලියැවී ඇති විෂය පරාසය

හුදෙක් පුස්කොළ පොත් යනු අත්ලිපි ගණයට ඇතුළත් වන්නා වූ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ සම්භාරයක් වන හෙයින් ද එය මධ්‍යකාලීන ලංකා සමාජයේ ග්‍රන්ථ නිෂ්පාදනය පිළිඹිබු කළ විශේෂ නිෂ්පාදිත ක්‍රියාදාමයක් වූ හෙයින් ද මෙම ලේඛන කලාව ඇසුරු කරමින් ලියැවී ඇති ග්‍රන්ථ සම්භාරය අතිමහත්ය. එය පුළුල් විෂය පරාසයක් හසුරුවමින් ලියැවී ඇති බව පුස්කොළ පොත් පරීක්ෂාවේ දී පෙනී ගිය කරුණකි. එම විෂය පරාසයන් පහත සඳහන් පරිදි පෙන්වා දිය හැකිය. ප්‍රධාන වශයෙන් බෞද්ධ ඉතිහාසය, බෞද්ධ සාමයික ග්‍රන්ථ, බෞද්ධ සිද්ධස්ථාන සම්බන්ධයෙන් ලියැවුණු ග්‍රන්ථ දැක්විය හැකිය. එමෙන්ම සිංහල සාහිත්‍යය සඳහා ගද්‍ය, පද්‍ය, ජාතක, පුරාවෘත්ත, ගී කාව්‍ය, ආදිය ඇතුළත්ය. ඉතිහාසය යන විෂය සම්බන්ධයෙන් විත්ති හා කඩයිම් පොත් ද නොයෙක් සම්ප්‍රදායන්, වංශ කථා, ඉඩම් විස්තර, උපත් හා විවාහ පිළිබඳව ලියැවුණු පුස්කොළ පොත්, ලේකම් මිටි, චරිතාපදාන ආදිය දැක්විය හැකිය. සිංහල භාෂාව සම්බන්ධයෙන් ව්‍යාකරණ, ශබ්ද කෝෂ, ඡන්දස් ශාස්ත්‍රය, සිංහල අකාරාදිය මෙන්ම කලාව සඳහා

චිත්‍රකරුවන් පිළිපදින ලද නීතිරීති, සායම් සෑදීමේ පිළිවෙල ආදිය අඩංගු පොත් ද දැක්විය හැකිය. එමෙන්ම කැටයම් කලාව, රූප නෙලීම, ලෝහ කර්මාන්තය, ගෘහ නිර්මාණ හා සූපවේදය සම්බන්ධයෙන් ලියැවුණු ග්‍රන්ථ ද මේ අතර වේ.

දේශීය ආයුර්වේදය ගත් විට මේ යටතට සෑම වෛද්‍ය ක්ෂේත්‍රයක්ම නියෝජනය වන පරිදි පොත් ලියැවී ඇත. පශු වෛද්‍ය විද්‍යාව සඳහා හරක් වෙදකම, නාගයින්ගේ විෂ නැසීමේ වෙදකම, පිස්සු බලු රෝගය, ඇස් වෙදකම, අලි වෙදකම යනාදිය දැක්විය හැකිය. වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ගත් විට සාමාන්‍ය ලෙඩ රෝග, ගර්භනී තත්වයන් දී ඇති වන ගැටළු, ළදරු රෝග, ශල්‍ය වෛද්‍ය විද්‍යාව, හෙද ක්‍රම, බෝවන රෝග, පිළිකා, ගෙඩි වෙදකම්, අස්ථි වෙදකම මෙන්ම දේශීය අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් තෙල් සිඳ ගන්නා ක්‍රම, ශාක සාර වෙදකම්, වට්ටෝරු වෙදකම මෙන්ම කැඳ, තෙල්, ගුලි, පත්තු, කල්ක, චූර්ණ, කසාය, රසායන සාදා ගන්නා අන්දම ආදිය සඳහා ද බොහෝ පුස්කොළ පොත් ප්‍රමාණයක් ලියැවී ඇත.

මෙයට අමතරව විද්‍යාව, ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය, නැකැත් පොත, මල්වර නැකැත්, නව ග්‍රහ ශාන්ති, ලිත් ගනින ක්‍රමය, යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, භූත විද්‍යාව, යන සියල්ල යක්ෂයින් හා සම්බන්ධව කරන්නා වූ බලි තොවිල් යාතු කර්ම ගණයට අයත් වේ. රිස් ඩේවිඩ්ස් පෙන්වා දී ඇති පරිදි මෙය කොටස් 06 ක් යටතේ කථා කළ හැකිය. එනම්,

1. ගුප්ත රෝග
2. ප්‍රතිකාර අරමුණු කරගත් රෝග
3. සෞඛ්‍ය තත්ත්වය යහපත් කර ගැනීමේ අරමුණින් පවත්වන්නා වූ යාතු කර්ම
4. යක්ෂයින් වැසී ඇති අයවලුන් එයින් මුදා ගැනීමට පවත්නා වූ ගුරුකම්
5. අන් අය හට වින පැමිණවීම අරමුණු කරගත් මන්ත්‍ර ගුරුකම් හා
6. අනාවැකි හා නිමිති කීම අරමුණු කරගත් ක්‍රමවේදයන් ලෙසිනි.

එමෙන්ම වාස්තු විද්‍යාව, භූගෝල විද්‍යාව, ජනශ්‍රැති, නාට්‍ය හා ගීත මෙන්ම අබෞද්ධ ග්‍රන්ථ ද වෙනත් භාෂාවන් ඇසුරින් ලියැවුණු ග්‍රන්ථ ද විශේෂයෙන්ම දෙමළ, තෙළිඟු කාම්බෝජියානු හා බුරුම ග්‍රන්ථ ද මේ අතර වේ. එසේ වුවද ශ්‍රී ලංකාව සතු පොත් එකතුන්හි බොහෝමයක්

දක්නට ඇත්තේ පාලි, සංස්කෘත හා සිංහල යන ත්‍රිභාෂාවන්ගෙන් ලියැවී ඇති පුස්කොළ පොත්ය. ඉහතින් සඳහන් කළා වූ පුළුල් විෂය පරාසයක ලියැවී ඇති මෙම ග්‍රන්ථ සම්භාරයෙන් වැදගත් තොරතුරු බොහෝමයක් අනාවරණය කර ගැනීමට හැකිවනවා ඇත.

## පර්යේෂණ මූලාශ්‍ර ලෙස ඇති වැදගත්කම

බොහෝ පුස්තකාලයන්හි මෙම එකතුන් සුළු වශයෙන් මෙන්ම විශාල වශයෙන් පැවතියේ වුව ද ඒවා හුදෙක් වර්ගීකරණය නොකර, භාවිතා නොකර, පිරිසිදු නොකර, නොසැලකිලිමත් ලෙස ගබඩා කර පැවතිය ද, පර්යේෂණයන් සඳහා වැදගත් තොරතුරු සපයන ප්‍රාථමික මූලාශ්‍ර ලෙස දැනුදු ඉතා ඉහළ වටිනාකමක් මෙම ග්‍රන්ථ සඳහා ඇත. ඉහත දැක්වූ හේතු කාරණා නිසා ශ්‍රී ලංකාවේ මෙම ග්‍රන්ථ ඇසුරින් අධ්‍යයනයන් හි යෙදෙන පර්යේෂකයින්ට හා සිසුන්ට ප්‍රායෝගික ප්‍රශ්න රැසකට මුහුණ දීමට සිදුව ඇති අතර මෙය ඔවුන් අභිමුවෙහි පවත්නා විශාල ගැටළුවක් ද වේ.

ලාංකික මානව ශාස්ත්‍ර විද්‍යාඥයෙක් වන කිත්සිරි මලල්ගොඩ මේ සම්බන්ධව සඳහන් කර ඇති පරිදි "මෑත කාලීන ලංකාවේ බෞද්ධ පිළිවෙත් පිළිබඳ ඉතිහාසය හැදෑරීමේ දී ඒ සඳහා පවත්නා වැදගත්ම මූලාශ්‍රයන් ලංකාව පුරා බොහෝ පිරිවෙන් පුස්තකාල වල විවිධ පරිමාණයෙන් විසිරී පවතී. ඒවා විධිමත් ලෙස සංවිධානය කර නොමැති නිසාත් විසිරී පවත්නා නිසාත් ඒවා අධ්‍යයනයන්ගෙන් ඈත්ව පවතින අතර කිසිවෙකු හෝ සිය අධ්‍යයන කටයුතු සඳහා ඒවා පරිහරණය කළ ද නියමිත කාලයක් තුළ දී එය සිදුකර ගැනීමට අපහසු තත්වයක පවතී".

වර්තමානයේ පුස්කොළ ලේඛන සඳහා ඇත්තේ ඓතිහාසික ප්‍රදර්ශනාත්මක වටිනාකමක් පමණක් බවත් ඒවාහි වැදගත්කමක් හෝ අදාළත්වයක් නොමැති බවටත් නොයෙක් දෙනා නොයෙක් අදහස් පළ කළ ද, පහත සඳහන් ආකාරයේ නොයෙකුත් අධ්‍යයන හා ශාස්ත්‍රීය ගවේෂණ මෙම එකතුන් පාදක කරගනිමින් සිදු කළ හැකිය. ඒ සඳහා පුස්තකාල මඟින් ලබන පිටිවහල අතිමහත්ය. එය ගවේෂණය, පර්යේෂණය, ඉගෙනුම්, ඉගැන්වීම් හා තම මතවාද ප්‍රකාශ කිරීම හා තොරතුරු බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් වන නිසා මෙවන් එකතුවක්

ආරක්ෂා කර ගනිමින් ඒවායින් ප්‍රයෝජනයක් ගැනීම සඳහා ඉඩකඩ සලසා දීම එහි මූලික වගකීම වේ.

ලංකාව තුළ ඇති පුස්කොළ පොත් එකතුන්හි නිවැරදි හා ප්‍රමාණාත්මක ගවේෂණයක් මෙතෙක් සිදු වී නොමැති අතර අද දක්වා පැවත ආ සියලු ග්‍රන්ථයන්හි පෙළ ද මුද්‍රණය සඳහා සකස් වී නොමැත. මෙසේ බොහෝ කලක් සංස්කරණයට ලක් නොවුණු හා මෙතෙක් කිසිවෙකුගේ ඇස නොගැටුණු මුල් පිටපත් හා අත්පොත් බොහෝමයක් තිබිය හැකිය. මෙම කාර්යය සඳහා බෙහෙවින් කාලය වැය වුව ද එවන් කටයුත්තක් සඳහා එළඹීමෙන් නව මංපෙත්, නව මතවාද, සත්‍ය තොරතුරු හෙළි කොට ගත හැකි අතර එමඟින් නව පර්යේෂණ හා ගවේෂණයන්ට ද ඉඩකඩ සැලසේ.

මෑත අතීතයේ දී උත්තර විචාරය හා ග්‍රන්ථ සංස්කරණ ක්‍රමවේදයන් ආදර්ශයට ගනිමින් පුස්කොළ පොත් කිහිපයක් සංස්කරණය කොට මුද්‍රණය කළ ද එයින් සමහරක් එහි සාම්ප්‍රදායික පෙළින් බැහැරව යමින් සංස්කරණය කොට ඇති බව පෙනේ. ශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා මෙම මුල් ග්‍රන්ථයන් හි අන්තර්ගත වී ඇති තොරතුරු ඉතා වැදගත් වන අතර එමඟින් සාවද්‍ය ලෙස සංස්කරණ වී ඇති ග්‍රන්ථ නැවත සකස් කිරීමට හැකිවනවා පමණක් නොව විවිධ වූ ග්‍රන්ථ විද්‍යාත්මක සම්ප්‍රදායන්හි වෙනස්කම් අධ්‍යයනය කිරීමට ද එමඟින් අවස්ථාව ලැබේ.

එසේම මෙම එකතුන් ක්‍රමානුකූලව සංවිධානය කර තිබීමෙන් හා ඒවා ස්ථානගත වී ඇති ප්‍රදේශ හා ආයතනය පිළිබඳ යාවත්කාලීන වූ තොරතුරු සපයා ගැනීමට හැකි වූවහොත් ජාතික හා අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ පර්යේෂණයන් හා නිගමනයන් රැසකට එළඹීමකට හැකියාව ලැබේ. මෙම ග්‍රන්ථයන්හි ඇති බොහෝ සත්‍ය හා වැදගත් කරුණු තවදුරටත් හෙළි නොවී පැවතීම නිසා පවත්නා සාධකයන්ට නව අරුත් හා සාක්ෂීන් ඉදිරිපත් කිරීමට තවදුරටත් එමගින් හැකිවනවා ඇත. එවන් වූ පුළුල් මට්ටමේ ගවේෂණයන් හා පර්යේෂණයන් ආරම්භ කිරීමට හැකි වීමෙන් මෙම පුස්කොළ පොත්, අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීමට උනන්දුවක් ඇති විය හැකිය. මෙම ග්‍රන්ථ මෙතෙක් කලක් පැවතිය ද එවන් සමීක්ෂණ හෝ පර්යේෂණ තාවකාලිකව හෝ සුළු වශයෙන් හෝ දියත් කර නොමැත.

තවත් සමහර විටෙක මෙවන් අධ්‍යයන අතපසු වී ඇත්තේ ඒ සඳහා බොහෝ කාලයක් වැය වන හෙයින් සහ එම කාර්යයට අවශ්‍ය දැනුමැති පුද්ගලයන් නොමැතිවීම නිසාය. එහෙත් එවන් අවස්ථාවන් හි කණ්ඩායම් වශයෙන් සැදි නානාවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය හා පර්යේෂණ කටයුතු සිදු කිරීමෙන් එක් විෂයක් යටතේ පවත්නා නොයෙක් පැතිකඩයන් පිළිබඳ විමර්ශනය කිරීමට හා නොයෙක් අදහස් මතු කර ගැනීමට අවස්ථාව පැදෙනු ඇත. නිදසුනක් ලෙස භාෂාව සම්බන්ධයෙන් ගත් කළ නොයෙකුත් වාග් විද්‍යාත්මක ගැටලු නිරාකරණය කර ගත හැකි අතර භාෂාවේ මෙතෙක් සොයා නොගත් ඉසව් කරා යාමට ද මඟ පැදෙනු ඇත. එමෙන්ම භාෂාව සම්බන්ධයෙන් පවත්නා පටු ආකල්ප හා හිස් අදහස් මඟ හරවා ගනිමින් වාග් විද්‍යාව සඳහා ප්‍රමාණවත් වූ අධ්‍යාපනික දායකත්වයක් මෙමගින් ලබා දිය හැකිය. එසේම සමහර ග්‍රන්ථයන් හි එයට අදාළ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සඳහන් වන බැවින් එවැනි ග්‍රන්ථයන් ඉතා වැදගත් විය හැකිය. මක්නිසාදයත් බොහෝ ග්‍රන්ථයන්හි ඒවා පිටපත් කළ වකවානුව හෝ පිටපත් කළ තැනැත්තා පිළිබඳ පැහැදිලි සාධක සොයා ගත නොහැකි බැවිනි. එමඟින් පුස්කොළ පොත්වල ඇති අතිරේක දත්තවල ඓතිහාසික වැදගත්කම සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කළ හැකිය.

තව ද විරාම ලක්ෂණ සම්බන්ධයෙන් ගත්කල මෙම ග්‍රන්ථ ලිවීමෙහි දී භාවිතා කර ඇති විරාම ලක්ෂණ ඉතා සීමා සහිතය. එනම් භාවිතා කර ඇත්තේ විරාම ලක්ෂණ කිහිපයක් වන අතර එය පුස්කොළ ලේඛන කලාවට පමණක් අනන්‍ය වූ විරාම ලක්ෂණ ක්‍රමයකි. එමඟින් පුරාණ ග්‍රන්ථ කතුවරුන්ගේ අනන්‍යතාවය විදහා දක්වන අතර පුරාණ ලංකාවෙහි පැවති ලේඛන වෘත්තිය සම්බන්ධයෙන් කරුණු හදාරත හැකිය.

ලංකාවේ දැනට පවත්නා පුස්කොළ පොත් අතර සමහර විෂයයන් සඳහා ලියැවී ඇති ග්‍රන්ථ විවාදාත්මක වන හෙයින් හා ගැටළු පැන නගින හෙයින් පර්යේෂකයින්, ගවේෂකයින්, ඉතිහාසඥයින්, මානව විද්‍යාඥයන් හා වාග් විද්‍යාඥයින් විසින් එම ක්ෂේත්‍ර පිළිබඳව නිසි අධ්‍යයනයකට යොමු වීමෙන් සංස්කරණ හා මුද්‍රණ කාර්යයන් හි දී සිදුවන්නා වූ හා සිදුව ඇති සාවද්‍ය තොරතුරුවලින් බොහෝ දුරට මඟ හරවා ගත හැකිය. එමෙන්ම ඉදිරි ශිෂ්‍ය පරම්පරාව සඳහා නිවැරදි තොරතුරු ලබා දීමට හැකි

වීමක්ද ඉන් සිදු විය හැකිය. එමෙන්ම දැනට පවත්නා සමහර ග්‍රන්ථයන්හි මුල හා අග පත් ඉරු නිසි පරිදි සොයා ගත නොහැකි හෙයින් ඒවා කියවීමෙහි දී හා විෂය හඳුනා ගැනීමේ දී නොයෙක් විට ගැටළු පැන නැගිය හැකිය. එවන් වූ අවස්ථා බොහොමයක් මඟ හරවා ගනිමින් එම ග්‍රන්ථ සඳහා විෂය හා නාමකරණය නිවැරදි ලෙස හඳුන්වා දීම ඉතා වැදගත් වේ.

ලංකාවේ සමහර පළාත් හි පුස්කොළ පොත් ලිවීමේ කලාවේ විවිධ බවක් දැකිය හැකිය. එනිසාම සමහර විටෙක ප්‍රධාන මුලාශ්‍රය ඇතුළත බාහිර හෝ එයට අදාළ නොවූ වෙනත් කරුණු සම්බන්ධව හෝ අදාළ කරුණු සම්බන්ධයෙන් වූ කුඩා ග්‍රන්ථ හෙවත් පෙළ පොත් එකතුකොට පුස්කොළ පොත සාදා තිබිය හැක. එබැවින් මෙම වර්ගයේ පුස්කොළ ග්‍රන්ථ අධ්‍යයනයේ දී ඒ සඳහා මහඟු අවස්ථාවක් ලබා ගත හැකිය. එමෙන්ම එමඟින් තුලනාත්මක අධ්‍යයනයන් ද සිදු කළ හැකිය. එමෙන්ම මෙතෙක් මුද්‍රණය නොකළ ග්‍රන්ථයන්හි තුලනාත්මක සැසඳීමක් සිදු කර නොමැති බැවින් හා දැනට මුද්‍රණය වී ඇති ග්‍රන්ථ සඳහා නව සංස්කරණයන් ඉදිරිපත් කිරීමට ද මෙමඟින් හැකියාව ලැබෙනු ඇත.

එමෙන්ම දැනට මුද්‍රණය වී ඇත්තේ වැදගත් ග්‍රන්ථ කිහිපයක් පමණක් වන හෙයින් දේශිය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ලියැවී ඇති එහෙත් මුද්‍රණය නොවුණු ග්‍රන්ථ සුවිශාල ප්‍රමාණයක් පවතී. ඒවාහි හුදෙක් සඳහන් වනුයේ දේශීය වෙද පරම්පරාවන් හි හා දේශීය වෛද්‍ය සම්ප්‍රදායන් පිළිබඳව වූ සත්‍ය වූ ප්‍රායෝගික වෙදකම්ය. එබැවින් මෙවන් වූ ඥාන සම්භාරයන් හැදෑරීමෙන් එයින් දේශිය වෛද්‍ය වෘත්තිකයන්ට පමණක් නොව වෛද්‍ය වෘත්තිය හදාරන ශිෂ්‍ය පරම්පරාවට ද බොහෝ පිළියම් අනාවරණය කරගත හැකි වනු ඇත. එමෙන්ම එමඟින් බටහිර වෛද්‍ය ක්‍රමයන්ට අනුවර්තනය වී ඇති වට්ටෝරු මෙන්ම එයට බලපෑම් එල්ල වී ඇති දේශීය වෙදකමෙහි ඇති සූක්ෂම වූ වෙදකම් සම්බන්ධයෙන් ද අධ්‍යයනයන් හා පර්යේෂණයන් සිදු කළ හැකිය. එවන් වූ අධ්‍යයනයන් සිදු කිරීමෙන් දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ඇල්මක් ඇති සාමාන්‍ය පුද්ගලයන්ට පවා එය මනා පිටිවහලක් විය හැකිය.

පුස්කොළ ග්‍රන්ථ ලිවීමට පෙර ධර්මය පවත්වාගෙන එනු ලැබුයේ මුඛ පරම්පරාගතව වන අතර ඒ සඳහා ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පාදක විය. එසේම ලංකාවේ විවිධ ප්‍රදේශයන් හි මෙම පරම්පරාවන් විසිරී සිටි බැවින් ග්‍රන්ථාරූඪකරණයෙහි දී වුවද ඔවුන් මුඛ පරම්පරාගතව පවත්වා ගෙන ආ පරිදි පුස්කොළ පොත් හි සටහන් වූවා විය හැකිය. ඒ අනුව පිටපත්කරණයේ දී ඔවුන්ගේ විවිධ වූ වෙනස්කම් සටහන් විය හැකි බැවින් ප්‍රාදේශීය වශයෙන් ග්‍රන්ථකරණයෙහි පවත්නා වෙනස්කම් අධ්‍යයනය සඳහා යොමු විය හැකිය. එනම් භාෂාවෙහි විද්‍යාත්මක ඉතිහාසය, සංස්කෘතිය, ඇදහිලි හා විශ්වාස යනාදී අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අධ්‍යයනය ආරම්භ කළ හැකි අතර එමඟින් සාරගර්භ වූ අදහස් මතු විය හැකිය. එය ලේඛන සම්ප්‍රදායයන්හි විවිධත්වය ඉස්මතු කර ගැනීම සඳහා කෙරෙන්නා වූ අධ්‍යයනයක් ද විය හැකිය. එමෙන්ම එයින් ග්‍රන්ථකරණයෙහි විධිමත් සම්ප්‍රදායන් පිළිබඳව අධ්‍යයනය කළ හැකිය.

මෙම ග්‍රන්ථ පරිශීලනයේ දී පෙනී යන වැදගත් කාරණයක් නම් පුස්කොළ පොත්හි රූප හෙවත් චිත්‍ර ඇඳ ඇති පොත් ප්‍රමාණය අල්ප වීමයි. එසේ වුවද වෛද්‍ය හා ජ්‍යොතිෂය ග්‍රන්ථයන්හි චිත්‍ර හා සටහන් මෙන්ම රූප ද දැකිය හැකි අතර එමඟින් එවකට පැවතියා වූ චිත්‍ර නිර්මාණ හෙවත් ඔවුන් සිය අදහස් චිත්‍රයට නැගූ ආකාරය අධ්‍යයනය කිරීමට හැකිවනවා ඇත. මෙමඟින් චිත්‍රකරුවා සතුව පැවති නිසඟ හැකියාවත් එම විෂයෙහි පවත්නා දක්ෂතාවත් පිළිබඳ වැදගත් අධ්‍යයනයක යෙදිය හැකිය. මෙවන් අධ්‍යයනයන් විවිධ වූ ක්‍රමෝපායන් නිරීක්ෂණය සඳහා මඟ පාදන අතර, පුස්කොළ කම්බා සඳහා යොදා ඇති චිත්‍ර කර්ම ද මේ අතර වැදගත් වේ.

අද වන විට ලංකාවේ මෙවන් මූලාශ්‍ර ලබා ගැනීම හෝ එකතු කිරීම සම්බන්ධයෙන් හෝ පුද්ගලික සන්තකයෙහි ඇති මූලාශ්‍ර පිළිබඳ ගවේෂණය කිරීම සම්බන්ධයෙන් හෝ ප්‍රතිපත්ති මාලාවක් හෝ නීතියක් සම්පාදනය වී නොමැති අතර වගකිවයුතු ආයතනයන්හි ඇති සේවය පුරප්පාඩු හෝ විෂය පිළිබඳව දැනුමැත්තන් නොමැති වීම යන කාරණා ද මීට හේතු පාදක වී ඇති බව පෙනේ. එසේම පර්යේෂණ හා අධ්‍යයන සිදුකිරීමට නම් ග්‍රන්ථ භාවිතා කළ හැකි පරිදි මනා භෞතික තත්වයකින් පවත්වාගෙන යා යුතුය. එසේ වුවද එවැනි සංරක්ෂණ ක්‍රමවේදයක් සම්බන්ධයෙන් ලිඛිත ජාතික ප්‍රතිපත්ති මාලාවක් හෝ ලියවිල්ලක් මේ

දක්වා සම්පාදනය වී නොමැති වීම කණගාටුදායක කරුණකි. සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් අද පවත්නා තාක්ෂණික උපක්‍රම සකසා බලන විට ඒ සඳහා අධික මුදලක් අත්‍යවශ්‍ය වන බැවින් භාණ්ඩ හා ගබඩා පහසුකම් සඳහා අධික මුදලක් අත්‍යාවශ්‍ය වන බැවින් භාණ්ඩ හා ගබඩා පහසුකම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම රාජ්‍ය අංශයන්ට පවා අපහසු කාරණයක්ව පවතී.

එසේ වුව ද දේශීයත්වය උරුම වූ සාම්ප්‍රදායික සංරක්ෂණ ක්‍රමවේදයන් දුරස්ථ වී යන යුගයක ඒ පිළිබඳව පුහුණු කිරීම පවා වැදගත් කාර්යයක් විය හැකිය. එය වියදම් අවම වූ, දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරන්නා වූ ප්‍රතිකර්ම වන නිසා එවැනි ප්‍රතිකාර මඟින් හෝ මෙවන් වූ ග්‍රන්ථ එකතුන්ට කල්යාමෙන් සිදුවිය හැකි දිරාපත්වීම් වළක්වා ගත හැකිය.

1931- 1978 දක්වා ලංකාවෙහි "ඓතිහාසික අත්ලිපි කොමිසම" Historical Manuscript Commision (HMC) නමින් කොමිසමක් පිහිටුවා තිබූ අතර එමඟින් දීපව්‍යාප්තව ඇති ඓතිහාසික ලේඛන එකතු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මකව තිබුණි. එහෙත් අද වන විට එවන් කොමිසමක් හෝ එම ක්‍රියාවලිය ක්‍රියාත්මක නොවන අතර ඒ පිළිබඳ මහජනයාට පවා දැනුවත්භාවයක් නොමැති වීම නිසා නොදැනීම මෙම වටිනා ලේඛන විනාශයට පත් වී ඇත. කොමිසම පැවති කල සිදු වූ ශාස්ත්‍රීය පර්යේෂණ ඉතා සක්‍රීය ලෙස පැවති අතර අද වන විට එවන් වූ ජාතික වැඩපිළිවෙලක අවශ්‍යතාව රටට දැනෙමින් පවතී.

එසේ වුවත් පෞද්ගලික සන්තකයෙහි ඇති වටිනා ලේඛන රාජ සන්තක කර ගැනීමෙහි බියෙන් පසු වන ඇතැම් පුද්ගලයන් තමා සන්තකයෙහි ඇති ඓතිහාසික ලියවිලි හා ග්‍රන්ථ පෙට්ටගම් තුළ බහා තැබීමෙන් එහි විනාශය සීඝ්‍රගාමී වී ඇත. එපමණක් නොව මෙම එකතුන් පවත්වාගෙන යන ආයතනයන් ඒවා සිය පාඨකයින්ට ලබා දීමට හැකි පරිදි සංවිධානය කර නොතිබීම ද කණගාටුවට කාරණයකි. එබැවින් අද පවතින තත්වය හමුවේ ලේඛනාරක්ෂකයින්ටත්, පුස්තකාලයාධිපතින්ටත්, සූචිකාරකයින්ටත්, නාමාවලි සකසන්නන්ටත්, අනෙකුත් විද්වතුන්ටත් පැවරී ඇති විශාල වගකීමක් වනුයේ මේ සඳහා ප්‍රමාණවත් වූ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙලක් පිළිබඳව උනන්දු වීමයි. දැනට ලංකාවේ විසිරී පවත්නා මෙවන් ග්‍රන්ථ

සඳහා නාමාවලි, සූචි, අනුක්‍රමණිකා ආදිය සැකසීම සඳහා ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යය. ඒ සඳහා දැනට ලංකාවේ භාවිතා වන හා ඉදිරියට භාවිතා කළ හැකි තාක්ෂණික ක්‍රියාදාමයන් එනම් සංගත තැටි, පරිගණකගත කිරීම හා සංඛ්‍යාංකණය (digitization) කිරීම වැනි ක්‍රියාදාමයන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

## සමාලෝචනය

ලංකාවේ තිබිය යුතු බොහෝ පුස්කොළ පොත් අද වන විට විදෙස් රටවල පුස්තකාලයන් හි හා කෞතුකාගාරයන් හි තැන්පත් වී ඇති අතර ඒවා බොහෝමයකට පාහේ ක්‍රමානුකූල හා සවිස්තරාත්මක නාමාවලි සහ සූචි සැකසී ඇත. එමෙන්ම ඒවා බොහොමයක් අනර්ඝ ලෙස මුද්‍රණය කර ඇත. නිදසුන් ලෙස හ්‍යුයු නෙවිල් එකතුව Hugh Nevil Collection of Sinhalese Munuscripts හා කොපන්හේගන්හි ඇති එකතුව ආදිය යි. එසේ වුව ද ලංකාවේ ඇති පුස්කොළ පොත් සඳහා ක්‍රමානුකූල ග්‍රන්ථාවලියක් ලෙස ප්‍රකාශයට පත් වී ඇත්තේ ඩබ්. ඒ. ඩී. සිල්වා විසින් සංග්‍රහ කරන ලද කොළඹ කෞතුකාගාරයෙ හි ඇති පුස්කොළ පොත් එකතුවයි. මෙයට අමතරව කේ. ඩී. සෝමදාසයන් විසින් සංගෘහිත 'ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය' කාණ්ඩ 03 යටතේ මුද්‍රණය කළ ද අද වන විට එහි සඳහන් ග්‍රන්ථ බොහෝමයක් එම පන්සල් හෝ පොත්ගුල්හි දක්නට නොමැත. එහි අඩංගු සමහර ග්‍රන්ථ අද වන විට වෙනත් පුස්තකාලවල හා අන්සතුව පවතින හෙයින් යාවත්කාලීන තොරතුරක් පිළිබඳව එම නාමාවලියෙන් අදහසක් ලබා ගත නොහැකි තත්වයක පවතී.

ඒ අනුව ලාංකිකයන්ට උරුමව පවතින ඓතිහාසික බුද්ධිමය දේපල පිළිබඳ අයිතිය තහවුරු කර ගැනීමටත්, විවිධ වූ පර්යේෂණ හා ගවේෂණ අවශ්‍යතා ඉටු කර ගැනීමටත්, සාවද්‍යභාවයෙන් තොර සාධිකාරි තොරතුරු එක්රැස් කිරීමටත් ඉවහල් වන්නා වූ මෙවන් ග්‍රන්ථ සම්භාරයක් ඇසුරින් කෙරෙන්නා වූ අධ්‍යයනයන් සඳහා දැනට පවත්නා ශාස්ත්‍රීය පාඨමාලාවන් හි ග්‍රන්ථ සංස්කරණය, පරිවර්තනය, හා සම්පාදනය වැනි විෂයයන් එක් කිරීම ඉතා කාලෝචිත වනු ඇත. එමඟින් පුස්කොළ ලේඛනයන් හි

පවත්නා එහෙත් දැනට රහසිතව ඇති ඉතා වැදගත් එමෙන්ම අනන්‍ය වූ සාධක බොහොමයක් එළි පෙහෙළි කර ගැනීමට අවස්ථාව විවර වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ඩේවි, ජෝන් (1976). ඩේවි දුටු ලංකාව අනුවා. එච්. එම්. සෝමරත්න, කොළඹ, ඇම්. ඩී. ගුණසේන.

රාජපතිරණ, චමිලා රූපිකා. (2005). "ඓතිහාසික ලේඛන එකතු කිරීමේ හා සුරැකීමේ ඇති වටිනාකම" ලේඛනාරක්ෂක සතිය සමරු කළඹ 2005 , කොළඹ: ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

සෝමදාමස , කේ. ඩී. (1959). ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය කාණ්ඩ 1-3 කොළඹ : සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Davids, T. W. Rhys. (1947). Sinhales Natioanl Heritage in Ola Leaf, The Buddhist, Vol xvii No. 5 Colombo: Y.M. B.A.

De Silva, W.A. (1938). Catalogue of Palm Leaf Manuscripts in the Library of the Colombo Museum, Memoirs of the Colombo museum Series A. No. 4 Vol. I. Colombo Ceylon Government Press.

Gunawardhana, Sirancee (1997). Palm - Leaf Manuscripts of Sri Lanka, Ratmalana: Sarvodaya Vishva Lekha.

Malagoda, Kitsiri. (1976). Buddhism in Sinhaless Society 1750- 1900: A Study of Religius Revival and Changr, London: Berkeley - Los Angeles.

Samuel, G. Johon. (1996). Objectives of the National Seminar, Palm - Leaf and other manuscripts in Indian Languages: Proceeding of the National Seminar Session Held in Pondicherry University 11-13 January 1995. India: Institute of Asian Studies.

Somadasa, K.D. (1995). Catalogue of the Hugh Nevill Collection of Sinhalese Manuscripts in the British Library, Vol. 7 London: Britsh Library Society.

# පුස්තකාල පාඨක අධ්‍යාපනයේ සිට තොරතුරු සාක්ෂරතාව දක්වා: මෙම පරිණාමීය ක්‍රියාවලියේ දී මතු වන කරුණු කීහිපයක්

මයිකල් වූලිස්ක්‍රොෆ්ට්
පරිවර්තනය: උදිත අලහකෝන්

## හැඳින්වීම

මෙම ලිපියේ දී මම තොරතුරු සාක්ෂරතාව පිළිබඳ විවිධ නිර්වචන, පුස්තකාල පාඨක අධ්‍යාපනයේ සිට එය පරිණාමය වී ඇති ආකාරය සහ විවිධ තොරතුරු සාක්ෂරතා වැඩසටහන් වල අරමුණු වෙත අවධානය යොමු කරමි. තොරතුරු සාක්ෂරතාව යනු යාවජීව සහ නම්‍යශීලී ඉගෙනුම් තත්වයන් සඳහා සැලකිය යුතු කුසලතාවක් බව අවධාරණය කරමි. මම තොරතුරු සාක්ෂරතාවේ දී පුස්තකාලයාධිපතීන්ගේ ප්‍රධාන භූමිකාව පෙන්වා දෙන අතර මෙම වැඩසටහන් වෙත පුස්තකාලයාධිපතීන්ගේ ඵලදායී දායකත්වය සහ එම වැඩසටහන් ඉදිරිපත් කිරීමට ඇති බාධා හඳුනා ගනිමි. මම තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමේ ක්‍රමවේද වැනි ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක අංග ආවරණය නොකරමි. එමෙන් ම මම සුවිශේෂ (ජාති) අංග ආමන්ත්‍රණය කළ ද එවන් වැඩසටහන්වල නියත අන්තර්ගතය සාකච්ඡා නොකරමි.

තොරතුරු සාක්ෂරතාව යනු මුළුමනින් ම නව ප්‍රපංචයක් නොවේ. 'තොරතුරු සාක්ෂරතාව' නම් යෙදුම පුස්තකාල සාහිත්‍යයේ ප්‍රථම වරට දිස් වූයේ 1970 දශකයේය. එය වර්තමානයේ පුස්තකාල පාඨක අධ්‍යාපනය සහ ග්‍රන්ථ විද්‍යාත්මක උපදෙස් සැපයීම පැහැදිලි කිරීමට සාවද්‍ය ලෙස යොදා ගැනේ. කෙසේ වෙතත්, පුස්තකාලය පරිහරණය කරන ආකාරය පැවසීමට වඩා බෙහෙවින් වැඩි යමක් තොරතුරු සාක්ෂරතා වැඩසටහන් ඉටු කරනු ලබයි. තොරතුරුවල උපායමාර්ගික වටිනාකම සහ භාවිතය සමඟ තොරතුරු සාක්ෂරතාව තීරණාත්මක ලෙස බැඳී තිබේ.

මෙම ලිපියේ අභිප්‍රායන්ට අනුව මා මෙම වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කරනු ඇත. ඒවා මුද්‍රිත සහ ඩිජිටල් ආකෘතියෙන් පුස්තකාලයේ පමණක් පවත්නා තොරතුරු ගැන ජනතාවට (පාසල් වයසේ සහ ඉන් ඉහළ)

උගන්වන වැඩසටහන් ම නොව තොරතුරු සහ දැනුම පිළිබඳ පුළුල් ලෝකයක තොරතුරු නිර්මාණය, ගවේෂණය සහ භාවිතය සිදුවන සන්දර්භය සපයන වැඩසටහන් ද වේ.

මුද්‍රිත සහ ඩිජිටල්ගත ආකෘති හරහා තොරතුරු සමුදායේ සිදු වන නිරන්තර ව්‍යාප්තියට උත්තේජනයේ මෙන් ම පරාජයේ ධාරිතාව ද පවතී. තොරතුරු ඩිජිටල් ගතකිරීම සහ ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් පවත්නා තොරතුරු වෙත ප්‍රවේශ වීම, ඒවා හැසිරවීම සහ සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය පාදක මෙවලම් වල සංවර්ධනය තොරතුරු යුගය යනුවෙන් හඳුන්වන දෙයෙහි ම අංගයකි. විවධ මාධ්‍යයන් තුළ තොරතුරු අතිවිශාල ප්‍රමාණයක් පැවතීමත් විශේෂයෙන් අන්තර්ජාලයේ පවත්නා තොරතුරු ඒවා බෙදා හැරීමට පෙර සමස්ථ විමසුම් ක්‍රියාවලියක් හෝ විද්වත් සංස්කරණ ක්‍රියාවලියක් හරහා ගමන් නොකිරීමත් නිසා පාඨකයන් මේවා ස්වකීය කාර්ය සඳහා සුපරික්ෂණයෙන් යුතුව යොදා ගැනීමට නම්, තොරතුරු එක්රැස් කිරීම සහ ඇගයීම් ක්‍රියාවලිය වෙත විචාරාත්මක චින්තනය ව්‍යවහාර කිරීම අනුල්ලංඝනීය වේ.

## සාක්ෂරතාව පිළිබඳ සංකල්පය සහ එහි අඛණ්ඩත්වය

යුනෙස්කෝව විසින් 1990 'ජාත්‍යන්තර සාක්ෂරතා වර්ෂය' යනුවෙන් නම් කරන ලදී. 1990 දශකයේ දී විස්තීරණ ලෙසත් ඵලදායී ලෙසත් අසාක්ෂරතාව ආමන්ත්‍රණය කරනු ලැබුව ද එය මුලිනුපුටා දැමීමට නොහැකි වී ඇත. ඇතැම් සාක්ෂරතා වැඩසටහන් කෙතරම් ඵලදායී වුව ද 2000 වන විටත් අසාක්ෂරතාව මුලිනුපුටා දැමීමට නොහැකි වන බව දැන් පැහැදිලිය.

යථාර්ථයේ දී විවිධ සාක්ෂරතා වර්ග පවත්නා බව බොහෝ අධ්‍යාපනඥයින් සහ තොරතුරු වෘත්තිකයන් හඳුනා ගනී. මෙලෙස තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව, සංස්කෘතික සාක්ෂරතාව, කෘත්‍යාත්මක සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතාව, ඡන්දය භාවිත කිරීමේ සාක්ෂරතාව, කාර්යය හා බැඳුණු සාක්ෂරතාව සහ තවත් බොහෝ සාක්ෂරතා වර්ග පවතී. Witbooi (1995) වැනි සමහර කතුවරුන් පවසනුයේ මේවා රුචිකත්වයන් පිළිබඳ නියත ක්ෂේත්‍රවලට කරනු ලබන මූලික සාක්ෂර

කුසලතාවන්ගේ හුදු ව්‍යවහාරයන් බවය. Witbooi සාක්ෂරතාවේ විවිධ වර්ගීකරණයන් හා ව්‍යවහාරයන් ස්ථානගත කළ හැකි අඛණ්ඩත්වයක් ඉදිරිපත් කරයි.

සාක්ෂරතාව යනු පරිණාමීය සංකල්පයක් බව යෝජනා කරන Behrens (1990) එය තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සංකල්පයට සම්බන්ධ අඛණ්ඩත්වයක් ලෙස සැලකිය යුතු බව සඳහන් කරයි. ඇය මෙසේ පවසයි.

> "කියවීමට සහ ලිවීමට පමණක් හැකියාව ලබා දෙන කුසලතා පුද්ගලයෙකුට නාගරික ජීවිතයේ ආර්ථික, දේශපාලනික, සමාජීය සහ සංස්කෘතික මානයන් සමඟ කටයුතු කිරීමට හැකියාව ලබා නොදෙනු ඇත. කෙනෙකු තොරතුරු සාක්ෂරතාව සම්බන්ධ අර්ථයෙන් සාක්ෂරතාව සලකයි නම්, වර්තමානයේ සාක්ෂරතාව සහිත යැයි සැලකෙන පුද්ගලයන් පරිණාමය වූ එවන් සමාජයක කටයුතු කිරීමට හැකි මට්ටමක සාක්ෂරතාවක් සහිත වූවන් නොවනු ඇත."

ඕස්ට්‍රේලියාවේ සහ උතුරු ඇමරිකාවේ පරිණාමය වී ඇති පරිදි තොරතුරු සාක්ෂරතාව යනු නියත ක්ෂේත්‍රයක් වෙතට මූලික තොරතුරු කුසලතා ව්‍යවහාර කිරීමෙන් ඔබ්බට දිවෙන්නක් බව මම විශ්වාස කරමි.

## තොරතුරු යුගය

තොරතුරු හැමවිට ම වටිනා භාණ්ඩයක් වී ඇත. එහෙත් නිර්මිත තොරතුරුවල ප්‍රමාණය සීග්‍රයෙන් වර්ධනය වී ඇති බැවින් එම තොරතුරුවල අගය අඩු වන බවක් දිස් වේ. (මුදල් අතිරික්තයක් ඇති විට සිදුවන්නාක් මෙන්) කෙසේ වෙතත්, උත්සාහයේ සෑම භූමි භාගයක ම අනන්‍ය ලෙස ප්‍රගතිය සහ දියුණුව අත් කර ගැනීමේ ක්‍රම ලෙස තොරතුරු මත වැඩි වැඩියෙන් ඉහළ අගයක් ස්ථානගත කෙරේ. සාර්ථක ජීවිතයක් ගතකිරීමේ දී තොරතුරු වෙත ප්‍රවේශය අධිපති සාධකයක් වේ. අපට අවශ්‍ය තොරතුරු මොනවා ද, අප ඒවා ලබා ගනුයේ කොහෙන් ද, එය තෝරා ගනුයේ සහ අගය කරනුයේ කෙසේ ද සහ පුද්ගල මෙන් ම සාමූහික ප්‍රගතිය සඳහා එය භාවිත කරනුයේ කෙසේ ද යන්න නිශ්චය කිරීමේ අවශ්‍යතාව තීරණාත්මක වැදගත්කමක් ගනී.

'තොරතුරු යුගය', 'තොරතුරු පිපිරීම' ගැන බොහෝ දේ ලියවී ඇති බව අපි දනිමු. ලේඛකයින් ගණනාවක් ඉමහත් විශ්වාසයෙන් පොතෙහි අභාවය ගැන ලියති. ඔවුන් එසේ කරනුයේ පොතෙහි පරම පැවැත්මට ම දායක වෙමිනි. ඩිජිටල් ආකෘතියෙන් ප්‍රකාශනය පළ වීමේ සීඝ්‍ර ව්‍යාප්තිය ගැන බොහෝ දේ රචනා වී පැවතිය ද තවමත් වනාන්තර කපා දැමෙයි. එහෙයින් මුද්‍රිත මාධ්‍යයෙන් තොරතුරු ප්‍රකාශනය කර බෙදා හැරීම සිදු විය හැකිය. මුද්‍රිත ප්‍රකාශන තවමත් අන් කවරදාටත් වඩා වේගයෙන් ව්‍යාප්ත වෙමින් තිබේ. එහෙයින් කඩදාසි වලින් තොර සමාජය මිථ්‍යාවක් බව සනාථ වී ඇත. ලොව පුරා පාඨකයෝ තිරයේ දිස් වන ඩිජිටල්ගත තොරතුරුවල මුද්‍රිත පිටපත් ගනිති. තිරයේ දිස් වන එම තොරතුරුවලට වඩා තුන් ගුණයක් වේගයෙන් කඩදාසියේ මුද්‍රිත එහි පිටපත කියවිය හැකි වීම ඊට හේතුවයි.

පසුගිය වසර තුනෙන් වසර දෙකක් ම මම විසිඑක් වන සියවසේ ප්‍රබෝධමත් නව පුස්තකාලයක පෙරනිමිති දැකීමට ඇමරිකා එක්සත් ජනපදයේ විවිධ ප්‍රදේශවල සැරිසැරුවෙමි. එහෙත් ඩිජිටල් තොරතුරු අතිවිශාල ප්‍රමාණයක් වෙතට සහ තොරතුරු ගබඩා කිරීමට, සංවිධානය කිරීමට සහ ඒවා වෙත ප්‍රවේශය සැපයීමට අවශ්‍ය දෘඩාංග සහ මෘදුකාංගවලට ඇති සබඳතාව වෙත තාක්ෂණික පරිවර්තනයේ පියවර තබන ලද පුස්තකාල දැකිය හැකි වූයේ කලාතුරකිනි. තවමත් ඒවායේ ආධිපතීත්වය දරනුයේ මුද්‍රිත මාධ්‍යයයි. එහෙත් මුද්‍රිත මාධ්‍යයේ ආධිපත්‍යයේ සිට අතිවිශාල ඩිජිටල් තොරතුරු සම්භාරයක් දක්වා අඛණ්ඩ පරිණාමීය විතැන් වීමක් මීළඟ විසි වසර තුළ සිදු වන බව නිසැකය.

මෙය හඳුනා ගන්නා Fink සහ Loomis (1995) මෙසේ සඳහන් කරයි.

> ''දෘඩාංග සහ මෘදුකාංගවල පැවතීම පුස්තකාල වල කාර්යයන් හෝ පෙනුම පවා මූලික වශයෙන් වෙනසකට බඳුන් කර නොමැත. කෙසේ වෙතත්, එය පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව විප්ලවීය වෙනසකට ලක් කර ඇත........ අප දැන් අපත් සමඟ ම සෙවීමේ යෙදෙන පාඨකයන් සඳහා මාර්ගය සිතියම්ගත කිරීමට, අසීමිත මෙන් ම පරිණාමය වන තොරතුරු මූලාශ්‍රවල යාත්‍රා කරන ගවේෂකයන්, බාලදක්ෂයන් සහ නව මං සොයන්නන් විය යුතුය. (අපට කළ හැක්කේ එවැන්නක් වීම පමණි.)''

එහෙත් එයට දිගු කලක් ගතව නොමැති ද? ව්‍යාතිරේක කීපයක් (විශේෂ එකතු පිළිබඳ පුස්තකාලයාධිපතීන්) තිබුණ ද මෑත දශකයන්හි අප බොහෝ දෙනෙකුට (විෂය පුස්තකාලයාධිපතීන් පවා) නියත විෂයන්හි සාහිත්‍ය සහ එම නියත ක්ෂේත්‍රවල පර්යේෂණයන්හි යෙදෙන්නන් (ශාස්ත්‍රඥයන්, වෘත්තීයවේදී සහ ආධුනිකයන්) සමඟ මුළුමනින් ම එක පෙළට සිටීමට නොහැකි වී ඇත.

## ඉගෙනුම් සමාජය සහ යාවජීව අධ්‍යාපනය

පුද්ගලයන් ඉගෙනුමට සවිබල ගැන්විය හැක්කේ බොහෝ විට අහම්බය මගින් බවත් ඔවුන්ගේ ජීවිත කාලය පුරා ඔවුන් කැමති දෙය කාලය, ආකාරය සහ ස්ථානය ව්‍යවහාරයෙන් සීමා වී ඇති බවත් අපි දනිමු. තොරතුරු සමාජය සහ ඉගෙනුම් සමාජය අතර වැදගත් සබඳතාවක් සැපයීමට තොරතුරු සාක්ෂරතාවට පුළුවන. තොරතුරු සාක්ෂර කුසලතා, සීග්‍රයෙන් වෙනස් වන ලෝකයක ජීවත් වීමේ විවිධ තත්වයන් ඉගෙනීමට සහ යළි ඉගැන්වීමටත් පුහුණු වීමට සහ යළි පුහුණු වීමටත් පුද්ගලයන්ට සහාය වේ. මීට වසර දෙකකට පෙර පරිකල්පනය කිරීමට පවා නොහැකි වූ වේගයකට සහ නිපුණතාවන්ට අනුගත වීමටත් නම්‍යශීලී වීමටත් එම කුසලතා අවශ්‍ය වේ. ''සියලු පුද්ගලයන්ට සිය ජීවිත කාලය පුරා ඕනෑ ම වේලාවක උපදෙස් ගැනීමට, අධ්‍යයනයට සහ ඉගෙනුමට සංවිධිත සහ විධිමත් අවස්ථා තිබිය යුතුය යන අවබෝධය පැවතීම යාවජීව අධ්‍යයනයට සම්බන්ධ'' බව Cropley (1997) පවසයි. එමෙන් ම අධ්‍යාපනයේ මට්ටම් සහ වර්ග අතර පවත්නා කෘත්‍රිම බාධක මුලිනුපුටා දැමිය යුතු බවටත් ඔහු තර්ක කරයි. බොහෝ සහ වඩාත් වැදගත් ඉගෙනුම (නිශ්චිත ලෙස ජීවන කුසලතා) තිබෙනුයේ පවතින අධ්‍යාපන පද්ධතියෙන් පිටත යැයි යන අවබෝධය වර්ධනය වෙමින් පවතී. ජනතාව මෙය ස්වකීය නිවාස, විවිධ මාධ්‍ය, මිතුරන් සහ සමීපතමයන් හරහා සාක්ෂාත් කර ගනිති. මට්ටම සහ ප්‍රාණයේ අර්ථයෙන් අධ්‍යාපන පද්ධතිය සමෝධානය කිරීම ඉගෙනුම් සමාජයක බිහිවීම වෙතට දිවෙන බව Candy (1993) සඳහන් කරයි. එය අතථ්‍ය ලෙස අසීමිත සහ අඛණ්ඩ ඉගෙනුම් අවස්ථාවක් පිළිබඳ තත්වයකි. එහි දී ජනතාව ස්වකීය ජීවිත කාලය පුරා ස්වාභාවිකව සහ ස්වයං විඥානයෙන් තොරව ඉගෙනනුමෙහි යෙදෙති. එමෙන් ම එහි දී ඕනෑ ම සමාජ පද්ධතියක් (පවුල, අසල්වැසියන්, සංවිධාන, නියෝජිතායතන,

ප්‍රජාව, රාජ්‍ය, ජාතිය හෝ ලෝකය) ඉගෙනුම් සම්පත් පද්ධතියක් ලෙස සංකල්පගත කළ හැකිය. ඉගෙනුම් සමාජයේ ප්‍රමුඛ ලක්ෂණයක් Candy (1993) තවදුරටත් විස්තර කරයි.

> ''ඉගෙනුම් සමාජ තුළ ඉගෙනුම්කරුවාගේ තේරීමෙහි පරම නිදහස පවතී. ඉගෙනුම්කරුවාගේ ස්වාධීනත්වය පිළිගැනීම සහ ඊට ගරු කිරීමට ගන්නා ප්‍රවේසම්සහගත සහ සවිඥානික උත්සාහයන් සෑම පුද්ගලයෙක් ම ස්වයං මෙහෙයුම්ගත විමසුම් කුසලතාවලිය සන්නද්ධ කිරීමත් නිසා තමන්ට අභිමුඛ වන අසීමිත ඉගෙනුම් අවස්ථා හරහා ස්වකීය වූ ගමන් මගක් තෝරා ගැනීමට ඔවුනට පුළුවන.''

කෙනෙකුගේ ජීවිතය පුරා අඛණ්ඩ ඉගෙනුමට ඇති හැකියාව යනු වෙනස් වන ලෝකයක් තුළ නොනැසී සිටීමේ ප්‍රධාන මෙවලමක් වේ. අතිවිශාල තොරතුරු ප්‍රමාණයක් පවතින අතර ඇතැම් විෂය ක්ෂේත්‍රයන්හි එය ඉතා ඉක්මනින් යාවත්කාලීන වේ. වර්තමාන ශ්‍රම බලකායට ඇතුළු වන යෞවනයන් බොහොමයක් විශ්‍රාම ගැනීමට පෙර වෙනස් රැකියා පහක්වත් අවම වශයෙන් කරනු ඇති බව පෙනේ. එහෙයින් හොඳින් කටයුතු කිරීමට නම් නව දැනුම් ක්ෂේත්‍රවලට පිවිසීමටත් එහි ප්‍රවීණත්වයට පත් වීමටත් අවශ්‍ය වනු ඇත. අධ්‍යාපනය යනු පූර්ව රැකියා ක්‍රියාවක් යැයි උපකල්පනය කිරීම තරුණයන්ට තවදුරටත් ප්‍රමාණවත් නොවේ. එමෙන් ම සෑම දැනුම් ක්ෂේත්‍රයක් තුළ ම සිදු වන සැලකිය යුතු සංවර්ධනයක් මත පිළිඹිබු වීමට ඔවුන්ගේ විධිමත් අධ්‍යාපනය යළි කිසිවිටකත් ප්‍රමාණවත් නොවේ. සිය කාර්ය සහ පෞද්ගලික ජීවිත සමඟ බැඳුණු දෑ වලට මෙම නව සහ අදාළ දැනුම යම් පමණක් හෝ භාවිත නොකිරීම දුර නොපෙනීමක් මෙන් ම අනතුරුදායක ද විය හැකිය.

Candy මෙසේ පවසයි.

> ''තොරතුරු සාක්ෂරතාව යනු තොරතුරු සමාජයේ ඉල්ලීම්වලට දක්වන සරල ප්‍රතිචාරයක් නොවේ. එය ඉගෙනුම් සමාජය අවබෝධ කර ගැනීමේ දී උපකාර වන වැදගත් බුද්ධිමය කෞශල්‍යයන් කට්ටලයකි.''

තොරතුරු සාක්ෂරතාව යනු විධිමත් මෙන් ම අවිධිමත් ඉගෙනුම් අවස්ථා බොහොමයක් සම්පාදනය කිරීමට පුද්ගලයන්ට අවකාශ සලසන කුසලතා කට්ටලයකි. මෙම කුසලතා අධ්‍යාපන පද්ධතිය හරහා මෙන් ම යාවජීව අධ්‍යාපනයට පවත්නා ආයතන ලෙස ස්වකීය භූමිකාවේ දී මහජන

පුස්තකාල හරහා ද සම්ප්‍රේෂණය කළ හැකිය. කෙසේ වෙතත්, බොහෝ මෙවන් වැඩසටහන් ප්‍රකාශයට පත් වනුයේ තෘතියික අධ්‍යාපන සන්දර්භය තුළය.

වත්මන් කාලයේ ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ තොරතුරු පිටාර ගැලීමයි. එහෙයින් අදාළ සංවර්ධනයන් සමඟ එක පෙළට සිටීමට ස්වකීය ජීවිත පුරා මිනිසුන් අඛණ්ඩව ඉගෙනුමට කල් තබා නැඹුරු කරන මානසික රාමුවක් සංවර්ධනය කිරීම අනුල්ලංඝනීය වේ. ලෝකයට තමන් පිළිබඳ සැබෑ අරුතකින් සම්බන්ධතාව පවත්වා ගෙන යා හැක්කේ එවිටය. මේ නිසා කාර්යක්ෂමව කටයුතු කිරීමට උසස් මට්ටමේ තොරතුරු කුසලතා අත්‍යාවශ්‍ය බවට පත් වෙමින් තිබේ.

Candy, Crebert සහ O' Leary (1993) මෙසේ පවසති.

> ''තොරතුරු වෙත ප්‍රවේශයන් තොරතුරු වල සහ තොරතුරු තාක්ෂණයේ විචාරාත්මක භාවිතයන් යාවජීව අධ්‍යාපනයට අතිශයින් ම තීරණාත්මක වේ..... මේ අනුව තොරතුරු සාක්ෂරතාවෙන් තොර නම්, කිසිදු උපාධිධරයෙකුඋගත් යැයි විනිශ්චය කළ නොහැක.''

අධ්‍යාපනයේ සෑම මට්ටමක ම පුස්තකාලයාධිපතීන්, ගුරුවරුන් සහ සිසුන් සඳහා මෙහි වැදගත්කමක් තිබේ.

## නම්‍යශීලී ඉගෙනුම

නම්‍යශීලී ඉගෙනුම යනු ඉගෙනුම් සමාජය විසින් ජනනය කරන ලද යාවජීව ඉගෙනුම සඳහා ඇති අවශ්‍යතාවට අධ්‍යාපනික ප්‍රතිචාරයකි. තොරතුරු සාක්ෂරතාව නම්‍යශීලී ඉගෙනුම් සන්දර්භය තුළ අත්‍යාවශ්‍ය කුසලතා සපයයි. බොහෝ තෘතීයික ආයතන අධ්‍යාපනය පිළිබඳ අභ්‍යන්තර/බාහිර යන ද්වි ධ්‍රැවය සැපයුම් මාදිලියේ සිට පාඨමාලා අන්තර්ගතය කෙසේ, කවදා, කොහේ සිට ලබා ගන්නේ ද යන්න පිළිබඳ පුළුල් පරාසයක තේරීමකට අභයන්තර සහ දුරස්ථ සිසුන්ට ඉඩ සලසන මාදිලියකට සීග්‍රයෙන් යොමු වෙමින් පවතී. ඇතැම් මාදිලි කේවල සිසුන් සහ සිසු කණ්ඩායම් වල අවශ්‍යතාවලට ගැළපීමට පහත සඳහන් සැකසුම් සියල්ල ඇතුළත් කිරීම තරම් දුරට පවා ගමන් කරමින් තිබේ.

- සාම්ප්‍රදායික අභ්‍යන්තර/බාහිර තේරීම බොඳ කරන වෙනස් මාවත්
- සැපයීමේ වෙනස් කාල
- ඉගෙනුමෙන් වෙනස් වේග
- පාඨමාලා සහ ප්‍රශ්න පත්‍රවල වෙනස් අන්තර්ගත
- වෙනස් ඇගයීම් ක්‍රම
- සම්පත්වල (වෙනස් මාධ්‍ය ඇතුළත්ව) වෙනස් භාවිතය
- තාක්ෂණයේ වෙනස් භාවිතය
- කේවල සිසුවාගේ සංස්කෘතිය පිළිගැනීම
- වෙනස් ප්‍රවේශ ලක්ෂ්‍යයන්හි දී කේවල සිසුවා ලද පූර්ව අධ්‍යාපනික සාධනයන් පිළිගැනීම
- වෙනස් පිටවීම් ලක්ෂ්‍ය
- අනෙක් අධ්‍යාපනික සැපයුම්කරුවන් සමග උපායමාර්ගික සහයෝගය (සාම්ප්‍රදායික නොවන සහ ප්‍රජා සංවිධාන ඇතුළුව) නම්‍යශීලී ඉගෙනුම බොහෝ රටවල දී ජයග්‍රාහී පසුබිමක් වේ. George සහ Luke (1996) මෙම ඉගෙනුම් මාදිලිය පිටුපස ඇති ගාමකත්වය සඳහා හේතු ලැයිස්තුගත කරතිඃ
- විශේෂයෙන් ප්‍රතිඵල වල අර්ථයෙන් ප්‍රවේශය සහ සමානත්වය සලකා බැලීම්
- ශිෂ්‍ය ජනගහනයේ විවිධත්වය
- ඉගැන්වීමේ වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය මාදිලි ඇගයීම
- විශේෂයෙන් කර්මාන්තයට සම්බන්ධ උපාධිධාරීන්ගේ ලක්ෂණ වෙත අලුත් කරන ලද අවධාරණයක්
- ආර්ථිකයට ඍජුව සම්බන්ධ ඉගෙනුම් අවස්ථා ජීවිත කාලය පුරා සැපයීමට ඇති අවශ්‍යතාව

නම්‍යශීලී බෙදාහැරීම වෙතට සිදු වන මෙම යොමු වීම තොරතුරු යුගයට අධ්‍යාපන ක්ෂේත්‍රය දක්වන ප්‍රතිචාරයක් ලෙස පැතිය හැකි බව මෙම කතුවරු සඳහන් කරති. කාර්මික යුගයේ දැවැන්ත නිෂ්පාදන ක්‍රමයකට ගැළපෙන අධ්‍යාපනික බෙදා හැරීම් මාදිලි තොරතුරු යුගයට තවදුරටත්

නොගැළපෙන බව ඔවුහු පෙන්වා දෙති. ඔවුහු නව වැඩ පරිසරයේ ලක්ෂණ පහත පරිදි දකිති.

- කාර්යයන් සීමා කිරීමට වඩා සමෝධානය කිරීම
- තනි කුසලතාවට වඩා බහු-කුසලතා සහ ප්‍රති-කුසලතා
- ශ්‍රම විභජනයට වඩා වෘත්තීමය ඒකාබද්ධතාව

මුල දී දැවැන්ත නිෂ්පාදන මාදිලිය යළි බල ගැන්වීමට භාවිත කළ තොරතුරු තාක්ෂණය, දැන් සැලකිය යුතු විවිධත්වයෙන් යුත් කේවල ශිෂ්‍ය කේන්ද්‍රීය අවශ්‍යතා සපුරා ලීමට සේවා සපයන නව අධ්‍යාපන මාදිලියකට අවකාශ සලසන්නෙකු ලෙස පිළිගැනීමට ලක් වෙමින් තිබේ.

දැවැන්ත නිෂ්පාදන මාදිලිය බලවත් කිරීමට මුලින් භාවිත කළ තොරතුරු තාක්ෂණය වර්තමානයේ පිළිගනු ලබනුයේ කේවල ශිෂ්‍ය කේන්ද්‍රීය අවශ්‍යතා සපුරා ලීමේ සැලකිය යුතු විවිධත්වයක් සඳහා අධ්‍යාපනය සැපයීමේ නව මාදිලියකට අවකාශ සලසන්නෙක් ලෙසය.

නම්‍යශීලී ඉගෙනුමෙහි නව අවශ්‍යතා ගුරු පුහුණුවේ වෙනස්වීම් ඉක්මවා යන අතර, ඒවා පුස්තකාල, තොරතුරු තාක්ෂණ සේවා සහ අධ්‍යාපන පරිපාලනය වෙත බලපෑම් එල්ල කරනු ලබයි. කිසිවක් අනර්ථ ලෙස සමානව නොපවතී. එය එතරම් ම තියුණු වෙනස් වීමකි. එය සැබවින් ම සුසමාදර්ශ විතැන් වීමක වැදගත්කම සහිත වෙනසකි. ගුරු පුහුණුවේ (ඇගයීම සහ බෙදා හැරීම ද ඇතුළුව) වෙනස් වීම්වලට අමතරව නම්‍යශීලී ඉගෙනුම දක්වා වෙනස් වීමට ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලියේ දී පුස්තකාලය වඩාත් කේන්ද්‍රීය ස්ථානයක පිහිටවනු ලැබේ. එහෙයින් ගුරුවරුන් සහ පුස්තකාලයාධිපතීන් අතර සමීප සහයෝගීත්වයක් අවශ්‍යය. එමෙන් ම සිසුන් තොරතුරු සාක්ෂර කුසලතා සංවර්ධනය කළ යුතුය. නව මාදිලියේ දී අධ්‍යාපන ක්‍රියාවලිය සමාන වැදගත්කමක් අත් කර ගනී. George සහ Luke (1996) දක්වන ආකාරයට,

> ''අධ්‍යාපන ක්‍රියාවලිය ආමන්ත්‍රණය කිරීමේ දී මෙම මාදිලිය තුළ තොරතුරු සාක්ෂරතාව ප්‍රධාන භූමිකාවක් රඟ දක්වයි. එය දකිනුයේ සාම්ප්‍රදායික සන්දර්භය තුළ නම්‍යශීලී බෙදා හැරීම් ක්‍රමවේදවලට තීරණාත්මක වන අධි-කුසලතා අත්පත් කර ගත හැකි ක්‍රියාවලියක් සහ විශ්වවිද්‍යාලයේ

සීමාවෙන් ඔබ්බට සිදු කරන දැනුමෙහි අඛණ්ඩ පුද්ගල හඹායාමක් ලෙසය.''

නම්‍යශීලී ඉගෙනුම තොරතුරු සම්පත් වල උපරිම භාවිතය වෙතට ඉලක්ක වෙයි. එහෙයින් ගුරුවරයාගේ දායකත්වය සරලව තොරතුරු සම්පත් ගණනාවකින් එකක් බවට පත් වේ. ගුරුවරයා තොරතුරු පිළිබඳ කේන්ද්‍රීය ඉගැන්වීමේ යෙදෙන්නෙකුගේ සිට තොරතුරු වල පුළුල් ව්‍යාප්තියක් වෙතට පහසුකම් සලසන්නෙකු දක්වා යොමු වේ. සිසුවා එයින් වඩාත් අදාළ, වඩාත් නිවැරදි සහ වඩාත් සවිමත් තොරතුරු තෝරා ගනී. මෙම ඉගෙනුම් මාදිලියේ දී විශ්ලේෂණ සහ ඇගයීම් කුසලතා ඒ හා සමානව වඩාත් අත්‍යාවශ්‍ය බවට පත් වේ. පවත්නා තොරතුරු සම්පත් උපරිම භාවිත කිරීමටත් සාර්ථක පාඨමාලා එල වෙතට සමෝධානය කිරීමටත් අවශ්‍ය කුසලතා තොරතුරු සාක්ෂරතාව සිසුන්ට සපයයි.

නම්‍යශීලී ඉගෙනුම වෙතට විතැන් වීමේ තීරණාත්මක අංගයක් වන්නේ ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරය තුළ සබඳතා යළි නිර්වචනය කිරීමය. මෙහි දී පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන් අතර සමීප සහයෝගීත්වය සඳහා සැලකිය යුතු අවස්ථාවන් පවතී. එය සිසුන්ට තොරතුරු සාක්ෂර කුසලතා අත් කර ගැනීමට හැකියාව සලසයි.

## තොරතුරු සාක්ෂරතාව- නිර්වචන කීපයක්

තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ප්‍රමුඛ අධිකාරීන් දෙදෙනෙකු වන Breivik සහ Gee (1989) යෝජනා කරනුයේ නිර්වචනය පරිණාමීය බවය.

> ''තොරතුරු අත්පත් කර ගැනීමට ඇති සමාජයේ අවශ්‍යතාව පරිණාමය වීමට සමානව සාක්ෂරතාව පිළිබඳ නිර්වචනය අඛණ්ඩව පරිණාමය වී ඇත. සාක්ෂරතාව පිළිබඳ බොහෝ විද්වතුන් එය සමාජ, සංස්කෘතික, දේශපාලනික සහ ආර්ථික සන්දර්භයේ වැදගත්කම පිළිගනිති. ........තොරතුරු පුපුරායාම මධ්‍යයේ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ, ඒවා නිරාවරණය කිරීමේ සහ ඇගයීමේ හැකියාව සාක්ෂරතාව පිළිබඳ වත්මන් නිර්වචනයේ කැපී පෙනෙන කොටසක් විය යුතුය.''

අනතුරුව මෙම නිර්වචනය වඩාත් විස්තරාත්මකව පැහැදිලි කෙරිණි.

> ''තොරතුරු සාක්ෂරතාවේ ලක්ෂණ වන්නේ කුසලතා වල (පර්යේෂණ උපායමාර්ග සහ ඇගයීමට සම්බන්ධ) සමෝධානික කට්ටලයක් සහ

> මෙවලම් හා සම්පත් පිළිබඳ දැනුම වේ. මෙම ලක්ෂණ අඛණ්ඩත්වය, විස්තර වෙත අවධානය සහ මුද්‍රිත වචනය සහ තනි සම්පත් පිළිගැනීමේ දී ප්‍රවේසම් සහගත වීම යනාදියට සම්බන්ධ ආකල්ප අත්පත් කර ගැනීම හරහා සංවර්ධනය කෙරේ. එමෙන් ම මෙම ලක්ෂණ කාලය සහ ශ්‍රමය වැය වන්නකි; අවශ්‍යතා මගින් මෙහෙයවන්නකි. (එය ගැටලු විසඳීමේ ක්‍රියාකාරකමකි.); සාක්ෂරතාවට සහ පරිගණක සාක්ෂරතාවට අදාළ වුව ද එයින් වෙනස් වූවකි.'' (Breivik සහ Gee, 1985)

මුද්‍රිත වචනයේ පිළිගැනීම සඳහා ව්‍යවහාර කරන ප්‍රවේසම අන්තර්ජාලයේ පවත්නා අතිවිශාල තොරතුරු සඳහා ද ව්‍යවහාර කෙරෙන බව කෙනෙකුට මීට එකතු කළ හැකිය. මන්ද, ඒවා පුළුල්ව බෙදා හැරීමට පෙර සමපදස්ථ හෝ සංස්කරණ විමසුම් ක්‍රියාවලියක් හරහා ගමන් නොකරන බැවිනි.

පහත ප්‍රකාශය තොරතුරු සාක්ෂරතාව සීමා නොවන්නේ කුමකට දැයි යෝජනා කරයි.

> ''තොරතුරු සාක්ෂරතාව යනු සම්පත් පිළිබඳ දැනුම පමණක් නොවේ: එය එක ම මූලාශ්‍රය ලෙස පුස්තකාලය මත පමණක් රඳා නොපවතී. එමෙන් ම එය හුදෙක් තොරතුරු සොයා ගැනීම පමණක් නොව ඒවා අවබෝධ කර ගැනීම සහ ඇගයීම ද වේ.'' (එම)

තොරතුරු සාක්ෂරතාව තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවට පර්යාය පදයක් නොවේ. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව කෙනෙකුට තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයෙකු බවට පත් වීමට අවශ්‍ය කුසලතා නොසපයයි. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව යනු තොරතුරු සාක්ෂරතාවේ උප-කට්ටලයකි. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව ලබා ගැනීමට දෘඩාංග සහ මෘදුකාංග ඵලදායීව කළමනාකරණය කිරීමට අවශ්‍ය කුසලතා පමණක් සැහේ. එය ඉලෙක්ට්‍රොනික සහ ඩිජිටල් මාදිලියේ තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවකාශ ලබා දෙයි.

මීට සමාන ආකාරයෙන්, පුස්තකාල සාක්ෂරතාව සහිත පුද්ගලයෙකු තොරතුරු සාක්ෂරතාව සහිත අයෙකු ලෙස සැලකිය නොහැක. පුස්තකාල සාක්ෂරතාව යනු තොරතුරු සාක්ෂරතාවේ උප කට්ටලයකි. පුස්තකාල යනු පවත්නා එක ම තොරතුරු සහ දැනුම සම්පත නොවේ. තොරතුරු සාක්ෂර කුසලතා මතු කරන පාඨමාලාවක් පුස්තකාල අග්‍රස්ථාපනය යැයි නම් කිරීම වැරදි මඟ පෙන්වීමකි. Behrens (1990) සඳහන් කරන

ආකාරයට පුස්තකාල කුසලතා අවධානය යොමු කරනුයේ තොරතුරු වෙත ස්ථානගත වීමට හෝ තොරතුරු සමුද්ධරණයේ උපකර්ණමය අංග වෙතය. උචිත සුපරික්ෂාකාරී බවකින් යුතුව තොරතුරු ඵලදායීව කැණීමට සහ භාවිත කිරීමට අවශ්‍ය පුළුල් සන්දර්භනීය අංග සහ උසස් මට්ටමේ විශ්ලේෂණ කුසලතා සාමාන්‍යයෙන් එයින් ආවරණය නොවේ.

තොරතුරු සාක්ෂරතාව පිළිබඳ සංකල්පය සමඟ පොරබදන බොහෝ ලේඛකයන් තොරතුරු සාක්ෂරතාවෙන් යුත් අයෙකු නිර්වචනය කිරීම මඟින් ඊට අර්ථ දක්වති. ඇමරිකානු පුස්තකාල සංගමය එවැනි පුද්ගලයෙකු හඳුන්වන්නේ;

> ''තොරතුරු අවශ්‍ය මොහොත හඳුනා ගන්නා සහ එම අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමටත් ඒවා ඇගයීමටත් ඵලදායීව භාවිත කිරීමට හැකියාව සහිත පුද්ගලයෙකු ලෙසය. අවසානයේ දී තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයෝ ඉගෙන ගන්නා ආකාරය දනිති. මන්ද, ඔවුන් තොරතුරු සංවිධානය කර ඇති ආකාරයත්, තොරතුරු සොයා ගන්නා ආකාරයත්, (අන්‍යයන්ට ඔවුන්ගෙන් ඉගෙනගත හැකි ආකාරයෙන්) තොරතුරු භාවිත කරන ආකාරයත් දන්නා බැවිනි.''

ඇමරිකානු පුස්තකාල සංගම් ලේඛනයේ මෙසේ ද සඳහන් වේ.

> ''තොරතුරු සාක්ෂරතාවෙන් යුත් පුද්ගලයෝ යාවජීව ඉගෙනුමට සූදානම් වෙති.'' (එම)

ඇමරිකානු පුස්තකාල සංගමයේ නිර්වචනය පුළුල් කරමින් Rader (1990) තොරතුරු සාක්ෂරතාව මෙසේ උපුටා දක්වයි.

> ''තොරතුරු හඳුනා ගැනීම සහ බෙදා හැරීම සඳහා වන පද්ධති සහ සේවා වැනි ප්‍රවර්තන සහ පූර්වකාලීන තොරතුරු අත්පත් කර ගැනීමට ඇති ක්‍රියාවලි සහ පද්ධති අවබෝධ කර ගැනීම;
>
> ''විවිධ ආකාරයෙන් තොරතුරු අවශ්‍යතා සඳහා පුස්තකාල ඇතුළු විවිධ තොරතුරු නාලිකා සහ මූලාශ්‍රවල ඵලදායිත්වය සහ විශ්වසනීයත්වය ඇගයීමට ඇති හැකියාව;
>
> ''දත්ත පදනම්, පැතුරුම්පත්, වදන් හා තොරතුරු පිරිසැකසුම් වැනි ක්ෂේත්‍රවල ඇති කෙනෙකුගේ තොරතුරු අත්පත් කර ගැනීමේ දී සහ ගබඩා කිරීමේ දී නියත මූලික කුසලතාවල ප්‍රවීණත්වයට පත් වීම.''

මෙහි දී නිශ්චිතව පුස්තකාල සලකනුයේ එය ප්‍රධාන මූලාශ්‍රය ලෙස පැවතිය හැකි වුව ද සරලව මූලාශ්‍ර ගණනාව අතරින් එකක් ලෙස පමණි.

විශේෂඥ කමිටුවක ප්‍රතිඵල වෙත අවධානය යොමු කරමින් Doyle (1990) තොරතුරු සාක්ෂරතාවෙන් යුත් පුද්ගලයෙකුගේ ලක්ෂණ ලැයිස්තුවක් ඉදිරිපත් කරයි. මේ අනුව තොරතුරු සාක්ෂරතාවෙන් යුත් පුද්ගලයා;

- තොරතුරු අවශ්‍යතාව හඳුනා ගනී.
- බුද්ධිමත් තීරණ ගැනීමට පදනම වන්නේ නිරවද්‍ය සහ පරිපූර්ණ තොරතුරු බව හඳුනා ගනී.
- විභව තොරතුරු සම්පත් හඳුනා ගනී.
- සාර්ථක සෙවුම් උපායමාර්ග සංවර්ධනය කරයි.
- පරිගණක පාදක සහ අනෙකුත් තාක්ෂණයන් ඇතුළු තොරතුරු සම්පත් වෙත ප්‍රවේශ වෙයි.
- තොරතුරු අගයයි.
- ප්‍රායෝගික ව්‍යවහාරය සඳහා තොරතුරු සංවිධානය කරයි.
- පවත්නා දැනුම් ශරීරය වෙතට නව තොරතුරු සමෛද්ධානය කරයි.
- විචාරාත්මක චින්තනයේ දී සහ ගැටලු විසඳීමේ දී තොරතුරු භාවිත කරයි.

තොරතුරු සෙවීමේ මාවතේ තබන ප්‍රථම තීරණාත්මක පියවර වන්නේ තම තොරතුරු අවශ්‍යතාව හඳුනා ගැනීමය. එහෙත් බොහෝ අය මෙම මූලික අවශ්‍යතාව පිළිබඳ දැනුවත් බවින් තොරය. මෙම දැනුවත්භාවයෙන් තොරව ඉහළ සාක්ෂාත්කරණ මට්ටමකට ළඟා වීම දුෂ්කරය. Joner උපුටා දක්වමින් Bruce (1995) මෙසේ පවසයි.

> ''තොරතුරු සාක්ෂරතාවෙන් යුත් පුද්ගලයා තොරතුරු ක්‍රියාවලි ක්‍රියාත්මක කරයි......''

තොරතුරු පරිසරය හඳුනා ගැනීම සහ පිළිගැනීම, තොරතුරු සඳහා ඇති අවශ්‍යතාවට ධනාත්මක ප්‍රතිචාර දැක්වීම, තොරතුරු පරතරය අවම කිරීමට විකල්ප උපායමාර්ග ගොඩ නැංවීම, උපායමාර්ගයක් ඇගයීම සහ තේරීම, එම උපායමාර්ගය මත කටයුතු කිරීම, උපායමාර්ගයක ඵලදායිත්වය

තක්සේරු කිරීම (සොයාගත් තොරතුරු ඇගයීම), තොරතුරු භාවිත කිරීම (තොරතුරු සංස්ලේෂණය කර සන්නිවේදනය කිරීම) සහ අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩා කිරීම පොදු ක්‍රියාවලියට අයත් වේ.

> ''වඩාත් නියත ක්‍රියාවලීන්ට ඇතුළත් වන්නේ මාර්ගගත සහ මුද්‍රිත තොරතුරු මූලාශ්‍රවල පවත්නා තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා උපායමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව, විධිමත් සහ සංවිධිත තොරතුරු ජාලවල කොටසක් නොවන ප්‍රජා පාදක සම්පත්වලින් තොරතුරු සමුද්ධරණය සඳහා උපායමාර්ග සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව, තොරතුරු කළමනාකරණය සහ සන්නිවේදනය සඳහා ව්‍යවහාරික මෘදුකාංග භාවිතයට ඇති හැකියාව යනාදිය වේ. මෙම ක්‍රියාවලීන් තොරතුරු වෙත ප්‍රවේශ වීම, විචාරාත්මක චින්තනය සහ සන්නිවේදන කුසලතාවල සංස්ලේෂණයකට සම්බන්ධ වේ.''

> ''ඔවුන්ට තොරතුරු ලෝකය ව්‍යුහගත වී ඇති ආකාරයත් විධිමත් තොරතුරු ජාල වෙත ප්‍රවේශ වන ආකාරයත් තවමත් එම ජාලවලට ඇතුළත් කර නොමැති තොරතුරු වෙත ප්‍රවේශ වන ආකාරයත් හුරුපුරුදුය. ශාස්ත්‍රීය තොරතුරු පද්ධති, අනුක්‍රමණික න්‍යාය සහ තොරතුරු නිර්මාණය හා සැපයීම සමඟ බැඳුණු බුද්ධිමය දේපළ හා දේශපාලනික සමාජීය හා ආර්ථික ගැටලු අවබෝධ කර ගැනීම ද තොරතුරු ලෝකය සමඟ හුරුපුරුදු වීමට අයත් වේ.'' (Bruce, 1995)

ඉහත උපුටා ගැනීමේ තිබෙන ප්‍රධාන වචනයක් වන්නේ 'උපායමාර්ගයයි.' තොරතුරු සෙවීමට, විශ්ලේෂණයට සහ භාවිතයට යොදා ගත් උපායමාර්ග ඇඟිලි වලින් සැහැල්ලුවෙන් සිටින කෙනෙකු, පූර්ව ක්‍රියාකාරී කෙනෙකු හෝ අවම වශයෙන් ක්‍රියාකාරී අයෙකු, කුමන තත්ත්වයක් සපයන්නේ දැයි බලා සිටින කෙනෙකු සහ තමන්, තමන්ගේ පවුල, තමන්ගේ ප්‍රජාව හෝ තමන්ගේ ජාතිය ඉදිරියට ගෙන යා හැකි හොඳ ම ආකාරය වෙත අවදිමත් වන්නෙකු පිළිබඳ සියලු හැඟවීම් සිදු කරයි.

## තොරතුරු සාක්ෂරතා වැඩසටහන්වල අභිමතාර්ථ

මෙවන් වැඩසටහන් වලින් සංවර්ධනය කරන කුසලතා කවරේ ද?

Marland (1981) ද්විතීයික පාසල් සඳහා භාවිතා කිරීමට යෝජිත තොරතුරු කුසලතාවන්ගේ වර්ගීකරණයක් ඉදිරිපත් කරයි. ඒ මත පදනම්ව තවත් අය ඊට සමාන ආදර්ශ සංවර්ධනය කර ඇත.

1. මට කිරීමට අවශ්‍ය කුමක් ද? (අවශ්‍යතාව පදනම් කර විශ්ලේෂණය කිරීම)
2. මට යන්නට අවශ්‍ය කොහේට ද? (භාවිත කළ හැකි සම්පත් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම)
3. මා මෙම තොරතුරු ලබා ගනුයේ කෙසේ ද? (එක් එක් සම්පත් හඳුනා ගැනීම සහ සොයා ගැනීම)
4. මා භාවිත කරනුයේ කවර සම්පත් ද? (ඒ ඒ සම්පත් විභාග කිරීම, තෝරා ගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම)
5. මා මෙම සම්පත් භාවිත කරන්නේ කෙසේ ද? (සම්පත් ප්‍රශ්න කිරිම)
6. මා වාර්තාවක් සැකසිය යුත්තේ කුමන සම්පත්වලින් ද?
7. මට අවශ්‍ය සම්පත් මට ලැබිණි ද? (අර්ථකථනය, විශ්ලේෂණය, සංස්ලේෂණය, ඇගයීම)
8. මා සාක්ෂාත් කර ගන්නේ කුමක් ද? (ඉදිරිපත් කිරීම, සන්නිවේදනය, ඇගයීම)
9. මා සාක්ෂාත් කර ගන්නේ කුමක් ද? (ඇගයීම)

'ග්‍රන්ථ විද්‍යාත්මක' අධ්‍යාපනය පිළිබඳ රචනයේ යෙදෙන Oberman සහ Strauch (1982) ශුද්ධ තාක්ෂණික කුසලතා වල සිට මූලධර්ම වල සංකල්පීය රාමුවක් පිළිබඳ සන්දර්භීය එළඹුමක් සහ සංවර්ධනයක් වෙතට යොමු වීමට බල කරයි. එහි දී හමු වූයේ කොතැනින් වුව ද තොරතුරු වෙත විචාරාත්මක සහ ඇගයීම් සහගත ප්‍රවේශය අවධාරණය කෙරිණි. එමෙන් ම ග්‍රන්ථ විද්‍යාත්මක උපදේශකත්වය, පුස්තකාල අධ්‍යාපනය සහ පුළුල් සන්දර්භනීය ගැටලු අතර පරතරයත් තොරතුරු මූලාශ්‍ර පිළිබඳ උසස් ඇගයීම් විශ්ලේෂණයත් පැහැදිලි විය.

න්‍යාය සහ ක්‍රමවේදය සමඟ පාඨක අධ්‍යාපනයේ අතිරේක ව්‍යවහාර සහ ශිල්පක්‍රම වලට ඇති අවශ්‍යතාව Kumar සහ Kumar (1983) අවධාරණය කරයි. පොදු මූලධර්ම භාවිතය යැයි සැලකිණි. එවිට අවශ්‍ය කුසලතා වල

වැදගත්කම ක්ෂණික ඉගෙනුම් අවශ්‍යතා වලට වඩා ඔබ්බෙන් රඳවා තබා ගත හැකිය.

Irving (1985) පහත සඳහන් කුසලතා පරාසය යෝජනා කරයි.

> ''....... ඒවා කියවීම, ලිවීම, සෙවීම, නිරාවරණය, සංවිධානය, පිරිසැකසීම, සිතීම, විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීම සමඟ බැඳී පවතී. ඒ හැමට ම වඩා ප්‍රශ්න හා උපකල්පන සම්පාදනයේ කුසලතා ඊට ඇතුළත් වේ. එනම්, දැන ගැනීමට එහි ඇති දෑ කුමක් ද, එය සොයා ගැනීමට විමසන ප්‍රශ්න මොනවා ද යන්නය.''

දැන ගැනීමට එහි ඇති දෑ කුමක් ද සහ එය සොයා ගැනීමට විමසන ප්‍රශ්න මොනවා දැයි අවධාරණය කරන විට Irving බොත්තම ඔබා සිටී. මෙය සත්‍යයක් බවත් වෛද්‍යවරයෙකු මුණගැසීමට ගියවිට බොහෝ පුද්ගලයන්ට අප්‍රමාණවත් හැඟීම් අභිමුඛ වන බවත් අපි සියල්ලන් ම පාහේ දනිමු. මන්ද, ඔවුන් තම රෝගීන්ට දැන ගැනීමට අවශ්‍ය දේ කුමක් දැයි දැන ගැනීමේ දී මනා සන්නිවේදකයන් නොවන බැවිනි. එමෙන් ම වෛද්‍ය ක්ෂේත්‍රය අප බොහෝ දෙනෙකුට තරමක් ගුප්ත බැවින් අප අපට දැන ගැනීමට අයිතිය ඇති දේ පමණක් නොව ඇසිය යුතු ප්‍රශ්න ගැන ද අපට දැනුවත් බවක් නොමැත. අදාළ තොරතුරු අප වෙත සන්නිවේදනය විය හැක්කේ එවිටය.

1987 දී Kirk (1987) Marland ට සමාන ක්‍රියාවලියක් ආවරණය කරමින් වර්ගීකරණයක් නිපදවීමය. මෙය ද පාසල්වල භාවිතය සඳහා නිර්මාණය කර ඇත.

Bruce (1995) ප්‍රකාශ කරනුයේ තොරතුරු සාක්ෂරතා වැඩසටහන් වල සමාන ක්‍රියාකාරකම් පරාසයක් ඇතුළත් විය යුතු වුව ද ඒවා තාර්කික පියවර අනුපිළිවෙළක මාදිලියකට නොදැමිය යුතු බවය. තොරතුරු තාක්ෂණ දෘඩාංග සමඟ හුරුපුරුදු බවත්, තෝරා ගත් තොරතුරු සැකසීම සඳහාත්, තෝරා ගත් ඵලවලට ගැළපෙන ආකාරයකින් ඒවා ඉදිරිපත් කිරීම සඳහා හැකියාව ලබා දෙන්නෙකු ලෙස තොරතුරු තාක්ෂණයේ බලපෑමක් ඊට ප්‍රථමයෙන් ම ඇතුළත් කළේ ඔහුය. යථාර්ථයේ දී ඒවායේ අනුබද්ධිත සියලු උපාංග ඊට ඇතුළත් වේ. මෙයට පෞද්ගලික පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර වලට අමතරව සර්වර් සහ දෘඩාංග ඇතුළත් කළ හැකිය. ඒවායේ

ප්‍රයෝජන කුඩා විය හැකි වුව ද සෙවුම් යන්ත්‍ර වෙත වැඩි බලපෑමක් කිරීමට මෘදුකාංග වලට හැකිය.

අන්තර්ජාලයට නව පරිශීලකයන් හඳුන්වා දීම පිළිබඳ අනතුරු හඟවමින් Duracle (1995) මෙසේ පවසයි.

> ''ජාල පරිහරණයට ආධුනිකයන් බොහෝ රූපවාහිනී ප්‍රේක්ෂකයන් මෙන් අන්තර්ජාලයෙන් ඔවුන් කියවන, දකින සහ නිරාවරණය කරන සියල්ල සත්‍ය ලෙස ගැනීමේ උගුලට පහසුවෙන් හසු විය හැකිය. පරිගණකයක් සහ ජාල සබඳතාවක් තිබෙන සියල්ලන්ට පාහේ තමන්ට අවශ්‍ය ඕනෑ ම දෙයක් අන්තර්ජාලයේ 'පළ' කිරීමට පුළුවන. මුරකරුවන් නොමැති වීමේ වාසි මෙන් ම අවාසි ද තිබේ. මුද්‍රණ පාදක ප්‍රකාශන ප්‍රජාවෙහි එවැන්නෙකු සිටී. මෙහි යහපත් පාර්ශ්වය වන්නේ වෙනත් ආකාරයකින් ලබා ගත නොහැකි තොරතුරු සහ අදහස් වෙත ප්‍රවේශයක් ජනතාවට ලැබීමය. අනෙක් අතට කරුණුවල නිරවද්‍ය බව සහ කිසිදු ගුණාත්මක තත්ත්වයක් සහතික කිරීමට ගොනුවල වැදගත්කම ඇගයීම සඳහා වගකියන කිසිදු ඒකකයක් නොමැත. එහෙයින් එහි මැණික් වලට අමතරව සුන්බුන් රැසක් එහි තිබේ.''

අන්තර්ජාලයට ප්‍රවේශ වී ලබා ගන්නා සියල්ල අනෙකුත් මූලාශ්‍ර වලට වඩා සත්‍යයෙන් ඉහළ යැයි ඇතැම් සිසුන් සිතීමට හේතුව සිතා ගැනීම අපහසුය. සැබැවින් ම බොහෝ අවස්ථාවල දැනුමේ ගැඹුරු මුහුද මත සුන්බුන් පාවෙයි. විචාරාත්මක ප්‍රශ්න කිරීමේ එළඹුමක් සංවර්ධනය කිරීම සියලු තොරතුරු වලට අත්‍යාවශ්‍ය වේ.

1996 දී, Eisenbery සහ Berlcowitz 'මහා හය' (Big Six) නමින් තොරතුරු සාක්ෂරතා ආදර්ශයක් සංවර්ධනය කළහ. එය අවම වශයෙන් ඇමරිකාව තුළ වඩාත් පුළුල්ව භාවිත කරන තොරතුරු සාක්ෂරතා ආදර්ශ වලින් එකක් බවට පත් වෙමින් තිබෙන බව Eisenbery සහ Johnson (1999) සඳහන් කරයි. එය තරමක් මෑත කාලීන ආදර්ශයක් නිසා මම මගේ විනිශ්චය පසුවට තබමි. පෙර පැවති වර්ගීකරණ එළඹුම් මෙන් තොරතුරු ගැටලු විසඳීමට ක්‍රමානුකූල එළඹුමක් සපයයි. එය අධ්‍යාපනික ප්‍රේක්ෂාවලිය, රැකියා තත්ත්වයන් සහ විෂය ක්ෂේත්‍ර පුරා මාරු කළ හැකි කුසලතා කට්ටලයක් ලෙස සැලසුම් කර ඇත. එහි පියවර වලට තාර්කික ගලා යාමක් තිබුණ ද තොරතුරු ගැටලු විසඳීම හැමවිට ම අනුක්‍රමික ක්‍රියාවලියක් නොවන බව කතුවරු පිළිගනිති. කෙසේ වෙතත්, ඔවුන්

පවසනුයේ යම් ලක්ෂ්‍යයක දී විවිධ පියවර සම්පූර්ණ විය යුතු වීම වැදගත් බවය.

## තොරතුරු සාක්ෂරතාවේ දී පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව සහ එම භූමිකාවට ඇති අභියෝග

ඉගැන්වීම, ඉගෙනුම සහ පර්යේෂණ වලට සහාය වන සැලකිය යුතු සම්පතක් ලෙස පුස්තකාලයාධිපතීන් කාලයක් පුරා පිළිගැනීමට ලක්ව ඇත. 'දැනුම තැන්පතුවට' ප්‍රධාන දායකත්වය සපයන්නන් ඔවුන්ය. මෙය විශ්වවිද්‍යාලයක ලක්ෂණයකි. එය අනෙක් උසස් ඉගෙනුම් ආයතනවලින් වෙනස් වන්නකි. හිමිකාරත්වය/ප්‍රවේශය විවාදය පැවති කාලයේ පවා සහ 'නියමිත සිද්ධිය' සමඟ පැවති විවාදයේ 'නියමිත වේලාවට' යෝජකයන් සිටි සමයේ පවා යථාර්ථය වූයේ එක්කෝ/නැත්නම් නොව දෙක ම/සහ යන්නය. මෙම වඩාත් සංකීර්ණ කාලයන් හි පුස්තකාලයාධිපතීන්ට වඩාත් කාලීන විලාසයකින් වඩාත් ගැළපෙන ආකෘතියකින් අදාළ තොරතුරු සොයා ගැනීමට උපකාර කිරීමේ දියුණු භූමිකාවක් තිබේ (සහ පාඨකයන්ට හෝ අරමුදල් සපයන ආයතනයට හෝ දෙකට ම පිළිගත හැකි මුදලකට).

ඉගැන්වීම වෙත තාක්ෂණය හඳුන්වා දීම ශාස්ත්‍රීය සන්නිවේදන රටාවන් ද වෙනස් කරයි. මාධ්‍ය විවිධත්වය වර්ධනය වීම ඕනෑ ම වේලාවක සහ ඕනෑ ම ස්ථානයක දී තමන්ට අවශ්‍ය සේවාව ලබා ගැනීමට සිසුන් වැඩි වැඩියෙන් ඉල්ලුම් කරයි. අවශ්‍ය වන්නේ අන් කවරදාටත් වඩා පාඨකයන් වෙත අවධානය යොමු කිරීමට පාඨක මිත්‍රශීලී වීමට පුස්තකාලයාධිපතීන් සහතික වීමය. එමෙන් ම වැඩි ස්වයංපෝෂිත බවක් ලබා ගැනීමට හැකි වන තොරතුරු සාක්ෂර කුසලතා ලබා ගැනීමට පාඨකයන්ට සහාය වීමය.

තමන් සතු සහ වෙනත් ස්ථානයකින් ණයට ලබා ගන්නා ප්‍රාදේශීය සම්පත් වලටත් කේවල ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමේ දී දුරස්ථ ප්‍රදේශයකින් ලබා ගන්නා සම්පත් වලටත් ප්‍රවේශය සැපයීමට බොහෝ දෙනෙකුට ප්‍රධාන මූලාශ්‍රය ලෙස පැවතීම අපේක්ෂා කළ ද සැබවින් ම පුස්තකාලය යනු තොරතුරු වෙත ප්‍රවේශය සපයන ස්ථානයක් පමණක් ම නොවේ. තොරතුරු සහ දැනුම සම්පත් කළමනාකරණයේ දී සහ හිමිකාරත්වය හා ප්‍රවේශය අතර උචිත සමතුලනය නිරන්තරයෙන් යළි විභාග කිරීමේ දී සහ

කවර මාධ්‍යයක් තබා ගන්නේ ද සැලකීමේ දී ප්‍රවේශය යනු අඛණ්ඩ අභියෝගයක්, උත්තේජනයක් මෙන් ම සතුටකි.

1997 පැවති Sydney InformationOnline and On Dise' 97 සම්මන්ත්‍රණයේ ඉදිරිපත් කරන ලද වාර්තාවක Australian Library Journal සංස්කාරක මෙසේ සඳහන් කළේය.

> ''Bit බ්ලැක්වෙල්හි Martin Marlow 'දැනුම නර්තන රචකයා' යන යෙදුම හඳුන්වා දිණි. එහෙත් අප ප්‍රතාපවත් ලෙස ඉදිරියට ගමන් කිරීමේ දී අපට මුද්‍රානාටක හෝ වියරු සමකාලීන නර්තනයක් දැක ගත හැකිවනු ඇත..... නර්තන රචකයන් ලෙස අපගේ (පුස්තකාලයාධිපතීන්) රාජකාරිය වනු ඇත්තේ අඛණ්ඩ ප්‍රවේශය සහතික කිරීමය. කෙසේ වෙතත්, වෙනස් සම්පත් සඳහා වෙනස් ආකෘති තේරීම සාර්ථකව කටයුතු කිරීමට යම් දැනුම මට්ටමක් සහිත පාඨකයෙකු උපකල්පනය කරයි. දැනුම යන්නෙන් මා අදහස් කරනුයේ සරලව ඉලෙක්ට්‍රොනික ආකෘති හැසිරවීමේ පරිගණක නිපුණත්වය නොව තොරතුරු සාක්ෂරතා කුසලතාවන්ය.'' (Ceveft, 1997)

පුස්තකාලයාධිපතීන් අත්‍යවශ්‍යයෙන් ම ඉගැන්විය යුතු වේ ද? Cowley iy Hammond (1987) ලියා දක්වා ඇත්තේ තෘතීයික ක්ෂේත්‍රයේ පුස්තකාලයාධිපතීන් පාඨක අධ්‍යාපනය පිළිබඳ උද්‍යෝගයක් දැක්වුව ද ගුරුවරුන් සහ සිසුන් විසින් එකී උද්‍යෝගය අත්‍යාවශ්‍යයෙන් ම බෙදා හදා නොගන්නා බවය.

> ''උදාසීනත්වය සහ අවබෝධයේ අඩුව බොහෝ විට හේතු වුව ද පාඨක අධ්‍යාපනය පිළිගැනීමේ අඩුව පීඨයේ සුළුතරයකින් එල්ල වන සම්පූර්ණ විරෝධයේ මාදිලියක් ගනී. සිසුන්ගේ පුස්තකාල භාවිතය සහ සාහිත්‍ය හා තොරතුරු වෙත ප්‍රවේශය ඒ ඒ ගුරුවරයා විසින් මග පෙන්වන්නක් විය යුතු බව එම සුළුතරයේ දැඩි හැඟීම වේ. මෙයට සම්බන්ධ වීමට ඇති කැමැත්තේ දී පුස්තකාලයාධිපතීන්ගේ පෙළඹීම පිළිබඳ සැකයක් පවතී. එමෙන් ම ගුරුවරයා සහ පුස්තකාලයාධිපති අතර සහයෝගිතාව පිළිබඳ හැඟීම සඳහා ඇත්තේ අඩු කැමැත්තකි..... අවබෝධයේ මට්ටමක් සපුරා ගැනීමේ අපේක්ෂාවේ දී සිසුන්ට වඩා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙතට පවත්නා සීමිත සම්පත් යොමු කිරීම වැඩි සහයෝගිතාවක් වෙතට දිවෙන බව ඇතැම් පුස්තකාලයාධිතීන්ගේ දැක්ම වේ.''......

පාඨක අධ්‍යාපනය සමඟ සම්බන්ධ වීමට ඇති පුස්තකාලයාධිපතීන්ගේ ආශාව වර්ධිත තත්ත්වයන් අත්කර ගැනීමට පුස්තකාලයාධිපතීන් විසින්

ගත් උත්සාහයක් බව Urquhart (1983) ගේ වචන දක්වමින් Cowley සහ Hammod පෙන්වා දෙති.

Breivik තොරතුරු සාක්ෂරතා වැඩසටහන් වල දී පුස්තකාලයාධිපතීන්ගේ ප්‍රබල මැදිහත් වීම පිළිබඳ යෝජනාව ගෙන එයි. ඒ අනුව ස්වකීය ස්ථාවරය යළි සලකා බැලීමට අඩු උද්‍යෝගයක් දක්වන සගයන් හඹා යාමට ඇති හොඳම ක්‍රමය කුඩා නියාමන ව්‍යාපෘතියකි. එහෙත් මෙවන් ප්‍රකාශනයක සහ යෝජනාවක අවදානම් සහගත දේශපාලන ගැටලු පවත්නා බව Breivik පිළිගනී.

Bruce (1995) ට අනුව සහයෝගී එළඹුම සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වේ.

> ''තොරතුරු සාක්ෂරතා වැඩසටහන් වලට මුල පුරන්නට කථිකාචාර්යවරුන්ගේ (විෂය විශේෂඥ), පුස්තකාලයාධිපතීන්ගේ, පරිගණක විද්‍යාඥයන්ගේ, මාධ්‍ය විශේෂඥයන්ගේ සහ ප්‍රජාවේ හවුල්කරුවන්ගේ සහයෝගය අවශ්‍ය වේ. එහෙයින් තොරතුරු සාක්ෂරතාව සඳහා වන වගකීම සහයෝගීත්ව පරිසරයක් තුළ බෙදා හදා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම අනුල්ලංඝනීය වේ.''

තොරතුරු සාක්ෂරතාව එක් ශික්ෂණයකින් සාක්ෂාත් කර ගත නොහැකිය යන වැදගත් අනතුරු හැඟවීම ඇය සපයයි. ඇය මෙසේ ද පවසයි.

> ''තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයෙකු නිර්මාණය කිරීම විෂයන් සහ ඉගෙනුම් අත්දැකීම් පරාසයකින් ලැබෙන සමුච්චිත අත්දැකීමකි.'' (එම)

Bruce විශ්වවිද්‍යාල සන්දර්භය තුළ තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනය සඳහා උපායමාර්ග ගණනාවක් ලැයිස්තුගත කරයි.

- පාඨමාලාවක් හෝ පාඨමාලා කීපයක් එකිනෙකට සම්බන්ධ කළ විෂයමාලා වෙතට තොරතුරු සාක්ෂරතා සංරචකය සමෝධානය කිරීම
- තෝරා ගත් විෂයක් හෝ කීපයක් වෙතට පමණක් තොරතුරු සාක්ෂරතා සංරචකය සමෝධානය කිරීම
- තොරතුරු සාක්ෂරතාවේ අංග වලට වෙන් වූ පාඨමාලාවක එක් හෝ මට්ටම් කීපයක දී විශේෂ විෂයන් හඳුන්වා දීම

- තොරතුරු සාක්ෂරතාව, මෙවලම්, පද්ධති සහ තාක්ෂණයන් හා තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනය පිළිබඳ යාවත්කාලීන දැනුම සපයමින් පර්යේෂණ සහ ඉගැන්වීම් කාර්යමණ්ඩල සඳහා පීඨ අතර සහ පීඨ තුළ වැඩමුළු
- පීඨ, ඉගෙනුම් සහායක උපදේශකයන් හෝ තොරතුරු සේවා අංශය මගින් සිසුන් සඳහා සපයන විෂය බාහිර අවස්ථා
- උපාධිධාරීන් සහ පුළුල් ප්‍රජාවේ සාමාජිකයන් සඳහා අඛණ්ඩ අධ්‍යාපන විෂයන් හෝ වැඩමුළු (එම)

නියාමන ව්‍යාපෘතිය සහ දාර්ශනික, ක්‍රමවිද්‍යාත්මක හා බුද්ධිමය අන්තර්ගතය පිළිබඳ ප්‍රශ්න සහ තොරතුරු සාක්ෂරතා වැඩසටහන් වල ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක පදනම හා සමානව ම ඵලදායී ගුරුවරුන් වීමට සන්නද්ධ වීම සඳහා පුස්තකාලයාධිපතීන්ගේ මැදිහත්වීම් අවශ්‍යතාව ද වැදගත් වේ. සමාන්‍යයෙන් පුස්තකාලයාධිපතීන් කේවල ගැටලු ගෙන එන කේවල පාඨකයන්ට සහාය සැපයීමේ දී කුසලතා දැක් වුව ද නියත තොරතුරු සාක්ෂර කුසලතා පිළිබඳ කණ්ඩායම් ඉගැන්වීමට තරමක් වෙනස් සන්නිවේදන කුසලතා අවශ්‍ය වේ.

Boisse, Webster සහ Metz විසින් රචිත පත්‍රිකා වෙත අවධානය යොමු කරන Townley සහ Myers (1995) තොරතුරු සාක්ෂරතාවේ දී පුස්තකාලයාධිපතීන්ගේ ඉගැන්වීම් භූමිකාවට සම්බන්ධ වෙනත් ගැටලු සලකා බලති.

> ''පුස්තකාලයාධිපතීන් තොරතුරු සාක්ෂරතාව පිළිබඳ ගුරුවරුන් ලෙස සාර්ථක වීම සඳහා ඔවුන්ගේ වෘත්තීය භූමිකා නවීකරණය කිරීමට පුස්තකාල පරිපාලකයන් සක්‍රීය භූමිකාවක් ඉටු කිරීම අවශ්‍ය වනු ඇත. පරිපාලකයන් පුස්තකාලයාධිපතීන්ට සියලු ආකෘතිවලින් ශාස්ත්‍රීය තොරතුරු ආමන්ත්‍රණය කළ හැකි පරිසරයක් නිර්මාණය කළ යුතුව ඇත. එවිට විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික තොරතුරු ඇතුළුව සමස්ත තොරතුරු වර්ණාවලිය ම ඉදිරිපත් කරනු ලබන අතර පුස්තකාලයාධිපතීන් තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීමේ ස්වකීය ඍජු භූමිකාව පුළුල් කිරීමට කටයුතු කළ යුතුව තිබේ. මෙම වෙනස්කම් දෙක ම පරිණාමීය වන අතර ඒවා එක් වූ විට පුස්තකාල සහ උසස් අධ්‍යාපනය සඳහා නව සුසමාදර්ශයක් සංස්ථාපනය කෙරේ.''

> ''පුස්තකාල වෘත්තිකයන්ට මෙම සැලැස්ම (ඉලෙක්ට්‍රොනික තොරතුරු සාක්ෂරතාව සඳහා) නියෝජනය විය යුත්තේ සරල විමර්ශන ප්‍රශ්න වලට පිළිතුරු දීමේ, නිශ්චිත සේවා සහාය සැපයීමේ සහ ග්‍රන්ථ විද්‍යාත්මක උපදෙස් සැපයීමේ සිට ක්‍රියාපාදක අධ්‍යාපනයට සහාය වීම සහ ඉලෙක්ට්‍රොනික තොරතුරු තාක්ෂණය ඉගැන්වීම දක්වා වේ. පුස්තකාලය තුළ මෙම සැලැස්ම සාර්ථක වීමට නම් එය පුස්තකාල සාක්ෂරතාවට වඩා තොරතුරු සාක්ෂරතාවේ අභිමතාර්ථ අවධාරණය කළ යුතුය. යාවජීව තොරතුරු කුසලතා සංවර්ධනය අවධාරණය කළ යුතුය; එය පුස්තකාල වෘත්තිකයන් පිළිබඳ ඉල්ලුම අඩු කරන කෙටි කාලීන තොරතුරු සහ විමසුම් අවශ්‍යතා සමඟ කටයුතු කළ යුතුය.''

Townley සහ Myers (1995) සිය පැහැදිලි කිරීමේ දී පමණට වඩා සංක්ෂිප්තය. සමහර විට හොඳ ම තොරතුරු මූලාශ්‍රය මුද්‍රිත ආකෘතියෙන් තිබිය හැකිය. එහෙයින් සිය තොරතුරු සාක්ෂරතා වැඩසටහන් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයට පමණක් සීමා වීම එය මුද්‍රිත මාධ්‍යයට සහ පුස්තකාලයට සීමා වීමට සමාන නොමග යාමක් වනු ඇත. නියත අවශ්‍යතාවක් සඳහා වඩාත් ගැළපෙන ආකෘතිය තුළ වඩාත් අදාළ සහ නිරවද්‍ය තොරතුරු තවමත් මුද්‍රිත හෝ පුද්ගල හෝ සැබවින් ම ඩිජිටල් ආකෘතියෙන් පැවතීමට පුළුවන. කෙටිකාලීන තොරතුරු සහ විමසුම් අවශ්‍යතා සඳහා සේවා සැපයීම පිළිබඳ ඔවුන්ගේ අවධාරණය විවිධ අභිප්‍රායන් සඳහා කාලයක් පුරා පවත්නා නියත කුසලතා සන්නිවේදනය කිරීමට ඉලක්ක කරන තොරතුරු සාක්ෂරතා ක්ෂේත්‍රයේ සේවය කරන්නවුන්ගේ මූලික විශ්වාසයට විරුද්ධ වේ. එහෙත් උගන්වන කුසලතා සඳහා සිසුන් නියත හා ක්ෂණික අවශ්‍යතාවක් දැකීමේ වැදගත්කම අවතක්සේරු කිරීමට මම අපේක්ෂා නොකරමි.

පුස්තකාල සඳහා අවශ්‍ය දෙය වන්නේ උචිත පරිදි කාර්ය මණ්ඩල වලින් සන්නද්ධ කිරීමත්, තොරතුරු සාක්ෂරතා වැඩසටහන්වල දී ගැළපෙන මට්ටමකට සහභාගී වීමට හැකිවන වෙනත් ක්‍රම සැකසීමත් ආයතනයේ ඉගෙනුම් සහ පර්යේෂණ ඵල වලට පුස්තකාලයේ ඇති සබඳතාව නිරන්තරයෙන් ප්‍රවර්ධනය කළ යුතු වීමත්ය.

ලින්කන් විශ්වවිද්‍යාලය 1991 සිට තොරතුරු සාක්ෂරතාව පිළිබඳ විෂයමාලා පාඨමාලාවක් සපයයි. නවසීලන්තයේ එවන් පාඨමාලාවක් පවත්නා එක ම තෘතීය ආයතනය එයයි. තොරතුරු අධ්‍යාපන

පුස්තකාලයාධිපති කෙනෙකුගේ තනතුර පුස්තකාල කාර්ය මණ්ඩලයේ ම කොටසකි. එම තනතුර තොරතුරු සාක්ෂරතාව ඉගැන්වීම පිළිබඳ පුස්තකාලයේ දර්ශනය සමඟ ගැළපේ. එයට පහත සඳහන් මූලධර්ම ඇතුළත් වේ.

- පුස්තකාල පාඨකයෙකු සමඟ වන සෑම සබඳතාවක් ම අධ්‍යාපනික අවස්ථාවක් ලෙස සැලකිය යුතුය. එහෙයින් උපාධිය සැලකිය යුතු ආකාරයෙන් වෙනස් වුව ද යම් ඉගැන්වීම් වගකීමක් සියලු කාර්ය මණ්ඩලයට තිබේ.
- තොරතුරු අධ්‍යාපන ඉගැන්වීම් සීඝ්‍රයෙන් වෙනස් වන තොරතුරු ක්ෂේත්‍රය සමඟ යාවත්කාලීන බවක් පවත්වා ගෙන යන ව්‍යවහාරික පුස්තකාලයාධිපතීන් විසින් වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කරනු ලබයි.
- තොරතුරු අධ්‍යයන තුළ සිසු ඉගෙනුම ගැටලු පාදක ඉගෙනුම මගින් වඩාත් ඵලදායීව සපුරා ගනු ලබයි. විධිමත් ඉගැන්වීමේ දී භාවිත කරන එළඹුම මෙයයි. සිසුන් සැබෑ විමසුම් සමඟ කටයුතු කරන විට පුස්තකාල තොරතුරු මේසයේ දී සෑම පාඨකයෙකුට ම වෙන් වෙන්ව අවධානය යොමු කිරීම දක්වා මෙය ව්‍යාප්ත වේ.
- පුස්තකාල කාර්ය මණ්ඩලය විධිමත් පන්ති කාමර ඉගැන්වීමට සම්බන්ධ වීම පාඨමාලා හරහා ඔවුන්ගේ ඉගැන්වීම් කුසලතා සංවර්ධනය කිරීම දිරිමත් කෙරේ.
- තොරතුරු අධ්‍යාපන වැඩසටහන් සම්පූර්ණ කට්ටලයේ කොටසක් වන අතර පුස්තකාල කාර්ය මණ්ඩලයේ සියල්ලන් විසින් එහි හිමිකාරිත්වය දරයි. (Laird & Dewe, 1993)

පුස්තකාලයාධිපතීන් සහ ඔවුන්ගේ සමීපතම තොරතුරු සගයන්ට නායකත්වය අභ්‍යාස කළ හැකි ආකාර ගණනාවක් Bruce (1995) පෙන්වා දෙයි.

- තොරතුරු සාක්ෂරතා වැඩසටහන්වල මුලපිරීම් වෙත සන්නිර්ශිත කැප වීම
- පුවත් හසුන් සහ වාර්ෂික වාර්තා මගින් තොරතුරු සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම

- මූලධර්ම, අභිමතාර්ථ සහ අරමුණු පිළිබඳ වැඩසටහනක් සංවර්ධනය කිරීම
- ඉගෙනුම් ඵල ඵලදායීව ඇගයීමට උපායමාර්ග සංවර්ධනය කිරීම

තොරතුරු සාක්ෂරතාවේ දී පුස්තකාලයේ භූමිකාව උපායමාර්ගික සැලසුම්කරණ ලේඛන සහ පුස්තකාලයේ ව්‍යාපාර සැලසුම් තුළ මෙන් ම එය අයත් ඕනෑ ම තොරතුරු සේවා අංශයක් තුළ පමණක් නොව පුළුල් වශයෙන් ආයතනයේ සැලසුම්කරණ ලේඛන තුළ ද විද්‍යමාන විය යුතුය. පුස්තකාලයාධිපතීන් ගුරුවරුන් ලෙස සම්බන්ධ වුව ද නොවූව ද ඔවුන් විෂය මාලාව සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා සම්බන්ධ විය යුතු බව Bruce තවදුරටත් සඳහන් කරයි.

## තොරතුරු සාක්ෂරතා වැඩසටහන් වලට ඇති බාධක

විෂයමාලාවට අයත් වුව ද නොවූව ද තොරතුරු සාක්ෂර කුසලතා සහ එවන් වැඩසටහන් සඳහා ඇති අවශ්‍යතාවට සහාය දීමට නැඹුරුවක් දක්වන සාධක විශේෂයෙන් උසස් අධ්‍යාපන ආයතනවලින් එතරම් දක්නට නොවීම විස්මයකි. පරිපාලකයන්, විද්වතුන්, සිසුන් මෙන් ම පුස්තකාලයාධිපතීන් වැනි උසස් අධ්‍යාපනයේ සියලු හවුල්කරුවන් තුළ ආකල්පමය වෙනසක් අවශ්‍ය වීම මීට එක් හේතුවකි. ඉහළ කුසලතා සහිත ඇතැම් පුස්තකාලයාධිපතීන් තමන් එසේ කිරීම අනවශ්‍ය ද්විත්වකරණයක් ලෙස දැකීමට බිය වීම නිසා එකී කුසලතා පැවරීමට පසුබෑම කෙනෙකු විමතියට පත් කිරීමට පුළුවන. එහෙත් තොරතුරු සහ දැනුම ක්ෂේත්‍රයේ විශිෂ්ට වෘත්තිකයන් ලෙස පුස්තකාලයාධිපතීන් හැමවිට ම තොරතුරු සහ දැනුම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම කළමනාකරණයේ වැදගත් සාධකයක් වනු ඇත. එහෙයින් නිරන්තරයෙන් ස්වකීය නායකත්ව තත්ත්වය දියුණු කර පවත්වා ගෙන යනු ඇත.

Farmers (1992) දකින ආකාරයට, ගුරුවරුන් වෙනුවෙන් ආකල්පමය විතැන් වීම යනු 'පංති කාමරය තුළ තොරතුරු බෙදා හරින්නෙකුගේ' සිට 'පංති කාමරයෙන් පිටත සම්පත් පාදක ඉගෙනුම හරහා ස්වාධීන ඉගෙනුම්කරුවන් බවට පත් කිරීමට සිසුන් සවිබල ගන්වන සුසාධ්‍යකාරයෙකු' දක්වා යොමු කිරීමය.

පුස්තකාලයාධිපතීන්ට පවත්නා ප්‍රධානතම බාධකයක් වන්නේ ඔවුනට සුජාත අධ්‍යාපනික භූමිකාවක් ඇති බවත් නිපුණ ගුරුවරුන් විය හැකි බවත් පිළිගැනීමට බොහෝ ගුරුවරුන් මැළිකමක් දැක්වීමය. මීට අමතරව, පුස්තකාල මෙම කුසලතා සන්නිවේදනය කිරීමට ගැළපෙන අවකාශ ලෙස සංවර්ධනය කිරීම හෝ ඊට ප්‍රවේශය සැපයීම අවශ්‍ය වේ. ගුරුවරුන් සමඟ සහයෝගී හවුල්කාරත්වයන් ස්ථාපිත කළ හැකි විට තොරතුරු සාක්ෂරතා වැඩසටහන් අධ්‍යාපනික ක්‍රියාවලියේ තීරණාත්මක කොටසක් බවට පත් වීමට අවශ්‍ය සහාය සහතික කිරීමට බොහෝ දුරට හැකියාව පවතින බවට සැකයක් නොමැත.

සිසුන් වෙනුවෙන් ඇති අභියෝග Farmers (1992) මෙසේ දකී.

> ''නිශ්ක්‍රීය සහ අන්‍යයන් මත යැපෙන ඉගෙනුම්කරුවන් වෙතින් ඉවත්ව තමන් විචාරාත්මකව තෝරා ගත් සහ විශ්ලේෂණය කළ තොරතුරු පංති කාමරයට ගෙන එන සක්‍රීය සහ ස්වාධීන ඉගෙනුම්කරුවන් බවට සිසුන් පත් විය යුතුය.''

වඩාත් වැදගත් ලෙස, Farmers (1992) 'නැවුම් ඉගෙනුම් ප්‍රජාවක්' තුළ සක්‍රීය හවුල්කාරත්වයන් සඳහා බලකර සිටී.

තොරතුරු සාක්ෂර කුසලතා සංවර්ධනය නොකිරීමට හේතුවක් ලෙස බොහෝ විට කාලය දැක්වුව ද මෙම කුසලතා අත්පත් කර ගැනීමට වෙන් කළ කාලය (එම කුසලතා සන්නිවේදනය කරන) තොරතුරු වෘත්තිකයන්ට ද ඉහළ ප්‍රතිලාභ අගයකින් යුක්තය.

විකල්ප අතිරේකයක් ලෙස දැකීමට වඩා උපරිම ප්‍රතිඵලයක් ලබා ගැනීමට නම් තොරතුරු සාක්ෂරතා වැඩසටහන් විෂය මාලාවට සමෝධානය කිරීම අවශ්‍යය. කෙසේ වෙතත්, බොහෝ තොරතුරු සාක්ෂරතා පාඨමාලා විධිමත් විෂය මාලාවට බාහිරින් අඛණ්ඩව සැපයීම පිළිගැනේ. එමෙන් ම උසස් ගුණාත්මක බවින් යුත් නිමවුමක් සහතික කිරීම ද වඩාත් වැදගත් වේ. සිසුන් එයට ආකර්ෂණය වන්නේත් යම් ආකාරයකින් වැදගත් කුසලතා අත්පත් කර ගන්නේත් එවිටය. එයින් ඔවුනට උත්තේජනයක් ලැබෙන අතර මෙවන් වැඩසටහන් වලට සහභාගී නොවන අනෙකුත් සිසුන්ට වඩා හොඳින් සිය කාර්යසාධනය සහතික කිරීමට මෙම කුසලතා

අදාළ වන බව ක්ෂණිකව දකී. මෙම කුසලතාවල දිගුකාලීන අදාළත්වය සිසුන් තොරතුරු සමාජයේ වඩාත් හැකියාව සහිත වූවන් බවට පත් කරන අතර යාවජීව අධ්‍යාපනයේ දී දක්ෂ ලෙස කටයුතු කිරීමට හැකියාව ලබා දෙයි.

## නිගමන

තොරතුරු යුගයේ දී සාත්ෂරතාව පිළිබඳ සංකල්පය තොරතුරු සාක්ෂරතාව අනුගමනය කිරීම දක්වා ව්‍යාප්ත කිරීම අවශ්‍ය වේ. පුළුල්තම සන්දර්භයක් තුළ තොරතුරු දැකීමත් අවශ්‍යතා නිශ්චය කිරීමත් අනතුරුව තොරතුරු සොයා ගැනීම, ඇගයීම, සංවිධානය සහ ව්‍යවහාර කිරීමත් ප්‍රධාන කුසලතා වේ.

# ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයෙහි ලා පාදක සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක විවරණයක්

ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස

## හැඳින්වීම

''**සහිතස්‍ය භාව : සාහිත්‍යම්**'' යන විග්‍රහයේ එන පරිදි සහිත බව හෙවත් රස සහිත වූ බව සාහිත්‍යය යි. එනම්, මනා කොට කියන ලද්ද හෝ මනා කොට තබන ලද දේ බව වැලිවිටියේ සෝරත හිමි සාහිත්‍ය සේවනයෙහි සඳහන් කෙරේ. සාහිත්‍යයෙහි ප්‍රධාන අරමුණු හෙවත් ශාඛා දෙකක් ඇත. එහි පළමුවැන්න, දැනුම සඳහා සාහිත්‍යය වන අතර දෙවැන්න, රස නිෂ්පත්තිය සඳහා සාහිත්‍යය වශයෙන් අර්ථවත් වේ. මේ අරමුණු වලින් විශේෂ අවධානය යොමුවන්නේ පළමුවැන්න වූ, දැනුම සඳහා වූ **පුස්තකාල හා විඥාපන විද්‍යා සාහිත්‍යය** හා සම්බන්ධයෙන් ප්‍රකාශිත ග්‍රන්ථ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු හා ශාස්ත්‍රීය සඟරා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම යි. එහි දී එහි ප්‍රමාණාත්මක වර්ධනය එකී සාහිත්‍යයෙහි වර්ධනය සඳහා අධ්‍යාපනික වශයෙන් ඍජුවම දායක වන ආයතනික මට්ටමෙන්, ලේඛක හා සංස්කාරක මට්ටම් මෙන් ම, භාවිත භාෂා මාධ්‍ය වශයෙන් සංක්ෂිප්තව විස්තර කෙරේ.

## ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයේ ආරම්භය

1957 දී කොළඹ ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට පැමිණි කැනේඩියානු පුස්තකාලයාධිපතිවරයකු වූ ඩොනල්ඩ් ඒ. රෙඩ්මන් නැමැති විශේෂඥයා මෙරට පුස්තකාලවේදීන් උදෙසා කෙටි කාලීන පාඨමාලාවක් (පියදාස, 1985 පි. 6) ආරම්භ කරන ලදී. 50 දශකය අග භාගය එනම්, 1957 මෙරට පුස්තකාල විද්‍යා අධ්‍යාපනයේ ආරම්භක අවධිය ලෙස සැලකිය හැකි බව මෙයින් මනාව පැහැදිලි වනු ඇත.

1961 ජූලි මස 04 වන දින කොළඹ දී ලංකා පුස්තකාල සංගමය පුස්තකාල විද්‍යා විද්වත් පාඨමාලාවක් (ලංකාගේ, 1973 පි. 122) අර්ධ කාලීන වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ආරම්භ කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා පුස්තකාල

සංගමය මෙරට පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත බිහිකිරීම ආරම්භ කරන ලද්දේ වර්ෂ 1961 දීය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක් මගින් ප්‍රථමයෙන් පුස්තකාල විද්‍යා පාඨමාලාවක් ආරම්භ කිරීමේ ගෞරවය හිමිකර ගත්තේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය යි. 1961 පුස්තකාල විද්‍යාව සම්බන්ධ **පශ්චාත් උපාධි ඩිප්ලෝමා** පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මෙම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය (අමරසිරි, 2014 පි. 27) **'ලන්ඩන් විශ්වවිද්‍යාල කොලිජියේ පාසැල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ විෂය නිර්දේශය'** ආශ්‍රයෙන් සකස් කර ගෙන තිබුණි.

කැලණිය විශ්වවිද්‍යාලය 1974 දී පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හා 1975 දී පුස්තකාල හා විඥාපන විද්‍යාව සම්බන්ධ පුස්තකාල විද්‍යාවේදි උපාධි පාඨමාලාවක් ද ආරම්භ කළ අතර මේ පාඨමාලා සියල්ල ම සඳහා සුදුසු සාහිත්‍යයක් නොවීම තදබල අවාසියක් වූයෙන් ගුරුවරයාගේ කාර්යය ඉතා වෙහෙසකාරී වන බව අධ්‍යයන කාර්යයෙහි නියුක්ත වන පිරිස තේරුම් ගෙන ඇත. එවක ශිෂ්‍යයාට කියවීමට ලැබුණේ ද දෙවන බසකින් පුස්තකාල තත්ත්වයන් පිළිබඳ තමන්ට කුළුපග නොවූ හා ඇතැම්විට වඩාත් සංකූල/අර්ථාවබෝධයට දුෂ්කර ලේඛනයන් ය. විශේෂයෙන් පශ්චාත් උපාධි පාඨමාලා වලදී පුස්තකාල විද්‍යා සංකල්ප ග්‍රහණය කර ගැනීම හෝ ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුම උද්ග්‍රහණය කිරීම අතිශයින් දුෂ්කර කටයුත්තක් විය.

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා සාහිත්‍යය ආරම්භ වී වසර පනස් නවයකට (1960-2019) ආසන්න ඉතිහාසයක් ඇත. ශ්‍රී ලංකාවේ පුස්තකාල වල නියාමක ග්‍රන්ථයක් වශයෙන් භාවිත වන හා එම විෂයෙන් රචිත ප්‍රථම සිංහල ග්‍රන්ථ වූ ''පුස්තකාල විද්‍යා ප්‍රවේශය'' (An Introduction to Library Science) රචනා කර ඇත්තේ 1960 දී ය. එය ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා සාහිත්‍යයේ ප්‍රථම කෘතිය බවට කරුණු නිරීක්ෂණය වන අවස්ථා දෙකකි. පළමුවැන්න, එහි පෙරවදනෙහි (පියදාස, 1960 පි. 7) මෙසේ සඳහන් වේ. **''මෙතෙක් පුස්තකාල සේවය ගැන හෝ පුස්තකාල විද්‍යාව ගැන හෝ සිංහල භාෂාවෙන් පොතක් ලියැවී**

**ඇත්දැයි අපි නොදනිමු. එබැවින් අමුතුම මගක යෑමේ දී විය හැකි අඩුපාඩුකම් බොහෝයි.''**

දෙවැන්න, ටී. ජී. පියදාස මහතාගේ අවමංගල්‍ය උත්සවයේ දී විද්‍යාලංකාර මුද්‍රණාලයෙන් මුද්‍රිත ''ශාස්ත්‍රාචාර්ය ටී. ජී. පියදාස උපහාරය'' නම් වූ චරිතාපදානයෙහි පිටුව 2හි මෙසේ සඳහන් වේ. ''ලංකාවේ පුස්තකාල වල නියාමක ග්‍රන්ථයක් හැටියට භාවිත වන හා එම විෂයෙන් ලියැවුන ප්‍රථම සිංහල විෂය ග්‍රන්ථය වන පුස්තකාල විද්‍යා ප්‍රවේශය ටී. ජී. අතින් බිහිවූයේ 1960 දී ය. පුස්තකාල විද්‍යා අධ්‍යාපනික කටයුතු දේශීය වශයෙන් ඇරඹීමෙහිලා පුරෝගාමියකු වූ ටී. ජී. එම කටයුතු සඳහා වෙන ම අධ්‍යයනාංශයක් කැලණිය විශ්වවිද්‍යාලයේ පිහිටුවීමෙහිලා ද මූලික විය.'' වශයෙන් වැඩිදුරටත් එහි සඳහන් වේ.

## පුස්තකාල හා විඥාපන විද්‍යා විවිධ විෂයක කෘති වර්ගීකරණය

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා සාහිත්‍යයට අදාළ කෘති මෙහි දී තෝරාගෙන ඇත්තේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනය හා සම්බන්ධ විවිධ ආයතන වල විෂය නිර්දේශ පාදක කරගනිමිනි. එමෙන්ම, මෙම විෂයයෙහි සංවර්ධනයට සෘජුව ම දායක වන කෘති පිළිබඳව ද ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු දක්වා ඇත.

ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සංවිධානය කර ඇත්තේ ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ සම්ප්‍රදායෙනි. කර්තෘක කෘති හා ආයතන මගින් ප්‍රකාශයට පත්කරන කෘති සිංහල භාෂාවේ අකාරාදි පිළිවෙළට කර්තෘ නාමය සඳහන් කර ඇත. කර්තෘ නාමය සඳහන් නොවන හෝ දර්ශනය නොවන හෝ අපහැදිලි අවස්ථා වල ග්‍රන්ථ නාමය අනුව සංවිධානය කර ඇත. ඩිවී දශම වර්ගීකරණයේ 23 වන සංස්කරණය අනුව වර්ගීකරණ සැලැස්ම සම්පාදනය කෙරිණි. 020 සිට 029 දක්වා පුස්තකාල හා විඥාපන විද්‍යාව වෙනුවෙන් වෙන්කර ඇති වර්ග අංක ද සුදුසු පරිදි පහත දැක්වෙන සේ සංස්කරණය කර අංක ගොඩනගා ඇත.

020 - පුස්තකාල විද්‍යාවේ මූලිකාංග, පුස්තකාල සම්පත්, සැලසුම් හා ප්‍රමිති
021 - පුස්තකාලය, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන වල සම්බන්ධතාව
022 - භෞතික ද්‍රව්‍ය පරිපාලනය
023 - පුද්ගල කළමනාකරණය
025 - පුස්තකාලය, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන මෙහෙයුම්
026 - නියත විෂයයන් සඳහා වෙන් වූ පුස්තකාල, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන
027 - සාමාන්‍ය පුස්තකාල, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන
028 - කියවීම සහ වෙනත් තොරතුරු මාධ්‍ය
029 - වෙනත් විෂයන්

පූර්වෝක්ත වර්ගීකරණයට අදාළ සාහිත්‍ය මූලාශ්‍ර හා ග්‍රන්ථාගත තොරතුරු ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විස්තරයට අනුව මෙහි සඳහන් කෙරේ. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සපයා ගැනීමට හැකි වූ අයුරෙන් හා විවිධ මූලාශ්‍ර වල සඳහන් වූ ග්‍රන්ථ විස්තර සාධිකාරී පසුබිමක් යටතේ සඳහන් කර ඇත.

## 020 පුස්තකාල විද්‍යාවේ මූලිකාංග, පුස්තකාල සම්පත්, සැලසුම් හා ප්‍රමිති

පුස්තකාල හා විඥාපන විද්‍යාවේ මූලිකාංග, පුස්තකාල සම්පත්, සැලසුම් හා ප්‍රමිති යන වර්ගීකරණය යටතේ අදාළ විෂය සම්බන්ධයෙන් පුළුල්ව විස්තර කෙරෙන සාහිත්‍යයන් සංවිධානය කර ඇත. සුවිශේෂ අවස්ථා අනුස්මරණය කිරීම සඳහා ප්‍රකාශිත සමරු සංග්‍රහ විශේෂයෙන් පුස්තකාල සේවාව පදනම් වී ඇති හෙයින් මේ යටතේ වර්ග කර ඇත.

**ඥාන නිධි**: කොළඹ මහජන පුස්තකාලයේ දියමන්ති උළෙල නිමිත්තෙන් නිකුත් කෙරෙන සමරු සංග්‍රහය / සංස්. ඊශ්වරී කොරයා. - කොළඹ : මහජන පුස්තකාලය, 1985 . - පි. xxv, 400

තාබ්‍රෙව්, එම්. එච්. ඩබ්ලිව්.
**පුස්තකාල විද්‍යාවේ මූලධර්ම** / එම්. එච්. ඩබ්ලිව්. තාබ්‍රෙව්. - කොළඹ : ඇම්. ඩී. ගුණසේන, 1964. - පි. xii, 176

**නුවණට මං** : 1990 දෙසැම්බර් මස 17 නව ගොඩනැගිල්ල විවෘත කිරීම නිමිත්තෙන් නිකුත් කෙරෙන සමරු සංග්‍රහය / සංස්. ඊශ්වරී කොරයා. - කොළඹ : මහජන පුස්තකාලය, 1980. - පි. xviii, 312

පියදාස, ටී. ජී.
**පුස්තකාල විද්‍යා ප්‍රවේශය** (An Introduction to Library Science) / ටී. ජී. පියදාස. - කොළඹ : [තැ. ස. නො.], මෙට්‍රෝ ප්‍රින්ටර්ස් (මුද්‍රණය), 1960.- පි. viii, 122

**පුස්තකාලය හා ජනතාව** : කොළඹ මහජන පුස්තකාලය 1925-1975 සමරු සංග්‍රහය / සංස්. ඊශ්වරී කොරයා. - කොළඹ : මහජන පුස්තකාලය, 1975. - පි. xvii, 282

**මහජන පුස්තකාල ප්‍රමිති** / සංස්. එන්. අමරසිංහ . - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1987. - පි. xix, 48. - ISBN 955-9011-06-5

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර
**පුස්තකාලය හා විශ්ව දැනුම** / ප්‍රේමචන්ද්‍ර මාගම්මන. - කොළඹ : ඇස්. ගොඩගේ, 2005. - පි. 234 . - ISBN 955-20-7940-3

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර
**විශ්ව දැනුමට මඟ පෙන්වන පුස්තකාල අත්පොත** / ප්‍රේමචන්ද්‍ර මාගම්මන. - කොළඹ : ගුණසේන, 2002

මුතුකුඩ, ජූඩ්
**පුස්තකාල හා විඥාපන විද්‍යාව** : සංකල්ප හඳුන්වාදීම, සාමාන්‍ය අවබෝධය / ජූඩ් මුතුකුඩ ; මෛත්‍රී ජයසුන්දර. - කොළඹ : ඇස්. ගොඩගේ, 2009. - පි. 112 . - ISBN 978-955-30-1197-8

විජයවර්ධන, මධුරංග ප්‍රසාද්

**පුස්තකාල විද්‍යාවේ මූලිකාංග** / මධුරංග ප්‍රසාද් විජයවර්ධන. - කොළඹ : ඇස්. ගොඩගේ, 2013. - පි. 127. - ISBN 978-955-30-4564-5

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ.

**පොතපත වත ගොත** : පුස්තකාල හා විඥාපන විද්‍යාව ආශ්‍රිත ලේඛන සංග්‍රහයකි / ඩබ්. කේ. එම්. එම්. කේ. වීරසිංහ. - කැලණිය : කර්තෘ, 2002. - පි. xvi, 140 ; ඡායාරූප. - ISBN 955-96862-2-4

**ශ්‍රී ලංකාව සඳහා පුස්තකාල ප්‍රමිති** -කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 2002. - පි. 8. - ISBN 955-9075-04-7

සමරකෝන්, අබේරත්න

**ඉගෙනුමට පුස්තකාල** / අබේරත්න සමරකෝන්. - ජා ඇල : සමන්ති පොත් ප්‍රකාශකයෝ, 2004

සෙනෙවිරත්න, සකුන්තලා

**පොත්ගුලේ වගතුග** : පුස්තකාල හා විඥාපන විද්‍යාව ආශ්‍රිත ලිපි සමුච්චයකි / සකුන්තලා සෙනෙවිරත්න. - කොළඹ : ඇස්. ගොඩගේ, 2018. - පි. 111. - ISBN 978-955-30-9317-2

Bonny, Harold V.

**Library service for Ceylon** / Harold V. Bonny. – [Colombo]: Department of Cultural Affairs, [1960] . – 46 p.

**Library Standards for Sri Lanka**. - Colombo : Sri Lanka Library Association, 1998

**Library Standards for Sri Lanka - Tamil . - Colombo : Sri Lanka Library Association, 1998**

## 020.3 පුස්තකාල විද්‍යා ශබ්දමාලා

ඉගෙනුම් හා ඉගැන්වීම් කටයුතු වල දී අදාළ විෂය හා සම්බන්ධ පාරිභාෂික වචන හා තාක්ෂණික වචන භාවිතය කරුණු මනාව අවබෝධ කර ගැනීමට පහසුවක් වේ. ඒ සඳහා සම්පාදනය කර ඇති සාධිකාරී ලේඛන වශයෙන් පාරිභාෂික ශබ්දමාලා වලට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයට අදාළ ශබ්දමාලා ද මෙහි දී විශේෂයෙන් ප්‍රයෝජනවත් වේ. ඒවා රාජ්‍ය මට්ටමෙන් මෙන් ම විෂයෙහි ප්‍රවීණයන් විසින් සම්පාදිතය. එවැනි කෘති කීපයක් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

**පුස්තකාල විද්‍යා ශබ්දමාලාව :** ඉංග්‍රීසි-සිංහල සහ සිංහල-ඉංග්‍රීසි. - කොළඹ : රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1988 . - පි. 109

ලංකාගේ, ජයසිරි
**පාරිභාෂික ශබ්ද මාලාව** : අනුක්‍රමණිකාකරණය, ඉංග්‍රීසි-සිංහල / ජයසිරි ලංකාගේ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1983

ලංකාගේ, ජයසිරි
**පාරිභාෂික ශබ්ද මාලාව** : ප්‍රලේඛන විද්‍යා, ඉංග්‍රීසි-සිංහල / ජයසිරි ලංකාගේ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1979

ලංකාගේ, ජයසිරි
**පාරිභාෂික ශබ්ද මාලාව** : වර්ගීකරණය, ඉංග්‍රීසි-සිංහල / ජයසිරි ලංකාගේ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1972

ලංකාගේ, ජයසිරි
**පාරිභාෂික ශබ්ද මාලාව** : විඥාපන විද්‍යාව, ඉංග්‍රීසි-සිංහල / ජයසිරි ලංකාගේ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1984

ලංකාගේ, ජයසිරි
**පාරිභාෂික ශබ්ද මාලාව** : සූචිකරණය, ඉංග්‍රීසි-සිංහල / ජයසිරි ලංකාගේ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1972

## 020.7 පුස්තකාල හා විඥාපන විද්‍යාඅධ්‍යාපන හා පර්යේෂණ

පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා විභාග අවශ්‍යතාවක් වන ග්‍රන්ථ නාමාවලී හා අනුක්‍රමණිකා සම්පාදනයේ දී අදාළ උපදෙස් හා විමර්ශන මූලාශ්‍ර දැක්වීමට අදාළ කරුණු පිළිබඳ තොරතුරු මේ කෘතිවල සඳහන් කෙරේ. මෙහි සඳහන් උපදෙස් පර්යේෂණ නිබන්ධ රචනයේ දී වෙනත් ආධුනිකයන්ට ද භාවිත කළ හැකිය.

අර්වින්, ඇන්

**පුස්තකාල හා විඥාපන සේවා අධ්‍යාපනය හා පුහුණුව** / ඇන් අර්වින් ; පරි. පියදාස රණසිංහ. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1988. - පි. 28. - ISBN 955-9011-39-1

රණසිංහ, ආර්. එච්. අයි. එස්.

**පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ 111 අදියර** : සාහිත්‍ය ගවේෂණය ආශ්‍රිත නිබන්ධය සැකසීම සම්බන්ධ උපදෙස් / ආර්. එච්. අයි. එස්. රණසිංහ. - සංශෝධිත සංස්කරණය. - කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 2009. - පි. vi, 26. - ISBN 955-9075-06-3

රණසිංහ, ආර්. එච්. අයි. එස්.

**සාහිත්‍ය ගවේෂණය** / ආර්. එච්. අයි. එස්. රණසිංහ. - කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 2002. - පි. v, 24. - ISBN 955-9075-06-3

## 021.7 මහජන සම්බන්ධතා

පූර්වෝක්ත කරුණ සම්බන්ධයෙන් විවිධ උප මාතෘකා යටතේ කරුණු සාකච්ඡා වුව ද අදාළ සාහිත්‍ය හා සම්බන්ධයෙන් රචනා වී ඇත්තේ එක් කෘතියක් පමණි.

ප්‍රේමදර්ශන, විජය

**පුස්තකාල හා මහජන සම්බන්ධතා** / විජය ප්‍රේමදර්ශන. - සංස්කරණ මුද්‍රණය. - නුගේගොඩ : සරසවි, 2015. - පි. 198. - ISBN 978-955-31-0348-2

## 022.9 උපකරණ, ගෘහ භාණ්ඩ

**පුස්තකාල දෘව භාණ්ඩ**. - කොළඹ :ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1994. - පි. iii, 28. - ISBN 955-9011-76-6

## 023 පුද්ගල කළමනාකරණය

පුද්ගල කළමනාකරණය යටතේ වෘත්තීය ආචාරධර්ම, පුස්තකාල වෘත්තිය, පුස්තකාලයාධිපතිත්වයෙහි ඉතිහාසය හා පෙරපර දෙදිග පුස්තකාලයාධිපතිවරුන් පිළිබඳ තොරතුරු හා මූලාශ්‍ර පිළිබඳ සාහිත්‍ය තත්ත්වය විවරණය කෙරේ. ඊට අදාළව ප්‍රකාශිත කෘති මේ යටතේ සඳහන් කර ඇත.

**Code of Professional Conduct and Ethics**. - Colombo : Sri Lanka Library Association, 1998. - පි. 11. - ISBN 955-9075-01-2

## 023.2 වෘත්තීය තනතුරු

තොම්සන්, ජේම්ස්

**පුස්තකාල බලය** : පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ නව දර්ශනයක් / ජේම්ස් තොම්සන්. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1986

තිස්ස, ආර්. ඩී. ආනන්ද

**පුස්තකාල වෘත්තිය** : පුස්තකාලයාධිපතිත්වයෙහි ඉතිහාසය, විකාශය හා නව ප්‍රවණතා / ආර්. ඩී. ආනන්ද තිස්ස. - කොළඹ : ඇස්. ගොඩගේ, 2019, පි. 263. - ISBN 978-955-30-9659-3

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ.

**ආචාර්ය එස්. ආර්. රංගනාදන් 1892-1972** : ඉන්දීය පුස්තකාලයාධිකාරිත්වයේ පියා / ඩබ්. කේ. එම්. එම්. කේ. වීරසිංහ. - කැලණිය : කර්තෘ, 1999. - පි. x, 75. - ISBN 955-96862-0-8

## 023.209 254 93 ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිකයන්

**කෘතවේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය** / සංස්. ලැගුම්දෙණියේ පියරතන හිමි ; ඩබ්ලිව්. ඒ. වීරසූරිය ; ආර්. ඩී. ආනන්ද තිස්ස. - රාගම : මහාචාර්ය පියදාස රණසිංහ පදනම, 2014. - පි. 648. - ISBN 978-955-4563-28-5

ජයසුන්දර, මෛත්‍රි

**පුස්තකාල වෘත්තිය සහ ශ්‍රී ලාංකික පුස්තකාලයාධිපතිවරු** / ජයසුන්දර මෛත්‍රි. - [තැ. ස. නො.] : [කර්තෘ], 2017. – පි. 112. - ISBN 978-955-0602-44-5

**මහාචාර්ය ජයසිරි ලංකාගේ අභිනන්දන ග්‍රන්ථය** / සංස්. මහාචාර්ය පියදාස රණසිංහ ; ආර්. ඩී. ආනන්ද තිස්ස. - කොළඹ : ඇස්. ගොඩගේ, 2012. - පි. 512. - ISBN 978-955-30-3779-4

**ප්‍රවීණ පුස්තකාලයාධිපති මහාචාර්ය වි. බ. දොරකුඹුර ගුණානුස්මරණ දෙවර්ෂ පූර්ණ උත්සව සම්භාවනා** / සංස්. පියදාස රණසිංහ. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, පි. 52.

## 025 පුස්තකාලය, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන මෙහෙයුම්

පුස්තකාලය, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන මෙහෙයුම් වර්ග පංතිය යටතේ පුස්තකාල විද්‍යාවේ පුළුල් විෂය ක්ෂේත්‍රයක් නිරාවරණය කෙරේ.

## 025.04 තොරතුරු ගබඩා කිරීමේ සහ නිරාවරණ ක්‍රම

අමරසිරි, ජී. ඩී.

**තොරතුරු සාක්ෂරතාවය** / ජී. ඩී. අමරසිරි. - මඩපාත : කර්තෘ, 2004. - පි. [x], 50. - ISBN 955-98967-0-9

අමරසිරි, ජී. ඩී.

**පුස්තකාල සංඛ්‍යාංකරණය** / ජී. ඩී. අමරසිරි. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2008. - පි. xi, 73. - ISBN 978-955-8383-45-2

## 025.1 පරිපාලනය

කුමාර, නිලන්ත ප්‍රදීප්

**විද්‍යාත්මක පුස්තකාල සේවාවක්** / නිලන්ත ප්‍රදීප් කුමාර. -කොළඹ : ඇස්. ගොඩගේ, 2006. - පි. xvi, 39. - ISBN 955-20-8549-7

ගුණසේකර, ධනපාල

**පරිගණකය හා පුස්තකාල සේවාව** / ධනපාල ගුණසේකර. - කොළඹ : ඇස්. ගොඩගේ, 1991

ගුණසේකර, ධනපාල

**පුස්තකාල සේවාවේ මූලිකාංග** / ධනපාල ගුණසේකර. - කොළඹ : ඇස්. ගොඩගේ, 1998. - පි. xii, 220. - ISBN 955-20-3101-X

ජයතිස්ස, එල්. ඒ.

**පුස්තකාල කළමනාකරණය** / ඒල්. ඒ. ජයතිස්ස. - කැලණිය : කර්තෘ, 1999. - පි. xvi, 278. - ISBN 955-96634-0-2

නීල්, කේ. ඩබ්ලිව්.

**පුස්තකාල පරිපාලනය පිළිබඳ හැඳින්වීමක්** / කේ. ඩබ්ලිව්. නීල් ; පරි. පියදාස රණසිංහ. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, 1990. - පි. [viii], 98. - ISBN 955-9011-45-6

## 025.2 ප්‍රතිග්‍රහණය හා එකතු සංවර්ධනය

මහාපත්‍ර, පී. කේ.

**පුස්තකාල එකතු කළමනාකරණය** / පී. කේ. මහාපත්‍ර, ; පරි. උදිත අලහකෝන්. - ගම්පහ : පරිවර්තක, 2003. - පි. 152. - ISBN 955-2082-10-2

## 025.3 ග්‍රන්ථ විද්‍යාත්මක විශ්ලේෂණය හා පාලනය

ජයසූරිය, සුමනා

**ග්‍රන්ථනාමාවලීකරණය** / සුමනා ජයසූරිය. - කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 2001. - පි. vi, 17.- ISBN 955-9075-03-9

## 025.31 සූචි

රණසිංහ, පියදාස

**සංක්ෂිප්ත ඇංග්ලෝ - ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය 2** : 1998 ප්‍රතිශෝධනය / පියදාස රණසිංහ. - රාගම : කර්තෘ, 2003. - පි. xii, 182. - ISBN 955-98109-0-1

## 025.32 විස්තරාත්මක සූචිකරණය

ගුණසේකර, ධනපාල

**මූලික සූචිකරණය** : ආධුනිකයන් සඳහා නියමුවකි / ධනපාල ගුණසේකර. - 3 වන සංස්කරණය. -කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2004. - පි. [viii], 244 : රූප සටහන්. - ISBN 955-8383-26-0

**ග්‍රන්ථනාම සාධිකාරී ලේඛනය** (සිංහල) : (අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා). - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2008. - පි. [vi], 57. - ISBN 978-955-8383-41-4

පද්මසිරි, ජී. ආර්.

**පුස්තකාල සූචිකරණය** / ජී. ආර්. පද්මසිරි. - කොළඹ : මෙන් ප්‍රකාශකයෝ, 2017. - පි. xiii, 175. - ISBN 978-955-7332-00-0

රත්නසේකර, ඩබ්. ඒ. ජේ. කෞශල්‍යා

**සුචිකරණ විධික්‍රම** / ඩබ්. ඒ. ජේ. කෞශල්‍යා රත්නසේකර ; එච්. සරත් නන්ද කුමාර. - ගම්පහ : කර්තෘ, 2008. - පි. vii, 74. - ISBN 978-955-50864-0-0

වනිගසූරිය, ප්‍රියංවදා

**සුචි පත්‍රිකා සම්පාදනය** / ප්‍රියංවදා වනිගසූරිය. - නිට්ටඹුව : කර්තෘ, 2018. - පි. 194. - ISBN 978-955-35526-0-0

## 025.4 විෂය විශ්ලේෂණය සහ පාලනය

තාබ්‍රෙව්, එම්. එච්. ඩබ්ලිව්.

**පුස්තකාලීය වර්ගීකරණය සහ නාමාවලී සැකසුම** / එම්. එච්. ඩබ්ලිව්. තාබ්‍රෙව්. - කොළඹ : ඇම්. ඩී. ගුණසේන, 1972. - පි. xii, 280

## 025.431 ඩිවී දශම වර්ගීකරණය

අලහකෝන්, උදිත

**ඩිවී දශම වර්ගීකරණය** : ප්‍රායෝගික ප්‍රවේශයක් / උදිත අලහකෝන්. - ගම්පහ : කර්තෘ, 2002. - පි. xii, 114. - ISBN 955-97907-0-6

ජයතිස්ස, එල්. ඒ.

**පුස්තකාල වර්ගීකරණ ප්‍රවේශය** / එල්. ඒ. ජයතිස්ස. - කොළඹ : ඇස්. ගොඩගේ, 2011. - පි. 160. - ISBN 978-955-30-3050-4

ඩිවී, මෙල්විල්

**ඩිවී දශම වර්ගීකරණය** / මෙල්විල් ඩිවී ; පරි. උදිත අලහකෝන්. - 21 සංස්කරණය. -කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2004. - පි. xvi, 320. - ISBN 955-8383-32-7

ඩිවී, මෙල්විල්

**ඩිවී දශම වර්ගීකරණය** / මෙල්විල් ඩිවී ; පරි. උදිත අලහකෝන්. - 23 සංස්කරණය. -ගම්පහ : Nine Publishing, 2017. - පි. 379. - ISBN 978-955-7688-15-2

පද්මසිරි, ජී. ආර්.

**පුස්තකාල වර්ගීකරණය** : වර්ගීකරණයේ මූලිකාංග, ඩිවී දශම හා විශ්ව දශම වර්ගීකරණ ක්‍රම පිළිබඳ හැඳින්වීමක් / ජී. ආර්. පද්මසිරි. - ඒකල : කර්තෘ, 2006. - පි. x, 238. - ISBN 955-98745-0-0

ලංකාගේ, ජයසිරි

**ඩිවී දශම වර්ගීකරණය** : පාසල් සංස්කරණය / ජයසිරි ලංකාගේ. - කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 1972. - පි. 90, උපැදිය x

ලංකාගේ, ජයසිරි

**වර්ගීකරණ ප්‍රවේශය හා ඩිවී දශම වර්ගීකරණය භාවිතය** / ජයසිරි ලංකාගේ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1989. - පි. 112. - ISBN 955-20-0148-X

**වර්ගීකරණය** (පළමු අදියර). - කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 2005. - පි. ii, 68

විජේගුණසිංහ, ඩී. ඩී.

**ඩිවී දශම වර්ගීකරණය** : 18 වන සංස්කරණය ආශ්‍රයෙනි / ඩී. ඩී. විජේගුණසිංහ. - කොළඹ : ඇස්. ගොඩගේ, 1990

සතිජා, එම්. පී.

**ඩිවී දශම වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය** / එම්. පී. සතිජා ; පරි. පියදාස රණසිංහ. - රාගම : පියදාස රණසිංහ, 2011. - පි. xvi, 300. - ISBN 978-955-98109-2-6

ஸ்ரீகாந்தலட்சுமி, அருளானந்தம்

தூயிதசமப்பகுப்புத்திட்டம் **23**ம்பதிப்பிற்கானகைநூல். (Dewey Decimal Classification : Handbook for 23rd edition) / அருளானந்தம்ஸ்ரீகாந்தலட்சுமி. - கொழும்பு : குமரன்புத்தகஇல்லம், 2017. - 310 பக்.

ஸ்ரீகாந்தலட்சுமி, அருளானந்தம்

நூலகப்பகுப்பாக்கம்நூலகர்கைநூல். (Library Classification : Librarians' Manual) / அருளானந்தம்ஸ்ரீகாந்தலட்சுமி. - யாழ்ப்பாணம் : நூலகவிழிப்புணர்வுநிறுவகம், 2005 . - 158 பக்.

**DDC and UDC** : Guide to Dewey Decimal Classification (DDC) System (23rd ed.) and Universal Decimal Classification (UDC) System / Compiled by G. R. Padmasiri ; R. D. Ananda Tissa**. -** Colombo : Sri Lanka Library Association, 2014 . – 222 p.

**Selected DDC numbers based on 20th edition**: a guide for students. - Colombo: Sri Lanka Library Association, 2004. –78, [14]p.

**025.47 විෂය සූචිකරණය**

රණසිංහ, පියදාස

**විෂය සූචිකරණය හා අනුක්‍රමණිකාකරණය** Subject Cataloguing and Indeexing / පියදාස රණසිංහ. - කැලණිය : කර්තෘ, 2007. - පි. xiii, 143.- ISBN 978-955-98109-1-9

## 025.52 විමර්ශනය හා තොරතුරු සේවා

ප්‍රේමදර්ශන, විජය

**විමර්ශන පුස්තකාල** : තොරතුරු සම්පත් හා සේවා පිළිබඳ හැඳින්වීමකි / විජය ප්‍රේමදර්ශන. - මුල්ලේරියාව : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2011. - පි. xvi, 169 : රූප සටහන්. - ISBN 978-955-652-810-7

## 025.8 එකතුව නඩත්තු කිරීම සහ සංරක්ෂණය කිරීම

විමලරත්න, කේ. ඩී. ජී.

**පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය** / කේ. ඩී. ජී. විමලරත්න. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1989. - පි. [x], 110. - ISBN 955-9011-07-3

විමලරත්න, කේ. ඩී. ජී.

**ලේඛන ප්‍රතිරූපණ විද්‍යාවේ මූලධර්ම** / කේ. ඩී. ජී. විමලරත්න. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1987. - පි. [x], 70. - ISBN 955-9011-08-1

## 025.84 සංරක්ෂණය

ධර්මසේන, ඩී. ඒ.

**සංරක්ෂණයේ එක් පැතිකඩක්** / ඩී. ඒ. ධර්මසේන. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, 2007. - පි. [viii], 31. - ISBN 978-955-8383-38-4

## 026 නියත විෂයයන් සඳහා වෙන් වූ පුස්තකාල, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන

කැම්බල්, ඩී. ජේ.

**කුඩා කාර්මික ආයතන පුස්තකාල** / ඩී. ජේ. කැම්බල්. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1986

Silva, Manil

**Special Libraries** / Manil Silva. – London: Andre Deutsch Limited, 1970. – 96 p.

## 027 සාමාන්‍ය පුස්තකාල, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන

ද සිල්වා, ගාමිණී

**ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන සේවා ව්‍යාප්තිය** / ගාමිණී ද සිල්වා. - පන්නිපිටිය : කර්තෘ, 2017. - පි. xvi, 208. - ISBN 978-955-38020-0-2

## 027.4 මහජන පුස්තකාල

අලහකෝන්, උදිත

**මහජන පුස්තකාල සේවාව** / උදිත අලහකෝන්. -කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2003

කොරයා, ඊශ්වරී

**ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල අත්පොත** / ඊශ්වරී කොරයා. - කොළඹ : කොළඹ මහජන පුස්තකාලය, 1978

නීල්, කේ. ඩබ්ලිව්.

**මහජන පුස්තකාල සේවාව** : සංවර්ධනය සඳහා ඉෆ්ලා/යුනෙස්කෝ නියමුව / කේ. ඩබ්ලිව්. නීල් ; පරි. උදිත අලහකොන්. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2005

Corea, Ishvari

**A Manual for public libraries in Sri Lanka** / Ishvari, Corea. – Colombo : Public Library, 1978. – viii, 137 p.

## 027.5 රජයේ පුස්තකාල

ප්‍රේමදර්ශන, විජය

**පළාත් මධ්‍ය පුස්තකාල සංවර්ධනය** / විජය ප්‍රේමදර්ශන. -කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2017. - පි. 220. - ISBN 978-955-7544-21-2

## 027.7 විද්‍යායතන සහ විශ්වවිද්‍යාල පුස්තකාල

Ranasinghe, R. H. I. S.

**The possibilities of resource sharing among university libraries in Sri Lanka** / R. H. I. S. Ranasinghe. – Colombo: S. Godage, 1997. – xii, 60 p. – ISBN 955-20-2596-6

## 027.8 පාසල් පුස්තකාල

අමරසිරි, උපාලි

**නව තොරතුරු මාධ්‍ය සහ පාසල් පුස්තකාල** / උපාලි අමරසිරි. - කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1985. - පි. xiii, 97

අලහකෝන්, උදිත

**පාසල් පුස්තකාල කළමනාකරණය** / උදිත අලහකෝන්. - කොළඹ : සදීපා ප්‍රකාශන, 2003. - පි. 70. - ISBN 955-8383-31-7

අලහකෝන්, උදිත

**පාසල් පුස්තකාල මාර්ගෝපදේශ** / උදිත අලහකෝන්. - ගම්පහ : Nine Publishing, 2017. - පි. 66. - ISBN 978-955-7688-12-1

ගුණසේකර, ධනපාල

**පාසැල් පුස්තකාල සේවාව** : කුඩා පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා නියමුවකි / ධනපාල ගුණසේකර. - කොළඹ : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2007. - පි. 340. - ISBN 978-955-652-357-7

**පාසල් පුස්තකාල** : ඉෆ්ලා/යුනෙස්කෝ නියමු මාලාව / ඉෆ්ලා හා යුනෙස්කෝ පරි. උදිත අලහකොන්. - කොළඹ : ඇස්. ගොඩගේ, 2006. - පි. 48. - ISBN 955-20- 8716-3

## 028 කියවීම සහ වෙනත් තොරතුරු මාධ්‍ය

නාරංගොඩ, නන්දාසීලි

**අතිරේක පොත් කියවීම සහ කියවීමේ පුරුද්ද** / නන්දාසීලි නාරංගොඩ. - [තැ. ස. නො.] : කර්තෘ, 2004. – පි. 104. - ISBN 955-96854-6-5

බාර්කර්, රොනල්ඩ්

**පොත් පවස** / රොනල්ඩ් බාර්කර් සහ රොබට් එස්කාර්පිට්. - කොළඹ : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1977. - කතුවරුන්ගේ Book Hunger නමින් ඉංග්‍රීසියෙන් ප්‍රකාශිත පොතේ සිංහල පරිවර්තනය. - පි. xii, 142

## 029. වෙනත් විෂයන්

### 029.1 ලේඛන මාධ්‍ය, මුද්‍රණ ශිල්පය හා ග්‍රන්ථ ප්‍රකාශනය

දයාරත්න, බන්දුල පී.

**පොත් ප්‍රකාශනය ව්‍යාපාරයක් වශයෙන්** / බන්දුල පී. දයාරත්න. - පන්නිපිටිය : රුවන් ප්‍රකාශන, 2006. - පි. 232. - ISBN 955-9004-04-2

පෙරේරා, නිමල් ආරියවංශ

**පොත් සැලසුම් කිරීම** : පොතක් මුද්‍රණයට අත්වැලක් / නිමල් ආරියවංශ පෙරේරා. - වැල්ලම්පිටිය : ලස්සන ප්‍රකාශකයෝ, 2006. - පි. 176.- ISBN 955-5502-26-9

විජේතුංග, නවනැලියේ

**පොතේ ගමන** / නවනැලියේ විජේතුංග. - මුල්ලේරියාව : කර්තෘ, 2012. - පි. 120.- ISBN 978-955-8672-66-9

## 029.2 ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය, ග්‍රන්ථ ප්‍රකාශනය හා අලෙවිය

හේමපාල, නුවරඑළියේ

**මුද්‍රිත සන්නිවේදනයේ සම්භවය සහ ප්‍රථම සිංහල මුද්‍රිත පොත** / නුවරඑළියේ හේමපාල. - මුල්ලේරියාව : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2005. - පි. 101. - ISBN 955-652-204-2

De silva, Harischandra

**Printing and publishing in Ceylon** / Harischandra De silva. – Colombo : Ministry of Education, 1972. – Phots, 48 p.

## 029.4 පුස්තකාල ඉතිහාසය

වීරසිංහ, එම්. කේ.

**පොත් පත් හසර** / එම්. කේ. වීරසිංහ. - කැලණිය : කර්තෘ, 2017. - පි. x, 174 . - ISBN 978-955-96862-5-5

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ.

**පුස්තකාල ඉතිහාසය** : ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයකි / ඩබ්. කේ. එම්. එම්. කේ. වීරසිංහ. - දළුගම : කර්තෘ, 2001.- පි. vi, 168. - ISBN 955-96862-1-6

## 029.454 93 ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය

රණසිංහ, ආර්. එච්. අයි. එස්.

**පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය** : ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහතුන් වන සියවස දක්වා / ආර්. එච්. අයි. එස්. රණසිංහ.- කැලණිය, කර්තෘ, 2006.- පි. xx, 260. - ISBN 955-99619-0-X

Piyadasa, T. G.

**Libraries in Sri Lanka**: Their origin and History from ancient times to the present time / T. G. Piyadasa. - Delhi: Sri Satguru Publications, 1985. - [viii], 112, [8] p. – (Studies on Sri Lanka series No. 1). – ISBN 81-7030-000-2 (මෙරට පුස්තකාල ඉතිහාසය පිළිබඳව ලියවුන ප්‍රථම පර්යේෂණ කෘතිය යි)

## ශාස්ත්‍රීය වාරික ප්‍රකාශන හා අභිනන්දන ග්‍රන්ථ

පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ඉගැන්වීමේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යනු ලබන ආයතන වල හා පුස්තකාල වෘත්තියට සෘජුවම දායක වන ආයතන, සංගම්. පුස්තකාල හා සංවිධානවල ප්‍රකාශන ද, විශේෂයෙන් කොළඹ මහජන පුස්තකාලයේ අනුස්මරණීය අවස්ථා සඳහා ප්‍රකාශිත පුස්තකාල හා ජනතාව, නුවණට මං හා ඥාන නිධි යන කෘති ද, පානදුර සද්ධර්මාකාර පිරිවෙන් ආයතනය විසින් පළකරන ලද පුස්තකාල විද්‍යාව, සද්ධර්මාකාර ශාස්ත්‍රීය ලිපි සරණිය හා ප්‍රවීණ පුස්තකාල වෘත්තිකයන් වෙනුවෙන් සම්පාදිත අභිනන්දන ග්‍රන්ථ තුනක් ද මේ යටතේ දක්වා ඇත.

## ලිපි ප්‍රකාශයට පත් වීම භාෂා මාධ්‍ය අනුව,

| වර්ෂය | ප්‍රකාශනයේ නාමය | ආයතනය | කලාප ගණන | ලිපි ගණන | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|---|---|---|
| 1962 | ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන | ශ්‍රී ලංකා පුස්තකාල සංගමය | 44 | 308 | 62 | 17 | 229 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1973 | පුස්තකාල ප්‍රවෘත්ති | ජාතික පුස්තකාලය | 107 | 428 | 201 | 51 | 176 |
| 1975 | පුස්තකාල හා ජනතාව | කොළඹ මහජන පුස්තකාලය | 01 | 39 | 08 | 01 | 30 |
| 1978 | පුස්තකාල විමසුම | කැලණිය විශ්වවිද්‍යාලය | 01 | 07 | 07 | - | - |
| 1980 | නුවණට මං | කොළඹ මහජන පුස්තකාලය | 01 | 29 | 06 | 03 | 20 |
| 1985 | ඥාන නිධි | කොළඹ මහජන පුස්තකාලය | 01 | 33 | 13 | 02 | 18 |
| 1990 | පුස්තකාල විද්‍යා | කැලණිය විශ්වවිද්‍යාලය | 08 | 147 | 141 | - | 06 |
| 1994 | සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය | සද්ධර්මාකර විද්‍යායතන පිරිවෙණ | 01 | 16 | 14 | - | 02 |
| 1995 | Journal of the University Librarians' Association | University Librarian | 27 | 167 | 07 | - | 160 |
| 2005 | ලේඛන සමුච්චය | කැලණිය විශ්වවිද්‍යාලය | 02 | 24 | 24 | - | - |
| 2005 | Sri Lankan Journal of Librarianship and Information Management | NILIS, University of Colombo | 09 | 33 | - | - | 33 |
| 2006 | විද්‍යාර්ථී | කැලණිය විශ්වවිද්‍යාලය | 02 | 24 | 14 | - | 10 |
| 2012 | මහාචාර්ය ජයසිරි ලංකාගේ අභිනන්දන ග්‍රන්ථය | එස්. ගොඩගේ සහ සහෝදරයෝ | 01 | 30 | 17 | 02 | 11 |
| 2014 | ජාතික පුස්තකාල විමර්ශන | ජාතික පුස්තකාලය | 04 | 29 | 12 | 04 | 13 |
| 2014 | මහාචාර්ය වි. බ. දොරකුඹුර ගුණානුස්මරණ දෙවර්ෂ පූර්ණ උත්සව සම්භාවනා | ජාතික පුස්තකාලය | 01 | 05 | 05 | - | - |
| 2016 | කෘතවේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය | මහාචාර්ය පියදාස රණසිංහ පදනම | 01 | 62 | 27 | - | 35 |
| **එකතුව** | | | **211** | **1381** | **558** | **80** | **743** |

## ආශ්‍රේය


අමරසිරි, උපාලි. (2014). ශ්‍රී ලංකාවේ ප්‍රථම පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව. *Sri Lanka Library Review*. වෙළුම 28. පි. 25-29.

පියදාස, ටී. ජී. (1960). **පුස්තකාල විද්‍යා ප්‍රවේශය** (An Introduction to Library Science) කොළඹ : [තැ. ස. නො.], මෙට්‍රෝ ප්‍රින්ටර්ස් (මුද්‍රණය).

පියදාස, ටී. ජී. (1985). ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිය පිළිබඳ මතක සටහන්. පුස්තකාල ප්‍රවෘත්ති : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය, ජූලි- දෙසැ. 6 (3/4), පි. 5-8.

ලංකාගේ, ජයසිරි. (1973). ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල අධ්‍යාපන සේවය (1961-1971). *Sri Lanka Library Review*. වෙළුම 4. අංක 2 පි. 122-123.


## වෙනත් ආශ්‍රේය


ලංකාගේ, ජයසිරි. (1980). ශ්‍රී ලංකාවේ පුස්තකාල ව්‍යාපාරය. නුවණට මං. කොළඹ: මහජන පුස්තකාලය පි. 23-32.

ලංකාගේ, ජයසිරි. (1975). පුස්තකාලය හා ජනතාව. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය. කොළඹ : මහජන පුස්තකාලය, පි. 67-74.

Amarasiri, M.S.U. (1980). Library Education and Training in Sri Lanka. M.A. theses, Loughborough University of Technology, U.K.

Amarasinghe, N. (1975). Libraries and Education for Librarianship in Sri Lanka on the threshold of new era. Colombo: Libraries and People, Colombo Public Library.

Block, S. C. (1959). Diploma in Librarianship (Memorandum). University of Ceylon Peradeniya.

Lankage, Jayasiri. (1971). Library Education in Ceylon. *Ceylon Library Review*. Sep. Vol. 4 No 1. 69-74 p.

The Colombo plan technical co-operation scheme (1957). Report for 1956-57 by the council for technical co-operation in South and South-East Asia: Colombo 38 p.

# ශ්‍රී ලාංකීය පාසල් පුස්තකාල සහ ගුරු පුස්තකාලයාධිපතිත්වයේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමසීමක්

පී. කේ. ජයසේකර

ශ්‍රී ලාංකික පාසල් අධ්‍යාපන ක්‍රමය තුළ පළමු වසරෙන් තම අධ්‍යාපනය ආරම්භ කරන සිසුන් උසස් පෙළින් පාසල් දිවියට සමු දෙන තෙක් වසර දහතුනකට වඩා වැඩි කාල සීමාවක් පාසල තුළ රැඳී සිටියි. එම පාසල් දිවිය තුළ සිසුන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කර ආත්ම විශ්වාසයෙන් යුතු ඵලදායී දරුවෙකු සමාජයට බිහි කිරීමට පාසල උපකාරී වේ. එමෙන්ම වර්තමානයේ විෂය නිර්දේශයට අදාළ දැනුමට අමතරව තම සිසුන්ට නව දැනුම ලබා ගැනීමට පාසල විවිධ අයුරින් දායක වන බව ද දැකිය හැකිය. පාසල් පුස්තකාල සහ පරිගණක විද්‍යාගාර යනු විශ්ව දැනුම ලබා ගැනීමට පාසල් සිසුන්ට ඇති ප්‍රධාන මූලාශ්‍ර දෙකකි. මේ අතරින් පහසුවෙන් තොරතුර ලබා ගත හැකි බව සහ ලබා ගත හැකි තොරතුරු වල නිරවද්‍යභාවය සැලකීමේ දී පාසල් පුස්තකාල ප්‍රධාන තැනක් ගනී. පාසැල් සමාජයේ සෑම සාමාජිකයෙකුටම අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය දැනුම මෙන්ම තම ජීවිත කාලය පුරා පෞද්ගලික සංවර්ධනය සඳහා භාවිතා කළ හැකි, නව දැනුම සහ නිපුණතා ලබා ගැනීමට ද පාසල් පුස්තකාලය උපකාරී වේ.

සරලව ගත හොත් පාසැල් පුස්තකාලයක් යනු, යම් පාසලක ඉගැන්වීම් පදනම් කරගෙන එම පාසලෙහි සිසුන්, ගුරු භවතුන් සහ අනෙකුත් කාර්යය මණ්ඩලයන්හි භාවිතය සඳහා අවශ්‍ය වන මුද්‍රිත හා මුද්‍රිත නොවන මාධ්‍ය රැස් කිරීම, සංවිධානය කිරීම හා ගබඩා කිරීම සිදුකරනු ලබන ස්ථානයකි. පුස්තකාල සංගම් හා ආයතන පිළිබඳ අන්තර්ජාතික ඒකාබද්ධ සංවිධානයේ (International Federation of Library Associations and Institution) නිර්වචනයට අනුව පාසල් පුස්තකාලය, පාසලක භෞතික සහ ඩිජිටල් ඉගෙනුම් අවකාශය වන අතර පාසල් සිසුන්ගේ, තොරතුරු භාවිතයෙන් අවබෝධය ලබා ගැනීම සහ පෞද්ගලික, සමාජීය සහ සංස්කෘතික වර්ධනයට දායක වන කියවීම, විමර්ශනය, පර්යේෂණ,

චින්තනය, පරිකල්පනය සහ නිර්මාණශීලීත්වය වර්ධනය කරන කේන්ද්‍රය වේ (IFLA School Libraries Section Standing Committee, 2015).

වර්තමාන පාසල් අධ්‍යාපන ක්‍රමය, ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුස්තකාල භාවිතය දිරිමත් කරයි. පාසල් පද්ධති තුළ, අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා පාසල් පුස්තකාල වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමෙන්ම පාසල් පුස්තකාල, පොත් කියවීම සඳහා හුරු වූ සමාජයක් නිර්මාණය කිරීම සඳහා මූලික අඩිතාලම දමන ස්ථානය ලෙසද සැලකිය හැකිය. එබැවින් පාසල් පද්ධතිය තුළ පාසල් පුස්තකාලයට ඇති ස්ථානය සුවිශේෂී වේ. එම සුවිශේෂීත්වය හේතුවෙන් වර්තමානයේ පාසල් පුස්තකාල "පුස්තකාල සහ තොරතුරු සම්පත් මධ්‍යස්ථාන" ලෙසද හැඳින්වීම සිදුකරයි.

තොරතුරු සාක්ෂරතාවයෙන් පරිපූර්ණ සිසුන් බිහි කිරීමට උරදෙන පාසල් පුස්තකාලයන්හි පැවැත්ම එහි කාර්යක්ෂම හා ඵලදායී සේවා මත රඳා පවතී. කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් ලබාදීම සඳහා ඕනෑම පුස්තකාලයකට, පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ දැනුමක් ඇති පුස්තකාලයාධිපතිවරයෙකු සිටීම, පුස්තකාල සහායකවරුන් සිටීම, පුස්තකාලය පවත්වාගෙන යාමට සුදුසු ස්ථානයක් තිබීම, පුස්තකාලයෙහි විධිමත් එකතුවක් තිබීම, පුස්තකාල ද්‍රව්‍ය සංසරණය සඳහා විධිමත් ක්‍රම තිබීම සහ විදුහල්පතිතුමා ඇතුළු පාසලෙහි පරිපාලන නිලධාරීන්ගේ නොමද සහය ලැබීම වැනි බොහෝ කරුණු බලපායි.

එබැවින්, මෙම ලිපියේ අරමුණු වනුයේ ;

1. පාසල් පුස්තකාලවල කාර්යභාරය අවබෝධ කර ගැනීම
2. ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලවල වර්තමාන තත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
3. ශ්‍රී ලංකාවේ ගුරු පුස්තකාලයාධිපතිත්වයේ වර්තමාන තත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සහ
4. ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සහ ගුරු පුස්තකාලයාධිපතිත්වය දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර පිළිබඳ සාකච්ඡා කිරීම වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් පාසල් වර්ග කිහිපයක් දැකිය හැකි වේ. එනම්, රාජ්‍ය පාසල්, පෞද්ගලික පාසල්, පිරිවෙන් සහ ජාත්‍යන්තර පාසල් වේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යංශය මඟින් පාලනය වන පාසල් රාජ්‍ය පාසල් වේ. වර්තමානය වන විට රජය විසින් ජාතික අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීමට වැඩි ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. එබැවින් මෙම ලිපියේ අවධානය රාජ්‍ය පාසල්වල ඇති පුස්තකාල වෙත යොමු වේ.

## පාසල් පුස්තකාලයන්හි කාර්යය භාරය

පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ අන්තර් ජාතික සංගමයට (International Association of School Librarianship) අනුව පාසල් පුස්තකාලයන් මඟින් සපයන ප්‍රධාන කාර්යය භාරයන් පහත පරිදි වේ (International Association of School Librarianship, 1993).

1. **තොරතුරු සේවාවන්** - විශ්වාසනීය තොරතුරු ලබා දීම, තොරතුරු සඳහා කඩිනම් ප්‍රවේශය, තොරතුරු සමුද්ධරණය හා හුවමාරුව සැපයීම; පාසැල් පුස්තකාලය, ප්‍රාදේශීය සහ ජාතික තොරතුරු ජාල වල කොටසක් විය යුතුය.
2. **අධ්‍යාපනික සේවාවන්** - දිවි ඇති තෙක් අධ්‍යාපනය (Life Long Learning) පවත්වා ගැනීමට අවශ්‍ය පහසුකම් සහ වාතාවරණය සැපයීම ; විෂයානුබද්ධ ඉගැන්වීම් සමඟ අනුගත වී, තොරතුරු සොයාගත හැකි ස්ථාන, සුදුසු තොරතුරු තෝරා ගැනීම සහ භාවිතය වැනි තොරතුරු කුසලතා වර්ධනයට මඟ පෙන්වීම; බුද්ධිමය නිදහස (Intellectual Freedom) ප්‍රවර්ධනය කිරීම.
3. **සංස්කෘතිකමය සේවාවන්** - සෞන්දර්යාත්මක අත්දැකීම් භාවිතයෙන්, කලාව රසවිදීමට මඟ පෙන්වීමෙන් සහ නිර්මාණශීලීත්වය දිරිගැන්වීමෙන් ජීවිතයේ ගුණාත්මකභාවය (Quality of Life) වැඩි දියුණු කිරීම සහ ධනාත්මක මානව සබඳතා වර්ධනය කිරීම.
4. **විනෝදාත්මක සේවාවන්** - සමබර සහ සාරවත් ජීවිතයක් පවත්වා ගැනීමට සහ වැඩි දියුණු කරගැනීම සඳහා විවේක කාලය (Leisure

Time) අර්ථවත් ලෙස ගත කිරීමට අවශ්‍ය විනෝදාත්මක තොරතුරු, ද්‍රව්‍ය සහ වැඩසටහන් සැපයීම සහ දිරිමත් කිරීම.

ඉහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා, පාසල් පුස්තකාල පහත ක්‍රියා මාර්ග නොපැකිලිව අනුගමනය කළ යුතුවේ.

1. පාසලේ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය එකතු සංවර්ධනය කිරීම.
2. සතුට සහ විනෝදය සඳහා කියවීමට අවශ්‍ය එකතු සංවර්ධනය කිරීම.
3. දරුවන්ට ස්වාධීනව ඉගෙනගත හැකිවන පරිදි තොරතුරු සාක්ෂර කුසලතා ඉගැන්වීම.
4. පාසල් තුළ "කියවීම් සංස්කෘතියක්" නිර්මාණය කිරීමට උපකාර කිරීම.
5. පාසල් සිසුන්ගේ විනෝදය සඳහා කියවීම (Leisure Reading) ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය උත්සව/ වැඩමුළු සංවිධානය කිරීම.

## ශ්‍රී ලාංකික පාසල් පුස්තකාලයන්හි වර්තමාන තත්ත්වය

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල පිළිබඳව විවිධ පර්යේෂකයින් විසින් විවිධ අරමුණු පෙරදැරි කරගෙන පර්යේෂණ සිදුකර ඇත. නමුත් දැනට ප්‍රකාශ වී ඇති පර්යේෂණ පත්‍රිකා ප්‍රමාණය සැලකීමේ දී පාසල් පුස්තකාල පිළිබඳ පර්යේෂණ, පර්යේෂකයින් අතර එතරම් ප්‍රචලිත මාතෘකාවක් නොවන බව පෙනී යයි. දැනට ප්‍රකාශවී ඇති පර්යේෂණ පත්‍රිකා අනුව, වර්තමාන තත්ත්වය සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ පාසල් පුස්තකාල වලට තවමත් අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව පෙනීයයි.

## යටිතල පහසුකම්

ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබීම ගුණාත්මක පුස්තකාල සේවාවන් සැපයීමට ප්‍රධාන වශයෙන් බලපායි. කුරුප්පුආරච්චි (2009) විසින් ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සංවර්ධනයේ තත්වය පිළිබඳ සිදුකරනු ලැබූ පර්යේෂණයකට අනුව 41% ක් පාසල් සතුව ස්ථිර පුස්තකාල පැවති අතර 20% ක් පාසල් සතුව ස්ථිර නොවන පුස්තකාල පැවතීය

(Kuruppaurachchi, 2009). මෙහි දී අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්මත නිර්ණායකයන්ට අනුව ප්‍රමාණවත් ඉඩකඩ සහිත වෙනම ස්ථානයක පිහිටි පුස්තකාල, ස්ථිර පුස්තකාල ලෙස හඳුන්වා ඇති අතර කාමරයක් තුළ කුඩා විවෘත හෝ ආවරණය කරන ලද පොත් රාක්ක තුළ තබා ඇති පොත් සුලු ප්‍රමාණයක් ඇති පුස්තකාල ස්ථිර නොවන පුස්තකාල ලෙස හඳුන්වා ඇත (Kuruppaurachchi, 2009).

අකුරැස්ස අධ්‍යාපන කලාපයේ පාසල් පුස්තකාල පදනම් කරගනිමින් ජයසේකර සහ සෙනෙවිරත්න (2017) විසින් සිදුකරන ලද අධ්‍යයනයට අනුව පාසල් පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටීම පිළිබඳව සැලකීමේ දී අකුරැස්ස අධ්‍යාපන කලාපයේ 47.22% පාසල් පුස්තකාල පන්ති කාමර ඇති ගොඩනැගිල්ලේම පිහිටි යාබද කාමරයක ස්ථානගත කර ඇති අතර 44.44% පාසල් සතුව වෙන්ව පිහිටි පුස්තකාල ගොඩනැගිලි ඇත (Jayasekara & Senevirathna, 2017). රත්නපුර සහ බලංගොඩ අධ්‍යාපන කලාපයන් හි පාසල් පුස්තකාල පිළිබඳව සිදුකරන ලද පර්යේෂණයකට අනුව 24% පාසල් සතුව වෙන්ව පිහිටි පුස්තකාල ගොඩනැගිලි ඇති අතර බහුතරයක් පාසල් (63%) පරිපාලන ගොඩනැගිල්ලට හෝ පන්ති කාමර ආසන්නයේ ඇති වෙන්ව පිහිටි කාමරයක් පුස්තකාලය ලෙස භාවිත කරයි (Wickramanayake, 2016).

මීට අමතරව පුස්තකාලය සඳහා අවශ්‍ය කරන මේස, පුටු සහ අනෙකුත් දැව භාණ්ඩ වල හිඟතාවයක් ද පවතී (Wickramanayake, 2016). එමෙන්ම අති බහුතරයක් පාසල් පුස්තකාලයන්හි පරිගණක පහසුකම් (85%) සහ අන්තර්ජාල පහසුකම්වල ද (90%) හිඟතාවයක් පවතී (Wickramanayake, 2016).

## පුස්තකාල එකතුන් සහ පුස්තකාල ද්‍රව්‍ය ගබඩා කිරීම

වර්තමානයේ පාසල් පුස්තකාල සතුව ඇති ග්‍රන්ථ එකතුන් වල තත්වය ද සතුටුදායක මට්ටමක නැත. රත්නපුර සහ බලංගොඩ අධ්‍යාපන කලාපයන්හි බහුතරයක් පාසල් සතුව (75%) ඇත්තේ අයිතම දහසකට

(1000) අඩු එකතුවකි (Wickramanayake, 2016). අකුරැස්ස අධ්‍යාපන කලාපයේ මෙම අගය 42% පමණ වේ (Jayasekara et al., 2018).

පාසල් පුස්තකාල තුළ පුස්තකාල ද්‍රව්‍ය ගබඩා කිරීම සැලකීමේ දී අකුරැස්ස අධ්‍යාපන කලාපයේ පාසල් පුස්තකාල වලින් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් (36.11%) පුස්තකාල ද්‍රව්‍ය විවෘත පොත් රාක්ක තුළ තබා ඇති අතර 25% පාසල් පුස්තකාල, වසා ඇති අල්මාරි තුළ පොත් ගබඩාකර ඇත (Jayasekara & Senevirathna, 2017a). එමෙන්ම 38.89% පාසල් පුස්තකාල පොත් ගබඩා කිරීමට ඉහත ක්‍රම දෙකෙහි සංයෝජනයන් භාවිත කරයි (Jayasekara & Senevirathna, 2017).

## පුස්තකාල ද්‍රව්‍ය වර්ගීකරණය සහ සූචිකරණය

දැනුම හා තොරතුරු සඳහා පිවිසුම් දොරටුවක් ලෙස ක්‍රියා කරන බැවින් පුස්තකාල තොරතුරු ලබා ගැනීම, සංවිධානය, බෙදා හැරීම හා සංරක්ෂණය වැනි කටයුතු ඉටු කළ යුතුය. මෙම සියලු කාර්යයන් අතර තොරතුරු මූලාශ්‍ර සංවිධානය කිරීම පුස්තකාලය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයයි. වර්ගීකරණය සහ සූචිකරණය යනු තොරතුරු මූලාශ්‍ර සංවිධානය කිරීම සඳහා පුස්තකාල විද්‍යා විෂයෙහි භාවිත කරන ප්‍රධාන සංකල්ප දෙකකි. වර්ගීකරණය සහ සූචිකරණය මගින් පාඨකයාට ප්‍රමාදයකින් තොරව තම තොරතුරු මූලාශ්‍ර වෙත පිවිසීමට අවස්ථාව සලසයි.

සරලව ගතහොත් වර්ගීකරණය යනු පොදු ලක්ෂණ හා සමානකම් අනුව පොත්පත් වර්ග කිරීම හෝ සංවිධානය කිරීමයි (Corea, Ojuando & Faruqi, 1993). ලෝකය පුරා විවිධ පුස්තකාල වර්ගීකරණය සඳහා විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරයි. පාසල් පුස්තකා වල භාවිතා වන වර්ගීකරණ ක්‍රම හඳුනාගැනීම සඳහා අකුරැස්ස අධ්‍යාපන කලාපයේ පාසල් පදනම් කරගනිමින් සිදුකරන ලද පර්යේෂණයකට අනුව ඩිවි දශම වර්ගීකරණය පාසල් පුස්තකාලයන් හි වඩාත්ම ජනප්‍රිය වර්ගීකරණ ක්‍රමය (36.1%) ලෙස හඳුනාගෙන ඇත (Senevirathna & Jayasekara, 2017b). මීට අමතරව පාසල් පුස්තකාල විසින් වර්ගීකරණය සඳහා වර්ණ කේත

ක්‍රමයක් (22.2%), ඩිවි දශම වර්ගීකරණය සමඟ වර්ණ කේත ක්‍රමයක් (13.9%) සහ තමන් විසින් සකස් කරගන්නා ලද ක්‍රමයක් (16.7%) භාවිත කරනු ලබයි (Senevirathna & Jayasekara, 2017b).

පුස්තකාල සූචියක් යනු කිසියම් පුස්තකාලයක හෝ පුස්තකාල සමූහයක ඇති සියලුම පුස්තකාල ද්‍රව්‍යයන්හි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අන්තර්ගත ලේඛනයකි (New World Encyclopedia, 2014). එමඟින් පරිශීලකයින්ට පුස්තකාලයේ ඇති සම්පත් පිහිටා ඇති ස්ථාන, ග්‍රන්ථ නාමය, කතෘ නාමය, සහ යොමු පද ආදිය භාවිත කර සොයාගත හැක. පාසල් පුස්තකාලයන් හි පුස්තකාල ද්‍රව්‍ය සූචිකරණය පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයකට අනුව අකුරුැස්ස කලාපයේ අති බහුතරයක් (95%) පාසල් පුස්තකාල සතුව පුස්තකාල සූචියක් නොමැති බව හඳුනාගෙන ඇත (Jayasekara et al., 2018). පුස්තකාලය සතුව සූචියක් නොමැති වීම පිළිබඳව තව දුරටත් සිදුකරන ලද අධ්‍යයනයකට අනුව පෙනීයන්නේ සම්පත් වල හිඟකම, සූචිකරණය පිළිබඳ අවබෝධයක් සහ දැනුමක් නොමැතිකම, ඒ සඳහා අවශ්‍ය කාලය සහ කාර්යමණ්ඩල නොමැතිකම හේතුවන බවයි (Jayasekara et al., 2018).

## ශ්‍රී ලාංකීය ගුරු පුස්තකාලයාධිපතීත්වය

විදුහල්පතිතුමාගේ පරිපාලනය යටතේ පාසල් පුස්තකාලයන්හි භාරකාරත්වය දරණ පුද්ගලයා "ගුරු පුස්තකාලයාධිපති" නම් වේ. යාපා විසින් පලකරන ලද පර්යේෂණ පත්‍රිකාවක් අනුව ශ්‍රී ලාංකික පාසල් පද්ධතියේ, පාසල් පුස්තකාලය භාරව සිටින ඕනෑම පුද්ගලයෙකු ගුරු පුස්තකාලයාධිපතිවරයා ලෙස හඳුන්වනු ලබන අතර එම පුද්ගලයා සුදුසුකම් ලත් පුස්තකාලයාධිපතිවරයෙක්, ගුරුවරයෙක්, ලිපිකරුවෙක් හෝ ස්වේච්ඡා සේවකයෙක් විය හැකිය (Yapa, 1998).

පාසැල් පුස්තකාලයක් කළමනාකරණය කිරීම සඳහා ගුරු පුස්තකාලයාධිපතිවරයා පුස්තකාල සහ විඥාපන විද්‍යාව ආශ්‍රිත දැනුම, කුසලතා සහ පුහුණුව සහිත පුද්ගලයකු විය යුතුය. පුස්තකාල ආශ්‍රිත රාජකාරි වන පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය, වර්ගීකරණය, සූචිකරණය, පුස්තකාල ද්‍රව්‍ය සංවිධානය සහ සංසරණය වැනි කාර්යයන් නිසි දැනුමක්

සහ පුහුණුවක් නොමැතිව හොඳින් සිදුකිරීම අපහසු කර්තව්‍යයකි. නමුත්, ශ්‍රී ලංකාවේ අති බහුතරයක් පාසල් පුස්තකාලයාධිපතිවරුන් පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ වෘත්තීය සුදුසුකම් නොමැති පිරිසක් වීම කණගාටුවට කරුණකි (Senevirathna & Jayasekara, 2017a: Wickramanayake, 2016). රත්නපුර සහ බලංගොඩ අධ්‍යාපන කලාපයන්හි 75% කට වඩා වැඩි ගුරු පුස්තකාලයාධිපතිවරුන් ප්‍රමාණයක් ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ වෘත්තීය සුදුසුකම් සපුරා නැත (Wickramanayake, 2016). අකුරුස්ස කලාපයේ එම අගය 89% ක් වේ (Senevirathna & Jayasekara, 2017a). ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලයන්හි වර්තමාන තත්වය සැලකීමේ දී බොහෝමයක් පාසල් පුස්තකාල සතුව සිටිනුයේ ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු නොව පුස්තකාල ගුරුවරයෙකු බව මනා සේ පෙනීයන කරුණක් වේ.

පාසල් පුස්තකාලයන්හි නිසි ලෙස ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා සහ පුස්තකාල සම්බන්ධ කාර්යයන් ඉටුකිරීමට ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට නිදහස තිබිය යුතුය. දැනට සිදුකරන ලද පර්යේෂණය වලින් හෙළිදරව් වී ඇති පරිදි, ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට පුස්තකාලය හා සබැඳි කාර්යයන් කිරීමට අවැසි ප්‍රමාණවත් නිදහසක් නොමැත (Jayasekara & Senevirathna, 2017b ; Wickramanayake, 2016). ජයසේකර සහ සෙනෙවිරත්න විසින් සිදුකරන ලද අධ්‍යයනයට අනුව අකුරැස්ස අධ්‍යාපන කලාපයේ අති බහුතරයක් ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට (80.6%) පුස්තකාලයෙහි කටයුතු සිදුකරන අතරතුරම පාසලෙහි විෂය නිර්දේශයට අදාළ විවිධ විෂයන් උගන්වමින් පන්ති කාමරයන්හි රැඳී සිටීමට ද සිදුවේ (Jayasekara & Senevirathna, 2017b). රත්නපුර සහ බලංගොඩ අධ්‍යාපන කලාප පාදක කරගනිමින් වික්‍රමනායක (2016) විසින් සිදුකරනු ලැබූ පර්යේෂණය ද මෙම තොරතුරු තව දුරටත් සනාථ කරයි. එම පර්යේෂණයට අනුව රත්නපුර සහ බලංගොඩ අධ්‍යාපන කලාපයන් හි 70% කට ආසන්න ගුරු පුස්තකාලයාධිපතිවරුන් හට පාසලෙහි ඉගැන්වීම් කටයුතු සිදු කරන අතරම පාසල් පුස්තකාලයේ ද සේවය කිරීමට සිදුවී ඇත. ඉගැන්වීම් කටයුතු වල නිරත වන අතරතුර ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට පුස්තකාලය සම්බන්ධ කාර්යයන් ඵලදායීව ඉටු කළ නොහැකිය. මේ නිසා,

ඔවුන්ගේ ඉගැන්වීම් පැය පුස්තකාලය විවෘතව තබන වේලාවන් සඳහා සෘජුව බලපායි. පුස්තකාලය පොත් ගබඩාවක් නොවන අතර එය ශිෂ්‍යයින්ට භාවිත කිරීමට පාසැල් කාලය තුළ දී හෝ අවම වශයෙන් පුස්තකාලය විවෘත තැබිය යුතුය.

## වැඩි දියුණු විය යුතු අයුරු

ශිෂ්‍යයන්ට සහ ගුරුවරුන්ට සම සේ ප්‍රතිලාභ ලබාගත හැකි ශක්තිමත් පුස්තකාලයක් ගුණාත්මක අධ්‍යාපනයේ ප්‍රධාන සංරචකයක් ලෙස හඳුනාගත යුතුය. නමුත්, වර්තමාන තත්වය සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ පාසල් පුස්තකාල වලට තවමත් අභියෝග වලට මුහුණ දීමට සිදුවන බව පෙනීයයි. අධ්‍යාපන අමාත්‍යංශය මඟින් පාලනය වන බැවින් සමස්ත පාසල් පද්ධතියේ පුස්තකාලයන් හි තත්වය වර්ධනය කිරීම රජය සතු වගකීමකි. එමෙන්ම තම පාසල සතුව දැනට පවතින පාසල් පුස්තකාලය සුදුසු ලෙස නඩත්තු කිරීම, එකතු සංවර්ධනය කිරීම සහ විධිමත් සේවාවක් සැපයීම යනාදී කාරණා සම්බන්ධයෙන් පාසලෙහි විදුහල්පති, ගුරුවරු, පාලක මණ්ඩලය සහ ගුරු පුස්තකාලයාධිපතිවරයා හෝ පුස්තකාලය භාරව සිටින ගුරුවරයා සතුව ද විශාල කාර්යය භාරයක් ඇත.

ඉහත අධ්‍යයන ප්‍රතිඵල අනුව පෙනී යන්නේ ප්‍රමාණාත්මක යටිතල පහසුකම් නොමැතිකම පාසල් පුස්තකාල මුහුණදෙන ප්‍රධාන අභියෝගයක් බවයි (Jayasekara & Senevirathna, 2017a ; Kuruppaurachchi, 2009; Wickramanayake, 2016). පුස්තකාලයක් තුළ සිසුන්ට තම අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා නිශ්ශබ්ද පරිසරයක් පැවතිය යුතුය. නමුත් ඉහත පර්යේෂණ ප්‍රතිඵල වලට අනුව බහුතරයක් පාසල් පුස්තකාල, පන්ති කාමර ඇති ගොඩනැගිල්ලේම පිහිටි යාබද කාමරයක ස්ථානගත කර ඇත (Jayasekara & Senevirathna, 2017a; Wickramanayake, 2016). පන්ති කාමරවල ඇති ඝෝෂාකාරී තත්ත්වයන් සමඟ පුස්තකාලය තුළ නිශ්ශබ්ද පරිසරයක් පවත්වා ගැනීම අසීරු කටයුත්තකි. එබැවින් ප්‍රමාණවත් ඉඩකඩ සහිත ඝෝෂා රහිත ස්ථානයක වෙනම පිහිටි පුස්තකාල ගොඩනැගිල්ලක අවශ්‍යතාව බහුතරයක් ශ්‍රී ලාංකික පාසල් සතුව පවතී.

වර්තමානයේ පාසල් පුස්තකාල තුළ වර්ගීකරණය සහ සූචිකරණය යන තොරතුරු මූලාශ්‍ර සංවිධානය කිරීම සඳහා පුස්තකාල විද්‍යා විෂයෙහි භාවිත කරන ප්‍රධාන ක්‍රියාවලීන් දෙක ද නිවැරදි අයුරින් සිදු නොවන බව පර්යේෂණවලින් ඔප්පු වී ඇත (Senevirathna & Jayasekara, 2017b). පාසල් පුස්තකාල සඳහා වර්ගීකරණ පද්ධතියක් තෝරා ගැනීමේ දී පුස්තකාල එකතුවේ ප්‍රමාණය, ස්වභාවය සහ සංයුතිය මෙන්ම පුස්තකාලය භාවිත කරන පාඨක ප්‍රජාව පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය. එබැවින් ඉහත කරුණු සලකා බලා, ශ්‍රී ලාංකීය පාසල් පුස්තකාල සඳහා සුදුසු සරල වර්ගීකරණ සහ සූචිකරණ ක්‍රමවේදයන් සැකසීම වඩාත් සුදුසු වේ. බහුතරයක් පාසල් පුස්තකාලයන් හි සුදුසුකම් ලත් ගුරු පුස්තකාලයාධිපතිවරුන් නොමැති බැවින් (Senevirathna & Jayasekara, 2017a) හඳුන්වා දෙනු ලබන වර්ගීකරණ සහ සූචිකරණ ක්‍රමවේදයන්, පුස්තකාල විද්‍යා විෂය පිළිබඳ පූර්ව දැනුමක් නොමැති අයකුට පවා පහසුවෙන් අවබෝධ කරගත හැකි විය යුතුය. එමෙන්ම ගුරු පුස්තකාලයාධිපතිවරුන්ගේ වර්ගීකරණ සහ සූචිකරණ දැනුම වර්ධනය කිරීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක් ද වේ. මෙවන් කාර්යයන් සඳහා පුස්තකාල සහ විඥාපන විද්‍යා විෂයෙහි ප්‍රායෝගික දැනුම ඇති ප්‍රවීණයන්ගේ සහය ද ලබා ගත යුතුවේ.

ඉහත කරුණු මඟින් පෙනීයන පරිදි වර්තමානයේ සුදුසුකම් ලත් ගුරු පුස්තකාලයාධිපතිවරයෙකුගෙන් සමන්විත පාසැල් පුස්තකාල සොයා ගැනීමට ඉතා අපහසු කරුණකි (Senevirathna & Jayasekara, 2017a: Wickramanayake, 2016: Yapa, 1998). එබැවින් පුස්තකාලයක් කාර්යක්ෂමව හා ඵලදායීව පරිපාලනය කිරීමට ගුරු පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලය භාරව සිටින ගුරුවරයාට හෝ ස්වේච්ඡා සේවකයන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම සිදුකල යුත්තකි. ශ්‍රී ලංකාවේ පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ පාඨමාලා පවත්වන ආයතන කිහිපයක් ඇත. ඒ අතර කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල සහ විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (NILIS), සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA) ප්‍රධාන තැනක් ගනී. මෙම ආයතනයන්ට අමතරව විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය (ULA) සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය

විශ්වවිද්‍යාල විසින් සංවිධානය කරන වැඩමුළු, පුහුණු වැඩසටහන් සහ ව්‍යාප්ති සේවා මඟින් ද පාසල් පුස්තකාල කළමණාකරණය පිළිබඳ දැනුම ලබා ගතහැක. උදාහරණයක් ලෙස රුහුණ විශ්වවිද්‍යාලය විසින් වාර්ෂිකව අකුරුැස්ස අධ්‍යාපන කලාපයේ ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා පවත්වන වැඩමුළුව දැක්විය හැක.

පාසල් පුස්තකාල කළමනාකරණය පිළිබඳ විදුහල්පතිතුමා ඇතුළු පාසලෙහි පරිපාලන නිලධාරීන්ගේ අනවධානය, අනවබෝධය සහ විධිමත් ගුරු පුස්තකාලයාධිපති සේවාවක් නොමැති වීම ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල පුස්තාකලයන් හි අසාර්ථකත්වය සඳහා හේතු වේ. මීට අමතරව, පාසැල් පුස්තකාලයන්හි නිසි ප්‍රමිතියෙන් යුතු සේවාවක් සැපයීම සඳහා ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට පුස්තකාල සම්බන්ධ කාර්යයන් ඉටුකිරීමට වෘත්තිය නිදහස තිබිය යුතුය. එමෙන්ම, ගුරු පුස්තකාලයාධිපතිවරුන් ලෙස රාජකාරි ආවරණය කිරීම සඳහා තාවකාලිකව පාසලේ සිටින ගුරුවරුන් පත්කිරීම වෙනුවට, පුස්තකාල සහ විඥාපන විද්‍යා විෂය හදාරා ඇති සුදුසු පුද්ගලයින් ගුරු පුස්තකාලයාධිපතිවරුන් ලෙස බඳවා ගැනීමට රජය ක්‍රියා කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල පිළිබඳව දැනට සිදුකර ඇති පර්යේෂණ ඉතා සීමිතය. එම පර්යේෂණ ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලයන් හි යථාර්ථය නිරූපණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ. එබැවින් පුස්තකාල සහ විඥාපන විද්‍යා විෂයෙහි පර්යේෂණ කටයුතුවල නිරත වන පර්යේෂකයින් මෙම විෂය ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ.

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි. එබැවින් ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල වල ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම සඳහා පාසල් පුස්තකාල සඳහා ප්‍රමාණවත් සම්පත් ලබා දීම සහ ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට අවශ්‍ය පුහුණු සහ පහසුකම් සැපයීමේ වගකීම ඔවුන්ට ඇත. එමෙන්ම ගුරු පුස්තකාලයාධිපති වෘත්තිය නගා සිටුවීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම ද ඔවුන් සතු වගකීමකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


Corea, I., Ojuando, G. D., & Faruqi, K. K. (Eds.). (1993). Classification. In *Encyclopedia of Information and Library Science Vol-2*. New Delhi: Akashdeep Publishing House.

IFLA School Libraries Section Standing Committee. (2015). *IFLA School Library Guidelines*.

International Association of School Librarianship. (1993). IASL Policy Statement on School Libraries. Retrieved January 25, 2019, from https://www.iasl-online.org/about/organization/sl_policy.html

Jayasekara, P. K., & Senevirathna, R. A. P. S. (2017a). Availability of infrastructure facilities in school libraries in Sri Lanka. *Proceedings of the UGC Sponsored International Conference on Knowledge Resources and Library Technologies*. India: Department of Library and Information Sciences. Bharathidasan University.

Jayasekara, P. K., & Senevirathna, R. A. P. S. (2017b). Nature of duties of teacher librarians in government school libraries. *Proceedings of 10th Annumal Research Conference*, 187. The Royal Asiatic Siciety of Sri Lanka.

Jayasekara, P. K., Senevirathna, R. A. P. S., & Karunaratne, A. (2018). Availability of library catalogues in school libraries. *Proceedings of National Library Research Symposium 2018*. Colombo: National Library and Documentation Services Board.

Kuruppaurachchi, S. (2009). Status of School Library Development in Sri Lanka. *Sri Lankan Journal of Librarianship and Information Management*, *1*(1), 25–30. https://doi.org/10.4038/sllim.v1i1.429

New World Encyclopedia. (2014). Library catalog. Retrieved June 26, 2018, from http://www.newworldencyclopedia.org/entry/Library_catalog

Senevirathna, R. A. P. S., & Jayasekara, P. K. (2017a). Exploring the professional qualification of teacher librarians in Akuressa educational zone. *Ruhuna University International Conference on Humanities and Social Sciences – 2017*, 204. Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka.

Senevirathna, R. A. P. S., & Jayasekara, P. K. (2017b). Library Classification Systems Used by School Libraries: With Special Reference to School. *Proceedings of the UGC Sponsored International Conference on Knowledge Resources and Library Technologies*. India: Department of Library and Information Sciences. Bharathidasan University.

Wickramanayake, L. (2016). Where to from here? Current status of school libraries in Sri Lanka: a survey. *New Library World*, *117*(3–4), 214–228. https://doi.org/10.1108/NLW-10-2015-0073

Yapa, G. (1998). School Libraries in Sri Lanka: A State-of-the-Art Report. *School Libraries Worldwide*, *4*(2), 1–14.

# යහපාලන රාජ්‍ය සංකල්පය (Good Governance) අර්ථාන්විත කිරීමෙහි ලා තොරතුරු දැන ගැනීමේ අයිතියෙහි සුවිශේෂීත්වය සහ එහි ප්‍රායෝගිකත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක්

ආචාර්ය සී. සී. ජයසුන්දර, අයි. කේ. ඩී. දිලිනි බෝධිනායක

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සිදු කර ඇති විග්‍රහයට අනුව, තොරතුරු දැන ගැනීමේ අයිතිය යනු යහපාලන රාජ්‍ය සංකල්පය තුළ දැක්වෙන ප්‍රධාන සංකල්ප අටෙන් එකකි. නීතියේ ආධිපත්‍යය, විනිවිදභාවය, ප්‍රතිචාර දැක්වීම, ඒකමතික බව, යුක්තිසහගත බව සහ සාධාරණත්වය, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව, වගවීම සහ සහභාගිත්වය යනු යහපාලන රාජ්‍ය සංකල්පය සැදුම්ලත් මූලික සංකල්ප වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තහවුරු කර ඇත. එකී මූලිකාංග අට යටතෙහි දැක්වෙන "විනිවිද භාවය" යන සංකල්පය හරහා තොරතුරු දැන ගැනීම පිළිබඳ ප්‍රජා අයිතිය තහවුරු කර ඇත. මෙම "විනිවිද භාවය" යන සංකල්පය සහ එහි ප්‍රායෝගික භාවිතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි විග්‍රහය වනුයේ, යම් රාජ්‍යයක් මඟින් ගනු ලබන ප්‍රතිපත්ති සහ ඒවා ප්‍රායෝගික කිරීමෙන් බලපෑම් වලට ලක්වන ප්‍රජාව වෙත ඒ පිළිබඳ අවශ්‍ය සියලුම ආකාරයේ තොරතුරු සැපයීම, එකී තොරතුරු සැපයීමේ දී ඒ සඳහා භාවිත කරන මාධ්‍ය සහ ආකෘති ජනතාවට පහසුවෙන් තේරුම් ගත හැකි වීම, එම තොරතුරු වෙත ඍජුව සහ නොමිලේ ප්‍රවේශ වීම සඳහා ඔවුන්ට අවස්ථාව සලසා දීම යන්නයි.

උක්ත විශ්ලේෂණයට අනුව, ඕනෑම රටක ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ ප්‍රධාන අංගයක් ලෙස ජනතාවට ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය හෙවත් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ලබා දීම හැඳින්විය හැකිය. ඒ සඳහා තොරතුරු දැන ගැනීමට ඔවුන් සතු අයිතිය ද ප්‍රජාතන්ත්‍රවාදය සහ පුද්ගල නිදහස ගරු කරන ඕනෑම සමාජයක කේන්ද්‍රීය අංගයකි. එනයින්, ඕනෑම පුරවැසියෙකු මානව සමාජයෙහි සාමාජිකයෙකු ලෙස සලකා ඔහුට හෝ ඇයට තොරතුරු දැනගැනීම සඳහා වන මූලික මිනිස් අයිතිවාසිකම ලබා දිය යුතුය. උක්ත කරුණ සනාථ කරමින් ජනතාව සතු මෙම අයිතිය ජාත්‍යන්තරව ද පිළිගෙන ඇති අතර ලෝකයේ වර්තමාන

සමාජ සන්දර්භය තුළ එය අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතියි. ඒ අනුව, මහජනතාවට යම් සාධාරණ මතවාදයන් ඇති කර ගැනීමටත් එය සමාජගත කිරීමටත් ඒ සඳහා අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමටත් නිදහස ලබා දිය යුතුය. එම නිදහස සර්ව සාධාරණ ලෙස බුක්ති විඳීම සඳහා අපක්ෂපාතී සහ විකෘති නොවූ තොරතුරු ලබා ගැනීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම රාජ්‍ය පාලනය මත පැවරී ඇති භාරධූර වගකීමක් ලෙස අදාළ පාර්ශ්වයන් විසින් සැලකිය යුතුය. තොරතුරු දැන ගැනීමේ අයිතිය සමාජමය අයිතියකි. එසේම, එය පෞද්ගලික මෙන්ම පොදු මානව අයිතියක් ද වේ. තව දුරටත් විග්‍රහ කරන්නේ නම් තොරතුරු දීම සහ ලැබීම යන දෙපක්ෂයම මෙයට අදාළ වේ. තොරතුරු ලබා ගැනීමේ අයිතිය පුද්ගල සමාජාවබෝධය පිළිබඳ දැනුම පුළුල් කරන්නක් ලෙස හුවා දැක්විය හැකිය. කාර්යක්ෂමව සහ සාඵල්‍යතාවයෙන් යුක්තව ස්වකීය කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් ලෙස තොරතුරු දැන ගැනීම රාජ්‍යය සහ පුරවැසි යන දෙපිරිසටම අවශ්‍යය. එබැවින් තොරතුරු දැන ගැනීම පෞද්ගලික අවශ්‍යතාවක් පමණක් නොව සමාජමය අවශ්‍යතාවක් ලෙසද සැලකෙයි. එම අවශ්‍යතාව ඉටු කරනු වස්, වගකීම් සහ යුතුකම් නිසි ලෙස වෙන්කර හඳුනා ගත් අපක්ෂපාතී මාධ්‍ය ප්‍රවාහයක් ද තිබීම අත්‍යවශ්‍යය.

තොරතුරු දැන ගැනීමේ වැදගත්කම වර්තමානය තුළ වඩාත් කැපී පෙනෙන්නේ ඒ සඳහා බලපාන විවිධ හේතු නිසාවෙනි. තොරතුරු දැන ගැනීමේ අයිතිය වැදගත් වන එක් හේතුවක් වන්නේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සහ විවෘත සමාජයක් නිර්මාණය කිරීම සඳහා එයින් ලැබෙන දායකත්වයයි. එහිදී සිවිල් ආරක්ෂාව සුරක්ෂිත කිරීමට හැකියාව ලැබෙයි. විනිවිදභාවයෙන් යුතුව තොරතුරු බෙදා හැරීමක් සිදු නොකරන රටක යම් යම් තීරණ ගැනීමේ දී ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වයක් දැක ගත නොහැකිය. ප්‍රශ්න හඳුනා ගැනීමට සහ ඒ සඳහා විසඳුම් සෙවීමට උත්සුක වන සමාජ සන්දර්භයක් තුළ අවශ්‍ය තොරතුරු සාඵල්‍ය ලෙස සම්ප්‍රේෂණය නොකරන්නේ නම් එකී වටපිටාව තුළ ක්‍රියාත්මක වන රජයන් සෑම විටම අසාර්ථක වන්නේය. එවැනි රජයක් රහස් කුමන්ත්‍රණ සහ කටකතා පැතිරවීමේ සංස්කෘතියක් රට තුළ ස්ථාපිත කිරීමට මූලික වෙයි. උදාහරණයක් ලෙස වර්තමානයේ දී ත්‍රස්තවාදී උවදුර ලෝක ව්‍යාප්ත තර්ජනයක් බවට පත්ව ඇත. ඒ සඳහා සමීපතම උදාහරණය වන්නේ 2019

අප්‍රේල් මස 21 වන දින ලාංකීය ක්‍රිස්තියානි දේවස්ථාන ඉලක්ක කරගනිමින් සිදු කරන ලද ත්‍රස්ත ප්‍රහාරයයි. මෙම ප්‍රහාරක අවදානම සම්බන්ධයෙන් තොරතුරු බුද්ධි අංශ විසින් රජයේ ආරක්ෂක අංශ වෙත දැනුම් දුන් බව පවසන නමුදු එම තොරතුරු අනුව ක්‍රියාත්මක වෙමින් පවතින අවදානම ගැන ජනතාව දැනුවත් නොකිරීමේ ප්‍රතිඵලය වූයේ බොහෝ පිරිසකට ජීවිත අහිමි කරලීමයි. නමුත්, අදාළ අවදානම ගැන තමන් ලද තොරතුරු පිළිබඳව විමර්ශනය කොට රජයේ පාර්ශ්ව විසින් ජනතාව දැනුවත් කර තිබුණි නම් හෝ එසේ දැනුම්වත් කිරීමක් සිදු නොකළ ද ඒ සඳහා ආරක්ෂාකාරී වැඩ පිළිවෙළක් සකස් කර එකී ආරක්ෂාකාරී වැඩ පිළිවෙළ පිළිබඳ හෝ දැනුවත් කළේ නම් ඒ සා විශාල විනාශයක් සිදු නොවනු ඇත. එහිදී රාජ්‍ය ආරක්ෂාව සඳහා තොරතුරු වසන් කරන්නා සේම ජනතා ආරක්ෂාව සඳහා තොරතුරු ලබාදීම මෙන්ම එකී තොරතුරු රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් වේ නම් නෛතික රාමුවට අනුකූල වන සේ ප්‍රතිව්‍යුහගත කරමින් ජනතා ස්වාධිපත්‍යය හා ආරක්ෂාව ප්‍රමුඛතාවයෙහි ලා කටයුතු කිරීම අත්‍යවශ්‍ය නොවන්නේදැ? යි යන ප්‍රශ්නාර්ථය මතු කරනු ලබයි.

තොරතුරු දැන ගැනීමේ අයිතිය වැදගත් වන අනෙක් කාරණය වන්නේ දරිද්‍රතාව සීමා කිරීම සහ වර්තමාන සහස්‍ර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා එයින් ලබා දෙන දායකත්වයයි. දරිද්‍රතාව තුරන් කිරීමට කටයුතු කරන ලෝකයේ විවිධ සංවිධාන මානව සංවර්ධන ඉලක්ක අකාර්යක්ෂම කිරීමට බලපාන හේතු පිළිබඳව ඇති තොරතුරු සෙවීම කෙරෙහි නිරන්තර අවධානය යොමු කරනු ලබයි. බොහෝ විට එවැනි තොරතුරු යට සැඟව ඇත්තේ දූෂණය, වංචාව, හොරකම, පුද්ගල මාමක දේශපාලනය, අවිනීතිය ආදී හේතු කාරණා විය හැකිය. එම තොරතුරු නිරාවරණය වීමට ඉඩ හැරීම යනු රජය සහ ජනතාව අතර පවතින සම්පත් බෙදී යාමේ විෂමතාව පිළිබඳ වෙනස සමාජයට දැන ගැනීමට ඉඩ ලබා දීමකි. එම නිසා තවත් අතෙකින් තොරතුරු දැන ගැනීමේ අයිතිය යනු දූෂණයට අභියෝග කිරීමකි. එය දූෂණය මැඩලීම සඳහා කදිම පිළියමකි. දූෂණය වූ කලී, සෑම රටකම අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වන්නක් වුව ද සංවර්ධනය වෙමින් පවතින ආර්ථික නිර්ණායක තුළ ගොනු වී ඇති රටවල් සඳහා එය විශාල බලපෑමක් සිදු කරනු ලබයි. එය සෘජුවම විදේශ ආයෝජන සඳහා බලපෑමක් ඇති කරන අතර ප්‍රවාහන,

සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි ජනතාවගේ මූලික අවශ්‍යතා හා සබැඳුණු අංශයන්හි භෞතික සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මූල්‍යමය ප්‍රතිලාභ කපා හැරීමට ද හේතුවක් වෙයි. එම නිසා අභිමතය අනිසි ලෙස යොදවමින් සිදු කරන වංචා දූෂණ ආදිය වළක්වාලීමට තොරතුරු දැන ගැනීමේ අයිතිය හරහා සුවිශාල කාර්යභාරයක් සිදු කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය නිලධාරීන් දේශපාලනඥයන් මෙන්ම පොදු මහ ජනතාව විසින් සිදු කරන දූෂණ, වංචා සහ රාජ්‍ය සම්පත් නාස්තිය බාහිර පාර්ශ්වයන් වෙත අනාවරණය වීම හේතු කොට ගෙන රාජ්‍ය සම්පත් නාස්තිය අවම කිරීමට හැකි වේ.

උක්ත තොරතුරු අනුව, තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කිරීම තුළ විවිධ වාසි සහගත තත්ත්වයන් ද ඇති කරනු ලබයි. විනිවිදභාවය හෙවත් රජයේ ක්‍රියාකාරකම්, නීති රීති සහ රෙගුලාසි ආදිය සම්බන්ධයෙන් පුරවැසියන්ට අවශ්‍ය තරම් තොරතුරු ලබා ගැනීමේ අයිතිය මෙමඟින් සහතික කෙරේ. මෙය රාජ්‍ය බලධාරීන් සහ එකී රාජ්‍යයයන් හි පුරවැසියන් අතර වඩා හොඳ සන්නිවේදනයක් සඳහා ඉඩක් නිර්මාණය කරයි. එසේම පුරවැසි කේන්ද්‍රීය ප්‍රවේශය හෙවත් තොරතුරු දැන ගැනීමේ අයිතිය නිසා පුරවැසියන් ඉල්ලා සිටින පරිදි බලධාරීන් තොරතුරු ලබාදීමට වග බලා ගන්නා අතර විකල්පමය තීරණ ගැනීමට පෙර ආණ්ඩුව සිතා බැලීමට පෙළඹවීම මේ හරහා සිදුවෙයි. එහිදී, යම් රටක පාලනාධිකාරියෙහි කාර්යයන් පිළිබඳ පාරදෘශ්‍යභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබෙයි. රාජ්‍යයන් විසින් මහජනතාවගේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් නීති විරෝධී ලෙස උල්ලංඝනය කරන විට එයට එරෙහිව පාලිත ප්‍රජාව නැඟී සිටින විට තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රදානය කිරීමට රජයට සිදු වෙයි. ඒ හරහා රාජ්‍යය විසින් පුරවැසියන්ව ආරක්ෂා කිරීම නිරායාසයෙන්ම සිදු වෙයි. තව දුරටත්, ස්වකීය ප්‍රජාවගේ තොරතුරු අයිතිය තහවුරු කිරීම මඟින් කිසියම් රටකට ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය කිරීමේ දී ඒ සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීමට කටයුතු කිරීමට සිදු වෙයි. එම නිසාම, ස්වකීය පාලිත පක්ෂයෙහි නිදහස අගය කිරීම සහ එය උල්ලංඝනය කිරීමට ඇති ඉඩ කඩ රාජ්‍ය පක්ෂයට ඇහිරී යනු ඇත. එකී කාරණා හේතු කොටගෙන රාජ්‍යයක තීරණ ගැනීමේ ක්‍රියාවලියට ජනතා සහභාගිත්වය ලබා ගැනීම

තුළින් ජනතාවගේ අදහස් වලට ගරු කිරීමට හැකි වන අතරම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ද අවස්ථාව ලැබේ.

තොරතුරු දැන ගැනීමේ අයිතිය නිසා මාධ්‍ය නිදහසට නව අර්ථකථනයක් ලැබී ඇත. මාධ්‍ය වෙත ලැබී ඇති එම නිදහස නිසා ජනතාවට තොරතුරු දැන ගැනීමේ අවස්ථා පුළුල් වී ඇත. දේශීය මට්ටමෙන් උදාහරණයක් ගෙන හැර දැක්වුව හොත් පසුගිය අප්‍රේල් මස ශ්‍රී ලංකාව තුළ ඇති වූ තස්ත්‍ර ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට මේ දිනවල පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් විසින් රජයේ මෙන්ම වෙනත් විවිධ දේශපාලනික සහ ආගමික සංවිධාන වල නියෝජිතයන්ගෙන් ප්‍රශ්න කිරීම් සිදුකරනු දක්නට ලැබෙයි. එම තේරීම් කාරක සභාව සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විවේචන සහ මති මතාන්තර කොයි ආකාර වෙතත් එම ප්‍රශ්න කිරීම් මාධ්‍ය මඟින් සජීවීව ජනතාව වෙත සමීප කිරීම සිදු කරනු ලබයි. එසේ සමීප කිරීම නිසා ජනතාවට සිය රාජ්‍යයෙහි ක්‍රියාකාරිත්වය වගකිව යුතු අංශවල ක්‍රියාකාරීත්වය, පුද්ගලානුබද්ධ කාරණා අදාළ සිද්ධීන් වෙත පාදක වී ඇති ආකාරය පිළිබඳ ස්වයංව විශ්ලේෂණයක් සිදු කර ගැනීමකට ඉඩ ලබා දෙයි. උක්ත ආකාරයට විවේචන එල්ල කිරීම සඳහා වුව ජනතාවට ඉඩ ලැබෙනුයේ එය තොරතුරු දැන ගැනීමේ අයිතිය මත පිහිටා සහ මාධ්‍ය හරහා දැක ගැනීමට ලැබෙන නිදහස නිසාවෙන් යැයි යමෙකුට තර්ක කළ හැකිය. නමුත්, මෙහිදී එම කාරණාව පිළිබඳව දෙයාකාරයකින් විශ්ලේෂණය කළ යුතුය. මෙහි වාසිදායක මෙන්ම අවාසිදායක තත්ත්ව ද දැක ගත හැකිය. ඇතැම් අය මෙවැනි කමිටු ඉදිරියේ සාක්ෂ්‍ය සපයන විට මාධ්‍ය වලට නිරාවරණය කිරීමෙන් වැළකී සිටීම යෝග්‍යය. යම් රටක බුද්ධි අංශ නිලධාරීන් වැනි අය එවැනි කමිටු ඉදිරියේ සාක්ෂ්‍ය සැපයීමේ දී ඔවුන් මාධ්‍යයට නිරාවරණය කිරීම රාජ්‍යයේ ආරක්ෂාවට මෙන්ම එම නිලධාරීන්ගේ ද ආරක්ෂාවට තර්ජනයක් විය හැකිය. ඔවුන් හෙළි කරන තොරතුරු ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත වන සේ ප්‍රචාරය කළ යුතු අතර එයින් අදාළ බලධාරීන්ගේ අනන්‍යතාව වාස්තවික වශයෙන් පොදු ජනතාවට මාධ්‍ය ඉදිරියේ හෙළි නොකළ යුතුය. එසේ ඔවුනගේ අනන්‍යතාව සඟවා සිටීමෙන් තොරතුරු දැන ගැනීමේ අයිතියට හානියක් සිදු වන්නේ නැත. මෑත ඉතිහාසය තුළ ඉතාමත් ප්‍රබල ලෙස කතා බහට ලක් වූ ජමාල් කෂෝගී ඝාතනය එක් අතෙකින් අදහස් ප්‍රකාශ කිරීමේ

නිදහස උල්ලංඝනය කිරීමක් ද තවත් අතෙකින් එහි සැබෑ තතු මාධ්‍ය මඟින් හෙළි කිරීමෙන් ලද මාධ්‍ය නිදහස හුවා දැක්වීමක් ලෙසද දැක්විය හැකිය. වර්ෂ 2018 ඔක්තෝබර් 02 වැනි දින තුර්කියේ ඉස්තාන්බූල් නුවර සවුදි තානාපති සේවයට අයත් කොන්සාල් කාර්යාලයේ දී සවුදි ජනමාධ්‍යවේදියෙකු වන ජමාල් කෂෝගී නැමැති මාධ්‍යවේදියා අමානුෂික ලෙස ඝාතනය කිරීමේ පුවත ලෝකයේම අවධානය දිනා ගත් සිදුවීමකි. ඇමෙරිකානු පුවත්පතක් මඟින් සහ වෙනත් සම්මුඛ සාකච්ඡාවල දී කෂෝගී විසින් සවුදියේ මොහොමඩ් බින් සල්මාන් කුමරු විවේචනය කිරීමට විරුද්ධව ඔහුව ඝාතනය කළැයි සවුදි රජයට චෝදනා කරමින් 2019 ජූනි මස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ විශේෂ නියෝජිත ඇග්නස් කැලමාර්ඩ් විසින් වර්තාවක් ඉදිරිපත් කර තිබෙන අතර තුර්කි රූපවාහිනී නාලිකාවක් මඟින් කෂෝගී ඝාතනය පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව්වක් ද කර ඇත. තව දුරටත් එය, ඇමෙරිකානු කේබල් ප්‍රවෘත්ති ජාලය (Cable News Network) සහ බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සංස්ථාව (British Broadcasting Corporation) වැනි මාධ්‍ය මඟින් ද හෙළි කරනු දක්නට ලැබිණි. එක් අතෙකින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය අභියෝගයට ලක් කළ සිද්ධියක් ලෙස කෂෝගී ඝාතනය හැඳින්විය හැකිය. තවත් අතෙකින් කෂෝගී ඝාතනය සඳහා දියත් කළ කූඨ සහ අතිශය සූක්ෂම සැලැසුම් පිළිබඳවත්, එම මිනීමැරුම සහ එහි සාක්ෂ්‍ය වසන් කිරීමට සවුදි රජය ගත් ව්‍යාජ ව්‍යර්ථ පිළිබඳවත් උක්ත මාධ්‍ය මඟින් ජනතාවට දැන ගන්නට ඉඩ සැලැස්වීම හරහා මෙම අතිශය දරුණු මිනීමැරුම පිළිබඳ සත්‍ය කතාව තව දුරටත් වසන් කර තබන්නට සවුදි බලධාරීන් දරන උත්සාහය මාධ්‍ය හමුවේ ව්‍යර්ථ වී ඇති ආකාරය ලොවට හෙළි කර සිටි අවස්ථාවක් ලෙසත් හැඳින්විය හැකිය.

තොරතුරු දැන ගැනීමේ අයිතියෙහි වටිනාකම සහ වාසි මෙන්ම ඒ හා සබැඳි යම් යම් අවාසිදායක තත්ත්ව ද දැක ගත හැකිය. ඉහත සඳහන් කළ පරිදි තොරතුරු දැන ගැනීමේ අයිතිය මුවාවෙන් රාජ්‍යමය ආරක්ෂාවට බාධාවන ඇතැම් තොරතුරු අනාවරණය කිරීමට සිදුවන අවස්ථාද දැක ගත හැකිය. එවැනි ආකාරයට තොරතුරු අනාවරණය වීම රටට අවාසිදායක වන අවස්ථා ඇත. උදාහරණයක් ලෙස වර්ෂ 2002 ජනවාරි මස 02 දින අතුරුගිරිය මිලේනියම් සිටි සිද්ධිය දැක්විය හැකිය. හමුදා

බුද්ධි අංශ කාර්යාලය යටතේ පවත්වාගෙන ගිය (Directorate of Military Intelligence) දිගු දුර පුනරුත්ථාපන මුර සංචාර ඒකකයේ (Range Reconnaissance Patrol Unit) මෙහෙයුම් සඳහා මිලේනියම් සිටි නිවාස යෝජනා ක්‍රමය තුළ පවත්වාගෙන ගිය නිවස එවකට බලයේ සිටි රජයේ නියෝගය මත වැටලීමකට ලක් කරන ලදී. එම වැටලීම සිදු කරන ලද්දේ එකී රජයේ ප්‍රබල දේශපාලන චරිත ඝාතනය සඳහා සැලැස්මක් ශ්‍රී ලංකා හමුදාව සතුව ඇති බවත් එහි සැලැසුම් මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ අතුරුගිරිය මිලේනියම් සිටි නිවාස යෝජනා ක්‍රමයේ පවත්වාගෙන යන නිවසක් තුළ බවත් රජය විසින් ප්‍රකාශ කිරීමත් සමඟය. ඒ අනුව එවකට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා පොලිසිය විසින් කැප්ටන් නීලම්, කෝප්‍රල් හිල්මි වැනි අයව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ලන්නා ලදී. එහිදී ඔවුන්ට අපරාධකරුවන්ට මෙන් සැලකූ පොලීසිය සියලුම මාධ්‍ය කැඳවා බුද්ධි අංශ නිලධාරීන් සතුව තිබූ සියලුම අවි ආයුධ නීත්‍යානුකූල නොවන බව පෙන්වා ඔවුන් පිළිබඳව මාධ්‍යයට ප්‍රසිද්ධ කරන ලදී. මෙම තොරතුරු ප්‍රසිද්ධ කිරීම තුළත් සටන් විරාම ගිවිසුම හරහා දිගු දුර පුනරුත්ථාපන මුර සංචාර ඒකකය එල්. ටී. ටී. ඊ. ප්‍රදේශ තුළට ඇතුළු වීමෙන් වළක්වාලීමත් හේතු කොටගෙන හමුදා බුද්ධි අංශ අඩපණ විය. එයින් ලද වාසිය ප්‍රයෝජනයට ගත් එල්. ටී. ටී. ඊ. සංවිධානය  දිගු දුර පුනරුත්ථාපන මුර සංචාර ඒකකයේ බුද්ධි අංශ නිළධාරීන් ඇතුළුව බොහෝ හමුදා නිළධාරීන් ඝාතනය කරන්නට විය. කපිතාන් නීලම් සහ ඔහුගේ පවුලේ අය ආරක්ෂාව සඳහා ඉන්දුනීසියාවට පිටත් කළ ද ඔවුන් අතුරුදහන් විය. ලුතිනන් කර්නල් මුතාලිෆ් ඝාතනය කළේය. වැදගත් කාර්යභාරයක් ඉටු කළ සුරේෂ් කලුබෝවිල වැන්නවුන් ද ඝාතනයට ලක් කළේය. මේ ආකාරයට බුද්ධි අංශ නිළධාරීන්ගේ ජීවිත ගණනාවක් උදුරා ගැනීමට ඔවුන් ගැන කළ හෙළිදරව්ව මුල් විය. ඒ අනුව රාජ්‍ය ආරක්ෂාවට තර්ජනය වන තොරතුරු අත්තනෝමතික සහ කිසිඳු වගකීමකින් තොරව හෙළි කිරීමෙන් සිදුව ඇති භයානක තත්ත්ව වැඩි දුර නොයා අප රටෙන්ම සොයා ගත හැකිය.

මේ ආකාරයට තොරතුරු දැන ගැනීමේ අයිතියෙහි ඇති වටිනාකම, වාසි සහගත බව මෙන්ම යහපත් සහ අයහපත් ප්‍රතිඵල සියලුම රාජ්‍යයන් සහ එහි පුරවැසියන් විසින් අඩු වැඩි වශයෙන් භුක්ති විඳිමින් සිටින බව පැහැදිලිව පෙනෙන්නට තිබෙන්නක් බවට උක්ත තොරතුරු සනාථ කර

සිටින අතර එකී තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කතිකාව ඉතා දීර්ඝ ඉතිහාසයකට දිව යන්නක් බව ද සඳහන් කළ යුතුය. වර්ෂ 1766 ''පුවත්පත් නිදහස (Freedom of Press Act 1766)'' පනත හඳුන්වා දීමත් සමඟ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ නිල වශයෙන් නීතියක් පැනවූ පළමු රට වන්නේ ස්වීඩනයයි. රාජ්‍යමය තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීම මෙන්ම අදාළ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එයට විරුද්ධව නඩු මඟට යාමට ද එම පනත මඟින් ජනතාවට නිදහස ලබා දී ඇත.

තව දුරටත්, වර්ෂ 1982 දී ඕස්ට්‍රේලියාව විසින් තොරතුරු දැන ගැනීම සඳහා වන නීති සම්පාදනය කරනුයේ වර්ෂ 1966 දී ඇමෙරිකානු රජය විසින් නීතිගත කරන ලද තොරතුරු දැනගැනීමේ නිදහස සඳහා වන පනත පාදක කර ගෙනය. එසේම කැනඩාව සහ නවසීලන්තය යන රටවල් ද තොරතුරු දැන ගැනීමේ අයිතිය ස්ථාපිත කර ඇත්තේ වර්ෂ 1982 දීය. හොංකොං රාජ්‍යය සිය තොරතුරු දැන ගැනීමේ පනත නීති ගත කර ඇත්තේ 1995 වන අතර තායිලන්තය වර්ෂ 1997 දී නීතිගත කරන ලද රාජ්‍ය තොරතුරු පනත හරහා තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය තහවුරු කර ඇත. ප්‍රජාව සඳහා තොරතුරු බෙදා හැරීමේ පනත මඟින් වර්ෂ 1998 සිට තොරතුරු දැන ගැනීමේ අයිතිය දකුණු කොරියානුවන්ට ලැබී ඇත. වර්ෂ 2001 අප්‍රේල් මස ස්ථාපිත කරන ලද තොරතුරු දැන ගැනීමේ පනත හරහා ජපානය ද සිය ප්‍රජාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය ස්ථාපිත කර ඇත. දකුණු අප්‍රිකාවේ තොරතුරු දැන ගැනීම සඳහා වන පනත සම්මත වී ඇත්තේ 2011 මාර්තු මාසයේදීය. තව දුරටත්, ඩෙන්මාර්ක් රාජ්‍යය 1985 දීත්, ග්‍රීසිය 1986 දීත්, ඔස්ට්‍රියාව 1987 දීත්, ඉතාලිය 1990 දීත්, නෝර්වේ රාජ්‍යය 1970 දීත් ආදී වශයෙන් සිය රාජ්‍යයන් තුළ තොරතුරු දැන ගැනීමේ අයිතිය ස්ථාපිත කර ඇත.

වර්ෂ 1911 දී තොරතුරු පමණක් නොව සියලුම දෑ පිළිබඳ රහස්‍ය භාවය සුරැකිය යුතුයි යන නිල රහස්‍ය පනත බ්‍රිතාන්‍ය රජය විසින් සම්මත කර ගන්නා ලදී. එහිදී අදාළ රහස් තොරතුරු හෙළි කරන්නන්ට වසර දෙකක සිර දඬුවමක් හිමි වන බව ද දක්වා ඇත. නමුත් වර්ෂ 1997 දී බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂ විසින් තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිවාසිකම ලබා දිය යුතු යැයි කරන ලද ඉල්ලීම් වල ප්‍රතිඵලයක් ලෙස 2000 වර්ෂය

වන විට ඔවුන් ද තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය සුරක්ෂිත කරන ලදී. එහි වගන්ති ප්‍රකාරව විවිධ කාරණා වලට යටත්ව තොරතුරු දැන ගැනීමේ අයිතිය ස්ථාපිත කර ඇත. එහිදී යම් තොරතුරක් ලබා නොදී රඳවා ගෙන සිටින්නේ නම් එයට හේතු ද මහජනතාව වෙත ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇත. ආසියානු රාජ්‍යයන් තුළ මුලින්ම තොරතුරු දැන ගැනීමේ අයිතීන්හි අවශ්‍යතාව හඳුනාගත් රට වනුයේ පිලිපීනයයි. ඒ වර්ෂ 1987 ත් පෙර සිටය. උක්ත රාජ්‍යයන් වලට අමතරව ප්‍රංශය, මෙක්සිකෝව, චීනය, පකිස්තානය, ඉන්දියාව ආදී බොහෝ රටවල් තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ නීති සහ අණ පනත් සම්පාදනය කර ඇත. ඒ ආකාරයට ක්‍රම ක්‍රමයෙන් ලෝකයේ විවිධ රාජ්‍යයන් සහ පාර්ශ්වයන් විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිය වෙනුවෙන් විවිධ ආකාරයෙන් නීති සහ සම්මුතීන් සම්පාදනය කරමින් වර්තමානය වන විට තොරතුරු දැන ගැනීමේ අයිතිය විශ්වව්‍යාප්ත සංකල්පයක් බවට පත් කර ඇත.

තොරතුරු දැන ගැනීමේ අයිතිය සඳහා විවිධ ප්‍රකාශනයන් සකස් කර සමාජගත කර තිබෙන බව ප්‍රත්‍යක්ෂ කාරණාවකි. ඒ අතුරින්, විවිධ ලෝක ව්‍යාප්ත සංවිධාන විසින් මෑත ඉතිහාසය තුළ ගන්නා ලද ප්‍රයත්නයන් වෙසෙසින්ම කැපී පෙනෙන බව කිව යුතුය.

එහිදී, මානව අයිතීන් සඳහා විශ්ව ප්‍රකාශනය (Universal Declaration of Human Rights) සහ මානව හිමිකම් පිළිබඳ යුරෝපීය සම්මුතිය (European Convention on Human Rights) එක්ව තොරතුරු දැන ගැනීම සඳහා වූ මානව අයිතීන් හඳුනා ගෙන ඒවා ආරක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ වූත් සාධනීය වූත් පියවරක් ගෙන ඇත. එහිදී අදහස් දැක්වීමේ නිදහස යන ශීර්ෂය යටතේ UDHR හි ලිපි අංක 19 සහ ECHR හි ලිපි අංක 10 මඟින් "බාධාවකින් තොරව අදහස් දැරීම සහ ප්‍රකාශ කිරීම මෙන්ම දේශ සීමා නොසලකා ඕනෑම මාධ්‍යයක් ඔස්සේ තොරතුරු සෙවීමේ, ලැබීමේ සහ බෙදා හැරීමේ අයිතිය" ආරක්ෂා කිරීම පිළිබඳව තහවුරු කර ඇත (Mokrosinska, 2018, p.89).

තවද, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත (United Nations Special Rapporteur on Freedom of

Opinion and Expression), මාධ්‍ය නිදහස පිළිබඳ යුරෝපීය ආරක්ෂාව සහ සහයෝගීතාව පිළිබඳ සංවිධානයෙහි නියෝජිත (OSCE Represntative on Freedom of Opinion and Expression) සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ ඇමෙරිකානු රාජ්‍ය සංවිධානයෙහි විශේෂ නියෝජිත (OAS Special Rapporteur on Freedom of Expression) යන පාර්ශ්වයන් විසින් වර්ෂ 2004 දී එළි දක්වන ලද ඒකාබද්ධ ප්‍රකාශනයෙහි "යම් රටක රාජ්‍ය අධිකාරීත්වයන් විසින් පවත්වාගෙන යනු ලබන තොරතුරු වෙත ප්‍රවේශ වීම එරටෙහි ජනතාව සතු මූලික මිනිස් අයිතිවාසිකමක් " වන බව තහවුරු කර ඇත.

තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනය කිරීමේ දී ලාංකික පුරවැසියන්ට ද තොරතුරු ලබා ගැනීමේ අයිතිය වර්තමාන සමාජය තුළ තහවුරු කර ඇති බව දැකගත හැකිය. එහි ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයන් කොයි ආකාර වෙතත් අතීතයට සාපේක්ෂව අද වන විට එහි සාධනීය ප්‍රගතියක් දැක ගත හැකිය. නමුදු, පැන නඟින ගැටළුව වනුයේ, එකී අයිතිය භාවිතය පිළිබඳ ජනතාව තුළ තවමත් පැහැදිලි දැනුවත්භාවයක් තිබේද? යන්නයි. තත්ත්වය එසේ වන නමුදු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, විසින් "2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත" යනුවෙන් තොරතුරු දැන ගැනීම සඳහා වන පනතක් ස්ථාපිත කර ඇත. එසේම මෙම පනතෙහි දැක්වෙන ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) ව්‍යවස්ථාව අනුව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ස්ථාපිත කර ඇති බැවින් මෙන්ම තොරතුරු ලබා ගැනීමේ අයිතිය බලාත්මක කර ඇති නිසා තොරතුරු බෙදා හැරීමේ දී රාජ්‍යය තුළ ඇති විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාව සපුරාලීම, තොරතුරු වලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම, තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීමට මූලික වන හේතු පැහැදිලි කිරීම, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම, තොරතුරු නිලධරයන් පත් කිරීම සහ තොරතුරු ලබා දීමට අදාළ කාර්ය පටිපාටි නිශ්චිතව දැක්වීම යන කාරණා ඇතුළත් කොට මෙම පනත සකස් කර ඇත. එම පනතේ 03 (1) කොටසෙහි දැක්වෙන පරිදි, තොරතුරු වලට ප්‍රවේශ වීමේ සීමා කිරීම් යටතේ දක්වා ඇති 05

වගන්තියේ නීති වලට යටත්ව පොදු අධිකාරියක සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති සියලුම තොරතුරු වලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම සෑම පුද්ගලයෙකුටම තිබිය යුතු බව දක්වා ඇත. පනතෙහි දක්වා ඇති ආකාරයට යම් තොරතුරක් හෙළි කිරීමෙන් ඇතිවන මහජන සුබ සිද්ධිය එම තොරතුරු හෙළි නොකර සිටීම නිසා වන හානියට වඩා වැඩි නම් එවැනි අවස්ථා වල අදාළ තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවසර ලබා දිය යුතු යැයි දක්වා ඇත. මෙම පනතෙහි 9 (1) (අ) යටතෙහි දක්වා ඇති පරිදි යම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මාස තුනකට පෙර අදාළ ව්‍යාපෘතිය සහ එමගින් බලපෑමට ලක් විය හැකි පාර්ශ්වයන්ට එහි බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම අදාළ විෂය භාර අමාත්‍යවරයා හරහා සිදු කළ යුතු බව දක්වා ඇත. උක්ත කාරණාව යටතේ, අදාළ ව්‍යාපෘතිය විදේශ ආධාර ලබන ව්‍යාපෘතියක් නම් එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් ලක්ෂය ඉක්මවන්නේ නම් එවැනි ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ද රුපියල් ලක්ෂ පහ ඉක්මවන දේශීය වශයෙන් ආධාර ලබන ව්‍යාපෘති වේ නම් ඒ පිළිබඳ තොරතුරු ද මහජනතාවට හෙළි කළ යුතුය. තව දුරටත් මෙම පනතෙහි ප්‍රකාරව කිසියම් පුරවැසියෙකු විසින් තොරතුරක් ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් කිසිඳු වග විභාගයකින් තොරව සිතා මතාම ප්‍රතික්ෂේප කිරීම, යම් යම් තොරතුරු වෙත ගාස්තු ගෙවා ප්‍රවේශය සපයන විට අදාළ වටිනාකමට වැඩි වටිනාකමක් අය කිරීම, තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රකාරව මෙම පනතෙහි අනුමත නිදහස උල්ලංඝනය කරමින් අදාළ තොරතුරු ලබා දීම සීමා කිරීම සහ 31 සහ 31 (3) වගන්ති ප්‍රකාරව තොරතුරු ලබා ගැනීම් සම්බන්ධ අභියාචනා වලට නිසි ප්‍රතිචාර නොදැක්වීම යන අවස්ථා පිළිබඳ තොරතුරු දැන ගැනීමේ පනත අනුව පත් කර ඇති කොමිෂන් සභාව මඟින් අදාළ විනය නිලධාරීන් වෙත දැනුම් දිය යුතු බව දක්වා ඇත. එය තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා වන අයිතිවාසිකම තහවුරු කිරීමට ගෙන ඇති පියවරක් ලෙස දැක්විය හැකිය.

මෙම පනතෙහි ප්‍රකාරව 5 (1) 2 වන උපවගන්තියට අනුව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ යුතු අවස්ථා පිළිබඳව ද කරුණු ඇතුළත් කර ඇත. එහිදී පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා අවසර ලබා දිය යුතු ආකාරය පිළිබඳ සඳහන් කර ඇත. පෞද්ගලික තොරතුරු හෙළිදරව් කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිඳු සම්බන්ධයක්

නොමැති අවස්ථාවක දී හෝ යම් තනි පුද්ගලයෙකුගේ පෞද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදු වේ නම් එවැනි තොරතුරු ප්‍රසිද්ධ නොකළ යුතු බව දක්වා ඇත. යම් තොරතුරක් හෙළි දරව් කිරීම රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවට හෝ ජාතික ආරක්ෂාවට අගතිදායක වන්නේ නම් එවැනි තොරතුරු හෙළි දරව් නොකළ යුතුය. ජාත්‍යන්තර නීතිය යටතේ අන්තර්ජාතික ගිවිසුම් හෝ බැඳීම් විසින් රහසිගතව ලබා ගත් තොරතුරු හෙළිදරව් කිරීම අන්තර්ජාතික වශයෙන් රාජ්‍යයන් අතර පවතින සම්බන්ධතා වලට හානි වන්නේ නම් එවැනි තොරතුරු ලබා නොදිය යුතු බව දක්වා ඇත. වාණිජමය තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී ඒ සඳහා වන ප්‍රතික්ෂේප කිරීම් ද මෙම පනත යටතේ දක්වා ඇත. රජයේ ආර්ථික හෝ මූල්‍යමය ප්‍රතිපත්ති වෙනස් කිරීමට හෝ අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධ තීරණ නිසි කලට පෙර ප්‍රචාරය නොකළ යුතු බව දක්වා ඇත. මෙම පනතෙහි 4 (ඈ) යටතේ දක්වා ඇති ආකාරයට 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂා කර ඇති වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළ ඇතුළු තොරතුරු හෙළිදරව් කිරීම යම් තුන්වන පාර්ශ්වයක තරඟකාරී බවට අහිතකර ලෙස බලපානු ලබයි නම් එවැනි තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඉඩ ලබා නොදිය යුතු බව ද දක්වා ඇත. කවර නම් පුද්ගලයෙකු විසින් වුව ස්වකීය වෛද්‍ය වාර්තාවල තොරතුරු ඔහුගේ කැමැත්තකින් තොරව තවත් පාර්ශ්වයක් වෙත ලබා දීමට ඉඩ නොලැබෙන සේ මෙම පනත මඟින් කටයුතු කර ඇත. නීතිමය තොරතුරු හෙළි කිරීමේ දී එය අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ සාධාරණත්වය හෝ අධිකාරී බලය පවත්වා ගෙන යෑමට හානිදායක වේ නම් එවැනි තොරතුරු ප්‍රචාරය නොකළ යුතුය. කිසියම් අපරාධ වලට සම්බන්ධව වරදකරුවන් සොයා ගැනීමේ දී, ඔවුන් අල්ලා ගැනීමේ මෙහෙයුම්වල දී සහ නඩු පැවරීමේ දී යම් අගතීන් සිදු වේ නම් එවැනි අවස්ථා වල එම තොරතුරු වෙත ප්‍රවේශ වීම වැළැක්විය යුතු බව ද දක්වා ඇත. නීතිය බලාත්මක කිරීම හෝ ජාතික ආරක්ෂාවට හානි වන යම් තොරතුරු ඇතුළත් රහසිගත මූලාශ්‍ර වල අනන්‍යතාව හෙළි වීමක් සිදු වන්නේ නම් එවැනි අවස්ථා වල එම තොරතුරු ලබා නොදිය යුතු බව මෙම පනත මඟින් අවධාරණය කර ඇත. තෙවන පාර්ශ්වයක් විසින් යම් තොරතුරක් කිසියම් ආයතනයකට හෝ රජයට ලබා දෙන විට දී එය තවත් පාර්ශ්වයකට ලබා දීම අදාළ තෙවන පාර්ශ්වය විසින් අනුමත කර නොමැති නම් එවැනි තොරතුරු ද

ලබා නොදිය යුතු බව දක්වා ඇත. යම් තොරතුරක් ප්‍රචාරය කිරීම මගින් පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ පළාත් සභා වරප්‍රසාද ආදිය උල්ලංඝනය කරන්නේ නම් එම තොරතුරු ද ලබා දීමට අවසර නොලැබෙන බව දක්වා ඇත. අධ්‍යාපන අංශයෙන් ගත් කල විවිධ අධ්‍යාපන ආයතනයන් මගින් පවත්වනු ලබන විභාග වලට අදාළ තොරතුරු රහසිගතව තබා ගැනීමට නියමිත වන අවස්ථා වල ඒවා වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබා නොදිය යුතු බව ද මෙම පනත තුළ අවධාරණය කර ඇත. විවිධ මැතිවරණ වලට අදාළ යම් යම් තොරතුරු වෙත ප්‍රවේශ වීමේදී ද කිසියම් සීමා පනවා ඇති බව මෙම පනත හරහා දැක ගත හැකිය.

උක්ත කරුණු වලට අනුව තොරතුරු ලබා ගැනීම සඳහා වන ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පවතින නෛතික තත්ත්ව මෙන්ම ඒවා ප්‍රායෝගික වන ආකාරය පිළිබඳ මනාව පැහැදිලි වෙයි.

කෙසේ නමුදු, පොදු අර්ථයෙන් ගත් කල සෑම අන්දමකම වාචික, ලිඛිත, චිත්‍රමය, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනිකගත ආකාරයෙන් හෝ ප්‍රජාවට කැමැති වෙනත් කිසියම් හෝ මාධ්‍යයකින් අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඔවුන්ට අයිතියක් තිබිය යුතුය. එසේ ප්‍රවේශ වෙමින් තොරතුරු ලබා ගැනීමේ අයිතිය ප්‍රධාන අංශ තුනක් යටතේ දැක්විය හැකිය. එනම්,

- **මූලික තොරතුරු අයිතීන් :** රටක පුරවැසියන් හට සෘජුවම ප්‍රවේශ වීමට අයිතිය ලබා දී ඇති රාජ්‍ය තොරතුරු මේ ගණයෙහි ලා සැලකෙයි. ව්‍යවස්ථානුරූපී නිර්වචනයන්ට අනුව, මූලික තොරතුරු අයිතීන් යනු, රටක පුරවැසියන් හට ලැබෙන ඉහළම තොරතුරු ලබා ගැනීමේ නිදහස හෙවත් වරප්‍රසාදයයි. සත්‍ය සහ තීරණාත්මක තොරතුරු වෙත සෘජුවම ප්‍රවේශ වීමට රජය විසින් සිය රටෙහි පුරවැසියන් වෙත සම්පූර්ණ නිදහස ලබා දීම මෙමගින් සිදු වෙයි. මෙකී තොරතුරු යටතේ පුරවැසියන්ට රාජ්‍ය තොරතුරු (Government Information) වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබා දෙයි. එම රාජ්‍ය තොරතුරු යටතට ගැනෙන්නේ මොනවාදැයි විමසා බැලීම මෙහිදී වැදගත් වේ.

විමසීමට ලක් කෙරෙන තොරතුරු හෙවත් ප්‍රවේශ වීමට අවශ්‍ය තොරතුරු දරා සිටින්නා පවතින රාජ්‍ය ව්‍යුහය යටතේ පාලනය වන අමාත්‍යාංශ,

අධිකාරී, ආයතන හෝ සංවිධාන වේ නම් ඒවා මඟින් ඍජුවම ලබා ගන්නා තොරතුරු මේ ගණයෙහි ලා සැලකෙයි. තව දුරටත් සමාජමය ක්‍රියාකාරීත්වයන් මනාව ගලා යාමට අවශ්‍ය පසුබිම සැකසීම ද මෙවැනි තොරතුරු වෙත ප්‍රවේශ වීමට ලබා දීම හරහා සිදු වෙයි. මන්ද යත්, රටක සමාජ ක්‍රියාකාරීත්වයන්හි සක්‍රීය බව සඳහා රාජ්‍ය තොරතුරු සමාජයට අනාවරණය වීම අවිවාදාත්මක අවශ්‍යතාවකි.

පළමුව, රටක පුරවැසියන්ගේ නීතිමය තත්ත්ව ස්ථාපනය සඳහා රාජ්‍ය තොරතුරු මඟින් විශාල දායකත්වයක් සපයනු ලබයි. රටක පැවැත්ම සඳහා පැනවෙන නීති සහ සෙසු විස්තර දැන ගැනීමට එම රටෙහි ජනතාවට අයිතියක් තිබිය යුතුය. නමුත්, යම් යම් නීති ජනතාවට ප්‍රසිද්ධ කිරීමෙන් එය රටෙහි ජාතික ආරක්ෂාවට බාධාවක් වන්නේ නම් එවන් අවස්ථා වල එම නීති හෝ එවැනි නීති පැනවූයේ ඇයි ද යන්න පිළිබඳව ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටීම සාධාරණ විය හැකිය. නමුත්, ජනතාවගේ එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමේදී එම නීති ඍජුවම ඔවුනගේ ජීවිත වලට බලපාන්නේ නම් ඒවා ගැන ඔවුන්ට දැනුවත් වීමට ඉඩ ලබා දීම අනිවාර්යය කොට සැලකිය යුතුය. මෙවැනි නීති ප්‍රභේද යටතේ නෛතික නීති සහ රෙගුලාසි (Legal Rules and Regulations), සම්මුති (Convention Texts), මන්ත්‍රණ සභා නියෝග (Orders in Council), රාජකීය නියෝග (Royal Decrees), ප්‍රතිපත්තිමය රීතී (Policy Rules), කලාපීය සැලැසුම් (Zoning Plans), පරිපාලනමය තීරණ (Administrative Decisions), නඩු නීති (Case Laws), සම්මත රෙගුලාසි (Standard Regulations), ගිවිසුම් සහ පැහැදිලි කිරීම් (Covenants and explanatory notes) ආදී නීතිමය තොරතුරු දැන ගැනීමට ජනතාවට නිදහස ඇත. මෙවැනි කාරණා පිළිබඳ දැනුවත් වීම මඟින් රටක බලපවත්වන නීති සහ එහි සාධාරණත්වය පිළිබඳ මතුවන අඩුලුහුඬුකම් සහ හිඩැස් කෙරෙහි ප්‍රජාවගේ අවධානය යොමු වීමට ඉඩකඩ වැඩි වනු ඇත. එකී ප්‍රවණතා හේතුකොටගෙන රටට සහ ජනතාවට හිතකර වන ලෙස එම නීති අනුගත කිරීමට ඉඩ ලැබෙනු ඇත. උදාහරණයක් ලෙස යම් කිසි පුද්ගලයෙකු විසින් කිසියම් අපරාධයක් කිරීම හෝ එයට තැත් කිරීම සම්පූර්ණ සමාජයටම බලපානු ලබන කාරණාවකි. එවන් වූ පුද්ගලයින් සමාජයට තර්ජනයක් වීම නොවැළැක්විය හැකිය. එවැනි අපරාධ සඳහා ක්‍රියාත්මක

වන නීති ආදිය ගැන රටක ප්‍රජාව දැනුවත් කිරීම අපරාධ සහ වැරදි වලට පුද්ගලයන් පෙළඹවීම අවම කිරීමට බලපානු ඇත. අනෙක් අතින්, එවැනි පුද්ගලයින් සමාජයට තර්ජනයක් වන බැවින් ඔවුන් ගන්නා එවැනි උත්සාහ ව්‍යර්ථ කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග ගැන ද සමාජය දැනුවත් කිරීම සෑම විටෙකම නොවූවත් ඇතැම් අවස්ථා වලදී අත්‍යාවශ්‍යය. එම නිසා, උක්ත ආකාරයට රටක පවත්නා නෛතික යෙදවුම් පිළිබඳව දැන ගැනීමට එරට පුරවැසියන්ට අවස්ථානුකූල අයිතියක් ඇත. මෙහිදී ස්වකීය රාජ්‍යයෙහි සහ ජනතාවගේ ආරක්ෂාව සහ පැවැත්මට හානි කරන දෑ වෙතොත් ඒවා සමාජගත නොකර සිටීම සාධාරණ යැයි ගිණිය හැකිය. නමුත්, එසේ නොවන සෑම අවස්ථාවකම උක්ත නීතිමය කාරණා පිළිබඳව දැනුවත් වීමට ඕනෑම රටක පුරවැසියන්ට අයිතියක් ඇති බව කිව යුතුය.

තව දුරටත්, සමාජමය ජීවිකාව තුළ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් මෙන්ම කලින් කලට ඒවාගේ වෙනස්වීමේ ප්‍රවණතාවන් පිළිබඳ කාලීන සහ ප්‍රමාණවත්  තොරතුරු වෙත ප්‍රවේශ වීමට රජය විසින් මූලික තොරතුරු අයිතිවාසිකම් යටතේ ජනතාවට නිදහස ලබා දිය යුතුය. එසේම, රජය විසින් ලියාපදිංචි කරන ලද ලේඛන ලෙස ඉඩම් ලේඛන (Land Registers), වෙළෙඳ ලේඛන (Trade Registers), කාටල ලේඛන (Cartel registers) ආදී ලේඛන වල ඇතුළත් තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍යතාව අනුව ජනතාවට අවසර ලබා දීම මේ යටතට ගැනෙන තවත් මූලික තොරතුරු නිදහසකි. ආයතන නිර්දේශ (Recommendations of Advisory Bodies), රජයේ පර්යේෂණ වාර්තා (Research Reports), රජයේ නිල වාර්තා (Official Reports), රාජ්‍ය ආයතනවල සංඛ්‍යාත්මක දත්ත (Statistical Data) ආදී තොරතුරු වෙත ද මහජනතාවට ප්‍රවේශ වීමට ඉඩ සැලසීම සිදු කළ යුතුය.

උක්ත අවස්ථාවන්හි දී රාජ්‍යයක් උපරිම ආකාරයෙන් තොරතුරු ප්‍රසිද්ධ කිරීම සිදු කළ යුතුය. සියලුම ආකාරයේ නිල තොරතුරු ජනතාවට ලබා ගැනීමට හැකි වීම මෙහිදී අත්‍යාවශ්‍යය. එහිදී තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉදිරිපත් කිරීමට රජය බැඳී සිටින බව තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳව වන ජාත්‍යන්තර ප්‍රමිතීන්හි අන්තර්ගත වේ.

උදාහරණ ලෙස, නාගරික සහ ග්‍රාමීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමක දී ඒ සඳහා වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය, ඒවා භාවිත වන ආකාරය ආදිය ගැන ජනතාවට දැන ගැනීමට අයිතියක් තිබිය යුතුය. තව දුරටත් පැහැදිලි කරන්නේ නම්, කිසියම් ප්‍රදේශයක මාර්ග සංවර්ධනයක් සඳහා රජය විසින් මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර එම මාර්ගය ප්‍රතිසංස්කරණය කරමින් පවතින්නේ යැයි සිතමු. එහිදී ඒ සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සහ මාර්ගය ප්‍රතිසංස්කරණයේ දී ඒ ඒ කාර්යයන් සඳහා එම ප්‍රතිපාදන වැය වන ආකාරය ආදිය ගැන ජනතාවට ප්‍රශ්න කිරීමට නිදහස ලබා දිය යුතු අතර එම ප්‍රශ්න කිරීම් වලට අදාළ තොරතුරු දැන ගැනීමට ද ඔවුන්ට අයිතියක් තිබිය යුතුය. එසේම යම් හෙයකින් එම ප්‍රතිසංස්කරණ අතර මග නවත්වා දමා තිබේ නම් ඒ පිළිබඳව ද ප්‍රශ්න නැගීමට සහ ඒ සඳහා තොරතුරු ලබා ගැනීමට පුරවැසියන් වශයෙන් ඔවුනට අයිතියක් තිබිය යුතුය. එය රටක පුරවැසියන් සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය ක්‍රියාත්මක විය යුතු ආකාරය වේ.

එසේම, රටක අධ්‍යාපන ක්‍රමය තුළ අධ්‍යාපනය නඟා සිටුවීමෙහිලා රජයේ ක්‍රියාකාරීත්වය ජනතාවට විනිවිද විය යුතුය. එහිදී, පාසල් වලට ළමුන් ඇතුළත් කර ගැනීම සහ ඒ සඳහා වන නිර්ණායක, පාසල්වල ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා වෙන් වන මූල්‍ය ප්‍රතිපාදන භාවිත වන ආකාරය මෙන්ම උසස් අධ්‍යාපන අංශවල කාර්යයන් යනාදී වශයෙන් රටක ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන මට්ටම්හි රාජ්‍ය සහ ප්‍රජා මැදිහත්වීම විනිවිද විය යුතුය.

එතකුදු නොව, ආර්ථිකමය වශයෙන් ජනතාව දැනුවත් විය යුතු සියලුම ගණයේ තොරතුරු බෙදා හැරීම වගකීමක් ලෙස සැලකිය යුතුය. ඒ යටතේ, සමාජ සුබසාධනය සහ සමාජ ආරක්ෂණය සඳහා වන ආර්ථික සැලසුම් සහ යෝජනා, දේශීය සහ විදේශීය වශයෙන් රාජ්‍යයන් අතර ඇති ආර්ථික ගිවිසුම්, විනිමය දත්ත සහ වාර්තා ආදී ආර්ථික තොරතුරු ජනතාව වෙත ලබා දිය යුතුය.

තව දුරටත්, වෛද්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීමට අදාළව සියලු තොරතුරු මෙන්ම සමාජමය සහ දේශපාලනික වශයෙන් සමාජගත විය යුතු සියලු තොරතුරු ජනතාව ඉදිරියේ තැබීම තොරතුරු දැන ගැනීමේ

අයිතිය ගරු කරන රාජ්‍ය පාලනයක් මඟින් සිදුවිය යුතුය. උදාහරණයක් ලෙස, රෝගීන්ට ඔවුන්ගේ වෛද්‍යමය වාර්තාවන්හි සැබෑ තත්ත්වය දැන ගැනීමට අවශ්‍ය නම් එය ඔවුන් වෙත ඉදිරිපත් කළ යුතුය. එය රෝගියාගේ ඉල්ලීමක් නම් එය ඔහු හෝ ඇය සතු තොරතුරු දැන ගැනීම සඳහා වන අයිතිය ද වේ. එවැනි අවස්ථා වෛද්‍ය තොරතුරු ලබා ගැනීම යටතේ වන පුද්ගල කේන්ද්‍රීය කාරණා වේ. නමුත් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ තොරතුරු ලබා ගැනීම සඳහා වන සමාජමය අයිතවාසිකම් ද ඇත. උදාහරණයක් ලෙස කිසියම් ව්‍යසනයක් හෝ හදිසි අනතුරු සහ ආපදා තත්ත්ව මත සිදු වූ පුද්ගල ජීවිත හානි වීම් පිළිබඳ නිවැරදි දත්ත දැන ගැනීමට ජනතාවට අයිතියක් තිබිය යුතුය. එවැනි තොරතුරු රාජ්‍යමය වශයෙන් හෝ පුද්ගල ආරක්ෂාව සඳහා තර්ජනයක් නොවන්නේ නම් ඒවා පිළිබඳ දැනුවත් වීමට ජනතාවට අයිතියක් තිබිය යුතුය. උදාහරණයක් ලෙස ඩෙංගු රෝගය යනු ශ්‍රී ලාංකික ජන සමාජය තුළ නිරන්තරවම කලින් කලට හිස ඔසවන රෝගයක් බව කවුරුත් දන්නා කරුණකි. එවැනි රෝගී තත්ත්ව වලින් ඇතැම් කාලවලදී සිදු වන ජීවිත හානි ප්‍රමාණය ඉතා ඉහළය. නමුත් රාජ්‍යමය වශයෙන් හෝ වෙනත් පාර්ශ්වයන් සඳහා බලපෑමක් වේ යැයි හේතුවෙන් උක්ත රෝගී තත්ත්වවල සත්‍ය සංඛ්‍යාත්මක දත්ත හෝ වෙනත් තොරතුරු ජනතාවගෙන් වසන් කිරීම තොරතුරු දැන ගැනීම සඳහා වන ඔවුන් සතු අයිතිය උල්ලංඝනය කිරීමක් විය හැකිය. තවද, කිසියම් රෝගී තත්ත්වයක දී වෛද්‍යවරුන් විසින් නියම කරන බෙහෙත් වර්ග පාවිච්චියේ දී එයින් ඇතිවන අතුරු ආබාධ පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා වෛද්‍යවරුන් යොමුවන බවක් දැකගත නොහැකිය. එසේම අදාළ ඖෂධ භාවිත කළ යුතු ආකාරය පිළිබඳ සම්පූර්ණ නිවැරදි මඟ පෙන්වීමක් සිදු කරනු දැකගත නොහැකිය. රෝගියා පරීක්ෂා කිරීමෙන් අනතුරුව කිසිඳු දැනුවත් කිරීමකින් තොරව සැනෙකින් බෙහෙත් වට්ටෝරුව අතට දී රෝගියා කාමරයෙන් පිටතට එවනු ලබන වෛද්‍යවරුන් වර්තමානය තුළ බොහෝ පෞද්ගලික මෙන්ම රජයේ රෝහල්වල දැක ගත හැකිය. නමුත් රෝගීන් සඳහා දෙනු ලබන ඖෂධ වර්ග භාවිත කළ යුතු කාල පරිච්ඡේද සහ දීර්ඝ කාලීන භාවිතය තුළ සිදු වන අතුරු ආබාධ ආදී කරුණු පිළිබඳ රෝගියාව දැනුවත් කිරීමක් සිදු කරනු දැකගත නොහැකිය. ස්වකීය රෝගී තත්ත්වයන් පිළිබඳ තමාට දැන ගැනීමට අවශ්‍ය තොරතුරු ගැන පුන පුනා රෝගියා විසින් වෛද්‍යවරයාගෙන් ප්‍රශ්න කළ ද එවිට හෝ ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් නොකර රෝගියා පිටමං කිරීමට තරම් වෛද්‍යවරුන්ට

ඇත්තේ පුදුමාකාර හදිසියකි. මෙම අත්දැකීම ලංකාවේ බොහෝමයක් රෝගීන් අත්විඳින්නක් බව නොරහසකි.

ඉහත සඳහන් වන ආකාරයට ඕනෑම රටක සෑම අංශයකින්ම අවශ්‍ය වන තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය නිදහස මහජනතාවට ලබා දීම එරටෙහි රාජ්‍ය පාලනය සතු ප්‍රබල වගකීමකි. එපමණක් නොව, ස්වකීය මහජනතාවගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම පමණක් සැලකිල්ලට නොගෙන ජනතාවට වැදගත් යැයි නිර්දේශිත අනෙකුත් තොරතුරු ද බෙදා හැරීමට රජය මෙන්ම වගකිව යුතු පාර්ශවයන් බැඳී සිටියි. මෙකී තොරතුරු දැන ගැනීම සහ එම තොරතුරු වෙත ප්‍රවේශ වීමෙහි ලා නීතිය පිළිබඳ ජනතාවට අධ්‍යාපනය ලබා දීම, සාක්ෂරතා මට්ටම් වලට ගැළපෙන ප්‍රකාශන මාධ්‍ය නිර්ණය කිරීම් සහ ඒවා පිළිබඳ ජනතාව අතර පුළුල් දැනීමක් ඇති කිරීමට කටයුතු කිරීම ආදිය ඕනෑම රටක තොරතුරු දැන ගැනීමේ නිදහස ස්ථාපිත කිරීමෙහි ලා අත්‍යවශ්‍ය වන මූලික සාධක ලෙස සැලකිය හැකිය.

උක්ත සඳහන් වන රාජ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා විවිධ ප්‍රවේශන මාර්ග ඇත. භෞතික ප්‍රවේශය එක් ක්‍රමයකි. එම තොරතුරු වෙත කිසිඳු සීමාවක් හෝ බාධකයක් පැනවීමකින් තොරව ප්‍රවේශ වීමට ඉඩ සැලසීම සිදු වේ. දෙවැනි ප්‍රවේශය වන්නේ මූල්‍යමය ප්‍රවේශයයි. මෙම ක්‍රමය යටතේ, සමහර තොරතුරු වලට ප්‍රවේශ වීමට ප්‍රජාව වෙත අවසර ලබා දී තිබුණ ද ඇතැම් තොරතුරු වෙත ප්‍රවේශ වීමට පුරවැසියන් විසින් කිසියම් මුදලක් ගෙවිය යුතුය. එහිදී සැලකිල්ලට ගත යුතු කරුණ වනුයේ රටේ සියලුම තරාතිරම් හි පුරවැසියන්ට දැරිය හැකි වන සේ සාධාරණ මිලක් අයකර සිටීමය. ඒ සඳහා සාධාරණ සහ යෝග්‍ය මිලකරණ ව්‍යුහයක් සම්පාදනය කර ගත යුතුය. එය, තොරතුරු වෙත ප්‍රවේශ වන ප්‍රතිශතය වැඩි කරන කාර්යක්ෂම යාන්ත්‍රණයක් බවට පත් විය යුතුය. තෙවැනි ප්‍රවේශ ක්‍රමය වන්නේ බුද්ධිමය ප්‍රවේශයයි. මෙම තොරතුරු ප්‍රජාව වෙත විවෘත වුවද ඒවා වෙත ප්‍රවේශ වීමට පුරවැසියන් හට පුළුල් දැනුවත් භාවයක් තිබිය යුතුය. මෙවැනි තොරතුරු සඳහා ප්‍රවේශ වීමට දුරස්ථ සහ අතථ්‍ය ප්‍රවේශ පහසුකම් යටතේ අන්තර්ජාල තාක්ෂණය භාවිත කිරීමට බොහෝ විට සිදු වේ. විමර්ශන මූලාශ්‍ර, අධිසාරණයන් හෙවත් සබැඳියාවන් (Hyperlinks), සෙවුම් යන්ත්‍ර ආදී ක්‍රම හරහාද මෙම තොරතුරු වලට

ප්‍රවේශ විය හැකිය. ඒ අනුව, මූලික තොරතුරු අයිතියක් වන පූර්වයෙහි සඳහන් කර ඇති රාජ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට නම් අදාළ ප්‍රවේශන ක්‍රම පිළබඳව ද ඕනෑම රටක පුරවැසියන් සතුව පුළුල් දැනීමක් සහ අවබෝධයක් තිබිය යුතුය.

- **ද්විතීය තොරතුරු අයිතීන්** ඃ රාජ්‍ය අනුග්‍රහය ඇතිව පුරවැසියන්ට අවශ්‍ය තොරතුරු වෙත තීරණාත්මක මාධ්‍ය හරහා වක්‍රාකාරයෙන් ප්‍රවේශ වීමට අවසර ලබා දීම මෙමගින් සිදු වේ. මේ ආකාර තොරතුරු වලට විවිධ මාධ්‍ය හරහා ප්‍රවේශ වීමට සිදු වන අතර ජනතාව වෙත තොරතුරු ලබා දීමට සම්පූර්ණ බලය එකී මාධ්‍ය වලට හිමි වේ. මෙවැනි තොරතුරු ලබා ගැනීමට නවීන සන්නිවේදන මාධ්‍ය ගැන ප්‍රජාවට මනා දැනුමක් තිබිය යුතු ය. මෙහිදී පෙර පරිදිම තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති ද්විතීය තොරතුරු මාධ්‍ය හෙවත් මෙවලම් මොනවාදැයි යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතුය. තොරතුරු චැනලයන් (Information Channels) යනුවෙන් හඳුන්වන එම තොරතුරු මාධ්‍ය ලෙස ස්ථාවර දුරකථන ජාල (Fixed Telephone Networks), පුවත්පත් (Newspapers), තැපැල් මාර්ගික ක්‍රම (Postal Systems), විකාශන ජාල (Broadcasting networks), ජංගම දුරකථන ජාල (Mobile Telephone Networks), අන්තර්ජාලය (Internet) ආදිය විශේෂ වේ. ලෝකයේ බොහෝ රටවල උක්ත මාධ්‍ය ජනතාව සඳහා තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නිදහස ලබා දෙන ද්විතීයික ක්‍රම ලෙස හැඳින්විය හැකිය. ඕනෑම රටක නීති සහ ප්‍රතිපත්ති සම්පාදකයින් මෙන්ම විධායක බලතල දරන්නවුන් විසින් ස්වකීය රටෙහි පුරවැසියන් සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරමින් උක්ත ප්‍රවේශන මාර්ග හරහා ස්වකීය ප්‍රජාවට අවශ්‍ය තොරතුරු වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ඉඩ සලසා දීමට කටයුතු කළ යුතුය.

- **තෘතීය තොරතුරු අයිතීන්** ඃ අනෙකුත් පුරවැසියන් සහ පෞද්ගලික නීතිගත ආයතන සමඟ තිරස් තොරතුරු සම්බන්ධතා මඟින් තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවසර ලබා දීම තොරතුරු අයිතිය ස්ථාපනය කිරීමෙහි ලා තවත් එක් අංශයකි. මෙහිදී, තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය පුරවැසියන් සමඟ එක්ව ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරලීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් නිර්මාණය කිරීමේ වගකීම

පමණක් රජය මගින් සිදු කරනු ලබයි. එකී ක්‍රමවේද හරහා තොරතුරු වෙත ප්‍රවේශ වීමට ජනතාවට බලය ලබා දීම සිදුවේ. මෙවැනි ආකාරයට තොරතුරු වෙත ප්‍රවේශ වීමට අයිතිය ලබා දීම තිරස් තොරතුරු ප්‍රවේශය යනුවෙන් හඳුන්වනු ලබයි. තෘතීය ක්‍රම තුළින් ප්‍රජාවට තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය එතරම් ප්‍රචලිත සහ සාධිකාරී බවක් දක්නට නොමැති වුවත් රජයේ මැදිහත්වීමක් හෝ වගවීමකින් තොරව පෞද්ගලික ආයතන සහ පාර්ශව මගින් තොරතුරු ලබා ගැනීමට ප්‍රජාවට ඇති නිදහස මෙමගින් මතු කර දක්වයි. කෙසේ නමුත්, මෙවැනි තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවකාශ ඇත්තේ මහජනතාවගේම පරිශ්‍රමයන් මත මිස රජයේ මැදිහත්වීමකින් තොරව බව සැලකිය යුතුය. නමුත් එවැනි පාර්ශ්ව මගින් වුවද මූලික තොරතුරු ලබා දීම හෝ මූලික තොරතුරු ලබා ගැනීමේ අයිතීන් වෙත ජනතාව යොමු කිරීම හෝ සිදු කළ හැකිය.

උක්ත සඳහන් තොරතුරු පොදු මහජනතාව අතරට ගෙන යන ප්‍රධානතම ප්‍රවාහය වන්නේ මාධ්‍ය වන අතර එහිදී මාධ්‍ය විසින් සිය වගකීම මනාව තෝරා බේරා ගත්තක් විය යුතුය. තොරතුරු ලබා දීමේ දී මාධ්‍ය සදාචාරය සහ ආචාරධර්ම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනී, අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය තොරතුරු ප්‍රචාරය කරන ප්‍රධාන මෙවලම් ලෙස ගත හැකිය. සමාජයක දියුණුව සහ පිරිහීම තීරණය කරන ප්‍රධානතම ප්‍රවාහයක් වශයෙන් මාධ්‍ය හැඳින්විය හැකිය. පුරවැසියන් විසින් විවිධ තීරණ සහ විනිශ්චයන් වලට එළඹෙනුයේ මාධ්‍ය විසින් ලබා දෙන තොරතුරු පාදක කරගෙන බැවින් තමන් විසින් ලබා දෙන තොරතුරු පිළිබඳ වගකීමක් මාධ්‍යවලට ඇත. ජනතාවට නිවැරදි තොරතුරු අපක්ෂපාතීව ලබා දෙන ජන හිතකාමී මාර්ගෝපදේශකයෙකු ලෙස කටයුතු කරනවා වෙනුවට වර්තමානයේ බොහෝ මාධ්‍ය වෙළඳ භාණ්ඩ බවට පත් වී ඇත. සාධිකාරීත්වය, නිවැරදි බව කුමක් වුවත් ඔවුන්ගේ අවශ්‍යතාව වන්නේ වෘත්තීයමය තරඟකාරීත්වයන් සහ ඇතැම් දේශපාලන පක්ෂවල න්‍යායපත්‍රයන් ක්‍රියාත්මක කිරීමෙහි ලා උත්සුක වීමයි. මෙය බොහෝ රූපවාහිනී මාධ්‍ය මගින් සිදු කරනු ලබයි. තමන් ජනතාවට ලබා දෙන තොරතුරෙහි නිවැරදි භාවය ඔවුන්ට වැදගත් නැත. ඔවුන්ට අවශ්‍යවන්නේ තමා වටා සිටින අනෙක් මාධ්‍යවලට වඩා තමන් පළමුවැන්නා යයි කියා ගැනීමට පමණි. එසේම විවිධ දේශපාලන පක්ෂවල

යටි අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය දැක්වීම විනා ස්වකීය වගකීම ඉටු කරන බවක් වර්තමාන මාධ්‍ය මඟින් දැක ගත නොහැකිය. එවැනි තත්ත්වයක විශේෂයෙන් ලාංකීය මාධ්‍ය ප්‍රවාහයන් ජනතාවගේ තොරතුරු අයිතීන් කෙසේ නම් සුරක්ෂිත කරන්නේද? යන්න ප්‍රබල ගැටළුවක් බවට පත්ව ඇත. එසේම පුද්ගලයන්ගේ පෞද්ගලික ජීවිතවලට හානිදායක වන ලෙස තොරතුරු ප්‍රචාරය කරන බවට මාධ්‍ය මඟින් දැක ගත හැකිය. වර්තමානය තුළ බොහෝ අවස්ථාවල අපට ඇසීමට දැකීමට ලැබෙන්නේ මිනීමැරුම්, මංකොල්ලකෑම්, දූෂණ, වංචා ආදී දෑ වලට සම්බන්ධ සිද්ධීන් පමණක්මය. එහිදී එම අපරාධ සැලසුම් කර ඇති ආකාරය මෙන්ම එම අපරාධයට සම්බන්ධ පුද්ගලයාගේ පවුලේ සියලුම සාමාජිකයන් පිළිබඳ තොරතුරු ද ප්‍රචාරය කිරීම මාධ්‍ය මඟින් සිදු කරන ප්‍රබල වරදකි. එහිදී එම ප්‍රවෘත්තිය බලා සිටින අය අපරාධ සැලසුම් කරන ආකාරය පිළිබඳ දර්ශන දැකගන්නා අතර එකී දර්ශන සහිත ප්‍රවෘත්ති සහ වැඩ සටහන් තවත් අපරාධකරුවන්ට එම ක්‍රම අනුගමනය කිරීමට අනුබලයක් සහ පෙළඹවීමක් ද විය හැකිය. එසේම සිය දිවි නසා ගැනීම් පිළිබඳ නිරන්තර මාධ්‍ය මඟින් වාර්තා කරනු ලබයි. එය අසා සිටින දකින තවත් කෙනෙක්ට එය තම ප්‍රශ්නවලට විසඳුමක් යැයි බොහෝ විට සිතට එන්නට ද බැරි නැත. එපමණක් නොව එවැනි සිද්ධිවලට අදාළ පුද්ගලයන්ගේ පවුලේ අය පිළිබඳව පවා මාධ්‍ය මඟින් හෙළිදරව් කිරීම එම පුද්ගලයන්ගේ ජීවිත ද අගතියට පත් කිරීමක් විය හැකිය. මෙම ලිපිය තුළම පූර්වයෙහි සඳහන් කළ මාධ්‍යවේදී ජමාල් කෂෝගීගේ ඝාතනය සිදුවන්නේ සවුදි කොන්සාල් කාර්යාලයේ දී ඔහුගේ විවාහයට අවශ්‍ය ලියකියවිලි සම්බන්ධ කාර්යයක් සඳහා ඇයගේ පෙම්වතිය සමඟ එහි යන ගමනේදීය. එහිදී කෂෝගීගේ ඝාතනයෙන් පසු මාධ්‍ය විසින් ඔහුගේ පෙම්වතිය නිරන්තර සාකච්ඡා සඳහා කැඳවා මුළු ලෝකයටම නිරාවරණය කළ අවස්ථා දැකගත හැකි විය. ලොව බලවත් රාජ්‍යයක් විසින් සිය ප්‍රේමවන්තයාව අතිශය බිහිසුණු ලෙස ඝාතනය කළ පසු ඇය ලෝකය ඉදිරියේ නිරාවරණය කිරීම ඇයගේ ජීවිතයට ද තර්ජනයක් නොවන්නේ යැයි කිව හැකිද?. ඒ අනුව, පුද්ගලයන්ගේ පෞද්ගලික ජීවිතයට බලපාන සංවේදී සහ රහස් තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටීම මාධ්‍ය සතු වගකීමකි. එවැනි තොරතුරු ප්‍රචාරය කරමින් පුද්ගල පෞද්ගලිකත්වය හානියට පත් නොකළ යුතුය. එවැනි තොරතුරු සමාජගත කිරීම තොරතුරු අයිතිය ආරක්ෂා කිරීමක්

ලෙස සැලකිය නොහැකි අතර එය පුද්ගල සහ සමාජ පැවැත්මට අහිතකර ලෙස බලපාන බව තේරුම් ගැනීම මාධ්‍ය සතුය.

එම නිසා ඕනෑම මාධ්‍යයක් තොරතුරු ප්‍රචාරය කිරීමක දී නිවැරදිව හා විකෘති කිරීමකින් තොරව ප්‍රවෘත්ති වාර්තා කිරීම සහ ඡායාරූප පළකිරීම කෙරෙහි සාධාරණ පරෙස්සමකින් කටයුතු කළ යුතුය. එහිදී යම් ප්‍රවෘත්තියක නිවැරදි බව එය පළ කරන්නට ප්‍රථම සොයා බැලීම සඳහා කතුවරුන් මෙන්ම වාර්තාකරුවෝ සියලුම ආකාරයේ උත්සාහයන් ගත යුතු වේ. එවැනි සොයා බැලීමක් කළ නොහැකි අවස්ථාවලදී ඒ බව අදාළ වාර්තාවේ සඳහන් කළ යුතුය. එය නිවැරදි තොරතුරු දැන ගැනීමක් වෙත ප්‍රජාව යොමු කිරීමේ මූලික පියවරක් ලෙස සැලකිය යුතුය.

සෑම මාධ්‍යයක්ම සිදු කරන්නේ ජාතික සේවාවක් මෙන්ම වගකීමකි. එම වගකීම සිදු කළ යුත්තේ මාධ්‍ය ආචාර ධර්මවලට ගරු කරමින්ය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන රෝම ලන්දේසී නීතිය අනුව ඕනෑම මාධ්‍යයක පළවෙන ප්‍රකාශන කරුණු කාරණා අතින් සත්‍යම විය යුතුය. නමුත් වර්තමානයේ එහි ප්‍රායෝගිකත්වය පිළිබඳ විවිධ සැකසංකා මතුවෙමින් පවතින්නේ යැයි කීම සාවද්‍ය නොවේ. මාධ්‍ය මඟින් සිදු කරන වැරදි තොරතුරු ප්‍රචාරය සඳහා කදිම උදාහරණයක් ලෙස වර්ෂ 2019 අප්‍රේල් 21 සිදු වූ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන්ගේ නම් සහ ඡායාරූප ප්‍රසිද්ධ කිරිමට අදාළ සිද්ධිය දැක්විය හැකිය. අදාළ සැකකරුවන්ගේ නම් වලට අදාළ රූප රාමු ප්‍රසිද්ධ කිරීමේ දී එම සිදුවීමට සම්බන්ධ අබ්දුල් කාදර් ෆාතිමා කාදියා යන මුස්ලිම් සැකකාරියගේ නම යටතේ ඇමෙරිකානු මුස්ලිම් ක්‍රියාකාරිනියක සහ ගත් කතුවරියක වන අමාරා මජීඩ් යන අයගේ පින්තූරය පළ කරන ලදී. මෙම පුවත දුටු අමාරා මජීඩ් එම ප්‍රහාර මාලාව සිදුකළේ යැයි හඳුනාගෙන ඇති සැකකාරියකගේ නම යටතේ තමාගේ පින්තූරයක් දක්වා ඇති බවත් එම නමින් පෙනී සිටින තැනැත්තිය තමා නොවන බවත් තමාගේ නම අමාරා මජීඩ් බවත් පවසන අතර තව දුරටත් සිය ට්විටර් ගිණුම හරහා ඇය විසින් ප්‍රකාශ කර සිටින්නේ "කරුණාකර මෙම බිහිසුණු ප්‍රහාරයට මා පටලවා ගැනීම හෝ සම්බන්ධ කර ගැනීම වහාම නවත්වන්න. නිර්දෝෂී පුද්ගලයෙකුගේ පවුල සහ සමාජය විනාශ කළ හැකි මෙවැනි තොරතුරු පළකිරීමේ දී මින්පසු සැලකිලිමත් වන්න" යනුවෙනි. අතිශය බිහිසුණු

මෙම ත්‍රස්ත ක්‍රියාව සිදු කළ කණ්ඩායමට සම්බන්ධ නොවන නිර්දෝෂී කාන්තාවකගේ පින්තූරයක් පළ කිරීමෙන් ඇයගේ ජීවිත ආරක්ෂාවට එල්ල විය හැකි තර්ජනය සුළුවෙන් තැකිය නොහැකිය. ප්‍රචාරය සඳහා මෙවැනි තොරතුරු නිදහස් කරන පාර්ශව ඒවාගේ ඇති නිරවද්‍යභාවය නැවත නැවත සනාථ කර ගත යුතු අතර මාධ්‍ය ද අදාළ පුවත සහ ඊට අදාළ දර්ශන ප්‍රචාරය කිරීමට පෙර තමන් වෙත ලද තොරතුරුවල නිරවද්‍යබව සැක හැර දැන ගත යුතුය. එය මාධ්‍ය සදාචාරය සුරක්ෂිත කිරීම සඳහා වැදගත් වේ. එසේම පාස්කු ප්‍රහාරයෙන් මිය ගිය සංඛ්‍යාව මූලික සංඛ්‍යා දත්ත වලට අනුව 359 ක් බව ප්‍රකාශ කළ අතර එය වැරදි ගණනය කිරීමක් බව පවසමින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රහාරයෙන් මිය ගිය පුද්ගල මරණ සංඛ්‍යාව 253 ක් බව පසුව දැනුම් දෙන ලදී. මෙවැනි සංඛ්‍යාත්මක දත්ත ප්‍රචාරය කිරීමේ දී ඒවා තමන්ට ලැබෙන හෙයින්ම පමණක් විකාශය නොකර එහි නිරවද්‍යතාව ගැන නැවත නැවත විමර්ශනය කිරීමෙන් පසුව සත්‍යතාව තහවුරු කර ගෙන එම තොරතුරු ප්‍රචාරය කළ යුතුය. එය මාධ්‍ය සතු තරඟකාරීත්වය ගැන සිතනවාට වඩා එහා ගිය වගකීමක් ලෙස සැලකිය යුතුය.

අවසාන වශයෙන්, තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ එහි නීතිමය රාමුව මෙන්ම ප්‍රයෝගිකත්වය පිළිබඳ ජනතාව සතුව මනා අවබෝධයක් තිබේදැ?යි යන්න කෙරෙහි ඇත්තේ සැකයකි. මන්ද යත්, තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ එයට අදාළ නීතිමය සීමාවන් මෙන්ම එම නෛතික සීමා කඩ කිරීමට එරෙහිව බලපැවැත්වෙන දඬුවම් කෙබඳු ද? යන්න ආදී කාරණා පිළිබඳව ජනතාව දැනුවත් කිරීමෙහි ලා ක්‍රියාත්මක වන රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තරමය වශයෙන් සෑහීමකට පත් විය හැකිද? යන ප්‍රශ්නාර්ථය මතුව තිබීමයි. එබැවින් හුදෙක් සිය වගකීම වන්නේ තොරතුරු දැන ගැනීමේ අයිතිය නෛතිකව ස්ථාපිත කිරීම පමණකැයි යන හිතළුවෙන් මිදී එකී අයිතිය පිළිබඳ ජනතාව නිරන්තර අවදියෙන් තැබීමට ද කටයුතු කිරීම රජය සහ එහි ක්‍රියාත්මක වන මාධ්‍ය ප්‍රවාහයන් විසින් අත්‍යාවශ්‍යයෙන්ම සිදුකළ යුතු සෙසු වගකීම් ලෙස සලකා කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවක් බව ද සඳහන් කළ යුතුය. එබැවින්, තොරතුරු දැන ගැනීමේ අයිතිය යනු යහපාලන රාජ්‍ය සංකල්පය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමෙහි ලා තව දුරටත් පුළුල්ව සහ

නිරන්තරව සමාජය තුළ කතිකාවට භාජනය විය යුතු සුවිශේෂී මාතෘකාවක් බව සඳහන් කළ යුතුය.

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


ගුණතිලක, පී. (2014). තොරතුරු දැන ගැනීමේ අයිතියඃ ජනමාධ්‍යවේදීන් සඳහා මාර්ගෝපදේශයක්. කොළඹඃ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය.

මහේන්ද්‍ර, එස්. (2010). නිර්මාණාත්මක චින්තනය සහ මාධ්‍ය භාවිතය. කොළඹඃ ගොඩගේ.

රාජපක්ෂ, ඩබ්ලිව්. (2007). ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු වරප්‍රසාද පනත. කොළඹඃ ගොඩගේ.

රාජපක්ෂ, ඩී. එස්. එන්. (2007). ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු වරප්‍රසාද පනත. කොළඹඃ ගොඩගේ.

Knoppers, B. M. (2006). From the Right to Know to the Right Not to Know. *Journal of law, medicine & ethics*. 42(1). 6-10. doi.org/10.1111/jlme.12113.

Laurie, G. (2014). Recognizing the right not to know. *Journal of law, medicine & ethics*. 42(1). 53-63. doi.org/10.1111/jlme.12118.

Mokrosinska, D. (2018). The people’s right to know and state secrecy. *Canadian Journal of Law & Jurisprudence*. 31(1). 87-106. doi: 10.1017/cjlj.2018.4


**(මෙම ලිපිය කර්තෘන් විසින් රචනා කොට ප්‍රකාශය කිරීමට නියමිත කෘතියක කොටසක් බව සැලකිය යුතුයි.)**

# පුස්තකාල සූචිකරණ නීති පද්ධතියේ නව ප්‍රවණතා පිළිබඳ හැඳින්වීමක්

ජී. ආර්. පද්මසිරි

ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණය (AACR 2) 1978 දී ප්‍රකාශයට පත්වූ අතර අවස්ථා කීපයකදීම එය නැවත සංශෝධනය විය. එම නීති පද්ධතිය මූලික වශයෙන් පත්‍රිකා සූචියක් අරමුණු කරගෙන සම්පාදනය වූ බව පෙනී යයි. පරිගණක සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ (ICT) සීඝ්‍ර වර්ධනයත්, ප්‍රකාශන ක්ෂේත්‍රයේ පෙරළිකාර වෙනස් වීම අනුව බිහිවන ඉලෙක්ට්‍රොනික පොත් සහ වාර සඟරා (E-books & E-journals) වැනි ඉලෙක්ට්‍රොනික ප්‍රකාශනත්, සංඛ්‍යාංක පුස්තකාල (Digital Libraries) සහ අතථ්‍ය පුස්තකාල (Virtual Libraries) බිහිවීමත් සමඟ, නව තොරතුරු මාධ්‍ය විස්තර කිරීමටත්, එම මාධ්‍ය කරා ළඟාවීමට ප්‍රවේශ මාර්ග සම්පාදනයටත් අවශ්‍ය ප්‍රතිපාදන සැකසිය යුතු බව සූචිකරණ නීති සම්පාදකයින්ගේ අවධානයට ලක්විය. ඒ අනුව, ඇමෙරිකානු පුස්තකාල සංගමය, ඕස්ට්‍රේලියානු සූචිකරණ කමිටුව, බ්‍රිතාන්‍ය පුස්තකාලය, කැනේඩියානු සූචිකරණ කමිටුව, පුස්තකාල හා විඥාපන වෘත්තිකයින්ගේ වරලත් ආයතනය, කොන්ග්‍රස් පුස්තකාල යන ආයතනයනගෙන් සමන්විත සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය සම්පාදනය පිළිබඳ ඒකාබද්ධ මෙහෙයුම් කමිටුව (Joint Steering Committee for Development of RDA-(JSC)) නව සූචිකරණ නීති සංග්‍රහයක් සම්පාදනය කිරීම සඳහා 1990 දශකයේ දී සාකච්ඡා ආරම්භ කරන ලදී. එහිදී ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 3 වන සංස්කරණයක් (AACR 3) වෙනුවට නව නීති සංග්‍රහයක් සම්පාදනය කිරීමට තීරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (Resource Description and Access – RDA) ප්‍රමිතිය බිහිවිය. මෙම ප්‍රමිතිය සම්පාදනයේ දී ISBD, Dublin Core වැනි ප්‍රමිතීන් පිළිබඳව අවධානය යොමුකර ඇති අතර MARC 21 ප්‍රමිතිය අවශ්‍ය සංශෝධන සහිතව භාවිත කර ඇත.

සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) ප්‍රකාශ කරන පරිදි මෙම ප්‍රමිතියේ පදනම වනුයේ උපයෝජකයාගේ අභිමතාර්ථ සපුරා ගැනීම වේ. එසේ නම්, සී. ඒ. කටර්විසින් ඉදිරිපත් කරන ලද පුස්තකාල සූචියක අරමුණු උපයෝජකයා පදනම් කරගෙන නොවේදැයි කෙනෙකුට තර්ක කළ හැකිය. පුස්තකාල සූචි සම්පාදනයේ ආරම්භයේ සිට ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණය දක්වාම සූචිකරණ නීති පද්ධතීන් විමර්ශනය කිරීමේ දී ඒ සියල්ලෙහිම මූලික අරමුණ වී ඇත්තේ උපයෝජකයාට තම තොරතුරු අවශ්‍යතාවය කාර්යක්ෂමව ඉටුකර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශය සැපයීමයි. ඒ අනුව බැලූ කළ සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) මගින් සිදුකෙරෙනුයේ ද එම කාර්යයම වන අතර කෘතියක නිර්මාණකරුවා සහ නිර්මාණය පිළිබඳව විස්තර කිරීමේ ක්‍රමවේදය පුළුල් ලෙස භාවිත කරමින් උපයෝජකයාගේ එළඹුම කුමන ප්‍රවේශ ලක්ෂ්‍යයක් ඔස්සේ වුව ද වඩාත් කාර්යක්ෂමව තම තොරතුරු අවශ්‍යතාව ඉටුකර ගැනීමට පහසුකම සපයා ඇත.

සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) යනු FRBR සහ FRAD යන සංකල්පිත පාදක ව්‍යුහය (Framework) පදනම් කරගෙන ගොඩනගන ලද විස්තරාත්මක සූචිකරණය සඳහා විධිමත්ව ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත සකස් කර ගැනීමට උපදෙස් සහ මාර්ගෝපදේශය සපයන ප්‍රමිතියක් ලෙස හැඳින්විය හැකිය. වර්තමානයේ දිනෙන් දින වැඩි දියුණුවන පරිගණක සහ සන්නිවේදන තාක්ෂණය සමග කටයුතු කරන පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සඳහා මෙම ප්‍රමිතිය විශේෂයෙන් සැලසුම් කර ඇත. කෙසේ වුවත් මෙම ප්‍රමිතිය මගින් සියලුම ආකාරයේ එනම් සමකාර්යය සහ සංඛ්‍යාංක (Analogue and Digital) සම්පත් විස්තර කිරීම සඳහා නම්‍යශීලී පාදක ව්‍යුහයක් සපයා ඇත. තවද වර්තමානයේ ඇති සහ බිහිවන දත්ත පදනම්වල (Databases) ආකෘතියට සකස් කරගත හැකි සහ දැනට පවත්නා මාර්ගගත සූචිවල සංලේඛවලට අනුරූප කරගත හැකි අයුරින් උපදෙස් සහ මාර්ගෝපදේශ සපයා ඇත.

ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාවල කාර්ය බද්ධ අවශ්‍යතා (Functional Requirements of Bibliographic Records - FRBR) 1990 දශකයේ දී

පුස්තකාල සංගම්වල ජාත්‍යන්තර සම්මේලනය (International Federation of Library Associations - IFLA) මගින් ගොඩනගා ඇත. උපයෝජකයාගේ හැසිරීම සහ තොරතුරු සමුද්ධරණය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව විස්තර කිරීම මෙහි මූලික අරමුණ වී ඇත. ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාවල කාර්ය බද්ධ අවශ්‍යතා (FRBR) ප්‍රධාන කරුණු හතරක් කෙරේ අවධානය යොමු කර ඇත. එනම්,

1. සොයා ගැනීම (Find)
2. හඳුනා ගැනීම (Identify)
3. තෝරා ගැනීම (Select)
4. ලබා ගැනීම (Obtain)

සූචිකරණ දත්ත වල උපයෝජකයා අවධානය යොමුකරන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් පිළිබඳව ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාවල කාර්ය බද්ධ අවශ්‍යතා (FRBR) නිර්වචනය කරයි. එනම්,

1. බුද්ධිමය හෝ කලාත්මක ප්‍රයත්නයකින් බිහිවන නිෂ්පාදන
2. බුද්ධිමය හෝ කලාත්මක අන්තර්ගතයට වගකියන වස්තූන් (Entities) ; භෞතික නිෂ්පාදනයට සහ බෙදාහැරීමට හෝ භාරකාරත්වයට
3. බුද්ධිමය හෝ කලාත්මක ප්‍රයත්නයට සම්බන්ධව කටයුතු කරන අතිරේක වස්තූන් (Entities)

මෙම ක්ෂේත්‍ර, පළමු කාණ්ඩයේ වස්තූන් (Group 1 Entities), දෙවන කාණ්ඩයේ වස්තූන් (Group 2 Entities), තුන්වන කාණ්ඩයේ වස්තූන් (Group 3 Entities) යනුවෙන් නම් කර ඇත.

## පළමු කාණ්ඩයේ වස්තූන් (Group 1 Entities)

### කෘතිය - Work

නිශ්චිත බුද්ධිමය හෝ කලාත්මක නිර්මාණයක් කෘතියක් ලෙස හැඳින්වේ. උදාහරණ ලෙස මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ගම්පෙරළිය දැක්විය හැකිය.

## ප්‍රකාශනය - Expression

බුද්ධිමය හෝ කලාත්මක අන්තර්ගතය ප්‍රකාශ කරන විධික්‍රමය ලෙස සරලව ප්‍රකාශනය යන සංකල්පය හැඳින්විය හැකිය. අක්ෂර සහ අංක යන දෙවර්ගයම (Alpha-Numeric), සංගීත හෝ නර්තනය පිළිබඳ ප්‍රස්තාර, ශබ්ද, ද්‍රව්‍ය (Object) ආදිය හෝ ඒවායේ ඕනෑම සංකලනයක් ලෙස විවිධ ස්වරූපයන්ගෙන් ප්‍රකාශ කෙරෙන බුද්ධිමය හෝ කලාත්මක සාක්ෂාත්කරණය (Realization), ප්‍රකාශනය ලෙස තවදුරටත් හැඳින්විය හැකිය.

## පළකිරීම - Manifestation

කෘතියක ප්‍රකාශනයේ භෞතික නිරූපණය ලෙස පළකිරීම හැඳින්විය හැකිය. බුද්ධිමය අන්තර්ගතයට සහ භෞතික ස්වරූපයට අදාල, සමාන ගති ලක්ෂණ දරන සියලුම භෞතික ද්‍රව්‍ය, වස්තුවක් (Entity) වශයෙන් පළකිරීම (Manifestation) නියෝජනය කරයි.

## අයිතමය - Item

කෘතියක, නිශ්චිත පළකිරීමක, එක් නිදර්ශනයක් ලෙස අයිතමය (Item) හැඳින්වේ. අයිතමයක උප ලක්ෂණ ලෙස එය හැඳින්වීම සඳහා භාවිත කෙරෙන තීරුකේතය (Barcode), අයිතමයේ තත්ත්වය (හානි සිදුවී තිබීම, පිටු අසම්පූර්ණ වීම) දැක්විය හැකිය. කෘතියක නිශ්චිත පළකිරීමක ස්ථානගත කිරීමකට අදාල තොරතුරු අයිතමය යටතේ විස්තර කෙරේ. මෙහි දී යම් නිශ්චිත පුස්තකාල ද්‍රව්‍යයක ස්ථානගත කිරීමට අදාල ඉලෙක්ට්‍රොනික තොරතුරු ද ඇතුළත්ව තොරතුරු සහ එයට ප්‍රවේශ විය හැකි ආකාරය පිළිබඳවද තොරතුරු සපයයි. උදාහරණ ලෙස නිශ්චිත පුස්තකාලයක්, අන්තර්ජාල ලිපිනය (Universal Resource Locator – URL), සංඛ්‍යාංක ද්‍රව්‍ය හැඳින්වීම (Digital Object Identifier – DOI). තවද, යම් කිසි වස්තුවකට ළඟාවිය හැකි ක්‍රමවේද එකකට වඩා ඇත්නම් ඒ පිළිබඳවද තොරතුරු මෙහි දී අන්තර්ගත කෙරේ.

## දෙවන කාණ්ඩයේ වස්තූන් (Group 2 Entities)

බුද්ධිමය හෝ කලාත්මක අන්තර්ගතයට වගකියන පුද්ගලයින් හෝ ආයතනවල තොරතුරු දෙවන කාණ්ඩයේ වස්තූන් වාර්තා කරයි. දෙවන කාණ්ඩයේ වස්තූන්වලට උදාහරණ ලෙස කතුවරුන්, පරිවර්තකයින්, සංස්කාරකවරුන්, පිටපත් රචකයින් හෝ ප්‍රකාශකයින්, නිශ්පාදකයින් දැක්විය හැකිය. දෙවන කාණ්ඩයේ වස්තූන්, පළමු සහ දෙවන කාණ්ඩයේ වස්තූන් අතර ඇති සම්බන්ධතාවය විස්තර කරනු ලබයි. එනම්, යම් කෘතියක් එක් නිර්මාණකරුවෙක් හෝ ආයතනයක් මගින් නිර්මාණය කිරීමෙන් අනතුරුව වෙනත් පුද්ගලයකු හෝ ආයතනයක් මගින් එය අක්ෂර, සංඛ්‍යා හෝ වෙනත් ස්වරූපයකට පරිවර්තනය කළ හැකිය. උදාහරණ ලෙස මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ ගම්පෙරළිය නව කථාව ලෙස්ටර් ජෙම්ස් පීරිස් මහතා විසින් චිත්‍රපටයක් බවට පරිවර්තනය කිරීම දැක්විය හැකිය.

## තුන්වන කාණ්ඩයේ වස්තූන් (Group 3 Entities)

පළමු කාණ්ඩයේ සහ දෙවන කාණ්ඩයේ බුද්ධිමය ප්‍රයත්නයන්ගේ විෂය පථයට ගැනෙන සංකල්ප (Concept), ද්‍රව්‍ය (Object), ඉසව් (Events) සහ ස්ථාන (Place) තුන්වන කාණ්ඩයේ වස්තූන් වේ, සංකල්ප - විෂය ශිර්ෂ, මාතෘකාමය පද වලින් පළමු කාණ්ඩයේ අන්තර්ගත අදහස් නිරූපණය වේ. ද්‍රව්‍ය යනු මුද්‍රිත පොත්, DVD වැනි භෞතික ද්‍රව්‍ය වේ. ඉසව් යනු නිශ්චිත ස්ථානයක සහ වේලාවක දී සිදුවන ක්‍රියාවන්ය. ප්‍රාදේශික හෝ පෘථිවියෙන් බැහැර ප්‍රදේශ ස්ථාන වේ. ඒවා ඓතිහාසික, සමකාලීන සහ භූගෝලීය සහ/ හෝ දේශපාලනික බල ප්‍රදේශ විය හැකිය.

## සාධිකාරී දත්තවල කාර්ය බද්ධ අවශ්‍යතා (Functional Requirements for Authority Data)

සාධිකාරී දත්තවල කාර්ය බද්ධ අවශ්‍යතා ආකෘතිය සම්පත් විස්තර කිරීම සඳහා භාවිත වස්තූන් (Entities), සහසම්බන්ධතා (Relationships) සහ උප ලක්ෂණ (Attributes) ආදියෙන් සමන්විත වේ. පළමු, දෙවන සහ

තුන්වන කාණ්ඩ වල වස්තූන් උප ලක්‍ෂණ මගින් විස්තර කෙරෙන අතර එකිනෙක අතර පවතින සහසම්බන්ධතාවය මත ඒවා සම්බන්ධ කළ හැකිය. උදාහරණ ලෙස කෘතියක උප ලක්‍ෂණ ලෙස ග්‍රන්ථ නාමය, ලේඛන ශෛලිය, කලා ශෛලිය ආදිය ද, පුද්ගලයකුට අදාල උප ලක්‍ෂණ ලෙස උපන් දිනය, ස්ත්‍රී/ පුරුෂ භාවය ආදිය ද දැක්විය හැකිය.

## ඇංග්ලෝ ඇමෙරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණයේ (AACR 2) සහ සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) ප්‍රමිතිය අතර දැකිය හැකි වෙනස්කම්

ඇංග්ලෝ - ඇමෙරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණය (AACR 2) පොත්, පුස්තිකා සහ මුද්‍රිත පත්‍රිකා, සිතියම් විද්‍යාත්මක ද්‍රව්‍ය, අත්පිටපත් යනාදී වශයෙන් හඳුනාගත් ද්‍රව්‍ය සූචිගත කිරීම සඳහා නීති සම්පාදනය කර ඇති අතර සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) ඕනෑම ද්‍රව්‍යකට අදාළ කරගත හැකි මූලධර්ම පද්ධතියක් හඳුන්වා දී ඇත. ඇංග්ලෝ - ඇමෙරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණය (AACR 2) පළමු කොටස විස්තර කිරීම් සඳහා සහ දෙවන කොටස ශීර්ෂ, ඒකීය ග්‍රන්ථ නාම සහ විමර්ශන යනුවෙන් කොටස් දෙකකට බෙදා ඇති අතර සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) පළමු කොටසේ සිට හතරවන කොටස දක්වා උප ලක්‍ෂණ (Recording Attributes) වාර්තා කිරීමටත්, පස්වන කොටසේ සිට දහවන කොටස දක්වා සහසම්බන්ධතා (Recording Relationships) වාර්තා කිරීමටත් වෙන්කර ඇත. එමෙන්ම එහි විශේෂිත දින, සම්බන්ධිත ස්ථාන, ලිපිනයන්, ක්‍රියාකාරී ක්ෂේත්‍ර, අනුබද්ධ කිරීම, වෘත්තිය, ස්ත්‍රී/ පුරුෂ භාවය, පවුල් තොරතුරු, සම්බන්ධිත භාෂාව යනාදී වශයෙන් සාධිකාරී දත්ත සඳහා උපදෙස් සපයා ඇත. ඇංග්ලෝ - ඇමෙරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණයේ (AACR 2) භාවිත පද වෙනුවට සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) ප්‍රමිතියේ දී වෙනත් පද මාලාවක් භාවිත කරන බව පහත වගුවෙන් පැහැදිලි වනු ඇත.

## භාවිත පද (Terminology)

| ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණය (AACR 2) | සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) |
|---|---|
| කර්තෘ (Author) | නිර්මාණකරු (Creator) |
| ප්‍රදේශය (Area) | මූලය (Element) |
| ප්‍රධාන සංලේඛය (Main Entry) | සාධිකාරී ප්‍රවේශ ලක්ෂ්‍යය (Authorized Accents Point) |
| ශීර්ෂය (Heading) | සාධිකාරී ප්‍රවේශ ලක්ෂ්‍යය (Authorized Accents Point) |
| ඒකීය ග්‍රන්ථ නාම (Uniform Title) | කෘතියක් සඳහා වරණීය ග්‍රන්ථ නාමය (Preferred Title for a Work) |
| බලන්න විමර්ශන (See Reference) | විචල්‍ය ප්‍රවේශ ලක්ෂ්‍යය (Variant Accents Point) |

## වගකීමේ ප්‍රකාශය (Statement of Responsibility)

ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 2 සංස්කරණය අනුව වගකීමේ ප්‍රකාශය පුද්ගලයින්/ ආයතන තුනකට සීමා කර තිබුනද සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) මගින් එම සීමාව ඉවත් කර සංඛ්‍යාව නොසලකා වගකීමේ ප්‍රකාශය අන්තර්ගත කිරීමට උපදෙස් දී ඇත. විකල්ප අතහැරීමක් වශයෙන් පමණක් අවශ්‍ය නම් පුද්ගලයින්/ ආයතන තුනකට සීමා කිරීම සිදු කළ හැකිය.

## සම්පත් ප්‍රභේද කරණය (Categorization of Resource)

## පොදු ද්‍රව්‍ය විස්තරය (General Material Designation – GMD)

ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 2 සංස්කරණය අනුව භාවිත කරන ලද පොදු ද්‍රව්‍ය විස්තරය (GMD) වෙනුවට සම්පත් ප්‍රභේද තුනක් හඳුන්වා දී ඇත.

1. මාධ්‍ය වර්ගය (Media Type)- පෙළ, සිතියම් විද්‍යාත්මක ද්‍රව්‍ය, සංගීත ප්‍රස්තාර
2. වාහක වර්ගය (Carrier Type)- ශ්‍රව්‍ය, දෘෂ්‍ය, සූක්ෂ්ම ස්වරූප, වීඩියෝ
3. අන්තර්ගත වර්ගය (Content Type)- ෆිල්ම් රෝල්, චිත්‍රපට, විනිවිදක, ස්ලයිඩ්

## කෙටියෙදුම් භාවිතය (Abbreviations)

කෘතියක අන්තර්ගත කෙටියෙදුම් හැර කෙටි යෙදුම් භාවිතය සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) ප්‍රමිතිය මගින් උපයෝජකයාගේ පහසුව පිණිස අවම කර ඇත. ඒ අනුව කෙටි යෙදුම වෙනුවට පදය හෝ වැකිය අන්තර්ගත කෙරේ.

උදා : [s.l.] / [Place of publication not identified]

[s.n.] / [Publisher not identified]

[et al.] / Names of all the authors

10p. : col. Ill ; 20cm. / 10 pages : color illustrations ; cm.

ed. / Edition

3 vol. / 3 Volumes

ca. 200p. / approximately 200 pages

පුස්තකාල සුචිකරණ ක්ෂේත්‍රයේ භාවිත නවතම ප්‍රමිතිය සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) වන අතර එය දැනටමත් කොන්ග්‍රස් පුස්තකාලය, බ්‍රිතාන්‍ය පුස්තකාලය වැනි පුස්තකාල වල භාවිත කෙරේ. වේගයෙන් ඉලෙක්ට්‍රොනික තොරතුරු මූලාශ්‍ර කෙරේ යොමුවන ශ්‍රී ලංකාව වැනි රටවල, විශේෂයෙන් විශ්වවිද්‍යාල පුස්තකාලවල සුචිකරණ ක්ෂේත්‍රයේ ඒකීය බවක් ඇති කිරීමටත්, උපයෝජකයාට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමටත් මෙවැනි නව ප්‍රවණතා කෙරේ අවධානය යොමු කිරීම බෙහෙවින් උපකාරී වනු ඇත.

සටහන: සම්පත් විස්තර කිරීම සහ ප්‍රවේශය (RDA) ප්‍රමිතියෙහි භාවිත තාක්‍ෂණික පද සඳහා සිංහල පද සම්පාදනය වී නොමැති බැවින්, ඉංග්‍රීසි - සිංහල භාෂා ශබ්දකෝෂ ඇසුරෙන් ආසන්න වශයෙන් ගැළපෙන සිංහල පද මෙහිදී භාවිත කර ඇති බව සැලකිය යුතුය.

## ආශ්‍රේය


Anglo-American cataloguing rules෧ (1988). 2nd ed., 1988 revision. Ottawa: Canadian Library Association.

Jones, ED. (2014). *RDA and serials cataloguing*. New Delhi: DBS Imprints.

Oliver, C. (2011). RDA: a quick introduction February. Available at:http://www.rda-jsc.org/archivedsite/docs/1-OLA-2011-RDA-introduction-Oliver.pdf (accessed 20 July. 2019).

Weber, MB (2013) *Describing electronic, digital and media using AACR2 and RDA: a how-to-do-it manual and CD-ROM for librarians*. New Delhi: DBS Imprint.

# සහශ්‍රක ඉගෙනුම්කරුවන්ට ඵලදායී ලෙස පහසුකම් සැලසීම සඳහා අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන්ගේ කුසලතා සහ නිපුණතා පරිණාමනය කිරීම

ආචාර්ය වත්මානෙල් සෙනවිරත්න

අප ජීවත් වන නූතන යුගය ''දැනුමේ යුගයක්'' ලෙස අර්ථ දක්වා ඇති අතර සමාජය ''දැනුම් සමාජය'' ලෙස අර්ථ දක්වා ඇත. මේ අතර සමහර තර්කයන්ට අනුව තොරතුරු සමාජය දැනුම නිර්මාණය සඳහා පදනම ද වේ. බුද්ධිමය ප්‍රාග්ධනයේ පදනම වන දැනුම, දැනුම් සමාජයේ ධාවකය වන අතර එය සමාජ ජීවිතය සංකීර්ණ කර නව සමාජ අනන්‍යතා බිහිවීමට මංපෙත් විවර කර තිබේ. මෙම සමාජයේ ක්‍රියාකාර සාමාජිකයන් ලෙස පුස්තකාලයාධිපතිවරු සමාජ අවකාශය, ව්‍යාපාරික අවකාශය, පුරවැසි ප්‍රඥප්ති ආදී සියලු අංශවල දී දැනුම් හුවමාරුවල නිරත වෙති. බුද්ධිමය ප්‍රාග්ධනය, දැනුමේ විවෘතභාවය සහ විවෘත විද්‍යාව, බුද්ධිමය ප්‍රාග්ධනයේ ප්‍රකාශන හිමිකම්, විවෘත සංස්කෘතිය, සයිබර් අවකාශය, ඩිජිටල් ජීවන රටාව, විඥාපන විද්‍යාව නැමැති විෂය ක්ෂේත්‍ර නිර්මාණය කලා වූ, සමාජ ක්‍රියාකාරකම් වලදී තාක්ෂණයට අනුවර්තනය වීම, සාම්ප්‍රදායික නොවන ජීවන රටා ආදී විවාදාත්මක කතිකාවන් වෙත නූතන සමාජය යොමු වී තිබේ. කාර්මික ආර්ථිකය තුළ භෞතික ප්‍රාග්ධනය (ඉඩම්, උපකරණ, ගොඩනැගිලි) සහ මූල්‍ය ප්‍රාග්ධනය නිෂ්පාදනයේ මූලික සාධක සහ ධනයේ ප්‍රභවයන් විය. නමුත් දැනුම් ආර්ථිකය තුළ තොරතුරු, දැනුම සහ බුද්ධිමය ප්‍රාග්ධනය නිෂ්පාදනයේ මූලික සාධකයන් වන අතර එය ධනය උත්පාදනය කිරීමේ ප්‍රධාන ප්‍රභවය වේ. තොරතුරු සමාජයේ ප්‍රධාන ධාවකයා ලෙස තාක්ෂණික දියුණුව සමාජ ජීවිතයේ සියලු අංශ කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කර තිබේ. මෙම පරිණාමනයේ ප්‍රධාන බලපෑම් ක්ෂේත්‍රය ලෙස තොරතුරු අංශය සහ එහි ප්‍රධාන පාර්ශවකරුවා ලෙස පුස්තකාලයාධිපතිවරුන්ගේ නිපුණතා බරපතල ලෙස අභියෝගයට ලක්ව තිබේ. දැනුම් සමාජයේ අතිශයින්ම වැදගත් කාර්යභාරයක් උසස් අධ්‍යාපනය ඉටු කරන බැවින් අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන්ගේ නිපුණතා පිළිබඳ තීරණාත්මක සූක්ෂම අවබෝධයක් මෙම තත්වයට අවශ්‍ය වේ. විශ්වවිද්‍යාල යනු පර්යේෂණ පදනම් කරගත් දැනුම උත්පාදනය කරන වේදිකා වන අතර එමනිසා ආර්ථිකය, තාක්ෂණය සහ

සමාජ ජීවිතය හැඩගැස්වීමේ දී උසස් ඉගෙනුම් ආයතන ලෙස විශ්වවිද්‍යාල කෙරෙහි දැනුම සමාජයේ බලපෑම සුවිශේෂී වේ. ශීඝ්‍රයෙන් වර්ධනය වන මෙම තත්වය වටා, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ක්‍රියාකාරිත්වයන් සහ විධිවිධාන සමග නව අනන්‍යතා මතුවී ඇති අතර, එහිදී අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය ද කාලීන ව නිශ්චය කරන ලද කුසලතා හා නිපුණතා සමූහයක් ද සමග නව අනන්‍යතාවයක් බවට පරිවර්තනය විය යුතු යැයි අභියෝගට ලක් වී ඇත. අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන්ගේ නිපුණතා අතර ***බුද්ධිමය ප්‍රාග්ධන වත්කම්*** ඉතා වැදගත් වන අතර ඒවා පැහැදිලිව හඳුනාගත යුතුය.

නුවණින් සලකා බැලීමේ දී දැනුම් ආර්ථිකය විවෘත හා විද්‍යුත් ඉගෙනුම් තුළින් අධ්‍යාපනයේ සීමා මායිම් අභිබවා ඉගෙනුම ලබන අය වෙත ළඟා වීමෙන් මානව ප්‍රාග්ධන සංවර්ධනයට ඉඩ සලසන අතර නිපුණතා ගොඩනැගීම නූතන සමාජයේ ක්‍රියාකාරී පුරවැසියෙකු වීමේ අවශ්‍යතාවයක් බවට පත්විය. නූතන තාක්ෂණය හා අධ්‍යාපන සවිබල ගැන්වීම් සමග සමාජ සවිබල ගැන්වීම තුළින් දැනුම් සමාජයේ පවත්නා තත්වය යාවජීව ඉගෙනීම ප්‍රවර්ධනය කිරීමට මඟ පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ. සහස්‍ර උපයෝජකයාගේ තොරතුරු ඉල්ලුම, තොරතුරු අවශ්‍යතාවයේ ක්ෂණික බව මත ජනනය වන අතර ඔවුන්ගේ හැසිරීම් රටා තොරතුරු ලබා ගැනීම සඳහා පමණක් නොව දැනුම ලබා ගැනීම, දැනුම හුවමාරුව, දැනුම සංස්ලේෂණය සහ පුනර්ජනනය යනාදිය සඳහා ද අරමුණු වේ.

එබැවින් තොරතුරු සැපයීමේ විෂය ගතික කෝණයකට වෙනස් වී ඇත. උදාහරණයක් ලෙස තොරතුරු අත්පත් කර ගැනීම දැනුම අත්පත් කර ගැනීමට පරිනාමණය වීම, තොරතුරු භාවිතය දැනුම භාවිතය හා දැනුම හුවමාරුව බවට පරිනාමණය වීම, තොරතුරු බෙදා හැරීම දැනුම සඳහා ප්‍රවේශය බවට පරිනාමණය වීම, තොරතුරු සාක්ෂරතා අධ්‍යාපනය ඉගෙනීමට ඉගෙනීමේ කුසලතා බවට පරිනාමණය වීම, තොරතුරු සෙවීමේ කුසලතා දැනුම සොයා ගැනීම සඳහා පරිණාමනය වීම, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු විවෘත ප්‍රවේශ බලපත්‍ර හරහා සම්පූර්ණ ලිපි දක්වා යොමු වීම ආදී. මේ අනුව තොරතුරු සැපයීම දැනුම පහසු කිරීම සඳහා පරිනාමණය කිරීම පුස්තකාලයාධිපතිවරුන් විසින් කාර්යක්ෂමව හා අර්ථවත් ලෙස සාක්ෂාත් කර ගත යුතුය.

මෙම සන්දර්භය තුළ ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරුන් වන අප තේරුම් ගත යුත්තේ විද්‍යුත් සම්පත් හා ඩිජිටල්කරණය කළ සම්පත් ප්‍රධාන වෙළඳ භාණ්ඩ වන අතර අතථ්‍ය නාලිකා යනු සහස්‍ර සේවාදායකයා වෙත ළඟා වීමේ ව්‍යාප්ති ක්‍රමවේදය බවයි. මෙම පාරිභෝගික භාණ්ඩ කළමනාකරණය කිරීමේ දී විශ්වවිද්‍යාල ඔවුන්ගේ ආචාර්යවරුන්ට, විද්‍යාර්ථයින්ට සහ පර්යේෂකයන්ට දැනුම ලබා දීම සඳහා පුස්තකාලයාධිපතිවරුන්ගෙන් විවිධ දායකත්වයන් අපේක්ෂා කරනු ලැබේ. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවාදායකයින් අපේක්ෂා කරන මෙම අභියෝගාත්මක සේවාවන් සහ පහසුකම් සැපයීමට අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන් කටයුතු කරන්නේ කෙසේද යන්න සලකා බැලිය යුතු කරුණකි. විශ්වවිද්‍යාලය අපේක්ෂා කරන සහස්‍රයේ උපාධි පැතිකඩ ගොඩනැගීමට පුස්තකාලයාධිපතිවරුන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ලෙස කෙතරම් ඵලදායී ලෙස දායක වේද යන්න අප විසින්ම සලකා බැලීම කාලීනව වැදගත් ය.

## දැනුම සමාජයට අවශ්‍ය නිපුණතා

2017 දිල්ලියේ දී පැවති 'One Globel Forum' (OGF, 2017) පිළිබඳ දෙදින ගෝලීය සමුළුවේ දී කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව නවෝත්පාදන, අධ්‍යාපනය, නිපුණතා සංවර්ධනය, පර්යේෂණ සහ විද්‍යාව දැනුම් සමාජයක ප්‍රධාන ධාවක බලවේගයන් වන අතර එබැවින් අධ්‍යාපනය නූතන සමාජයේ ප්‍රමුඛතම අංගය වේ. World of Education 2015 දී ප්‍රකාශයට පත් කරන ලද පියර්සන් ඉගෙනුම් වක්‍රය (The Pearsons Learning Curve) මඟින් නූතන විද්‍යාර්ථයාට නායකත්වය, ඩිජිටල් සාක්ෂරතාවය, සන්නිවේදනය, චිත්තවේගාත්මක බුද්ධිය, ව්‍යවසායකත්වය, ගෝලීය පුරවැසිභාවය, ගැටළු විසඳීම සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් ආදී ඉගෙනුම් කුසලතා 08 ක් අවශ්‍ය බව පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කේ-සෑම් අනුකූලතා ආකෘතියට (K-SAM compliance model) අනුව, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) : (2015) ප්‍රථම උපාධි අපේක්ෂකයෙකු (UG) ස්වකීය අධ්‍යයන කාලය තුළ වගා කරගනු ඇතියි අපේක්ෂා කරන කුසලතා සමූහයක් ඉදිරිපත් කෙරේ. උපාධි අපේක්ෂකයෙකු ලෙස අධ්‍යයන වැඩසටහන අවසන් කිරීමෙන් පසු

ඔවුන්ගේ උපාධිධාරී පැතිකඩ (Graduate Profile) නිපුණතා හතරක් සනාථ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට අනුව, (2015),

> "Knowledge: *what the qualification holders know,* Skills: *what the qualification holders can do,* Attitudes, values, professionalism and vision for life : *how the qualification holders think and behave,* Mind-set and Paradigm : *how the qualification holders perceive the world".* These set of core competencies were further broken down into 12 skills. (See figure 1)

1. විෂය/ න්‍යායාත්මක දැනුම - ස්වාධීන ඉගෙනුම් කාර්යයන්, සාකච්ඡා මත පදනම් වූ ඉගැන්වීම්, කණ්ඩායම් ඉගෙනීම, කුඩා කණ්ඩායම් ඉගෙනුම් කාර්යයන්
2. ප්‍රායෝගික දැනුම සහ පරිචය - ගැටළු පදනම් වූ ඉගෙනුම, විචාරාත්මක ඉගෙනුම, ප්‍රායෝගික පන්ති, විද්‍යාගාර සැසි, භූමිකා රංගන
3. සන්නිවේදනය - ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්, භූමිකා රංගන, විවාද, නාට්‍ය
4. කණ්ඩායම් කාර්යය සහ නායකත්වය - කණ්ඩායම් ව්‍යාපෘති, ප්‍රායෝගික පුහුණු, කුඩා කණ්ඩායම් ඉගෙනුම්, ඉගෙනුම් ක්‍රීඩා
5. නිර්මාණාත්මකභාවය සහ ගැටළු විසඳීම - නිබන්ධන, ව්‍යාපෘති, කුඩා කණ්ඩායම් ඉගෙනුම, ගැටළු පදනම් වූ ඉගෙනුම
6. කළමණාකාරීත්වය සහ ව්‍යවසායකත්වය - කාණ්ඩය, ව්‍යාපෘති, ප්‍රායෝගික පුහුණු, උත්තේජනාත්මක ඉගෙනුම, සේවා අනුයුක්ත පුහුණු
7. තොරතුරු පාවිච්චිය සහ පාලනය - නිබන්ධන, ඉදිරිපත් කිරීම්, ව්‍යාපෘති, සිද්ධි අධ්‍යයනය
8. ජාලගත වීම සහ සාමාජීය කුසලතා - ඉදිරිපත් කිරීම්, භූමිකා රංගන, විවාද, නාට්‍ය
9. අනුගතවීම සහ නම්‍යශීලීභාවය - කණ්ඩායම් ව්‍යාපෘති, භූමිකා රංගන, ප්‍රායෝගික පුහුණු, ව්‍යාපෘති කළඹ (Portfolio)

10. ආකල්ප, වටිනාකම් සහ වෘත්තිකභාවය - කණ්ඩායම් ව්‍යාපෘති, භූමිකා රංගන, ප්‍රායෝගික පුහුණු, ව්‍යාපෘති කළඹ (Portfolio),
11. ජීවන දෘෂ්ටිය - ගැටළු පදනම් ඉගෙනීම, ප්‍රතිබිම්බගත ඉගෙනීම
12. ස්වයං යාවත්කාලීන බව සහ යාවජීව ඉගෙනීම - ගැටළු පදනම් ඉගෙනීම, ප්‍රතිබිම්බගත ඉගෙනීම

Figure 1: Categories of Learning outcomes- Learner Skill levels SLQF (2015) පි. 14

විශ්වවිද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල උපාධි පාඨමාලා වල සියලුම අධ්‍යයන වැඩසටහන්, පාඨමාලා සහ අධ්‍යයන ඒකක මෙම ඉගෙනුම් ඵල වලට අනුකූල වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර උපාධි පාඨමාලාවක් සඳහා SLQF-KSAM අනුකූලතාවය ලබා ගැනීම සඳහා සියලුම අධ්‍යයන වැඩසටහන් SLQF ඉගෙනුම් ඵල සමඟ සිතියම් ගත කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ඉගෙනුම් ඵල ලබා ගැනීමේදී අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන්ට ඔවුන්ගේ හැකියාවන් පෙළගස්වා ඉගෙනුම්කරුවන්ගේ බුද්ධිමය සහය ගොඩනැගීමට පහසුකම් සපයන්නේ කෙසේද ඒ පිළිබඳව ඔවුන් දැනුවත් වී ඇතිද?

ඉගෙනුම්කරුවන්ට විවිධ ඉගෙනුම් සම්පත් ලබා දීම සඳහා මූල්‍ය ප්‍රාග්ධනය ලබා ගැනීමට පෙර, නවීන ආකෘතික ගෘහ භාණ්ඩ ලබා ගැනීමට පෙර, මිල අධික දත්ත පදනම් වෙත ප්‍රවේශය ලබා ගැනීමට පෙර, ශක්තිමත් තාක්ෂණ පදනම් සහ පද්ධති, වේගවත් ප්‍රවේශ පද්ධති (Fast Access Systems) සහ වයි-ෆයි (Wi-Fi) ස්ථාපනය කර ගත යුතුව ඇති අතර එම අභියෝගයන්ට මුහුණ දීමට අපගේ අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන් සන්නද්ධ විය යුතුය. මේ සඳහා යම් අභියෝගයටම කාවැදී ඇති උපයෝගී අවස්ථාවන් කුමක්දැයි විමර්ශනය කිරීම ඉතා වැදගත් වෙනු ඇත.

'දැනුම් පහසුකම් සැපයීම' ගැන අප කතා කරන විට එය සරලව යෙදිය හැකි සංකල්පයක් නොවේ. චූ (1998) සහ ඩික්සන් (2000) ට අනුව නවීන පුස්තකාල සේවාවේ තීරණාත්මක ලක්ෂ්‍යයක් වන අතර එය දැනුම

සම්පත් හඳුනා ගැනීම, අවශ්‍යතා අනුව සංස්කරණය කිරීම, හුවමාරු කිරීම්, බෙදා හැරීම, වලංගු කිරීම්, අවලංගු කිරීම් යනාදිය ඇතුළත් වේ. දැනුම සම්පත් භාවිතා කිරීම සහ උපයෝගී කර ගැනීම දැනුම සමාජයේ ඉහළ අගයක් ගන්නා කුසලතාවකි.

ඇල්වෙසන්, (Alvesson) 2001 දක්වන ආකාරයට, යමක් කරන්නේ කෙසේදැයි දන්නා අයව දැනුම් පහසුකම් සපයන්නන් ලෙස හැඳින්වේ. දැනුම පහසුකම් සපයන්නන් පිරිසකට දැනුම නිර්මාණය කිරීම, අර්ථ නිරූපණය කිරීම, ප්‍රකාශ කිරීම සහ දැනුම පිළිබඳ කතන්දර ඒ සියල්ලේම ආකාරයෙන් පැවසීමට උපකාරී වේ. ඔවුන්ගේ කාර්යභාරය, අනාගත පුස්තකාලයක සහ අනාගතයේ දැනුම සමාජයේ, දැනුම බෙදා හැරීම සැලසුම් කිරීම අරමුණු කරයි. දැනුම පහසුකම් සපයන්නාගේ කාර්යභාරය වන්නේ දැනුම හුවමාරු කර ගැනීම සඳහා වේදිකා සහ අවස්ථාවන් නිර්මාණය කිරීමයි. දැනුම වාණිජ හා දැනුම වෙළඳපල තුළ මෙය නව කාර්යභාරයක් වේ.

ඉහත සඳහන් කළ පරිදි දැනුම සමාජය පුස්තකාලයාධිපතිවරුන්ට අප අයත් අධ්‍යයන විෂය පථය තුළ නව අනන්‍යතාවයක් ඇති කිරීමට නව අවස්ථා ලබා දෙයි. ඔවුන්ට ඇති එක් ප්‍රමුඛ අවස්ථාවක් නම්, ඔවුන්ගේ " බුද්ධිමය ප්‍රාග්ධන වත්කම්" වෙනත් ශාස්ත්‍රවන්තයින් හා සමානය. වෘත්තීය මට්ටම පවත්වා ගැනීම, විශ්ව විද්‍යාලයේ ආයතනික සංස්කෘතියට දායක වීම සහ සහශ්‍රක ඉගෙනුම ලබන අයට ඵලදායී හා අර්ථවත් ලෙස සේවය කිරීමයි. එබැවින් බුද්ධිමය ප්‍රාග්ධනය යනු ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරුන් විසින් වගාකර ගත යුතු වඩාත්ම කැපී පෙනෙන වත්කමයි.

## පුස්තකාලයාධිපතිවරුන්ගේ බුද්ධිමය ප්‍රාග්ධන වත්කම්

පුස්තකාලයාධිපතිවරුන්ගේ බුද්ධිමය ප්‍රාග්ධන (IC) වත්කම් සමඟ කටයුතු කිරීමේ දී බුද්ධිමය ප්‍රාග්ධනය යනු කුමක්ද යන්න පිළිබඳ හැඳින්වීමක් අවශ්‍ය වේ. බුද්ධිමය ප්‍රාග්ධනය යනු භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා වටිනාකමක් නිපදවන හෝ නිර්මාණය කරන දැනුමයි. ඇන්ඩ්‍රීසන්

Andriessen (2004) සහ ඇමිඩොන් Amidon සහ තවත් අය. (2005) බුද්ධිමය ප්‍රාග්ධනයෙහි අංශ තුනක් අඩංගු වේ ;

**අ)** මානව ප්‍රාග්ධනය : සහජ (අස්පර්ශීය) දැනුම හා කුසලතා සහ ආකල්ප

**ආ)** ව්‍යුහාත්මක ප්‍රාග්ධනය : සංස්කෘතිය, ක්‍රියා පටිපාටි සහ පැහැදිලි දැනුම සහ

**ඇ)** සම්බන්ධතා ප්‍රාග්ධනය : සන්නිවේදනය, දැනුම සහ සමාජ ජාල මෙන්ම ආයතනික කීර්තිය. එය දැනුම සමාජයේ වෙනත් ඕනෑම ස්පර්ශ්‍ය වත්කමක් මත අගය කරන සම්පතකි.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තරඟකාරී බුද්ධිමය වත්කම් මට්ටම් දෙකක් තිබේ ;

1. **උසස් අධ්‍යාපන ආයතනයේ ආයතනික ප්‍රාග්ධන වත්කම්** - සංවිධානයේ බුද්ධිමය ප්‍රාග්ධනයට එහි සේවකයින්ගේ දැනුම, බුද්ධිය, දැනුම හා ක්‍රියාදාමයන් මෙන්ම එම ක්‍රියාදාමයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ හැකියාව ද ඇතුළත් වේ. ශාස්ත්‍රීය ආයතනයක වඩාත්ම කැපී පෙනෙන සේවක කාණ්ඩය වන්නේ අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය වන අතර, එහි ආයතනික තත්ත්වය තුළ ආයතනය කළමනාකරණය කිරීම සඳහා ව්‍යුහාත්මක හා කාර්ය පටිපාටික කාර්යයන් පරිපාලනය කිරීමේ දී අධ්‍යයන නොවන පරිපාලන කාර්ය මණ්ඩලය ද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

2. **පුද්ගල ප්‍රාග්ධන වත්කම්** - බුද්ධිමය වත්කම් ආයතනයේ සෑම පුද්ගලයෙකුටම අයත් වේ; අධ්‍යයන/ පර්යේෂකයින්/ ආයතනයට අයත් සිසුන්. පුද්ගලයන්ගේ සහ ප්‍රජාවන්ගේ බුද්ධිමය ප්‍රාග්ධනය යනු සංවිධානයේ බුද්ධිමය ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා වන සංවිධානයේ ධනයයි. මෙම යුගයේ දී ආයතනයකට තිබිය හැකි වැදගත්ම වත්කම දැනුම හා බුද්ධිමය ප්‍රාග්ධනය වනු ඇත. තනි ප්‍රාග්ධන වත්කම් යනු නිසඟ (අප්‍රකාශිත) හා ප්‍රකාශිත දැනුම් මිශ්‍රණයකට වඩා අස්පර්ශීය නිපුණතා ය. පුස්තකාලයාධිපතිවරයකු විසින් මෙහෙයවනු ලබන බුද්ධිමය නිපුණතාවන්හි, භෞතික වත්කම් හා පුස්තකාලයකට අයිති හා එහි ප්‍රදර්ශනය කර ඇති සම්පත් වලට වඩා ඉහළ වටිනාකමක් ඇත.

Business Today සඟරාව විසින් තෝරාගෙන ඇති පරිදි රටේ පිළිගත් සමාගම් දහය (10) සඳහා මෙය පිළිගත හැකි කරුණක් වනු ඇත. එසේ බලන විට ශාස්ත්‍රීය ක්ෂේත්‍රය තුළ බුද්ධිමය ප්‍රාග්ධනය සමාජ ප්‍රාග්ධන වත්කම්වලට වඩා ඉහළ අගයක් ගනී, මන්ද දැනුම් සමාජයේ පුස්තකාලයක මූලික වටිනාකම, පුස්තකාලයේ සම්පත් එකතුවෙන් පුස්තකාලයාධිපතිවරුන්ගේ බුද්ධිමය ප්‍රාග්ධන වත්කම් වෙත මාරුවීමක් ඇති බැවිනි. එබැවින් පුස්තකාලයාධිපතිවරුන් අතර තනි ප්‍රාග්ධන වත්කම් ප්‍රචාරණය සඳහා වන පිරිවැය ආයෝජනයක් ලෙස සැලකිය යුතු අතර එය ආයතනික පුහුණු අයවැයේ පිරිවැය ශීර්ෂයක් ලෙස නොව අධ්‍යයන පුස්තකාල ක්‍රියාත්මක වන ආකාරය සහ ඒවා නව දැනුම් පරිසරයේ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් සංස්කෘතිය සමඟ පෙළ ගැසී ඇති ආකාරය සම්බන්ධයෙන් ප්‍රමුඛ වැදගත්කමක් ඇත.

බෙඩ්ෆර්ඩ් සහ තවත් අය (බෙඩ්ෆෝර්ඩ්, 2015, පිටුව 84-85) ඉගෙනුම ලබන සිසුන්ට පහසුකම් සැලසීමේ දී අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන්ගේ අවධානය යොමු කළ යුතු ඒකාබද්ධ බුද්ධිමය ප්‍රාග්ධන කුසලතා සඳහන් කර ඇත. පහත දැක්වෙන්නේ අපගේ අධ්‍යයන පරිසරයේ ඉගෙනුම් සංස්කෘතියට අනුව ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරයකු ලෙස කටයුතු කිරීමේ දී Bedford අර්ථ නිරූපනය කළ හා නිරීක්ෂණය කළ අනෙකුත් කුසලතා ය.

- **අප්‍රකාශිත දැනුම** - (විෂය ක්ෂේත්‍රයේ සහ පුස්තකාල ක්ෂේත්‍රයේ වැඩ කිරීමෙන් ලබා ගත්) පෞද්ගලික දැනුම, වසර ගණනාවක් තිස්සේ ලබාගත් චිත්තවේගාත්මක බුද්ධිය, අස්පර්ශ, හුවමාරු කළ නොහැකි, ඉගැන්විය නොහැකි සහ යමෙකු පුහුණු කළ නොහැක. කෙසේ වෙතත් පුද්ගලික කුසලතාවයක් ලෙස පටු කර ඇත. උදාඃ තොරතුරු සම්පත් පිළිබඳ දැනුම, විමසීම්වලට පිළිතුරු සපයන ආකාරය, විෂය පථය පිළිබඳ දැනුම, තොරතුරු හැසිරීම් පිළිබඳ දැනුම, තොරතුරු නිෂ්පාදන සම්පාදනය කිරීමේදී දැනුම අවබෝධ කර ගැනීම, ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ දැනුම, ඕනෑම වර්ගයක ද්‍රව්‍ය සංවිධානය කිරීම, යම් අරමුණක් සඳහා තාක්ෂණයන් භාවිතා කිරීම ආදිය.

- **බුද්ධිමය කුසලතා** - බුද්ධිමය හැකියාවන් සහ වෙනත් පුද්ගලයෙකුට සම්පූර්ණයෙන් මාරු කළ නොහැකි නිපුණතාවය මත ඔහු/ ඇය තුළ ප්‍රචාරය කළ හැකි නමුත් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වූ උගත් කුසලතාවයක් සහ වඩාත් වැදගත්: පර්යේෂණ කුසලතා, විශ්ලේෂණ කුසලතා, විවේචනාත්මක චින්තනය කුසලතා, දැනුම සම්පාදනය (ඩිජිටල් සහ වෙබ් පාදක), පුහුණු හා උපදේශන කුසලතා, ඉගැන්වීම් හා පුහුණු කුසලතා, දැනුම ඉදිරිපත් කිරීම, සන්නිවේදන කුසලතා, පහසුකම් සැපයීම සහ සාකච්ඡා කිරීමේ කුසලතා, උපදේශන කුසලතා, සම්මුඛ පරීක්ෂණ කුසලතා, වෙනත් අධ්‍යාපනඥයින් සමඟ අධ්‍යයන සංසදවල දැනුම හුවමාරු කර ගැනීම, දැනුම ලබා ගැනීම (ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරයකු සඳහා ඉතා වැදගත් කුසලතාවයකි), ශක්තිමත් සංවිධානාත්මක කුසලතා ආදිය යි.
- **වෘත්තීය ආකල්පය** - වෘත්තීය ගතිකත්වය ළඟා කර ගැනීමට මෙන්ම සේවා සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ඉතා වැදගත් වේ. සමස්ත පුස්තකාල සේවාව හැඩගැස්වීමේ දී පුස්තකාලයාධිපතිගේ ආකල්පයට ප්‍රමුඛ වැදගත්කමක් හිමිවේ : ආකල්පයේ ගුණාංග - අනුවර්තනය වීමේ හැකියාව, උපදෙස් දීම, අත්දැකීම් සහ දැනුම බෙදාගැනීම, අඛණ්ඩ ඉගෙනීමට ඇති උනන්දුව, නිර්මාණශීලිත්වය කෙරෙහි ඇති නැඹුරුව, සහයෝගී ආකල්ප, උපදේශනය, ස්වයං අභිප්‍රේරණය, ස්වයං ප්‍රතිනිර්මාණය සහ සමාලෝචනය, සේවා ආකල්ප, ස්ථානීය ඉගෙනුම් ප්‍රවේශය, සමාජ බුද්ධිය, දැක්ම, කණ්ඩායම්වල වැඩ කිරීමට ඇති කැමැත්ත, බලය පැවරීම, වැඩ කණ්ඩායම් සවිබල ගැන්වීම සහ පුහුණු කිරීම (ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය මෙන්ම උපකාරක කාර්ය මණ්ඩලය) ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා කැපවීම යනාදිය යි.
- **පැහැදිලි (ප්‍රකාශිත) දැනුම** - වාර්තාගත තොරතුරු තුළින් ලබාගත් දැනුම හා කුසලතා. සේවයේ සිටින ඕනෑම කෙනෙකුට මෙම නිපුණතා මට්ටම ලබාගත හැකිය. එකතු සංවර්ධන ප්‍රතිපත්ති, එකතු සංවර්ධන මාර්ගෝපදේශ, තොරතුරු ප්‍රමිතීන්, ග්‍රන්ථමිතික/ විද්‍යාමිතික, ශ්‍රේණිගත කිරීමේ පද්ධති, රීති, රෙගුලාසි, නීති අනුව,

අදාළ පනත් සහ ආඥාපනත් මෙම කාණ්ඩයට අයත් වේ. නැවතත් දැනුම තමා තුළම ඇති කර ගැනීමට ඇති පුද්ගලික උනන්දුවයි.

- **කාර්යපටිපාටික දැනුම** - ක්‍රියාපටිපාටීන් අධ්‍යයනය කිරීමෙන්, විශ්ලේෂණය කිරීමෙන් හා උපයෝගී කර ගැනීමෙන්, දැනුම අත්පත් කර ගැනීමේ සහ තෝරා ගැනීමේ දැනුම, අයවැයකරණය, වර්ගීකරණ පද්ධති ලැයිස්තුගත කිරීම සහ භාවිතා කිරීම, පහසුකම් කළමනාකරණ දැනුම, ආයතනික පරිසරයට අදාළ තොරතුරු සොයා ගැනීමේ උපාය මාර්ග, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී චක්‍රලේඛ සහ ක්‍රියාපටිපාටි භාවිතා කිරීම ප්‍රකාශන හිමිකම් නිෂ්කාශන ගැටළු, ආයතනයේ වාර්තා කළමනාකරණ ක්‍රියා පටිපාටි ආදියෙන් ලබාගත් නිපුණතාවය සහ කුසලතා.

- **සංස්කෘතික දැනුවත්භාවය** - පුස්තකාලයාධිපතිගේ සාර්ථකත්වයට ප්‍රබල සාධකයකි. ආයතනික සංස්කෘතියට සාපේක්ෂව කුසලතා වර්ධනය කළ යුතුය. විශේෂිත වූ ප්‍රදේශය, ප්‍රජාව සහ විෂය ධාරාවන් මත පදනම්ව මෙය උසස් අධ්‍යාපන ආයතනයෙන් ආයතනයට වෙනස් විය හැකිය. පුස්තකාලයාධිපතිවරයා එම ශාස්ත්‍රීය පරිසරයේ සංස්කෘතික වටිනාකම් ඵලදායී ලෙස අවශෝෂණය කර ගත යුතුය. නිශ්චිත හැසිරීම්, භාවිතයන්, සම්මතයන්, පුද්ගලික අනන්‍යතා හඳුනා ගැනීම, චාරිත්‍ර වාරිත්‍ර සහ ඒ අනුව පුහුණු වීම සඳහා විවෘත මනස ඉතා වැදගත් වේ. ආගම, ජනවාර්ගිකත්වය, සමාජ තත්වය යනාදිය සම්බන්ධයෙන් පුස්තකාලයාධිපති අපක්ෂපාතී විය යුතුය. මෙම විෂය පථය තුළ පුස්තකාලයාධිපතිවරයාට විශ්වවිද්‍යාලයේ ප්‍රජා සංස්කෘතිය තුළ ශක්තිමත් පුස්තකාල සංස්කෘතියක් ගොඩනගා ගත හැකිය.

- **වෘත්තීයමය වශයෙන් ජාලගත වීම** - වෘත්තීය පුස්තකාලයාධිපතිවරයකු විසින් වර්ධනය කළ යුතු, පවත්වාගෙන යායුතු හා වැඩිදියුණු කළ යුතු වෘත්තීය නිපුණතාවයකි ඃ වෘත්තීය සංගම්වල සාමාජිකත්වය (Associate Fellowship), කර්තෘ ජාල, ප්‍රකාශක ජාල, LIS ප්‍රජාව, රාජ්‍ය අංශයේ ප්‍රජා ජාල, සමාජ ජාල, විෂය ආශ්‍රිත ජාල, ප්‍රජා සේවා කණ්ඩායම්, තාක්ෂණික ආධාරක කණ්ඩායම්,

ජාත්‍යන්තර වෘත්තීය ජාලය, වෙනත් පිළිගත් විදේශීය විශ්වවිද්‍යාල පුස්තකාල සමඟ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම.

- **පුද්ගල කීර්තිය** - මේ සම්බන්ධයෙන් පුද්ගලයන්ගේ කාර්යභාර සම්බන්ධතා, ප්‍රජා සංවිධාන සමඟ සම්බන්ධතා, රාජ්‍ය අංශයේ ආයතන හා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධතා, වෙනත් වෘත්තීය සංගම් සමඟ සම්බන්ධතා (උදා: OPA, රාජකීය ආසියාතික සංගමය ආදිය) විද්වත් වැඩ, ප්‍රකාශන, ඉදිරිපත් කිරීම, ඉගැන්වීම, විද්වත් සිදුවීම් සංවිධානය කිරීම, ජාල සහ සංසද ආරම්භ කිරීම, වෘත්තීය සංසද වලට එලදායි ලෙස දායක වීමේ හැකියාව, ප්‍රජා වැඩසටහන්, පාසල් මට්ටමේ වැඩසටහන්, අවාසි සහගත ප්‍රජාවන් (බන්ධනාගාරය, වෙනස් හැකියාවන් සහිත, බලපෑමට ලක් වූ) ප්‍රජාවන් අතර ඇති සබඳතා ආදිය යි.

- **නව සංකල්ප සමඟ කටයුතු කිරීම** - පුස්තකාලයාධිපතිවරුන් අනිවාර්යයෙන්ම, විවෘතභාවය වැනි පුළුල් සංකල්ප, (පුළුල් සංකල්පයක් යනු; විවෘත ප්‍රවේශය, විවෘත බලපත්‍ර, විවෘත විද්‍යාව, විවෘත පර්යේෂණ, විවෘත දත්ත, විවෘත අධ්‍යාපන සම්පත්, දැවැන්ත විවෘත මාර්ගගත පාඨමාලා) සහයෝගී ඉගෙනුම් පද්ධති, වැඩිහිටි ඉගෙනීම, උසස් අධ්‍යාපනයට නම්‍යශීලී ප්‍රවේශ මට්ටම්, ජීවිත කාලය පුරාම ඉගෙනීම යනාදිය පිළිබඳ ව සුපරීක්ෂාකාරී ව අවදියෙන් සිටිය යුතු ය.

## නිගමනය

දැනුම් සමාජයේ තීරණාත්මක ලක්ෂණයක් වන්නේ දැනුමේ සංකීර්ණතාවයේ අසාමාන්‍ය වැඩිවීමක් වන අතර එය තොරතුරුවල වත්මන් තත්වයට විශාල ලෙස බලපායි. දිනෙන් දින වර්ධනය වන සයිබර් අවකාශය සහ ඩිජිටල් ජීවිත හැරුණු විට තොරතුරු ප්‍රමාණය පුද්ගලයන්ට හසු කර ගත නොහැකි නමුත් ක්‍රියාකාරී පුස්තකාලය තුළ ක්‍රියාකාරී පුස්තකාලයාධිපතිවරුන් උපායමාර්ගික ස්ථානයක තබා ඇති ආයතනික උපායමාර්ගික සැලැස්මට අනුව ආයතන වලට පහසුකම් සැපයිය යුතුය. උසස් අධ්‍යාපනයේ සහ දැනුම බෙදා හැරීමේ ගෝලීයකරණයේ පුළුල්

පරාසයන් තුළ ශාස්ත්‍රීය පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යභාරය එකතු කිරීමේ හා ව්‍යුහයන්ගේ භාරකරුවන්ගෙන් වෙනස් වෙමින් පවතින නමුත් සහශ්‍රක ඉගෙනුම් පරිසරයට පහසුකම් සැලසීමේ දී භාවිතයට නොගත් මානසික හා බුද්ධිමය හැකියාවන් උපයෝගී කර ගැනීමයි.

දැනුම් සමාජය හා ආර්ථිකය නූතන ජීවන රටාවේ සෑම අංශයකම පරිවර්තනයක් ගෙන එනු ලබන අතර එය පුස්තකාල ක්‍රියාකරන ආකාරය සහ ඔවුන් කළ යුතු දේ වෙනස් කරයි. වැදගත්ම වෙනස වනුයේ පුස්තකාලයාධිපතිවරුන්ගේ බුද්ධිමය ප්‍රාග්ධන වත්කම්වල වැඩි වටිනාකම සහ පුස්තකාලයාධිපතිවරුන්ගේ වැදගත්කම වෙන කවරදාටත් වඩා පහසුකම් සැපයීමේ කාර්යභාරය සහ දැනුම මැදිහත්වීමේ කාර්යභාරය සමඟ වඩා පුළුල් වනු ඇත. පුස්තකාලයාධිපතිවරුන් දැනුම සමාජය විසින් ඉල්ලා සිටින නව භූමිකාවන් සඳහා යොදා ගත යුත්තේ ඔවුන්ගේ තාක්ෂණික කුසලතා සහ ජාලගත කුසලතා වැඩි කිරීමෙන් පමණක් නොව, ඔවුන්ගේ බුද්ධිමය ප්‍රාග්ධන වත්කම් සඳහා ආයෝජනය කිරීම හා යෙදවීමෙනි. පුස්තකාල විද්‍යා වෘත්තිකයන් අඛණ්ඩව ඉගෙන ගන්නන්, ඵලදායී පුහුණුකරුවන්, හොඳ ගුරුවරුන්, මානව හිතවාදීන් සහ උපදේශකයින්, අදාල පහසුකම් සපයන්නන්, පුස්තකාල කාර්ය මණ්ඩලයේ තනතුරු නොසලකා ගතික හැකියාවන් ගොඩනගන්නන් විය යුතුය. බුද්ධිමය ප්‍රාග්ධන නිපුණතා පිළිබඳ අනාගත පුස්තකාලයාධිපතිවරුන් සූදානම් කිරීම සඳහා පුස්තකාල හා තොරතුරු විද්‍යා විෂය මාලාවට න්‍යාය සහ ප්‍රායෝගික අංග ඇතුළත් විය යුතුය. ඉහත සඳහන් කළ බුද්ධිමය හා චර්යාත්මක නිපුණතා ක්‍රියාකාරී හා මෙහෙයුම් නිපුණතාවන්ට සමානය. මෙහි දී අධ්‍යයන ක්ෂේත්‍රයේ පුස්තකාලයාධිපතිවරුන් SLQF ආකෘතිය සඳහා අනුගත වන්නේ කෙසේද යන්න පිළිබඳ නිරතුරුවම අවධානය යොමු කළ යුතුය. එබැවින් අපගේම බුද්ධිමය ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම වෙනුවෙන් මූලික ආකල්පමය වෙනසක් අවශ්‍ය වන අතර පුස්තකාල ශාස්ත්‍රීය සංස්කෘතිය තුළ “දැනුම කළමණාකරුවෙකු ලෙස” අප අපව ම දැකිය යුතුය. එසේම එම සංකල්පය නව සමාජ අනන්‍යතාවයක් ලෙස ඉදිරියට ගෙන ආ යුතුය.

## References

Alvesson, M. (2001). Knowledge Work: Ambiguity, Image and Identity. Accessible at: https://journals.sagepub.com/doi/10.1177/0018726701547004

Amidon, S. (2005). Human capital. Guardian Books. Review at: https://www.theguardian.com/ books/2005/jan/23/fiction.features2.

Andriessen, D. (2004). Making Sense of Intellectual Capital: designing a method for the valuation of intangibles. Accessible at: https://www.researchgate.net/publication/246750007_Making_Sense_of_Intellectual_Capital_designing_a_method_for_the_valuation_of_intangibles.

Bedford, D. A. D. (2015). The Role of Librarians in a Knowledge Society: Valuing Our Intellectual Capital Assets. DOI: 10.1108/S0065-283020150000039011.

One Globel forum – 2017. (2017). Annual knowledge forum of India. 10th to 11th February 2017 New Delhi, India.

SLQF. (2015). Sri Lanka Qualification Frame. University Grants Commission; Colombo.

World of education. (2015). Learning curve of Pearson. Text by Bob Lingard. https://worldsofeducation.org/en/woe_homepage/woe_detail/4829/the-learning-curve-of-pearson.

# විමර්ශන මූලාශ්‍රයක් ලෙස ශබ්දකෝෂවල වැදගත්කම හා එහි නූතන ප්‍රවණතා

ආර්. ඒ. පී. සකුන්තලා සෙනෙවිරත්න

ඕනෑම භාෂාවක පදනම වන්නේ අක්ෂර මාලාවයි. අකුරෙන් අකුර සම්බන්ධ වීමෙන් ගොඩනැගෙන වචනයකින් විවිධ අර්ථයන් නියෝජනය කරනු ඇත. වර්තමාන ලෝකයේ එක් එක් රටවල් තුළ විවිධ භාෂාවන් භාවිත කරනු දැකිය හැකිය. විවිධ ජාතීන් වෙසෙන එකම රටක් තුල ද ඔවුනොවුන්ට ආවේණික වූ භාෂාවන් දැකිය හැකිය. එක් එක් පුද්ගලයා අතර මෙන්ම විවිධ ජාතීන් අතරත් ඔවුන්ගේ ප්‍රධානතම සන්නිවේදන හුවමාරු මාධ්‍ය වන්නේ භාෂාවයි. එබැවින් යම් භාෂාවක් අධ්‍යයනයේ දී අත්‍යාවශ්‍ය වන මූලාශ්‍ර විශේෂයක් ලෙස ශබ්ද කෝෂය හඳුන්වා දිය හැකිය.

## ශබ්ද කෝෂයක් යනු :

භාෂාවක භාවිත වන වචන පිළිබඳ තොරතුරු සපයා දෙන මූලාශ්‍රයක් ලෙස ශබ්ද කෝෂය හැඳින්විය හැකිය. යම් භාෂාවක භාවිත වන වචනවල අර්ථය, වචනය ලියන ආකාරය නැතහොත් අක්ෂර වින්‍යාසය, වචනයේ නිරුක්තිය, එය වාක්‍යයන්හි යෙදෙන ආකාරය හෙවත් ව්‍යවහාරය ආදී මූලික තොරතුරු මෙමඟින් ලබාදෙයි. ශබ්ද කෝෂයක් යන්න පහත ආකාරයෙන් නිර්වචනාත්මකව දැක්විය හැකිය.

> "A book or electronic resource that lists the words of a language (typically in alphabetical order) and gives their meaning, or gives the equivalent words in a different language, often also providing information about pronunciation, origin, and usage."

> අකාරාදී පිළිවෙලට සකස් කරන ලද භාෂාවක වචන සහ ඒවායේ තේරුම්, එම තේරුම සහිත වෙනත් භාෂාවක වචන, උච්ඡාරණය, ප්‍රභවය සහ භාවිතය පිළිබඳව ඇති පොතක් හෝ ඉලෙක්ට්‍රොනික මෙවලමක් වේ.

"A reference book on a particular subject, the items of which are typically arranged in alphabetical order."

යම් විෂයකට අදාළව අකාරාදි පිළිවෙලට පෙල ගස්වන ලද විමර්ශන ග්‍රන්ථයකි.

"A dictionary, some times known as a wordbook, is a collection of words in one or more specific languages, often arranged alphabetically which may include information on definitions, usage, etymologies, pronunciations, translation etc. or a book of words in one language with their equivalents in another, sometimes known as a lexicon."

එක් භාෂාවක් හෝ භාෂා ගණනකට අදාළ අර්ථකථන, භාවිතය, ශබ්ද නිෂ්පත්තිය, උච්ඡාරණය, පරිවර්තනය ආදිය පිළිබඳ තොරතුරු අකාරාදී පිළිවෙලට සකසන ලද පද එකතුවක් ලෙස හෝ එක් භාෂාවක වචන සහ ඒවායේ අර්ථයට සමාන වෙනත් භාෂාවක වචනවල එකතුවක් ලෙස ශබ්ද කෝෂය හැඳින්විය හැකිය.

## විමර්ශන මූලාශ්‍රයක් ලෙස ශබ්ද කෝෂයක විශේෂත්වය ඃ

උක්ත නිර්වචනාත්මකව දක්වා ඇති ලක්ෂණ නිසාම එය විමර්ශන මූලාශ්‍රයක් ලෙස ද හඳුන්වනු ලබයි. විමර්ශන ග්‍රන්ථයක් යනු යම්කිසි තොරතුරක් ක්ෂණිකව උද්ධරණය කරගත හැකි වන සේ තොරතුරු යම් සංවිධානාත්මක ආකාරයකින් ඇතුලත් කොට ඇති ග්‍රන්ථයන් වේ. ශබ්ද කෝෂයක මෙම ලක්ෂණය ඉතා මැනවින් දැකිය හැකිය. යම් භාෂාවක අක්ෂර මාලාවේ ආකාරාදිය පදනම් කර ගෙන එහි අනුපිළිවෙලට වචන පෙළ ගස්වා තිබීම ශබ්ද කෝෂයන්හි දැකිය හැක. වචනවල මුලකුර සමාන නම් ඒවායෙහි යෙදී ඇති පිල්ලම්වල අනුපිළිවෙල ද, යෙදී ඇති පිල්ලම් සමාන නම් ඊළඟ අකුර ද වශයෙන් සලසා පරීක්ෂා කල යුතු වේ.

එබැවින් එය පරිශීලනය කරන්නෙකුට යම් තොරතුරක් උද්ධරණය කර ගැනීම සඳහා එම තොරතුර හමුවන තුරු එහි මුල සිට අග දක්වා කියවීම

අවශ්‍ය නොවන අතර තමාට අවශ්‍යම තොරතුර වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි වේ. තවද භාවිත කල කෙටි කිරීම් හා කේත පද යොදා තිබීමත් ඒවායෙන් ගම්‍ය වන දෑ පාඨකයාගේ පහසුව සඳහා ඉදිරිපත් කර තිබීමත් දැක ගත හැකිය.

එසේම ශබ්ද කෝෂයක තවත් එක් විශේෂත්වයක් වන්නේ එහි ඇති සාධිකාරීත්වය හෙවත් නිවැරදි බවයි. වෘත්තීයමය සුදුසුකම් වලින් සැදුම්ලත් ලේඛක මඩුල්ලක් හෝ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුම්ලත් පුද්ගලයකුගේ දායකත්වයෙන් නිමවන මූලාශ්‍රයක් බැවින් එහි ඇති තොරතුරුවල සාධිකාරීත්වයක් දැකිය හැකි වීමද තවත් එක් විශේෂත්වයකි. නිවැරදි තොරතුරු රහිත ග්‍රන්ථයක් මඟින් පාඨකයා නොමඟ යාමට ඉඩකඩ ඇත. වර්තමානයේ තොරතුරක වටිනාකම රඳා පවතින්නේ එහි ඇති නිවැරදි බව, විශ්වාසනීය බව, කාලීන බව, අදාළ බව හා ප්‍රමාණවත් බව යන සාධක මතය. එබැවින් ශබ්ද කෝෂයක් ද මෙකී ලක්ෂණ වලින් අනූන බව කිව යුතුය. මෙරට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කර ඇති කාණ්ඩ විසි ගණනකින් යුත් සිංහල ශබ්ද කෝෂය සාධිකාරී බවින් යුතු උසස් මට්ටමේ ශබ්ද කෝෂ ග්‍රන්ථයක් බව පෙන්වා දිය හැකිය.

## පුස්තකාලයක ප්‍රධානතම මූලාශ්‍රයක් ලෙස ශබ්ද කෝෂය :

ඕනෑම පුස්තකාලයක තිබිය යුතු ප්‍රධානතම විමර්ශන මූලාශ්‍රයක් ලෙස ශබ්ද කෝෂය පෙන්වා දිය හැකිය. පාසැල් පුස්තකාලයක් වුවද, විශ්වවිද්‍යාල පුස්තකාලයක් වුවද, මහජන පුස්තකාලයක් වුවද, විශේෂ පුස්තකාලයක් වුවද, ජාතික පුස්තකාලයක් වුවද මේ සෑම පුස්තකාල වර්ගයකම තිබිය යුතු අත්‍යාවශ්‍ය ග්‍රන්ථයක් ලෙස ශබ්ද කෝෂ පෙරමුණේ සිටී.

පාඨකයන්ගේ භාෂා අධ්‍යයනයේ දී අත්‍යාවශ්‍ය මූලාශ්‍ර විශේෂය වන්නේ ශබ්ද කෝෂයයි. මේවායෙහි ඇති තොරතුරුවල වටිනාකම හේතුවෙන් බොහොමයක් ග්‍රන්ථ වල මිල අධික බවක් ද දැකිය හැක. ඒ නිසාම පාඨකයන් අතින් නැතිවීම හෝ ඒවාට හානි පැමිණවීම අවම කරගැනීම සඳහාත්, සීමිත පිටපත් සංඛ්‍යාවක් තිබීම නිසාත් මෙම ග්‍රන්ථ පුස්තකාලය

තුළම රඳවා තැබීමට පුස්තකාලයාධිපතිවරුන් කටයුතු කරනු ඇත. තවත් ආකාරයකින් බැලුවහොත් මෙම ග්‍රන්ථ සාහිත්‍ය කෘති මෙන් එක දිගට කියවා ගෙන යාමේ අවශ්‍යතාවයක් නැති පාඨකයා සොයන විෂය කරුණක් හෝ කරුණු කිහිපයක් දැන ගැනීම සඳහා භාවිත කරන ග්‍රන්ථයක් බැවින් මෙම ග්‍රන්ථ පුස්තකාලයේ නිත්‍ය විමර්ශන අංශය තුළ රඳවා තැබිය යුතු විමර්ශන මූලාශ්‍ර විශේෂයක් ලෙස ද සැලකේ.

## ශබ්ද කෝෂ වර්ග :

එක් එක් ශබ්දකෝෂයන්හි අන්තර්ගත හා පෙළගස්වා ඇති කරුණු අනුවත්, අධ්‍යයනයේ පහසුව සඳහාත් ශබ්දකෝෂ වර්ග විවිධ ආකාරයෙන් දැකිය හැකිය.

- පූර්ණ ශබ්ද කෝෂ
- සංක්ෂිප්ත ශබ්ද කෝෂ
- ඒක භාෂා ශබ්ද කෝෂ
- ද්වි භාෂා ශබ්ද කෝෂ
- බහු භාෂා ශබ්ද කෝෂ
- විෂය ශබ්ද කෝෂ
- චරිතාපදාන ශබ්ද කෝෂ
- ළමා ශබ්ද කෝෂ ආදිය ප්‍රධාන වශයෙන් පෙන්වා දිය හැකිය.

## • පූර්ණ ශබ්ද කෝෂ

භාෂාවක භාවිතා වන සියලු වචන අන්තර්ගත කරමින් ඒ සෑම වචනයක් සඳහාම අර්ථය, නිරුක්තිය, අක්ෂර වින්‍යාසය, ව්‍යවහාරය ආදීය සඳහන් තොරතුරු සියල්ලක්ම මෙවැනි ශබ්ද කෝෂයක දැකිය හැකි වේ. සමහර අවස්ථාවල දී වචනවල අර්ථය පැහැදිලි කිරීම සඳහා චිත්‍ර වැනි දෑ උපයෝගී කොට ගෙන ඇත. මෙම ශබ්ද කෝෂ ප්‍රමාණාත්මකව ගත් විට වෙළුම් ගණනාවකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද සිංහල ශබ්ද කෝෂය ද පූර්ණ ශබ්ද කෝෂ ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකිය.

- **සංක්ෂිප්ත ශබ්ද කෝෂ**

සංක්ෂිප්ත යන අරුතින් කියවෙන්නාක් මෙන් මෙම ශබ්ද කෝෂ වල විශේෂත්වය වන්නේ තෝරාගත් තොරතුරු පමණක් අන්තර්ගත කොට තිබීමයි. පූර්ණ ශබ්ද කෝෂ වල මෙන් සියළු වචන අන්තර්ගත නොකොට සීමිත වචන ප්‍රමාණයක් මෙම ග්‍රන්ථවල දැකිය හැකිය.

මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂය, ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය මේ යටතට ගැනේ.

- **ඒක භාෂා ශබ්ද කෝෂ**

සාමාන්‍ය ශබ්ද කෝෂ විශේෂය යටතට ගැනෙන ඒක භාෂා ශබ්ද කෝෂ වල විශේෂත්වය වන්නේ එක් භාෂාවකින් අදාළ වචනයත් එම භාෂාවෙන්ම ඊට අදාළ අර්ථයත් දක්වා තිබීමයි. වඩාත්ම ප්‍රසිද්ධ ඒක භාෂා ශබ්දකෝෂයක් ලෙස ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්ද කෝෂය (Oxford English Dictionary) හැඳින්විය හැකිය. මෙරට තුළ ද සම්පාදනය කරන ලද ඒක භාෂා ශබ්ද කෝෂ කිහිපයකි.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සිංහල ශබ්ද කෝෂය, කොත්මලේ කේ. ඒ. බී. එඩ්මන්ඩ් විසින් සම්පාදනය කරන ලද මහා සිංහල සාහිත්‍ය ශබ්ද කෝෂය, වැලිවිටියේ සෝරත හිමියන් විසින් සකස් කරන ලද සුමංගල ශබ්ද කෝෂය යනාදිය උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

හරිස්චන්ද්‍ර විජේතුංග විසින් සම්පාදනය කරන ලද ගුණසේන සිංහල ශබ්ද කෝෂය ද ඉතා උසස් මට්ටමේ ග්‍රන්ථයක් ලෙස පැසසිය යුතුය. මෙම ශබ්ද කෝෂය මඟින් අර්ථ දැක්වීම්, අක්ෂර වින්‍යාසය, නිවැරදි උච්ඡාරනය, පද බෙදීම් ආදී පොදු කරුණු හැරුණු විට න,ණ,ල,ළ ව්‍යවහාරය, ශ,ෂ,ස භාවිතය, ප,ඵ,ෆ ව්‍යවහාරය, අල්ප ප්‍රාණ හා මහාප්‍රාණ යෙදීම්, සමානාර්ථ ප්‍රයෝග සොයා ගැනීම ආදී වූ කරුණු ගණනාවක් පිළිබඳව වචන ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක තොරතුරු දක්වා තිබීම විශේෂත්වයකි.

- **ද්වි භාෂා ශබ්ද කෝෂ**

භාෂා දෙකක් සඳහා සකස් කල ශබ්ද කෝෂ ද්වි භාෂා ශබ්ද කෝෂ යනුවෙන් හැඳින්වේ. එක් භාෂාවකින් අදාල වචනයත්, තවත් භාෂාවකින් ඊට අදාළ අර්ථ නිරුක්තියත් දක්වා තිබීම මෙම ශබ්ද කෝෂ වල දැකිය හැකි විශේෂත්වයයි. ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂය, සිංහල - දෙමළ ශබ්ද කෝෂය, සිංහල - සංස්කෘත ශබ්ද කෝෂය වැනි ග්‍රන්ථ ගණනාවක් ද්වි භාෂා ශබ්ද කෝෂ ලෙස පෙන්වා දිය හැකිය.

- **බහු භාෂා ශබ්ද කෝෂ**

භාෂා ගණනාවක් පාදක කොට ගෙන තිබීම මෙම ශබ්ද කෝෂ වල දැකිය හැකි විශේෂත්වයයි. එක් භාෂාවකින් මුල් වචනය සඳහන් කර තවත් භාෂා කිහිපයකින් එම වචනයේ අර්ථය දැක්වීම මෙම කෝෂ ග්‍රන්ථවල දැකිය හැකිය. බහු භාෂාවන් කතා කරන රටවල් මෙවැනි ශබ්ද කෝෂ අනිවාර්යයෙන් ප්‍රකාශයට පත් කල යුතුය.

ගොඩගේ පොත් ප්‍රකාශන ආතනය මඟින් සම්පාදනය කර ඇති ගොඩගේ ඉංග්‍රීසි - සිංහල - දෙමළ ශබ්ද කෝෂය මීට නිදසුනකි.

- **විෂය ශබ්ද කෝෂ**

අනෙකුත් සියලු ශබ්ද කෝෂ අතුරින් විෂය ශබ්ද කෝෂ සුවිශේෂී වන්නේ ඒවායෙහි අන්තර්ගතය විවිධ විෂයන් පදනම් කර ගෙන සකස් වී තිබීමයි. එක් එක් විෂයන් සඳහා විෂය දැනුම ලබා දීම අරමුණු කර ගනිමින් සම්පාදනය කොට ඇති මෙම මූලාශ්‍රවල විවිධ විෂයන්හි සඳහන් වචන වලට සවිස්තර ලෙස අර්ථ කථනය කිරීම මෙමඟින් සිදු කරයි. විශේෂයෙන්ම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු වල නියැලෙන පුද්ගලයන්ට ඉතාම අත්‍යාවශ්‍ය විමර්ශන ග්‍රන්ථයක් ද වේ. යම්කිසි විෂයක් හා සම්බන්ධ සියලු වචන සඳහා සවිස්තරාත්මක අර්ථකතනයක් විෂය විශ්ව කෝෂ මඟින් ලබා දෙයි. මේවා සකස් කිරීමේ දී එම විෂය හා සම්බන්ධ ප්‍රමුඛ පද තෝරා ගෙන එම පද පිළිබඳ අර්ථ නිරුක්තිය ලබා දීමක් සිදු වේ.

වර්තමානයේ සෑම විෂය ක්ෂේත්‍රයක්ම පාදක කර ගනිමින් විෂය විශ්ව කෝෂ නිර්මාණය කර ඇති බව පෙනේ. එපමණක් නොව එක් එක් විෂයන්හි අනු විෂයන් සඳහා ද විෂය විශ්වකෝෂ සම්පාදනය වී තිබේ. විශ්වවිද්‍යාල පුස්තකාල, විශේෂ පුස්තකාලයන්හි අනිවාර්යයෙන්ම තිබිය යුතු විමර්ශන ග්‍රන්ථ විශේෂයක් ලෙස ද පෙන්වා දිය හැකිය.

ලෝකයේ මෙවැනි විෂය ශබ්ද කෝෂ දහස් ගණනින් දැකිය හැකි අතර ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත මහා සිංහල ශබ්ද කෝෂය උසස් ගණයේ ග්‍රන්ථයක් ලෙස පෙන්වා දිය හැකිය. සිංහල සාහිත්‍ය විෂයට හා විචාරයට අදාළව අර්ථ ඉදිරිපත් කර ඇති මෙහි පැරණි සාහිත්‍ය මෙන්ම නූතන සාහිත්‍ය විචාරයට අදාළ පද ද විග්‍රහ කොට දක්වා ඇත. රූඪි අර්ථවත් වචන රාශියක් ද සමඟින් වචන 18000 කට අධික සංඛ්‍යාවකට අර්ථ නිරුක්තීන් දක්වා ඇත.

- **චරිතාපදාන ශබ්ද කෝෂ**

විවිධ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිතාපදාන පිළිබඳ විස්තර එකී පුද්ගලයන්ගේ නම් අනුව අකාරාදී පිළිවෙළට සඳහන් කර ඇති ග්‍රන්ථ චරිතාපදාන ශබ්ද කෝෂ ලෙස හැඳින්වේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රසිද්ධියට පත් පුද්ගලයන් පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා මෙම මූලාශ්‍ර ඉතාම වැදගත් වේ. එක් විෂයක් සඳහා ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිතාපදාන ශබ්ද කෝෂ හා සෑම විෂයකටම අයත්වන පුද්ගලයන්ගේ චරිතාපදාන ඇතුලත් පොදු චරිතාපදාන ශබ්ද කෝෂ ද දැකිය හැකිය.

චරිතාපදාන ශබ්ද කෝෂ ග්‍රන්ථ වල පුද්ගලයන් පිළිබඳ තොරතුරු සඳහන් කිරීමේ දී පිළිගත් ප්‍රමිතියකට අනුව එම තොරතුරු ඇතුළත් කර තිබීම ද විශේෂත්වයකි. චරිතාපදානයට භාජනය වන පුද්ගලයාගේ සම්පූර්ණ නම, උපන් දිනය, මියගොස් ඇත්නම් එම දිනය, ලැබූ අධ්‍යාපනය, දරන ලද තනතුරු, කරන ලද සේවාවන්, ප්‍රකාශයට පත් කර ඇති ග්‍රන්ථ ආදි තොරතුරු සංක්ෂිප්ත ලෙස ඇතුලත් කර තිබේ. මෙම තොරතුරු ඇතුලත් ලිපිය සමඟ අදාළ පුද්ගලයාගේ ඡායාරූපයක් ද ඇතුලත් කර තිබේ. එකී පුද්ගලයන්ගේ නම් වල අකාරාදි පිළිවෙල අනුව පෙළගස්වා ඇති අතර

අදාළ තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අනුක්‍රමණිකාවක් ද ඇතුලත් කර තිබේ.

අධ්‍යයන හා පර්යේෂණ කටයුතු වල නියැලෙන පුද්ගලයන් සඳහා ඉතා වටිනා ග්‍රන්ථයක් වන අතර සෑම පුස්තකාලයකම තිබිය යුතු විමර්ශන මූලාශ්‍රයක් ද වේ. ලෝකය සෑම රටකම පාහේ චරිතාපදාන ශබ්ද කෝෂ සම්පාදනය කරන අතර විද්‍යා, සමාජීය විද්‍යා, සාහිත්‍ය කලා ආදී විවිධ විෂයන් යටතේ චරිතාපදාන ශබ්ද කෝෂ ප්‍රකාශයට පත් කෙරේ.

කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය මඟින් ප්‍රකාශයට පත් කරන ලද Cambridge Dictionary of Scientists නම් චරිතාපදාන ශබ්ද කෝෂය විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිතාපදාන පිළිබඳ තොරතුරු ඇතුලත් වේ. ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලය මඟින් ප්‍රකාශයට පත් කර ඇති The Concise Dictionary of National Biography නම් ග්‍රන්ථය ද එවැනි චරිතාපදාන ශබ්ද කෝෂයකි. නමුදු මෙරට තුළ විධිමත්ව සැකසුණු චරිතාපදාන ශබ්ද කෝෂයක් දැකිය නොහැකි අතර තරමක් දුරට සාර්ථක මට්ටමක පවතින ග්‍රන්ථයක් ලෙස ලේක්හවුස් ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති ''ලංකා ජනපොත'' හැඳින්විය හැකිය.

- **ළමා ශබ්ද කෝෂ**

ළමයින් පාදක කර ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීම සඳහා සැකසුණු ළමා ශබ්ද කෝෂ ග්‍රන්ථ ද සුවිශේෂී වේ. එක් එක් ළමයින්ගේ වයස් කාණ්ඩ, දැනුම් මට්ටම් පදනම් කරගෙන ළමා ශබ්ද කෝෂ සම්පාදනය කෙරේ. ළමා මනසට ගැලපෙන ලෙසිනුත්, ධාරණය කරගැනීමේ පහසුව පිණිසත් වර්ණ චිත්‍ර ආදිය භාවිත කරමින් මෙම ග්‍රන්ථ සම්පාදනය කර තිබෙනු දැකිය හැකිය.

## ශබ්ද කෝෂකරණයෙහි නූතන ප්‍රවණතා

වර්තමානයේ තොරතුරු මූලාශ්‍ර අතර ප්‍රධානතම විමර්ශන මූලාශ්‍රයක් ලෙස සැලකෙන ශබ්ද කෝෂ අත්‍යවශ්‍ය තොරතුරු මාධ්‍යයක් බවට පත් වී

ඇත. සෑම පුස්තකාලයකම පමණක් නොව සෑම නිවසකම එක් ශබ්ද කෝෂයක් හෝ තිබෙනු ඇතිවාට සැකයක් නොමැත.

වත්මන් සමාජීය මිනිසා විවිධ භාෂාවන් අධ්‍යයනයට නැඹුරු වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඇතැමෙක් වෙනත් භාෂාවන් වැඩි දුර අධ්‍යයනයට සේම ඇතැමෙක් විදෙස් රටවල නිරතවීම සඳහා යොමු වන බැවින් විවිධ භාෂා අධ්‍යයනය අද සුලබව දක්නට ලැබේ. මෙරට තුළ වුවද සෑම ක්ෂේත්‍රයක්ම පාහේ අද වන විට ඉංග්‍රීසිකරණයට අනුගත වී ඇති බවක් දක්නට ලැබේ. ලෝකයේ බොහොමයක් තොරතුරු උත්පාදනය වන්නේ ද ඉංග්‍රීසි භාෂාව පදනම් කරගෙන වීම විශේෂත්වයකි. එවැනි පසුබිමක් තුළ සෑම පුද්ගලයකුටම තම මවු භාෂාවට අමතරව තවත් භාෂා එකක් හෝ කිහිපයක් දැනගෙන සිටීම යෝග්‍ය වේ.

එවන් භාෂාවක් අධ්‍යයනයේ දී අප මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය වන්නේ එකී භාෂාව උච්ඡාරණය කරන ආකාරය, එහි අර්ථය, එය භාවිත කරන ආකාරය පිළිබඳවයි. එම තත්ත්වය මඟහරවා ගත හැකි ප්‍රබලම අවිය වන්නේ ශබ්ද කෝෂයයි. උක්ත පැහැදිලි කල ආකාරය අනුව විවිධ ශබ්ද කෝෂ වර්ග දක්නට ලැබෙන අතර අවශ්‍යතාවය අනුව එක් එක් ග්‍රන්ථ භාවිත කිරීමේ හැකියාව ඇත. පසුගිය කාලවකවානු වලදී භාවිත කල ශබ්ද කෝෂ හා සසඳන කල වර්තමාන ශබ්දකෝෂකරණයේ නව ප්‍රවණතාවයන් ගණනාවක් එය පරිශීලනය කරන්නෙකුට දැකිය හැකිය.

දැනට අවුරුදු ගණනකට පෙර එක් ග්‍රන්ථයක් හෝ දෙකක් වශයෙන් පළ වූ ශබ්ද කෝෂ වර්තමානය වන විට වෙළුම් ගණනාවකින් යුක්තව ප්‍රකාශයට පත් වී ඇති බව පැහැදිලි වේ. එමගින් පැහැදිලි වන්නේ ශබ්ද කෝෂයක අන්තර්ගත වචන ප්‍රමාණය ප්‍රමාණාත්මකව වර්ධනය වී ඇති බවයි. මේ අතර අතේ ගෙන යා හැකි Pocket Dictionary ද නැතුවා ම නොවේ.

එපමණක් නොව අද වන විට ලොව බොහොමයක් ශබ්ද කෝෂ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් (Electronic Media) හෝ මාර්ගගත (Online) ආකාරයෙන් කියවා ගැනීමට පහසුකම් සලසා තිබීම ශබ්දකෝෂකරණයේ තාක්ෂණික දියුණුවක් ලෙස පෙන්වා දිය හැකිය. ඔක්ස්පර්ඩ් ශබ්ද කෝෂය

සංගෘහිත තැටි (CD - ROM) ආකාරයෙන් මෙන්ම මාර්ගගත (Online) ආකාරයෙන් පවතින බව උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

එපමණක් නොව අද බොහොමයක් ශබ්ද කෝෂ සංඛ්‍යාංකකරණයට (Digititalized) භාජනය කරමින් පරිශීලනය කිරීමට අවස්ථාව සලසා දී තිබීම නූතන තාක්ෂණයේ බල මහිමයෙන් දුන් දායදයක් බවට පත් වී ඇත. ඒ හේතුවෙන් වෙළුම් ගණනාවක් තැන්පත් කිරීමට යන ඉඩකඩ ප්‍රමාණය සීමා කරමින් ඉතා කුඩා ඉඩකඩක තැන්පත් කිරීමට අවකාශය ලබා දී ඇතිවා පමණක් නොව ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් ගෙන යා හැකි, පහසුවෙන් පරිශීලනය කළ හැකි තත්ත්වයට ශබ්දකෝෂකරණයේ නව පෙරළියක් සිදු වී ඇත. මාර්ගගත දත්ත පදනම් හරහා යාවත්කාලීන තොරතුරු වලට ප්‍රවේශ වී එහි ගණුදෙනුකරුවකු වීමේ පහසුකම් ද සලසා දී තිබීම අද ශබ්දකෝෂකරණයෙහි දැකිය හැකි නූතන ප්‍රවණතාවයකි.

එමඟින් අළුතින් එකතුවන වචන පිළිබඳ දැන ගැනීමට හැකිවීමත්, තොරතුරුවල යාවත්කාලීන බවකුත්, ප්‍රමාණාත්මකව වචන වැඩි ප්‍රමාණයක් අධ්‍යයනය කිරීමට හැකි වීමත් දක්නට ලැබේ. එසේම තාක්ෂණික දියුණුවේ මහිමයෙන් වර්තමාන ශබ්ද කෝෂකරණයේ නවතම ප්‍රවණතාවය ලෙස ශබ්ද කෝෂ වල ඇති වචනන්හි එය උච්ඡාරණය කරන ආකාරය නැතහොත් හඬ ඇසීමේ පහසුකම සලසා තිබීම ඉතාම පැසසිය යුතු ලක්ෂණයකි. සමහර අවස්ථාවල දී අප විසින් ග්‍රන්ථය දෙස පරීක්ෂා කර බලා ශබ්දය උච්ඡාරණය කර ගැනීමට වඩා එම උච්ඡාරණ විලාශය ඇසීමට සැලස්වීමෙන් නිවැරදිවම වචනය ග්‍රහණය කර ගැනීමට හැකියාව ලැබී ඇත.

සමහර අවස්ථාවල දී අප සතු පරිගණකය ඔස්සේ මෙම ශබ්ද කෝෂ පරිශීලනය කිරීමටත් එහිම දියුණු ක්‍රමවේදයක් ලෙස පරිගණක වැඩසටහන් හෝ මෘදුකාංග හරහා ජංගම දූරකතනය ඔස්සේ මෙම ශබ්ද කෝෂ පරිශීලනය කිරීමට පහසුකම් සලසා ඇත.

එසේම සමහර අවස්ථාවල දී වචනවල අර්ථය පැහැදිලි කිරීම සඳහා චිත්‍ර හෝ රූපමය මාධ්‍ය උපයෝගි කර ගනිමින් නිවැරදිම අදහස ලබාදීමට කටයුතු කර ඇති අවස්ථා ද දැකිය හැකිය. එහි වර්ධනයක් ලෙස වීඩියෝ

ශබ්ද කෝෂ (Video Dictionary) ද වර්තමාන ශබ්ද කෝෂකරණයේ නව ප්‍රවණතාවයන් ලෙස දැක ගත හැකිය. මේ අයුරින් බලන විට ප්‍රමාණාත්මකව විශාල වශයෙන් හා මුද්‍රණ ද්වාරයෙන් ප්‍රකාශයට පත් වූ ශබ්ද කෝෂ වෙනුවට වචන අන්තර්ගතයෙන් විශාල වූ එහෙත් ප්‍රමාණයෙන් අතේ ගෙන යා හැකි මට්ටමේ පරිවර්තනයකට නූතන ශබ්ද කෝෂකරණයේ ප්‍රවණතාවයක් දැකිය හැකි බව පැහැදිලි වේ. ඊට ප්‍රධානවම බලපා ඇත්තේ නූතන තාක්ෂණයේ දියුණුවයි.

## ශ්‍රී ලංකාව තුළ ශබ්ද කෝෂකරණයේ සංවර්ධනය විය යුතු අංශ

ලෝකයේ රටවල් වල ශබ්ද කෝෂකරණය එසේ වුවද මෙරට තුළද දියුණු ක්‍රමවේදයක් භාවිත කිරීමට කාලය එළඹ ඇත. දැනට යම් යම් පුද්ගලයන් විසින් සම්පාදනය කරන ලද ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂ කිහිපයක් පරිගණකය හෝ ජංගම දුරකතනය හරහා බලා ගැනීමට පහසුකම් තිබුණ ද වඩා දියුණු ක්‍රමවේදයන් මෙරට තුළ ද ක්‍රියාත්මක කිරීම උචිත වේ. සිංහල භාෂාවේ මුදුන් මල්කඩ වැනි සිංහල ශබ්ද කෝෂය නව සංස්කරණ තුළින් ප්‍රකාශයට පත් කිරීමටත්, එය මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ පරිශීලනයට ඉඩකඩ සැලසීමත්, දත්ත පදනම් (Data Base) හරහා පුස්තකාලවල භාවිතයටත් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව යෝජනා කල හැකිය.

තවද මෙරට විවිධ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එනම් අධ්‍යාපන, දේශපාලන, සමාජීය, ආගමික, කලාව, සාහිත්‍ය වැනි ක්ෂේත්‍රයන්හි දායකත්වයක් දැක් වූ පුද්ගලයන් වෙනුවෙන් වඩා සාධිකාරී චරිතාපදාන ශබ්දකෝෂයක අවශ්‍යතාවය පවතින බවද යෝජනා කල හැකිය. එය මතු උපදින පරම්පරාව වෙනුවෙන් ද වටිනා කෘතියක් වනු නොඅනුමානය.

එසේම මෙරට පාරම්පරික දැනුම අතින් අන් රටවල් අභිබවා ඉදිරියෙන් සිටින බව කිව යුතුමය. පැරණි දැනුම, චාරිත්‍ර වාරිත්‍ර විධි, සිරිත් විරිත්, හෙළ වෙදකම් යනාදිය පදනම් කරගත් විෂයන් සම්බන්ධයෙන් දැනුම ඇතුලත් ශබ්ද කෝෂයන්හි අඩුවක් පවතින බව ද පෙනේ. තවද කුඩා ළමයින් වෙනුවෙන් සකස් කරන ලද ළමා ශබ්ද කෝෂවල වටිනාකමට ද අවධානය යොමු කල යුතුව ඇත. මෙම පහසුකම් ද සැලසීමට හැකි වුව

හොත් ලොව අනෙක් රටවල සේම මෙරට තුළ ද ශබ්දකෝෂකරණයේ පෙරළියක් දැකිය හැකි බවට සැකයක් නොමැත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Atkins, B.T.S. and Rundell, Michael. (2008). The oxford guide to practical lexicography. oxford: oxford university press.

Nielsen, Sandro. (2008). The effect of lexicographical information costs on dictionary making and use.

Webster's new world college dictionary. (2002).

එඩ්මන්ඩ්, කේ. බී. ඒ. (2007). මහා සිංහල සාහිත්‍ය ශබ්ද කෝෂය, කොළඹ : ගොඩගේ ප්‍රකාශක.

ගුණසේකර, ධනපාල. (1998). පුස්තකාල සේවාවේ මූලිකාංග, කොළඹ : ගොඩගේ ප්‍රකාශක.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර. (2005). පුස්තකාලය හා විශ්ව දැනුම, කොළඹ : ගොඩගේ ප්‍රකාශක.

මාගම්මන, ප්‍රේමචන්ද්‍ර. (2002). විශ්ව දැනුමට මඟ පෙන්වන පුස්තකාල අත්පොත, කොළඹ : ගුණසේන සමාගම.

විජේතුංග, හරිස්චන්ද්‍ර. (2005). ගුණසේන මහා සිංහල ශබ්ද කෝෂය, කොළඹ : ගුණසේන සමාගම.

# අනුක්‍රමණිකාකරණය, ඒ ආශ්‍රිත සංකල්ප ප්‍රභේද සහ පද්ධති පිළිබඳ සරල අර්ථ නිරූපණයක්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්. ඒ. වීරසූරිය


## සාරසංග්‍රහය

අනුක්‍රමණිකාකරණය අයත් වන්නේ සූක්ෂම තොරතුරු එකතු කිරීම, සංවිධානය, පිරිසැකසුම්කරණය සහ බෙදා හැරීමටයි. වර්ගීකරණය, සූචිකරණය, ග්‍රන්ථ නාමාවලීකරණය අයත්වන්නේ සාර්ව තොරතුරු සංවිධානයටයි. මෙම ලිපිය මගින් අනුක්‍රමණිකාකරණය යන්න පැහැදිලි කර ඇත. තවද අනුක්‍රමණිකාකරණ විෂයට අයත් විවිධ පද, සංකල්ප විධි සහ ක්‍රමවේද රාශියක් තිබෙන අතර මෙම ලිපිය මගින් ඒ කිහිපයක් පිළිබඳ ගවේෂණය කොට ඉදිරිපත් කර ඇත.


**මූලික පද : අනුක්‍රමණිකා, අනුක්‍රමණිකාකරණය, අනුක්‍රමණිකා භාෂාව, අනුක්‍රමණිකා පද්ධති, අනුක්‍රමණිකා ප්‍රභේද, ප්‍රවේශ පද, මූලික පද**

## හැඳින්වීම

තොරතුරු සංවිධානය (Organization of Information) සහ තොරතුරු කළමනාකරණය (Information Management) අද ඉතා අත්‍යවශ්‍යම අංශයක් ලෙස පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය මගින් අවධාරණය කරවයි. මෙහි ලා වර්ගීකරණය, සූචිකරණය, ග්‍රන්ථ නාමාවලීකරණය, ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රකාශනය, සංවිධානය මගින් ලෝකයේ නිර්මිත දැනුම කළමනාකරණය කරවන සාර්ව විධි ක්‍රමයට අයත් වේ. අනුක්‍රමණිකාකරණය එහි සූක්ෂම අංශයට ගැනේ.

## අනුක්‍රමණිකාකරණය (Indexing)

අනුක්‍රමණිකා සහ අනුක්‍රමණිකාකරණය මගින් ලේඛනවල හෝ අන්තර්ජාල හෝ වෙනත් ඕනෑම ආකාර මූලාශ්‍රයක, දැනුම් බහාලුමක (Knowledge Container) අන්තර්ගතයට විවිධ ප්‍රවේශ, මූලික වශයෙන් මුඛ්‍ය පද හෝ

සම්මත පද ඔස්සේ එලැඹිය හැකිය. නැතිනම් තොරතුරු කරා ළඟා වීමත්, එම තොරතුරු ලබා ගැනීමටත් අවකාශ සලසනු ලැබේ. පද හෝ නියමිත ප්‍රවේශයන් ඔස්සේ ඉතා සූක්ෂම අයුරින්, සූක්ෂම පද හෝ සූක්ෂම එළැඹුම් ඔස්සේ අනුක්‍රමණිකා හෝ අනුක්‍රමණිකාකරණය මගින් දැනුම ලබාගැනීම, එලෙස දැනුම ලබාගැනීම සඳහා ප්‍රවේශ පද පිළියෙල කිරීම, සංවිධානය එමගින් තොරතුරු උද්ධරණය කරගැනීම අනුක්‍රමණිකා මගින් කරනු ලැබේ (Booth, 2001). මෙලෙස තොරතුරු සමුද්ධරණය සඳහා සකසන ලද මූලාශ්‍ර විශේෂය "අනුක්‍රමණිකා" (Indexes) ලෙස හඳුන්වනු ලැබේ. ඒවා සම්පාදනය, එලෙස මුද්‍රිතව හෝ මුද්‍රිත නොවන වෙනත් ආකාර වලින් අනුක්‍රමණිකා පිළියෙල කිරීම හෝ ස්වයංක්‍රීයව පිළියෙල වීම අනුක්‍රමණිකාකරණය නම් වේ.

## අනුක්‍රමණිකා පිළිබඳ නිර්වචන

"ලේඛනවල හෝ මූලාශ්‍රවල අන්තර්ගත කරුණු තොරතුරු හෝ අයිතම කරා ප්‍රවේශ වීම සඳහා ඒවායේ අඩංගු පද හෝ අයිතම මගින් හෝ වෙනත් පාලිත පද මාලා වලින් තෝරා ගත් පද ඉතා ක්‍රමානුකූලව බොහෝ විට අකාරාදීව හෝ වෙන යම් ප්‍රශස්ථ අනුක්‍රමයකට පිළියෙල කරමින් එකී අන්තර්ගත වෙනම වෙන් කිරීම, සංවිධානය හඳුනාගැනීම, ප්‍රවේශ වීම සඳහා පිළියෙල කර ඇති මාර්ගෝපදේශ විශේෂය හෝ වර්ගය" (British Standard Institution, 1988).

මේ අනුව අනුක්‍රමණිකාවක් යනු, "කිසියම් ලේඛනයක, ලේඛන රාශියක, මූලාශ්‍ර විශේෂයක අන්තර්ගතයට ප්‍රවේශ වීම, එයින් තොරතුරු ලබාගැනීම සඳහා ඒවායේ අන්තර්ගත, පද, සංකල්ප හෝ අයිතම අකාරාදීව හෝ වෙනත් සංවිධිත ක්‍රමයකට ඉතා පහසුවෙන් උද්ධරණය කර ගැනීම අටියෙන් පිළියෙල කිරීම, එලෙස පිළියෙල කරගත් මාර්ගෝපදේශ කෘතිය".

මේ අනුව අනුක්‍රමණිකාවක් මගින් ලේඛන හෝ තොරතුරු කරා ප්‍රවේශ වන්නේ මූලික පද හෝ සංකල්ප තුලිනි. ඇතැම් විට අයිතමයක් මගින් ද විය හැකිය. මේ අනුක්‍රමණිකාවක ප්‍රවේශ පද නොහොත් මූලික නොහොත් මුඛ්‍ය පද හෝ අයිතමයන්, එම නිසි අනුක්‍රමයකට පෙළගැස්වීම. බොහෝ විට අකාරාදී හෝ වර්ගීකෘත හෝ අංකන ක්‍රමයක් මගින් ප්‍රවේශ විය

හැකිය. ඒවා තුළින් විෂය අන්තර්ගතයට, ලේඛනවලට, විෂයන්වලට, සංකල්ප වලට ප්‍රවේශ විය හැකිය. මේ අනුව කර්තෘ, ලිපිනාම ආදී ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රවේශ පමණක් නොව ඒ සමග එයටත් වඩා සූක්ෂම එළඹුම්වන විෂයීය පද හා සංකල්ප ප්‍රවේශ තුළින් තොරතුරු කරා ප්‍රවේශ වීමට සකස් කර ඇති කෘති (Knight, G. Norman,1998) අනුක්‍රමණිකා වේ. මේ අනුව අනුක්‍රමණිකාවක අන්තර්ගත සංවිධානය පහත අයුරින් දැක්විය හැකිය.

1. ප්‍රවේශ නොහොත් මූලික පද (Access or Keywords)
2. ග්‍රන්ථ විද්‍යාත්මක පද යෙදීම්
3. එම පද ක්‍රමිකව සංවිධානය කිරීම නොහොත් පෙළගැස්ම
4. ඒවා තුළින් විෂය හෝ අයිතම කරා ළඟා වීමට ඉඩකඩ සැලැස්ම
5. තොරතුරු හෝ අයිතම කිසියම් සංලේඛ ක්‍රමයක් තුල සංවිධානය කිරීම
6. එම සංලේඛ හෝ අයිතම සංවිධානය
7. ඇතැම් අවස්ථාවල දී සෘජු නොහොත් නියතම තොරතුර හෝ විෂයෙන් තවත් විෂයයන් කරා යොමුකිරීම
8. පාඨකයා නොහොත් තොරතුරු අවශ්‍යතාවට නොගැලපෙන, අවශ්‍ය නොවන තොරතුරු හෝ විෂය කරා ප්‍රවේශ වීමේ අවස්ථා මඟ හැරලීමේ ක්‍රියාමාර්ග

## අනුක්‍රමණිකා ප්‍රභේද නොහොත් වර්ග (Types of Indexes)

පිළියෙල කර ඇති අනුක්‍රමණිකාවල ස්වභාවය, අන්තර්ගත දෑ, කරුණු, අයිතම, ස්වරූප, මාදිලිය, ප්‍රකාශන වර්ගය යනාදී මූලික ලක්ෂණ අනුව අනුක්‍රමණිකා වර්ග නොහොත් ප්‍රභේද දක්නට ලැබේ. ඒවා කිහිපයක් පහත නම් කර ඇත.

- කර්තෘ අනුක්‍රමණිකාව (Author Index)
- ග්‍රන්ථනාම අනුක්‍රමණිකාව (Title Index)
- ලිපි නාම අනුක්‍රමණිකාව (Article Title Index)
- නාම අනුක්‍රමණිකාව (Name Index)
- විෂය අනුක්‍රමණිකාව (Subject Index)
- ග්‍රන්ථගත අනුක්‍රමණිකාව (Book Index)

- වාර සඟරා සඳහා අනුක්‍රමණිකාව (Index to Periodicals)
- එකතු සඳහා අනුක්‍රමණිකාව (Index to Collections)
- වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව ( Index to Periodical Articles)
- ස්ථාන අනුක්‍රමණිකාව (Place or Location Index)
- අයිතම අනුක්‍රමණිකාව (Item Index)
- සාපේක්ෂ අනුක්‍රමණිකාව (Relative Index)
- ඍජු අනුක්‍රමණිකාව (Direct Index)
- දාම අනුක්‍රමණිකාව (Chain Index)
- උද්ධරණ අනුක්‍රමණිකාව (Citation Index)
- සමුච්චිත අනුක්‍රමණිකාව (Cumulative Index)
- උපාධි නිබන්ධ අනුක්‍රමණිකාව (Index to Theses)
- පේටන්ට් බලපත්‍ර අනුක්‍රමණිකාව (Patent Index)
- දෘෂ්‍ය අනුක්‍රමණිකාව (Visible Index)
- පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව (Newspaper article Index)
- පුවත්පත් සඳහා අනුක්‍රමණිකාව (Index to Newspapers)
- ග්‍රන්ථ මාලා අනුක්‍රමණිකාව (Series Index)
- මාර්ගත අනුක්‍රමණිකාව (Online Index)
- විද්‍යුත් අනුක්‍රමණිකාව (E-index)
- ස්වයංක්‍රීය අනුක්‍රමණිකාව (Auto Index)
- විෂයමුඛ නොහොත් මුඛාශ්‍රිත අනුක්‍රමණිකාව (Faceted Index)
- අකාරාදී අනුක්‍රමණිකාව (Alphabetical Index)
- වර්ගීකෘත අනුක්‍රමණිකාව (Classified Index)
- ඒ ඒ ලේඛන සඳහා අනුක්‍රමණිකාව
    1. ඔප්පු අනුක්‍රමණිකාව (Index to Deeds)
    2. චක්‍රලේඛ අනුක්‍රමණිකාව (Index to Circulars)
    3. වාර්තා අනුක්‍රමණිකාව (Index to Reports)
- අත්හුරු අනුක්‍රමණිකාව (Manual Index)
- අත්පිටපත් අනුක්‍රමණිකාව (Manuscripts Index)

## අනුක්‍රමණිකාකරණය ආශ්‍රිත පද හා සංකල්ප

### අනුක්‍රමණිකාකරණය

එනම් අනුක්‍රමණිකාවන් පිළියෙල කරන හෝ සකස්වන විද්‍යාව හා කලාව, ක්‍රම පටිපාටිය අනුක්‍රමණිකාකරණය නම් වේ.

### අනුක්‍රමණිකා

"අනුක්‍රමණිකාවක්" හෝ "අනුක්‍රමණිකා" යනු උක්ත අනුක්‍රමණිකාකරණය මගින් අවසානයේ පිළියෙල කරනු ලබන පද, සංකල්ප, අයිතම අඩංගු මාර්ගෝපදේශයයි.

### පූර්ව - සමන්වය අනුක්‍රමණිකාකරණය (Pre-coordinate Indexing)

අනුක්‍රමණිකා සකස්කිරීමේ දී පද ගැලපීමත්, පද යෙදීමත් සිදුවේ. මෙලෙස පද සංවිධානය අනුක්‍රමණිකාව පිළියෙල කිරීමට ප්‍රථම සිදුකිරීම පූර්ව සමන්වය අනුක්‍රමණිකාකරණය නම්වේ.

### අපර- සමන්වය අනුක්‍රමණිකාකරණය (Post-coordinate Indexing)

මෙහිදී පද ගැලපීම, පද සංවිධානය, පද හඳුනාගැනීම, වෙනස් කිරීම ප්‍රධාන වශයෙන් පද ගැලපීම, ලේඛන හෝ මූලාශ්‍ර සෙවීම නොහොත් ගවේෂණ අවස්ථාවේ දී ස්වයංක්‍රීයව සිද්ධවීමේ ක්‍රියාවලිය අපර - සමන්වය අනුක්‍රමණිකාකරණය නම් වේ. පද ගැලපීම අපරව සිදුවීම මෙනම්.

### අනුක්‍රමණිකා භාෂාව (Indexing Language)

අනුක්‍රමණිකා සම්පාදනයේ දී සංකල්ප පද, යෙදුම් විද්‍යානුකූලව තෝරා ගනු ලැබේ. පද හෝ අයිතම විද්‍යානුකූලව නිර්ණය හා භාවිතය තුළ භාෂාවක් නිර්මාණය වේ. මෙය යම් ආකාරයක ස්වයං සිද්ධ හෝ අත්හුරු ක්‍රමයකට සැකැසීමේ දී නිර්මිත භාෂාව අනුක්‍රමණිකා භාෂාව නම් වේ. මෙහිදී නෙගැලපෙන පද, අභාවිත පද, දෝෂ පද, අර්ථ විරහිත පද, භාෂා

උපකාරක පද අත්හරිමින් ස්වභාවික භාෂාව සහ කෘතිම භාෂාවක් තුළින් සංවිධානය හා සමුද්ධරණය සඳහා භාවිත භාෂාව අනුක්‍රමණිකා භාෂාව නම් වේ (Mulvany,2005). මෙහිදී අනුක්‍රමණිකා පද, කේත පද, සංලේඛ පද, අනුක්‍රමණිකා නීති රීති සියල්ලම ගත් විට මෙම භාෂාව නිර්මාණය වේ (Lancaster, 1988).

## පාලිත භාෂාව (Controlled Language)

උක්ත අනුක්‍රමණිකා භාෂාව සම්බන්ධ සංකල්පයකි. මෙහිදී සම්මත පද රැස්කිරීමත්, තෝරා බේරා, සැකැසුම්කරණය තුලින් පාලනයක් තුලින් ඇතිවන භාෂාවයි. උදාහරණ ලෙස වර්ගීකරණ ක්‍රමයක අඩංගු අනුක්‍රමණිකාව, විෂය ශීර්ෂ ලැයිස්තු, පර්යායකෝෂ ග්‍රන්ථවල ඇතුලත් භාෂාව පාලිත භාෂාවට උදාහරණ වේ. මේ අනුව අනුක්‍රමණිකාවල පාලිත භාෂාව අඩංගු වේ.

## ප්‍රත්‍යානයනය හා ප්‍රත්‍යානයන අනුපාතය (Recall and Recall Ratio)

ප්‍රත්‍යානයනය යනු යම් අයෙකු තම තොරතුරු ගවේෂණය කිරීමේ දී අනුක්‍රමණිකා ක්‍රියාවලිය තුළ (අත්හුරු හෝ ස්වයංක්‍රීයව) ඔහුගේ ඇයගේ තොරතුරු අවශ්‍යතාව මත අදාළතම ලේඛන හෝ අදාළතම තොරතුරු වලට වඩා වැඩි, අදාල නොවන තොරතුරු හෝ ලේඛන හමුවන අවස්ථාවයි. උදාහරණ ලෙස යම් ලේඛන ගොනුවක හෝ තොරතුරු ගොනුවක අදාල ලේඛන 50 ක් තිබෙන අවස්ථාවක එයින් 20 ක් ගවේෂණයේ දී උද්ධරණය වීම, මෙහිදී අදාල ලේඛන හෝ තොරතුරු 30 ක් මඟහැරී ඇත. මෙම අවස්ථාව හඳුන්වන්නේ ප්‍රත්‍යානයනය (Vickery, 1973) නමිනි. ප්‍රත්‍යානයන අනුපාතය යනු මෙය ප්‍රතිශතයක් ලෙස පෙන්වීමයි. ප්‍රත්‍යානයනය වැඩි වන විට අදාල ලේඛන හෝ තොරතුරු අඩු වනු ඇත. අනුක්‍රමණිකා පද්ධතියක් ඇගැයීමේ දී භාවිතා වන ශිල්ප ක්‍රමයක් ලෙස මෙය හඳුන්වා දී ඇත.

## යථාර්ථය සහ යථාර්ථ අනුපාතය (Precision and Precision Ratio)

යථාර්ථය යනු ලේඛන හෝ තොරතුරු ගොනුවකින් ඉහත පරිදි ගවේෂණය කිරීමේ දී අදාල ලේඛන තොරතුරු හෝ ප්‍රමාණය වැඩියෙන් සමුද්ධරණය වීමකි. එනම් අදාළ ලේඛන වැඩි ප්‍රමාණයක් සොයාගැනීමට ඇති හැකියාවයි. උදාහරණ ලෙස තොරතුරු ගොනුවක ඇති අදාල ලේඛන 50 ක් වන අවස්ථාවක එයින් 40 ක්ම එනම් අදාළ ලේඛන බහුල ප්‍රමාණයක් අත්පත් වන්නේ නම් එනම් අදාළ ලේඛන ඉහළ ප්‍රමාණයකුත්, එම ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකින් අදාළ ලේඛන හෝ තොරතුරු හමුවීමයි. මෙහිදී අදාළ ලේඛන 10 ක් ගිලිහී ඇත. මේ අනුව ප්‍රත්‍යානයන වැඩිවීම යනු අදාළ ලේඛන අඩුවෙන් සමුද්ධරණය වී අදාළ නොවන ලේඛන හෝ අදාළ නොවන තොරතුරු වැඩියෙන් සමුද්ධරණය වීමයි. යථාර්ථය වැඩිවන අවස්ථාවක දී අදාළ ලේඛන වැඩි ප්‍රමාණයක් උද්ධරණය වී අදාළ නොවන ලේඛන අඩුවෙන් සමුද්ධරණය වන බවයි. යථාර්ථය වැඩිවීම යනු අත්‍යවශ්‍ය ලේඛන හෝ තොරතුරු ප්‍රවේශ වීම සතුටු දායක බවයි. මේ අනුව යථාර්ථය අනුපාතය යනු ලැබූ ලේඛන හෝ තොරතුරු ප්‍රතිශතාත්මකව දැක්වීම යි. මෙම ශිල්ප ක්‍රම දෙකම භාවිත වන්නේ අනුක්‍රමණිකා පද්ධතියක ගුණාත්මක භාවය ඇගැයීමකට ලක් කරන අවස්ථාවලදී ය.

## අනුක්‍රමණිකා පද්ධති නොහොත් අනුක්‍රමණිකා ක්‍රම (Indexing Systems)

අනුක්‍රමණිකා පද්ධති හෝ ක්‍රම යනු යම් අනුක්‍රමණිකාවක් පිළියෙල කරගැනීම සඳහා භාවිතා කළ හැකි අනුක්‍රමණිකා විශාරදයන් විසින් දැනටමත් හඳුන්වා දී ඇති උපක්‍රම නොහොත් විධි ක්‍රමයක් වේ. මේවා එක් අන්දමකින් අනුක්‍රමණිකා ශිල්ප ක්‍රම, අනුක්‍රමණිකා ක්‍රමෝපායන වශයෙන් ද හඳුන්වා දිය හැකිය. වර්ගීකරණයේ දී පද්ධති නොහොත් ක්‍රම ලෙස ඩිවි දශම වර්ගීකරණ ක්‍රමය, විශ්ව දශම වර්ගීකරණ ක්‍රමය, දෙතිත් වර්ගීකරණ ක්‍රමය උදාහරණ ලෙස උපුටා දැක්විය හැකිය. අනුක්‍රමනිකාකරණයේ දී අනුක්‍රමණිකා පද්ධති නොහොත් උපක්‍රම කිහිපයක් පහත දක්වා ඇත. ඒවා මගින් අනුක්‍රමණිකාකරුවාට හෝ ශිෂ්‍යයනට, පුස්තකාලයාධිපතීනට අනුක්‍රමණිකා පිළියෙල කරගත හැකිය.

- ඒක පද අනුක්‍රමණිකා පද්ධතිය (Uni - term Indexing System)
- දාම අනුක්‍රමණිකා පද්ධතිය (Chain Indexing System)
- පරි - රක්ෂිත සන්දර්භ අනුක්‍රමණිකා පද්ධතිය (Pre - served Context Indexing System)
- සන්ධර්භය තුළ මූලික පද අනුක්‍රමණිකා පද්ධතිය (Keyword in Context Indexing System)
- සන්දර්භයෙන් බැහැර මූලික පද අනුක්‍රමණිකා පද්ධතිය (Keyword Out of Context Indexing System)
- උද්ධරණ පාදක අනුක්‍රමණිකා පද්ධතිය (Citation Based Indexing System)

(රණසිංහ 2007)

ලෝකයේ සම්මත අනුක්‍රමණිකා පද්ධති ගණනාවක් පවතී. මෙම ක්‍රම තුළින් පුස්තකාලයකට, ප්‍රලේඛන මධ්‍යස්ථානයකට හෝ තොරතුරු මධ්‍යස්ථානයකට උචිත අනුක්‍රමණිකා ක්‍රමයන්/ ක්‍රම උපයෝගී කරගනිමින් තම අනුක්‍රමණිකා සකස්කර ගත හැකිය.

## අනුක්‍රමණිකා සඟරා හා දත්ත සංචිත (Indexing Periodicals & Databases)

අනුක්‍රමණිකා සඟරා යනු සඟරා විශේෂයක් වන අතර වර්තමානයේ මේවා මාර්ගගත දත්ත සංචිත ලෙස සකස්කර ඇත. විද්‍යානුකූල පිළිවෙලකට තෝරා ගත් සඟරා ලැයිස්තුවක් පවත්වාගෙන යමින් එම ලැයිස්තුවේ ඇති සඟරාවල ලිපි සඳහා අනුක්‍රමණිකාවක් පිළියෙල කරනු ලැබේ. එම ලිපි ඇතුලත් විශේෂ සඟරා අනුක්‍රමණිකා සඟරා නම් වේ. වර්තමානයේ මේ සම්බන්ධව දත්ත සංචිත ගණනාවක් ඇත. වර්තමානයේ දැවැන්ත ප්‍රකාශන ආයතන මේ සඳහා හවුල් වී සිටී. මුලින් අනුක්‍රමණිකා සඟරා වශයෙන් මුද්‍රිත නිකුත් කළ අතර ඒවා වර්තමානයේ මාර්ගගතව නිකුත් කරනු ලැබේ. මේ සියල්ලම අද හඳුන්වනු ලබන්නේ අනුක්‍රමණිකා සේවා වශයෙනි. ඉයුජින් ගාර්ෆීල් ආරම්භ කළ ISI (1960) පසුව Web of Science

වර්තමානයේ (Clarivate Analytics) ලෝකයේ අනුක්‍රමණිකා සේවා අතර ප්‍රමුඛතම ආයතනයකි.

## සමාලෝචනය (Conclusion)

අනුක්‍රමණිකාකරණය මේ අනුව විද්‍යාත්මක භාෂාවක් (Scientific Language) සකස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස හැඳින්විය හැකිය. මෙම භාෂාව පාලිත භාෂාවක් වන අතර තොරතුරු කළමනාකරණය, දැනුම සංවිධානය හා දැනුම කළමනාකරණය (Knowledge Management) විෂයට අයත් උප විෂයකි. මෙහිදී ලේඛනවල හෝ මූලාශ්‍රයක, මූලාශ්‍ර වල අන්තර්ගත දැනුමට ප්‍රවේශ වීම සඳහා ඉතාම සූක්ෂම ලෙස පද එකතු කර ගැනීම පද අර්ථ නිරූපණය, නිවැරදි පද තෝරා ගැනීම පද සංවිධානය, අයිතම සංවිධානය එම පද ප්‍රවේශය තුලින් සූක්ෂම තොරතුරු කරා එලැඹීමේ ඉඩකඩ සම්පාදනය කරනු ලැබේ. අදාළ පද හා සංකල්ප කිහිපයක් විග්‍රහ කර දක්වා ඇත.

## විමර්ශන


Booth, Pat F. (2001). Indexing the manual of good practice. München: Saur.

British Standards Institution. (1988). Recommendations for the preparation of indexes for books, periodicals and other publications (BS 3700). London: BSI.

Browne, G. and Jermey, J. (2007). The Indexing companion. Cambridge: Cambridge University Press.

Cleveland, Donald B and Cleveland Ana D. (2013). Introduction to indexing and abstracting. Santa Barbara, California: Libraries Unlimited.

Knight, G. Norman. (1998). Indexing, the art of: a guide to the indexing of books and periodicals. London: Routledge.

Lancaster, F.W. (1998). Information retrieval systems: Characteristics testing and evaluation. New York: John Willey.

Mulvany, N. (2005). Indexing books (2nd ed.). Chicago: University of Chicago Press.

රණසිංහ, පියදාස. (2007). විෂය සූචිකරණය හා අනුක්‍රමණිකාකරණය. කැලණිය : කර්තෘ

Rowley, Jenifer. (1998). Abstracts and indexes (2nd ed.). London: C. Bingley.

Smith, Sherry L. and Kell, Kari J. (2005). Inside indexing the decision-making process. [United States]: Northwest Indexing Press.

Vickery, B.C. (1973). Information systems. London: Buttorworths.

Wellisch, Hans H. (2001). Indexing A to Z (2nd ed.). New York: H.W. Wilson.

# පුස්තකාල හා තාක්ෂණික සේවා

ඩබ්ලිව්. එම්. තුසිතකුමාරි

## හැඳින්වීම

මානව වර්ගයාගේ මූලික අවශ්‍යතාවයන්ගෙන් එකක් ලෙස තොරතුරු හැඳින්වීමට පුළුවන. නව තොරතුරු බිහි වීමත්, තිබෙන තොරතුරු යල් පැන යාමත් වත්මන් ලෝකයේ පොදු ලක්ෂණයක් බවට පත්ව ඇත. මේ ආකාරයට ලොව පුරා බිහිවන තොරතුරු වර්තමාන පාඨකයා කරා ගෙන යාමත් අනාගතය උදෙසා උරුම කරලීමත් පුස්තකාලයට පැවරී ඇත. විවිධ මාධ්‍ය ඔස්සේ විප්ලවීය ආකාරයෙන් ප්‍රකාශයට පත්වන තොරතුරු අනාගත පරපුරට භාවිතා කළ හැකි පරිදි රැස්කොට, සංවිධානය කොට, ගබඩා කොට, සමුද්ධරණය හා සංන්නිවේදනය සඳහා තබා ඇති ස්ථානය පුස්තකාලය ලෙස හැඳින්වීමට පුළුවන.

අතීත පුස්තකාල ආගමික ස්ථාන ආශ්‍රිතව විමර්ශන පුස්තකාල ලෙස බිහිවූ අතර මහජනතාවට පහසුවෙන් ළඟාවීමට අවස්ථාවක් නොතිබිණි. කාර්මික විප්ලවයත් සමගම සෑම අංශයක් මෙන්ම පුස්තකාල ද නව මුහුණුවරකින් පොදු ජනතාවට සේවාවන් විවෘත කරන ලදී. මෙම සේවා පුළුල් වීමත් සමඟම පුස්තකාලයේ තාක්ෂණික අංශයේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට පුස්තකාල බලධාරින්ට සිදුවිය. මේ නිසා වර්තමාන පුස්තකාලයාධිපතිවරයා තුළ සම්ප්‍රදායික පුස්තකාල භූමිකාවෙන් ඔබ්බට ගිය වෘත්තීයමය දැනුම, හැකියාව හා තාක්ෂණය මුල් කරගත් සේවා සැපයුම්කරුවෙකුගේ භූමිකාවක් දැකිය හැකිය.

## පුස්තකාල ඉතිහාසය

වත්මන් ලොව දැකිය හැකි වේගවත් සංවර්ධනයේ රහස අක්ෂර ලේඛන කලාවයි. ආදි මානවයා එදිනෙදා ඔවුන් විසින් කළ කී දේ සමහර අවස්ථාවලදී විවිධ ද්‍රව්‍ය මත සටහන් කර තැබීමට හුරුවී සිටියහ. ඒ සඳහා ඔවුහු තමන් වාසය කළ ගල්ගුහාවන් හි ගල් තලාවන් යොදාගන්නා ලදී. ඉන් පසුව ලිවීමේ මාධ්‍ය මැටි පුවරු, පැපිරස්, පාච්මන්ට්, වෙලම් වල සිට කඩදාසි භාවිතය දක්වා පරිණාමයට පත්විය.

අක්ෂර ලේඛන කලාවේ සමාරම්භය දක්වා දිව යන දිගු ඉතිහාසයක් පුස්තකාල වලට ද තිබේ. මන්ද යත් ලේඛන නිෂ්පාදනයත් සමගම ඒවා මතු ප්‍රයෝජනය පිණිස රාශිගත කොට ආරක්ෂා කිරීම ද අවශ්‍ය වූ හෙයිනි.

"Library" යන වචනය ලතින් භාෂාවෙන් බිඳී ආ ඉංග්‍රීසි වචනයකි. "පොත් වලට සම්බන්ධ" යන අරුත් සහිත ලතින් "Lubrius" යන පුල්ලිංග පදයේ ස්ත්‍රී ලිංග පදය වන "පොත්හල" යන අරුත් සහිත "Libraria" යන පදයෙන් බිඳී ප්‍රංශ භාෂාව ඔස්සේ මධ්‍ය කාලීන ඉංග්‍රීසි භාෂාවට එක් වූ " Library" යන පදය "පොත්, වාර සඟරා ආදියේ එකතු කියැවීම, බැහැර ගෙන යාම පිණිස ලබාගැනීම හෝ විමර්ශනය සඳහා තැන්පත් කොට ඇති ගොඩනැගිල්ලක් හෝ කාමරයක්" යනුවෙන් "New Oxford Dictionry" හි අර්ථ දක්වයි. (Brown (ed), 1993, p.1578)

පුස්තකාල හා විඥාපන විද්‍යා ශබ්දකෝෂ වලදී පුස්තකාලය පිළිබඳ දක්වා ඇති නිර්වචනයන් ද මීට බොහෝ දුරට සමානය. හැරඩ්ගේ පුස්තකලයාධිපතිවරුන් සඳහා වන පාරිභාෂික ශබ්ද මාලාවට අනුව, " කියවීම හා උපදේශනය සඳහා තබා ඇති පොත් එකතුව සහ අනෙකුත් සාහිත්‍යමය ද්‍රව්‍යයන්ගෙන් යුත් ස්ථානය, ගොඩනැගිල්ල, කාමරය හෝ කාමර සමූහය පුස්තකාලයයි." (Harrod, 1977, p.487)

ඇමරිකානු පුස්තකාල සංගමයේ පාරිභාෂික ශබ්දමාලාවට අනුව පුස්තකාලය යනු, "කියවීම, උපදේශනය හා අධ්‍යයනය සඳහා තබා ඇති පොත් එකතුන් සහ අනෙකුත් සාහිත්‍යමය ද්‍රව්‍යයන්ගෙන් යුත් කාමරය හෝ කාමර සමූහය හෝ ගොඩනැගිල්ල, පුස්තකාලයයි." (Thompson, 1971, p.80)

මේ සියලු නිර්වචන සැලකිල්ලට ගත් විට නිරීක්ෂණය කළ හැකි පොදු කරුණු කීපයක් ඇත. ඒවා නම් ;

1. පුස්තකාලය මිනිස් ඥානය පිළිබඳ වාර්තා රැස් කරන ස්ථානයකි.
2. එබඳු අඩංගු වාර්තා ආරක්ෂා කරන ස්ථානයකි.

3. එබඳු අඩංගු වාර්තා පරිභෝජනයට ඉඩ සලස්වනු ලබන ස්ථානයකි.
4. එබඳු වාර්තාගත තොරතුරු බෙදාහරින හෝ ප්‍රචාරණය කරනු ලබන ස්ථානයකි.

පුස්තකාලයකින් ඉටුවන යතෝක්ත කාර්යභාරයන් දෙස ඓතිහාසික නයින් සලකා බැලීමේ දී පෙනීයන්නේ එකී කාර්යභාරයන් දීර්ඝකාලීනව සිදු වූ ඓතිහාසික ක්‍රියාදාමයක ප්‍රතිඵල වශයෙන් විකාශයට පත් වූ ඒවා බවයි.

පුස්තකාල ඉතිහාසය විමසා බැලීමේ දී ඉහත සඳහන් කාරණා මොනවට සනාථ කළ හැකිය. අතීත පුස්තකාලයාධිපතිවරයා සතු භූමිකාව වූයේ පොත් භාරකාරත්වයයි. ඔහුගේ ප්‍රධානතම කාර්යය වූයේ පොත්පත් ආරක්ෂා කිරීම සහ පොත්පත් යදමින් බැඳ තැබීමේ කාර්යය පරීක්ෂා කිරීමයි.

20 වන ශත වර්ෂය වන විට යදම් පුස්තකාල (Chained Library) අධ්‍යයන පුස්තකාලයන්හි තැන්පතු එකතුව (Reserve Collection) බවට පත්වී ඇති අතර ක්‍රි. ව. 1750 න් පසු ක්‍රමයෙන් පුස්තකාල තුළින් යදම් ඉවත් කිරීම සිදුවී තිබේ. (Jackson, 1970, p.434, 437)

ක්‍රි. ව. 1945 සිට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු වූ විවිධ වෙනස්කම් නිසා පාඨක රටාවන් හා රුචිකත්වයන් සීඝ්‍රයෙන් වෙනස් විය. (කොරයා, 1969, 1184 පි.) පුස්තකාලය ස්වයං අධ්‍යාපනය සඳහා ඇති කේන්ද්‍රස්ථානයක් වූ අතර සියලු තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමට යා යුතු එකම ගෝලීය තොරතුරු මධ්‍යස්ථානය ද විය. එනිසාම පුද්ගලයාට, විශේෂයෙන් අධ්‍යාපනය ලබන්නන්ට හා පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති තීරකයන්ට, කළමනාකරුවන්ට, නිර්මාණකරුවන්ට ආදී සියල්ලන්ට ම නැතුවම බැරි ස්ථානයක් බවට වර්තමාන පුස්තකාලය පත්ව ඇත. මේ තොරතුරු අද මුද්‍රිත මාධ්‍යයට පමණක් ම සීමාවී නොමැති අතර ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය හරහා ද ඉතා ඉක්මනින් ලබාගැනීමට හැකිවී තිබීම විශේෂ ලක්ෂණයකි.

කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ සමාජීය, ආර්ථික හා දේශපාලනික පුනරුදය නිසා දැනුම පුළුල් වූ අතර පුස්තකාලවල

ස්වභාවය ද සීඝ්‍රයෙන් වෙනස් මඟකට යොමු විය. මේ වනවිට පුද්ගලයාගේ සාක්ෂරතාව හොඳ මට්ටමක පැවතීමත්, උගතුන් බහුල වීමත් නිසා දැනුම හා අවබෝධය සපුරාලීමට පුස්තකාලය මහඟු දායාදයක් විය. දැනුම පොදුවේ බෙදීයාම සඳහා විශ්වවිද්‍යාල ආරම්භ වීම හේතුවෙන් පුස්තකාල වලට ප්‍රමුඛත්වයක් හිමිවිය. මේ නිසා පුස්තකාල සේවාවන් පුළුල් කිරීමට සිදුවීමත්, එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව වැඩි වැඩියෙන් පුස්තකාල වෙත ඇදී ඒමත් සිදුවිය. (Wheitby, 1997, p.289)

විශ්වවිද්‍යාල පුස්තකාල ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස ක්‍රි.ව. 1500 දී පමණ යුරෝපයේ බිහි වූ විශ්වවිද්‍යාල සැලකීමට පුළුවන. එමෙන්ම පසු කාලීනව ආරම්භ කරන ලද ප්‍රංශයේ පැරිස්, සෝබෝන් වැනි විශ්වවිද්‍යාල අනුබද්ධිත විද්‍යායතන රැසක එකතුවක් වූ අතර 1412 දී ඔක්ස්ෆෝර්ඩ් හා 1425 කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල ආරම්භ විය. මෙම විශ්වවිද්‍යාල ආරම්භයත් සමඟම එම විශ්වවිද්‍යාලවල පුස්තකාලයන් ද ආරම්භ වී ඇත. (වීරසිංහ, 2000, 53 පි.)

මේ ආකාරයට ප්‍රකාශන බහුලතාවයන්, පෞද්ගලික පරිත්‍යාගයනුත් ආශ්‍රයෙන් බිහිවූ විශ්වවිද්‍යාල පුස්තකාල වත්මන් ලෝකයේ ඉතා සුප්‍රසිද්ධ හා ගුණාත්මක එකතුන් ඇති ආයතන බවට පත්වී ඇත. මෙම විශ්වවිද්‍යාලයීය පුස්තකාලයන්හි ප්‍රසිද්ධිය නිසාම විශ්වවිද්‍යාලයන්හි නාමය ද ගෞරවනීය තත්ත්වයට පත්වී ඇති බව පැහැදිලි වේ.

මෙවැනි ප්‍රසිද්ධියක් හා ගෞරවනීය තත්ත්වයක් උදා කර ගැනීම සඳහා ප්‍රධානම බලවේගය ලෙස හැඳින්විය හැක්කේ 15 වන ශත වර්ෂයේ දී ජර්මන් ජාතික ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමයි. අනතුරුව ඔහු විසින් සොයාගන්නා ලද මුද්‍රණ ශිල්පය ලොව පුරා ව්‍යාප්ත වූ අතර එමඟින් තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ විශාල පෙරළියක් ඇති කිරීමට ද හැකි විය. (Thompson, 1981, p.161) මුද්‍රණ ශිල්පයත් සමඟ ලෝකයේ සාහිත්‍ය බහුල වූ අතර පුස්තකාල පොත්පත් වලින් පිරී ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පුස්තකාල වලින් යදම් ඉවත්වී සාමාන්‍ය ජනතාව සඳහා ද පොත් කරා ප්‍රවේශ වීමේ අවස්ථාව ලැබිණි. (Thompson, 1981, p.161)

මේ ආකාරයට මුද්‍රණ ශිල්පයේ ව්‍යාප්තියට සමගාමීව ග්‍රන්ථ නිෂ්පාදනය ද වේගවත් විය. මෙම වේගවත් ග්‍රන්ථ ප්‍රකාශනය විශාල වශයෙන් ලෝකය පුරා සුවිසල් පුස්තකාල ආරම්භ කිරීමට මූලික වූ ප්‍රබල සාධකයයි. බටහිර රටවල් වලින් ආරම්භ වූ මෙම පුනරුදය ලොව පුරා ප්‍රචලිත වීමට තවත් විශේෂ සිද්ධියක් වූයේ ක්‍රි.ව. 105 දී චීන ජාතික සායි ලුන් (T'sai Lun) විසින් කඩදාසි සොයාගෙන තිබීමයි.

තවද ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලයේත්, වලාභි, වික්‍රමශිලා හා තක්ෂිලා යන විශ්වවිද්‍යාලයන්හිත්, විශාල ග්‍රන්ථ එකතුන් සහිත පුස්තකාල තිබී ඇත. මෙම ආයතනයන්හි සිසුන් දහස් ගණනින් අධ්‍යාපනය හදාරා ඇති බවත්, බෞද්ධ පොත්පත් හා වේද, දර්ශනය, ජ්‍යොතිෂ්‍ය, කෘෂිකර්මය, වෛද්‍ය විද්‍යාව වැනි විෂයන්ට අදාළ ග්‍රන්ථ එකතුන් ද තිබී ඇති අතර මෙම එකතුන් අතර විශාල ප්‍රමාණයක් ශාස්ත්‍රීය තොරතුරු ඇතුළත් පුස්කොළ පොත් විය. (වීරසිංහ, 2000, 39 පි.)

කාර්මික විප්ලවයට පෙර ඇමෙරිකාවේ උසස් අධ්‍යාපන ආයතන 'විද්‍යායතන' නමින් හඳුන්වා දෙන ලදී. විප්ලවයට පසු මේ විද්‍යායතන විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් විය. රජයේ විශ්වවිද්‍යාල ආරම්භ වූ බවට සාක්ෂි දරන්නේ 18 වන ශත වර්ෂයේ අවසාන භාගයේදීය. ක්‍රි. ව. 1825 දී තෝමස් ජෙෆර්සන් විසින් ගොඩනැගූ වර්ජිනියා විශ්වවිද්‍යාලය ඇමෙරිකාවේ මුල්ම රාජ්‍ය විශ්වවිද්‍යාලය ලෙස පිළිගැනේ. අනතුරුව යුරෝපීය බලපෑමෙන් පෙරදිග රාජ්‍යවල ද අධ්‍යාපනඥයන්ගේ නායකත්ව යටතේ විශ්වවිද්‍යාල ගොඩනැගුණු අතර බොහෝ ප්‍රාදේශීය විශ්වවිද්‍යාල යුද්ධයෙන් පසු විශාල වශයෙන් වර්ධනය වූ බැවින් නාගරිකව ජීවත් වූ අයටද නොමිලේ අධ්‍යාපනය ලබාදෙන ලදී. (Gates, 1978, p.288 )

## ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පුස්තකාල ඉතිහාසය ක්‍රි. පූ. 3 වන සියවස තරම් ඈතට දිවේ. අතීත හෙළ රජදරුවෝ සුවිසල් වෙහෙර විහාර පමණක් නොව සංඝාරාම සමග පුස්තකාල ද (පොත්ගුල්) ඉදි කළහ.

කොරයා විසින් ලංකාවේ අධ්‍යාපනය, සියවස ප්‍රකාශනයට ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ සටහනෙහි දක්වා ඇත්තේ, ක්‍රි. පූ. 543 ආර්යයන්ගේ පැමිණීමෙන් පසු විධිමත් වූ පුස්තකාල ඉතිහාසයක් ශ්‍රී ලංකාවේ ආරම්භ වූ බවයි. ක්‍රි. පූ. 3 වන සියවසේ මහින්දාගමනයෙන් පසු සිංහල සමාජය හා සංස්කෘතික තත්ත්වයන්හි ඇතිවූ දියුණුවත් සමඟම සිංහල භාෂාව, ලිවීම, චිත්‍රකලාව හා ගෘහ නිර්මාණ ශිල්පය යන විෂයය ක්ෂේත්‍රයන් ද දියුණු වී තිබිණි. ශ්‍රී ලංකා ඉතිහාසයේ පුස්තකාල වර්ධනය සඳහා තබන ලද ඓතිහාසික පියවරක් ලෙස හැඳින්විය හැක්කේ ක්‍රි. පූ. පළමුවන සියවසේ දී වළගම්බා රජු දවස (වට්ට ගාමිණී අභය - ක්‍රි.පූ. 103) භික්ෂූන් ලවා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරලීමයි. මෙය ශ්‍රී ලංකා සාහිත්‍ය ඉතිහාසයේ සන්ධිස්ථානයකි. එකල පාලි භාෂාවෙන් පුස්කොළ වල රචිත ධර්මය පිටපත් කරවා ප්‍රධාන ආරාම කීපයකම තැන්පත් කරන ලදී.

අනුරාධපුර යුගයේ පැවති ක්‍රි. පූ. 3 වන සියවසේ දී පමණ ආරම්භ වූ ප්‍රධාන භික්ෂු ආරාමයක් වූ මහා විහාරය භික්ෂු අධ්‍යාපන ආයතනයක් ද විය. අභයගිරි විහාරය හා ජේතවන විහාරය ද එවැනිම ප්‍රධාන භික්ෂු අධ්‍යාපනික ආයතන දෙකක් විය. ඉන්දියාවේ නාලන්දා, තක්ෂිලා වැනි අධ්‍යාපනික ආයතනයන්ට සමාන වූ මෙම ලාංකීය භික්ෂු ආධ්‍යාපනික ආයතනවල පුස්තකාල ද තිබී ඇත. එකල "පොත්ගුල" යනුවෙන් හඳුන්වා ඇති මෙම පුස්තකාල වල පාලි, ත්‍රිපිටකය ඇතුළුව තවත් බොහෝ ග්‍රන්ථ සම්භාරයක් තිබී ඇති අතර මෙම පොත් පරිහරණය සඳහා විදේශිය විද්වතුන් විසින්ද රුචියක් දක්වා ඇත. නිදසුන් ලෙස ක්‍රි. ව. 5 සියවසේ දී (ක්‍රි.ව. 406 - 428 : මහානාම රජු දවස) බුද්ධඝෝෂ හිමියන් මහා විහාරයේ ත්‍රිපිටකය හැදෑරූ බවත්, එහිමියන් විසින් විසුද්ධිමග්ගය ලියන ලද බවත් ඒ සඳහා බොහෝ බෞද්ධ පොතපත පරිශීලනය කරන ලදුව ඒ හිමියන් විසින් සම්පාදිත සමන්ත පාසාදිකා අට්ඨකථාව සඳහා ද අටුවා පොත් පරිශීලනය කළ බවට ද ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. අතීත ලංකාවේ ප්‍රධාන භික්ෂු ආරාම සියල්ලකම පාහේ පුස්කොළ පොත් සහිත පොත්ගුල් තිබී ඇති අතර ජේතවනාරාමයෙහි "පොත්ථකාලයක්" හා පොත් තැම්පත් කිරීම සඳහා මන්දිර දෙකක් තිබූ බවටද සාක්ෂි ඇත. (කොරයා, 1995)

තවද, චීන ජාතික පාහියන් භික්ෂුව ද බෞද්ධ පොතපත පරිශීලනය සඳහා මෙම යුගයේ ලංකාවට වැඩම කොට ඇති අතර උන්වහන්සේ දක්වා ඇති

ආකාරයට අභයගිරි විහාරයේ භික්ෂූන් 5000 ක් වැඩ වාසය කොට ඇත. එමෙන්ම මහා විහාරයෙහි භික්ෂූන්ගේ පරිශීලනය සඳහා පොත්පත් රාශියක් තිබූ බව ද පැහැදිලි වේ. ආරාම මුල්කරගෙන මෙම පොත්පත් තැන්පත් කෙරුණු අතර එම පොත් විහාරාරාමය තුළ පමණක් පරිශීලනය කිරීමට අවස්ථාවක් උගතුන්ට ලබාදී තිබිණි. මෙම ග්‍රන්ථ විමර්ශනය සඳහා පමණක් විය. විවිධ භාෂා වලින් විවිධ විෂයන්ට අදාළව ලියැවුණු පොත් පරිශීලනයට ගත් බව කුමාරදාස රජුගේ ග්‍රන්ථ, සේන රජුගේ සියබස්ලකර, V කස්සප රජුගේ දම්පියා අටුවා ගැටපදය, දිඹුලාගල මහා කස්සප හා මොගල්ලාන යන හිමිවරුන්ගේ ග්‍රන්ථ සහ ගුරුළුගෝමීන්ගේ අමාවතුර සහ ධර්මප්‍රදීපිකාව යන ග්‍රන්ථ විසින් හෙළිකරනු ලැබෙන අතර මෙම පොත්පත් ආරක්ෂා කරන්නවුන් ‘පුස්තකාල භාරකරු’ යන නමින් හඳුන්වනු ලැබීය. (කොරයා, 1969)

චූලවංශයට අනුව විජයබාහු රජ ත්‍රිපිටකය පිටපත් කරවා විහාරවල තැන්පත් කර ඇති බැවින් මහපැරකුම්බා රජු විසින් ද පොත් තැන්පත් කිරීම සඳහා ශාලා "එකසිය අටක්" කරවා ඇති බවත් තවද, මහපැරකුම්බා රජ විසින් කරවන ලද සෑම සංඝාරාමයක්ම පුස්තකාල දෙකකින් සමන්විතවූ බවත් පැහැදිලි වේ. "රාජකීය පුස්තකාලය" යැයි විශ්වාස කළහැකි පොත්ගුල් විහාරයේ නටඹුන් අද ද දැකිය හැක. (කොරයා, 1969) කෙසේ වුවද ශ්‍රී ලංකාව තුළ වරින් වර ඇති වූ දේශපාලනික ගැටුම් හා විවිධ ආක්‍රමණිකයන් නිසා බොහෝ වටිනා පොත්පත් හා පොත්ගුල් ද විනාශ වී ඇත.

පුස්තකාල සංවර්ධනය හා රාජකීය අනුග්‍රහය අතර පැවතියේ සෘජු සබඳතාවකි. ‘‘පැරණි ලෝකයෙහි පුස්කොළ සැමවිටම පන්සල්, දේවස්ථාන හා ශුද්ධස්ථාන හෝ ඇත්ත වශයෙන්ම රජුගේ දේවත්වයට හවුල්කරුවෙකු වන මාළිගය ආශ්‍රිතව පැවතුණු බව දැනගැනීම අපේ මවිතයට හේතුවක් නොවේ" යනුවෙන් මේ කරුණ පිළිබඳ තව දුරටත් පැහැදිලිවේ. (Francis) Wright, 1958, p. 43)

ඉන්පසු III වන විජයබාහු (ක්‍රි. ව. 1232 - 1236), II වන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1236 - 1270), IV වන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1302 - 1326) හා VI වන

පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1412 - 1467) යුගයන්හි ලංකාවේ සාහිත්‍ය පුනරුදයක් ඇතිවූ අතර බුදුසසුන සහ අධ්‍යාපනය දියුණු කිරීමට ඔවුන් වෙහෙසී ඇත.

තවද කෝට්ටේ යුගයේ දී VI වන පැරකුම් රජ ලංකාවේ පිරිවෙන් සඳහා අනුග්‍රහය දක්වමින් ඒවායේ විෂය මාලාවට සංස්කෘත, පාලි, දෙමළ හා අර්ථශාස්ත්‍රය ඇතුළත් කර ඇත. එම පිරිවෙන්වල තිබූ පොත්ගුල් පිළිබඳ වංශ කථා මෙන්ම වෙනත් සාහිත්‍ය මූලාශ්‍රවල විස්තර සපයා ඇත.

13 වන සියවසෙහි ආර්ය චක්‍රවර්ති රාජ පරම්පරාවෙහි ඉතා වැදගත් රජු වූ වරෝදය ශේකරාස ශේකරන් දවස ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පුස්තකාලයක වෛද්‍ය විද්‍යාව, නක්ෂත්‍රය, සංස්කෘත, පුරාණ පරිවර්තනය සහ වෙනත් කෘති ද ඔහුගේ අනුග්‍රහය යටතේ ඇතිවූ අතර එම කෘති ‘සරස්වතී මහාලය’ යන පුස්තකාලයෙහි ආරක්ෂා කෙරුණු බවට ද සාක්ෂි ඇත.

VI වන පැරකුම්බා රජ දවස සිට VI බුවනෙකබා රජ දවස (ක්‍රි. ව. 1470 - 1478) දක්වා තිබූ සාහිත්‍ය දියුණුව විවිධ ආක්‍රමණ හා දේශපාලනික වියවුල් හේතුවෙන් පිරිහෙන්නට විය. බටහිර ජාතීන්ගේ ආක්‍රමණ නිසා මෙම පරිහානිය තව තවත් වේගවත් වූ අතර I රාජසිංහ රජ හින්දු භක්තිකයෙක් වීමෙන් පසු තත්ත්වය වඩාත් දරුණු වී ඇත.

බ්‍රිතාන්‍යයන්ගේ ආක්‍රමණයෙන් අනතුරුව රජයේ නිළධාරීන්ගෙන් හා හමුදා සේවකයන්ගෙන් සාමාජික මුදල් අයකර කියවන්නන් සීමිත ප්‍රමාණයක් සඳහා විවිධ පුස්තකාල පවත්වා ගෙන යන ලදුව පසුකාලීනව එම පුස්තකාල පොදු මහජනයාට ද විවෘතව තැබීමට කටයුතු කර ඇත.

19 වන සියවසෙහි 2 වන භාගයේ සිට ශ්‍රී ලංකාවේ විවිධ නගරවල පුස්තකාල ආරම්භ විය. කොළඹ නගරයේ ඇති වැදගත්ම හා පැරණිම පුස්තකාලය, රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ පුස්තකාලයයි. ක්‍රි. ව. 1875 දී කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි අංශයක පිහිටුවන ලද එය එම පුස්තකාලයෙහි ම කොටසක් බවට පත්විය. මෙම පුස්තකාලය උගතුන්ට හා පර්යේෂකයින්ට ප්‍රයෝජනය සඳහා වූ කොටසක් බවට ද පත්විය. (Ferginson’s Sri Lanka Directory, 1995-96, p.1029-1033)

පෙරදිග සාහිත්‍ය හා බුද්ධ ධර්මය පිළිබඳ වැදගත් මධ්‍යස්ථාන දෙකක් වූ කොළඹ විද්‍යෝදය පිරිවෙන හා කැලණිය විද්‍යාලංකාර පිරිවෙන ක්‍රි. ව. 1874 හා 1875 වර්ෂවල පිහිටුවා ඇත. මෙම ආයතන දෙකෙහි පුස්තකාලයන්ට අමතරව නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත පිහිටි ප්‍රාචීන පුස්තකාලයේ ද වටිනා පුස්කොළ පොත් සම්භාරයක් තිබී ඇත. ශ්‍රී ලංකාවේ විශාලම පුස්තකාලය වූ කොළඹ මහජන පුස්තකාලය ක්‍රි. ව. 1925 දී පිහිටුවන ලද්දේ 1813 පිහිටුවන ලද එක්සත් ජනපද ප්‍රවෘත්ති සේවාවත් (Ceylon United Services Library) ක්‍රි. ව. 1829 දී පිහිටුවන ලද පිටකොටුවේ පුස්තකාලයත් (Pettah Library) එක් කිරීමෙනි. (Ferginson's Sri Lanka Directory, 1995-96, p.1029-1033)

මහජන පුස්තකාල තුළ සලසන සේවාවන්ට අතිරේක වශයෙන් බ්‍රිතාන්‍ය මණ්ඩලය හා එක්සත් ජනපද ප්‍රවෘත්ති සේවාව ද, පුස්තකාල සේවාවන් සලසනු ලැබේ. (කොරයා, 1995, 169 පි.) ඉන්පසුව රජයේ දෙපාර්තමේන්තු හා සංස්ථාවන් හි සහ උසස් අධ්‍යාපන ආයතන වලට සම්බන්ධ මනාව සංවිධානය කරන ලද විශ්වවිද්‍යාල පුස්තකාල ක්‍රි. ව. 1942 සිට ආරම්භ විය.

## ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල විකාශය

19 වන ශත වර්ෂයෙහි අවසාන භාගය වන විට ශ්‍රී ලංකාවේ පාසල් තිබුණ ද විශ්වවිද්‍යාලයක් නොවීය. මේ වනවිට ලංකාවේ ප්‍රකට ද්විතීයික පාසැල, කොළඹ ඇකඩමියයි. (ක්වීන්ස් කොලේජ් පසුව රෝයල් කොලේජ් විය) එය පශ්චාත් ද්විතීයික පාඨමාලා පැවැත් වූ එකම ආයතනය ද විය. (Commonwealth Universities Year Book, 1999, p.1395) 20 වන ශත වර්ෂයේ මුල් දශකය වන විට අධිරාජ්‍යවාදී පාලනයක් යටතේ පැවැති යටත් විජිතයකට විශ්වවිද්‍යාලයක් ලබාගැනීම අසීරු කරුණක් විය. එහෙත් දේශීය නීති සම්පාදකයින් විසින් ක්‍රි. ව. 1921 දී විශ්වවිද්‍යාලයක් ගොඩනැංවීම සඳහා ආණ්ඩුවට යෝජනා කිරීමෙන් අනතුරුව එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ආරම්භ කරමින් මුලින් ම ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ ලංකා ශාඛාව එනම්, ලංකා විශ්වවිද්‍යාල කොලිජිය කොළඹ පිහිටවනු ලැබුණු බව පොදු රාජ්‍ය මණ්ඩලයීය විශ්වවිද්‍යාල වාර්ෂික ග්‍රන්ථයෙහි සඳහන් වේ. තව දුරටත් එහි සඳහන්

වන්නේ එවක බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාල කොමිසමේ සභාපති වූ වෝල්ටර් බුචනන් රිඩෙල් (Walter Buchanan Riddell) විසින් ලංකාවේ ගොඩනැංවිය යුතු විශ්වවිද්‍යාලයක පූර්ණ විස්තර ඇතුළත් දළ සටහනක් සකස් කිරීම සඳහා 1926 ජනවාරි මස කොමිසමක් ද පත්කරන ලද බවයි.

1959 දී ලංකා විද්‍යාලංකාර හා ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාල ආරම්භ කරන තුරු තිබූ එක ම විශ්වවිද්‍යාල පුස්තකාලය වූයේ පේරාදෙණිය ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලය යි. එම පුස්තකාලය එවකට තිබූ එකම පුස්තකාලය වූ හෙයින් විවිධ වරප්‍රසාද හිමිවී ඇත. එනම්, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ (University College) එකතුව උරුම කරගත් මෙම පුස්තකාලයට රජයේ නොමසුරු ප්‍රතිපාදන සැපයීම යටතේ වර්ධනය වීමට හැකිවිය. තවද මෙම පුස්තකාලයට ලැබී ඇති පෞද්ගලික එකතු නිසා "ශ්‍රී ලංකා එකතුව" වැඩි දියුණුවී අද දක්වාම ලංකාව පිළිබඳ අධ්‍යයන සම්බන්ධයෙන් හොඳම එකතුව ලෙස පවතී. (Jayasooriya, 1992, p.16) එමෙන්ම 1952 විශ්වවිද්‍යාල පුස්තකාලය නීතිමය තැන්පතු පුස්තකාලය ලෙස හඳුනාගත් අතර එවකට ප්‍රකාශිත සියලුම ප්‍රකාශනවල හිමිකරු විය. මෙම විශ්වවිද්‍යාල පුස්තකාල වර්ධනය සඳහා මුල් අවධියේ දී ආර්. එස්. එන්රයිට්ස් (R. S. Enrights) සහ එස්. සී. බ්ලොක් (S. C. Block) හා කාර්යශූර පුස්තකාලයාධිපතිවරුන්ගේ සේවය ඉමහත් රුකුලක් විය. එවකට ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයක් නොතිබුණ ද මෙම පුස්තකාලය නවදිල්ලියේ පිහිටි අග්නිදිග ආසියානු සහයෝගිතා කාර්යාලයටත් ග්‍රන්ථ විද්‍යාත්මක සේවාවන් සැපයීමට තරම් පොහොසත් වී ඇත. (Jayasooriya, 1992, p.16)

1960 දශකය පුස්තකාල විකාශනයේ නව අවධියක් විය. මෙම දශකය අවසාන වීමට ප්‍රථම නව විශ්වවිද්‍යාල හතරක් ස්ථාපනය කළ අතර ඒවායේ පුස්තකාල ඇරඹීමට මූලික එකතුද තිබිණි. 1875 දී ආරම්භ කරන ලද විද්‍යාලංකාර පිරිවෙනත්, 1873 දී ආරම්භ කරන ලද විද්‍යෝදය පිරිවෙනත් බෞද්ධ අධ්‍යාපනය සඳහා පොහොසත් වූ ග්‍රන්ථ වලින් සමන්විතව තිබිණි. මෙම බෞද්ධ අධ්‍යයන ආයතන දෙක විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන විට එම එකතු එම නව පුස්තකාලවල න්‍යෂ්ටිය බවට පත්වී ඇත. එමෙන්ම 1963 සිට කොළඹ විශ්වවිද්‍යාලයීය

පුස්තකාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ශාඛාවක් ලෙස පැවති අතර එය 1967 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වෙන්වී ස්වාධීන පුස්තකාලයක් බවට පත්වී ඇත. (Jayasooriya, 1992, p.16)

1823 දී ආශ්‍රම පුස්තකාලයක් ලෙස ආරම්භ වී 1974 දී යාපනය මණ්ඩප පුස්තකාලය ලෙස පැවති පුස්තකාලය උසස් ග්‍රන්ථ එකතුවකින් යුත් විශ්වවිද්‍යාල පුස්තකාලය බවට ද පත්විය.

මෙසේ ආරම්භ වූ විශ්වවිද්‍යාල 16 ක් දක්වා අද වන විට වැඩි වී ඇති අතර ඒ සෑම විශ්වවිද්‍යාලයකම පුස්තකාලයක් හෝ කීපයක් (පීඨ පුස්තකාල හා පශ්චාත් උපාධි ආයතන පුස්තකාල වශයෙන්)/ පද්ධතියක් ලෙස පිහිටුවා ඇත.

## පුස්තකාල එකතුව

වාර්තා කර ඇති දැනුම ලබාගැනීමට පුස්තකාලය නිදහස් මාවතක් මෙන්ම තොරතුරු ලබාගැනීමට ද මඟක් වේ. අධ්‍යාපනයේ ප්‍රතිඵල නෙලා ගැනීමට වෙහෙසෙන්නන්ට පුස්තකාලය ගුරුවරයෙකු සේය. එබැවින් දැනුම් සම්පත් මධ්‍යස්ථානයක් ලෙස හෝ එවැනි ක්‍රියාකාරී ඒකකයක් ලෙස පුස්තකාලය හැඳින්වීමට පුළුවන.

එහි තැන්පත් වී ඇති මූලාශ්‍ර මෙසේ වර්ග කළ හැකිය.

(අ) මාධ්‍ය A - සම්ප්‍රදායික මූලාශ්‍ර : පොත්, චිත්‍රපට, පටිගත තැටි, ප්‍රස්තාර, ආකෘති, මුද්‍රණ ආදිය (Traditional Materials, Books, Films, Records, Charts, Models, Paints etc)

(ආ) මාධ්‍ය B - බැහැර කරලිය හැකි ද්‍රව්‍ය : පිටකවර, විස්තර පත්‍රිකා : (Disposible Materials, Paperbacks, Brochears, etc.)

(ඇ) මාධ්‍ය C - තොරතුරු හුවමාරු හෝ ලබාගැනීම සඳහා වූ විද්‍යුත් මාධ්‍ය : (Electrically Made Transmitted Fyda Delivered Units of Information)

## පුස්තකාල සේවා

පුස්තකාල සේවාවන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම් කාර්ය මණ්ඩලය, පොත් සහ පාඨකයන් යන ප්‍රකට ත්‍රිත්වයේ අවියෝජනීය සම්බන්ධතාවයක් තිබිය යුතුය.

පාඨකයන් සංඛ්‍යාව වැඩිවන විට ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා තෘප්තිමත් කිරිම සඳහා දැනුම අඩංගු මාධ්‍යයන් වැඩි වැඩියෙන් පුස්තකාලය විසින් රැස්කොට සංවිධානය කළ යුතුය. දිනෙන් දින අධ්‍යයනයන් දියුණුවීමත්, විෂය ව්‍යාප්තියත් මීට හේතුවී ඇත. මේ නිසා ම පුස්තකාල කාර්ය මණ්ඩලය ද වැඩිවන පාඨක පිරිසට හා පොත්පත්වලට සාපේක්ෂව වැඩි කිරීමට සිදුවේ. (Singh, 1988, p.168)

විප්ලවීය ලෙස තොරතුරු බිහිවන විට තොරතුරු අවශ්‍යතා ද සංකීර්ණ වේ. එම තොරතුරු රැස්කිරීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සඳහා පුස්තකාලයාධිපතිවරු විසින් සැලසුම් සකස් කිරීම අවශ්‍ය වේ. එවැනි සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය කාරණා කීපයකි. එම කාරණා මෙසේ පැහැදිලි කළ හැකිය. (Singh, 1988, p.168)

**අ)** කරගෙන යා යුතු හෝ කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් හඳුනාගත යුතුය. ඒවා මණ්ඩල ක්‍රියාකාරිත්වයෙන් ඒකරාශි කළ යුතුය.

**ආ)** සජාතීය අංශයක් හෝ ඒකකයක් ඇතුළත ඒවායෙහි ක්‍රියාකාරීත්වය ධනාත්මකව සත්‍ය කළ යුතුය.

**ඇ)** එකිනෙක ඒකකයේ කාර්යය හා වගකීම නිශ්චිතව හඳුනා ගත යුතුය.

**ඈ)** එකිනෙක අංශ අතර තිබිය යුතු අධිකාරිත්වය හා සම්බන්ධතාවේ සීමා නිර්වචනය කළ යුතුය.

පාලන හා කළමනාකරණ සේවා යනු පුස්තකාලයේ "තිරයෙන් වැසුණු සේවාව යි" මෙහි ප්‍රධාන කාර්ය පුස්තකාලයේ විවිධ සේවා හා අංශ සැලසුම් කිරීමයි. පුස්තකාලයක සැලැස්මක් සඳහා විවිධ කොටස් අර්ථාන්විතව සංවිධානය කළ යුතු අතර පුද්ගලයන්ගේ සේවා පරිපාලන හා කළමනාකරණ ප්‍රතිපත්ති ද සැසදෙන සුළු විය යුතුය.

පුස්තකාලයක් තුළ ක්‍රියාත්මක වන සේවා ප්‍රධාන වශයෙන් කොටස් 2 ක් යටතේ දැක්විය හැක.

1. තාක්ෂණික සේවා
2. පාඨක සේවා

## තාක්ෂණික සේවා

පුස්තකාලයේ භාවිතය සඳහා පුස්තකාල සම්පත් අත්පත් කරගැනීම, සංවිධානය හා පිරිසැකසුම්කරණය සම්බන්ධ සියළු ක්‍රියාවලීන් තාක්ෂණික සේවාවන් යයි නිර්වචනය කළ හැකිය. (Harrod, 1977, p.812)

පුස්තකාලයක් තුළ නිරන්තරයෙන් සිදුවන සේවාවන් ලෙස පහත දැක්වෙන සේවාවන් පුස්තකාල හා විඥාපන විද්‍යා විශ්වකෝෂයෙහි පැහැදිලි කර ඇත. (Thompson, 1970)

1. ප්‍රතිග්‍රහණය
2. පරිග්‍රහණ අණුක්‍රමය
3. වාර සඟරා වාර්තා
4. සූචිකරණය
5. වර්ගීකරණය
6. පොත් බැඳීම හා සැකසීම
7. තොග ගබඩාව යනු එම ක්‍රියාවලීන්ය.

පහත කාර්යයන් ද මෙම ක්‍රියාවලියට ම අයත්වේ.

- ග්‍රන්ථ නාමාවලි, සඟරා ඒකාබද්ධ ලැයිස්තු නාමාවලි ආදිය පොත් හා වාර සඟරා තෝරාගැනීම සඳහා ලබාගැනීම.
- පාඨක ගවේෂණයන් සිදුකර පාඨක ඉල්ලීම් අනුව පොත්පත් ලැයිස්තු සැකසීම.

- පිළිගත් ප්‍රතිපත්තියක් මත පිළිගත් වෙළඳුන්, මිල හා වට්ටම් ගැන සාකච්ඡා කර පොත් ඇණවුම් කිරීම.
- වාර සඟරා පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කරනුයේ අදාළ සඟරාවෙන් පුස්තකාලයට ලබාගත් මුල්ම කලාපය පමණි.
- ලේඛන රාක්කගත කිරීම.
- හානි වූ පොත් (කැඩුණු හෝ පිටු ගැලවී ගිය) හා පැරණි එකී සඟරා කලාප බැඳීම.

මෙහිදී පොත් තෝරාගැනීමේ මූලධර්ම කෙරෙහි පුස්තකාලයාධිපති අවධානය යොමුකළ යුතුය. අවශ්‍ය පිටපත් ඉක්මනින් ලබාගත යුතු අතර අනවශ්‍ය පිටපත් ඉවත්කර පාඨක අවශ්‍යතා සලකා බලමින් සූචිකරණ කටයුතු සංවිධානය කළ යුතුය. පරිග්‍රහණය කරන ලද පොත් ඉතා ඉක්මනින් රාක්කවල තැන්පත් කළ යුතුය. (Thompson, 1970)

තවද ඉහත දැක්වෙන කාරණා අතුරින් විශේෂ කාරණා කීපයක් පිළිබඳ අවධානය යොමු කරමු.

**පොත් තේරීමේදී සලකා බැලිය යුතු කරුණු**

- පුස්තකාල වර්ගය
- පුස්තකාල අරමුණු
- පාඨකයින්
- අධ්‍යාපන මට්ටම
- නාගරික / ග්‍රාමීය
- සමාජ ආර්ථික පසුබිම
- ආගමික විශ්වාස / ඇදහිලි
- මුදල් ප්‍රතිපාදන
- ගොඩනැගිල්ල
- සේවකයින්
- වෙනත් පහසුකම්

- පවත්නා සේවාවන්

පුස්තකාල කමිටුවල දායකත්වය ලබා ගැනීම ද පොත් තේරීමේ දී ඉතා වැදගත් වේ. (පුස්තකාල වර්ගය අනුව)

## ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය

මෙය පියවර කීපයක් ඔස්සේ සිදු කෙරෙනු ඇත.

## ඇණවුම් පත්‍රිකා පිළියෙල කිරීම

මෙම ඇණවුම් පත්‍රිකා (Book Selection Cards), යෝජනා පත්‍රිකා (Suggestion cards), ප්‍රයාන පත්‍රිකා (Travelling Cards) යනුවෙන්ද හඳුන්වනු ලැබේ.

ඇණවුම් පත්‍රිකාවේ ආකෘතියක් පහත දැක්වේ. (මෙය තම පුස්තකාල වර්ගයේ අවශ්‍යතාවය අනුව සකස් කර ගත හැකිය.)

Author (Surname first) Indent No.
Office Notes Title & Edition
Place of Publication Publisher Dated of Publication
Source ISBN
Price No. of copies required
Recommended by Department
For office use only
Catalogue Order Index
Bibliographies checked Class Number
Date of Indent

## ඇණවුම් පත්‍රිකා ගොනු කිරීම

මෙය ක්‍රම කීපයකට සිදු කළ හැකිය.

- විෂයය අනුව

- කර්තෘ අනුව
- ප්‍රකාශක අනුව

## ග්‍රන්ථ විද්‍යාත්මක සෝදිසිය

මෙය පුස්තකාල මූලාශ්‍ර ; ප්‍රධාන සූචිය, යවන ලද ඇණවුම් හා ලැබී ඇති ඇණවුම් භාවිතයෙන් සිදු කළ හැකි අතර අතිරේක පිටපත්/ ද්විත්වකරණයන් සිදුවීම වැළැක්වීම සඳහා වැදගත් වේ.

## ඇණවුම් ලැයිස්තු පිළියෙල කිරීම.

ආකාර කීපයයකට ; ප්‍රකාශක අනුව, ශීර්ෂ අංකය අනුව, කර්තෘ නාම අකාරාදී පිළිවෙල අනුව පිළියෙල කළ හැකිය.

ඇතැම් ලැයිස්තු පිළියෙල කිරීමේ දී තවදුරටත් ග්‍රන්ථ නාමාවලි, ග්‍රන්ථ විචාර ආදිය දේශීය වශයෙනුත්, අන්තර්ජාලය හා ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පදනම් ජාත්‍යන්තර වශයෙනුත් භාවිතා කළ හැකිය.

## පුස්තකාල ද්‍රව්‍ය ඇණවුම් කිරීම.

පුස්තකාල ද්‍රව්‍ය ඇණවුම් කිරීමේ දී ඇණවුම් ලැයිස්තු සමඟ ආවරණ ලිපියක් ද (Covering Letter) යැවිය යුතුය. එය බලධාරී ලිපිය යනුවෙන් ද හැඳින්වේ. මෙම ආවරණ ලිපියෙහි,

- පුස්තකාලයේ නම හා ලිපිනය
- වෙළඳ ආයතනයේ හෝ ප්‍රකාශකගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුය.

ආවරණ ලිපියෙහි ආකෘතියක් පහත දැක්වෙන අතර මෙය දේශීය හා විදේශීය ආයතන සමග සන්නිවේදයේ යෙදීමට භාවිතා කළ හැකිය. (මෙම ආකෘතියට අනුව අදාළ ලිපිය තම පුස්තකාලයට ගැලපෙන පරිදි සකස් කර ගැනිම සුදුසුය).

ආවරණ ලිපිය සකස් කිරීමේ දී ආයතනයේ ලිපි ශීර්ෂය/ Letter Head භාවිතා කිරීම සුදුසුය.

## ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය

ග්‍රන්ථ ප්‍රතිග්‍රහණය යනු මිලදී ගැනීමෙන්, පරිත්‍යාග මගින් හෝ හුවමාරු මගින් පුස්තකාලයට පොත් පත් අත්පත් කර ගැනීමයි. මෙහිදී පියවර කීපයක් අනුගමනය කරනු ලැබේ.

- පෙර මිල ගණන් කැඳවීම. එම මිල ගණන් කැඳවීමෙන් පසුව පොත් මිලදී ගැනීම සම්බන්ධ තාක්ෂණික විශ්ලේෂණ කමිටුවේ - TEC (Technical Evaluation Committee) නිර්දේශය අනුව ප්‍රසම්පාදන අනුමැතියෙන් පොත්/ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඇණවුම් කිරීම සිදුවේ. (ඊට අමතරව ඇණවුම් ලැයිස්තුවේ ඇති පොත්පත් පොත් සාප්පුවට ගොස් තෝරා ගැනීම ද සිදු කෙරේ. මෙහිදී පුස්තකාල ප්‍රතිපත්ති හා ක්‍රමවේද පිළිබඳ සැලකිලිමත් විය යුතුය.)
- පොත් හා දැනුම අඩංගු ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඇණවුම් කර මාස 03ක් වැනි කාලයක් පොත් සැපයිම සඳහා ප්‍රකාශකයන්ට හෝ පොත් වෙළඳුන්ට ලබා දේ.
- කාලය ඉකුත් වීමෙන් පසු සිහි කැඳවීම් කිරීමෙන් අනතුරුව පොත් සැපයිය නොහැකි නම් එම ඇණවුම් අවලංගු කරනු ලැබේ.

**සැ.යු :** ඇණවුම් අවලංගු කිරීමේ දී අදාළ ලියකියවිලි වල ; ඇණවුම් අංකය (Order No.), පෙර මිල ගණන් කැඳවීම් අංකය (Proforma Invoice No.) හා දිනය (Date) සඳහන් කළ යුතුය.

## පුස්තකාලයට පොත් ලබා ගැනීම

- පොත් පාර්සලය පරීක්ෂා කිරීම හා සටහන් තබා ගැනීම : ලැබුණු දිනය, පාර්සල් ප්‍රමාණය හා පොත් සංඛ්‍යාව මෙහිදී සටහන් කෙරේ.
- බිල්පත සමග පරීක්ෂා කිරීම : ඇණවුම් කරන ලද පොත් නිසි ලෙස ලැබී ඇති ද යන වග පරීක්ෂාව.
- පොත් පෙරළා පරීක්ෂාව : වැරදි සංස්කරණ, අසම්පූර්ණ පිටපත්, මුද්‍රණ දෝෂ ආදිය ඇත්නම් ආපසු අදාළ ආයතනයට දැනුම් දීම. දෝෂ සහිත නම්, නිවැරදි/ සම්පූර්ණ පොත ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

## ගෙවීම් සඳහා පියවර ගැනීම

- නිවැරදි පොත් සඳහා ගෙවීම් කටයුතු පිළියෙල කිරීම.
- බිල්පතෙහි රතු පෑනෙන් පොතට හිමි පරිග්‍රහණ (ප්‍රවේශ) අංකය සටහන් කිරීම.
- ගෙවීම් නිර්දේශ කරමින් පුස්තකාලයට එම පොත් ලැබී ඇති බව දන්වා පරිග්‍රහණ අංක සහිත බිල්පත් මූල්‍ය අංශයට යවනු ලැබේ. මෙහිදී අදාල මවු ආයතනය විසින් ගෙවීම් සඳහා භාවිතා කරනු ලබන ලේඛන/ ආකෘති භාවිතා කළ යුතුය.

## ගෙවීම් සඳහා යවනු ලබන බිල්පත් හා ගෙවීම් අනුමත කළ ලියකියවිලි පිටපත් පුස්තකාලයේ තබා ගැනීම

ඒ සඳහා වෙනම ගොනුවක් පවත්වාගෙන යා යුතුය.

උදා : පුස්තකාල පොත්/ ශ්‍රව්‍ය දෘෂ්‍ය සඳහා ගෙවීම

## විශේෂයෙන් පුස්තකාල පොත්/ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඇණවුම් කිරීම සම්බන්ධ හුවමාරු කරන ලද සියලු ලියකියවිලි සිහිකැඳවීම් ඇතුළුව අදාළ ප්‍රකාශකගේ/ පොත් සපයන්නන්ගේ/ පොත් ආයතනයේ නාමය යටතේ ගොනුකර තැබීම

උදා : Blackwell/ Lake House ආදී වශයෙන්

## පරිග්‍රහණ ලේඛනය

පුස්තකාලයට ලැබුනු පොත් පිළිබඳ විස්තර ඇතුළත් නිත්‍ය ලේඛනය පරිග්‍රහණ ලේඛනයයි. එමෙන්ම එය පුස්තකාලයේ ජීවන අංකය පිළිබිඹු කරන දර්ශකයයි.

## පරිග්‍රහණ ලේඛනයේ අන්තර්ගත විය යුතු කරුණු

- දිනය
- පරිග්‍රහණ අංකය
- කර්තෘ/ සංස්කාරක/ අනුවාදක
- ග්‍රන්ථ නාමය
- කාණ්ඩය/ කොටස/ වෙළුම
- සංස්කරණය
- ප්‍රකාශිත ස්ථානය
- ප්‍රකාශක
- ප්‍රකාශිත දිනය (වර්ෂය)
- පිටු විස්තර
- ශීර්ෂ අංකය
- ලැබුණු පිළිවෙල (මිලදී ගැනිම/ පරිත්‍යාග/ හුවමාරු)
- බිල් අංකය
- මිල (දේශීය/ විදේශීය)
- බැඳුම් ගාස්තු
- වෙනත් කරුණු

පරිග්‍රහණ ලේඛනයේ පොත්පත් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේදී ;

- එකම තීන්ත වර්ගයක් භාවිතා කිරීම
- එක් වර්ණයක් භාවිතා කිරීම
- පැහැදිලි අකුරින් සටහන් තැබීම අත්‍යවශ්‍ය වන අතර
- පරිග්‍රහණ අංක සටහන් කිරීම සඳහා අංකන යන්ත්‍රයක් (Numbering Machine) භාවිතා කිරීම සුදුසු වන අතර පරිග්‍රහණ අංකය සෑම විටම අංක 04කින්වත් ආරම්භ කිරීම සුදුසුය. උදා : 0001

## පරිග්‍රහණ අංක යොදන පිළිවෙල

- බිල්පත්වල නම් සඳහන් පිළිවෙල
- කාණ්ඩ වල අනුපිළිවෙල අනුගමනය කළ යුතුය.

- පරිග්‍රහණ අංකය පොත්වල සටහන් කිරීමේ දී එය සටහන් කළ යුත්තේ,
- ග්‍රන්ථ නාම පිටුව
- රහස් පිටුව/ පිටු
- අවසාන පිටුව
- දින ලේබලය
- පොත් සාක්කුව
- බැහැර ගෙන යන්නන් සඳහා වු දැන්වීම යන ස්ථානයන් හි ය.

## වර්ගීකරණය හා සුචිකරණය

පුස්තකාලයේ ඇති පොත් පත් හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ක්‍රමාණුකූලව පිළිවෙලකට සංවිධානය සඳහා වර්ගීකරණය සහ සුචිකරණය අවශ්‍ය වේ. මෙය අංශ දෙකක් යටතේ සිදුකෙරේ. (Srivastava) Varma, 1980, P.197)

- තාක්ෂණික පිරිසැකසුම්කරණ අංශය
- වාර සඟරා අංශය

තාක්ෂණික පිරිසැකසුම්කරණ අංශයෙහි වර්ගීකරණය හා සුචිකරණය කරන ලද ග්‍රන්ථ, ප්‍රධාන සුචිය නඩත්තුව, රාක්ක ලැයිස්තු පවත්වා ගෙන යාම සිදුකෙරේ.

වර්ගීකරණය යනුවෙන් අදහස් කරනුයේ සරලව කියතොත් "ක්‍රමාණුකූලව වර්ග පංතියක් හෝ වර්ග පංති වෙන් කිරීම හෝ මගින් සංවිධානය කිරීමයි." (Clason, 1976, p.95)

හැරඩ්ගේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා වන පාරිභාෂික ශබ්ද මාලාවට අනුව, වර්ගීකරණය යනු, "පොත් සහ අනෙක් තොරතුරු සම්පත් විෂය අනුව තර්කානුකූල ක්‍රමයකට පෙළ ගැස්වීමයි." (Harrod, 1977, p.177)

මෙසේ ඉදිරිපත් කර ඇති විවිධ නිර්වචන ඔස්සේ පැහැදිලි වන්නේ සමාන විෂයයන් එක් කිරීමෙන් හා අසමාන විෂයයන් වෙන් කිරීමෙන් විෂය ඥාතිත්වය අනුව පෙළ ගැන්වීම සඳහා තාර්කික පදනමක් අනුගමනය

කිරීම වර්ගීකරණය ලෙසයි. ලෝකයේ විවිධ වර්ගීකරණ ක්‍රම විවිධ පුස්තකාල විද්‍යාඥයින් විසින් හඳුන්වා දී ඇතත් බහුල වශයෙන් මෙරට පුස්තකාල විසින් භාවිත කරනු ලබන්නේ ඩිවි දශම වර්ගීකරණ ක්‍රමයයි. (DDC - Dewey Desimal Classification)

පුස්තකාල සූචිය පිළිබඳව ද විවිධ නිර්වචන විවිධ පුස්තකාලවේදීන් විසින් ඉදිරිපත් කර ඇත. හැරඩ්ගේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා වන පාරිභාෂික ශබ්ද මාලාවට අනුව, පුස්තකාල සූචිය යනු, "පුස්තකාලයේ එකතුව එනම්, පොත්, සිතියම් සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් ලැයිස්තුවකි." (Harrod, 1977, p.168)

මෙම සූචිය නිසා පාඨකයාට පහසුවෙන් තම තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවී තිබේ. තමන්ට අවශ්‍ය පොතක් හෝ පොතක් නොවන වෙනත් තොරතුරු මූලාශ්‍රයක් පුස්තකාලයේ තිබේ ද, තිබේනම් කුමන අංශයේ ද, කුමන විෂයයක් යටතේ ද යන්න පිළිබඳ සොයා ගැනීමට හැකිවේ. මෙම පහසුව ලබාදීම සඳහා සූචිය ප්‍රධාන කොටස් තුනකින් සම්පාදනය කොට තිබේ. (සම්ප්‍රදායික අත්හුරු ක්‍රමයට අනුව)

1. කර්තෘ ග්‍රන්ථ නාම අකාරාදී සූචිය
2. වර්ගීකෘත සූචිය
3. විෂයය අනුක්‍රමණිකාව එම කොටස් තුනයි.

සූචිය භාවිතා කර පොතක් සොයාගැනීම සඳහා පාඨකයාට ප්‍රවේශ විය හැකි මාර්ග තුනකි.

1. කර්තෘ නාමය මගින්
2. ග්‍රන්ථ නාමය මගින්
3. විෂයය මගින් (Srivastava) Verma, 1980, p.197)

වර්තමානයේ දී පුස්තකාල සූචියෙහි ස්වරූප දෙකක් දැකිය හැකිය. ග්‍රන්ථ විඥාපන සේවාවන් යටතේ එන එක් සේවාවක් වන පුස්තකාල සූචියෙහි එම ස්වරූප ලෙස,

- පත්‍රිකා සූචිය සහ

- පරිගණක සුචිය දැක්වීමට පුළුවන.

## සඟරා ඇණවුම් කිරීම

ඊට අමතරව පුස්තකාලයේ සඟරා අංශයේ ඇති එක්තරා වර්ගයක සුචියකි ; දෘෂ්‍ය අනුක්‍රමණිකාව (Visible Index) අකාරාදී අනුක්‍රමයකට ගොනුකර ඇති මෙම දෘෂ්‍ය අනුක්‍රමණිකාව මගින් පුස්තකාලයේ ඇති සඟරා මොනවාද, මේ වන විට ලැබී ඇති සඟරා කලාප මොනවාද, විෂයානුබද්ධ සඟරා මොනවාද ආදී වශයෙන් පිළිතුරු ලබාගත හැකිය. (Harrod, 1977, p.866)

වාර සඟරාවල ස්වභාවය අනුව අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ විශේෂත්වයක් දරයි. ප්‍රකාශකයින්ගෙන්, නිත්‍ය නියෝජිතයන්ගෙන් හා හුවමාරු මඟින් එම කටයුත්ත කළ හැකිය. පුස්තකාලයේ අවශ්‍යතාවය අනුව සඟරා ඇණවුම් කිරීමේ දී අත්‍යවශ්‍ය කාරණා කීපයකි. එනම්,

- නිවැරදි නාමය
- ප්‍රකාශක හා ලිපිනය
- ශීර්ෂ අංකය
- දායක මුදල සඳහන් කිරීම යි.

ඉහත තොරතුරුවල නිරවද්‍යතාවය ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර මගින් පිරික්සිය හැකිය.

උදා : a) Ulrichs Periodacal Directory (ULRICH)

b) British Union Catalogue of Periodicals (BUCOP)

c) වර්තමානයේ අන්තර්ජාලය හා ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත පදනම්

ඊට අමතරව, පුස්තකාල මූලාශ්‍ර හෙවත් ;

d) දෘෂ්‍ය සුචිය/ දෘෂ්‍ය අනුක්‍රමණිකාව (Visible Index) හා සඟරා ඇණවුම් වාර්තා (දැනට දායකත්වය ලබා ඇති සඟරා පිළිබඳ) පිරික්සීම මගින් කළ හැකිය.

දෘෂ්‍ය අනුක්‍රමණිකාවක (Visible Index) ආකෘතියක් පහතින් දැක්වේ.

මෙම සඟරා පුස්තකාලයට ඇනවුම් කිරීමේදී/ මිලදී ගැනීමේදී ;

- අදාල වර්ෂය (වර්ෂයට අදාල සියලුම සඟරා කලාප) සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
- දායක මුදල් සමග තැපැල් ගාස්තු ද ගෙවීම අවශ්‍ය වේ.
- වාර්ෂික දායක මුදල් ගෙවා පුස්තකාල දායකත්වය යාවත්කාලීන කළ යුතුය.
- වාර සඟරා සමග පුස්තකාලයට ආවරණ ලිපියක් නොලැබෙන හෙයින් සඟරාව එවනු ලබන කවරය පිළිබඳ සැලකිළිමත් විය යුතුය.

**පුස්තකාලයට සඟරාව ලැබීමෙන් පසු කළ යුතු කාර්යයන් කීපයක් ඇත.**

එනම්,
දිනය ද සහිත පුස්තකාල අයිතිය හඟවන මුද්‍රාව පිට කවර දෙකේ ඇතුල් පැත්තේත්, පටුන පිටුවේත්, සෑම ඡායාරූපයකම පසු පැත්තේත් (කියවීමට බාධා නොවන පරිදි) තැබිය යුතුය.
වාර සඟරා පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කරනු නොලැබුව ද, පුස්තකාලයට ලැබුණු ප්‍රථම/ මංගල කලාපය පමණක් පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

අයිතිය හඟවන මුද්‍රා තැබීමෙන් පසු එම සඟරා පිළිබඳ සඟරා ලේඛනයේ හෝ දෘෂ්‍ය අනුක්‍රමණිකාවේ සටහන් තැබිය යුතුය. දෘෂ්‍ය අනුක්‍රමණිකාව, පත්‍රිකා සඳහා සකස් කරන ලද කැබිනට්ටුවකි. එම පත්‍රිකා සඟරා නාම අකාරාදී පිළිවෙළට ගොනු කරනු ලැබේ.

## සඟරා ලේඛනයක් පිළියෙල කිරීම

සඟරා ලේඛනයක් දෘෂ්‍ය අනුක්‍රමණිකාවක් පවත්වාගෙන යාමට පහසුකම් නොමැති අවස්ථාවක දී පවත්වාගෙන යා හැකිය. මෙම සඟරා ලේඛනයක ඇතුළත් විය යුතු කරුණු කීපයකි.

- පුස්තකාලයට සඟරාව ලැබුණු දිනය
- ප්‍රකාශන හා ප්‍රකාශිත ස්ථානය

- වෙළුම/ කාණ්ඩ අංකය
- කළාප අංකය
- දිනය/ මාසය
- අවුරුද්ද
- කාලය (මාසික/ වාරික)
- ISSN
- මිලදී ගැනීමක්/ පරිත්‍යාගයක්/ හුවමාරුවක්

සඟරා ලේඛනයේ පිටුවක ආකෘතියක් පහත දැක්වේ.

සඟරාවේ නම : ................................ කාලය : ..................
(Title of the Periodical) : ........................ (Frequency) : ..................
ප්‍රකාශක (ලිපිනය) : ………………………………………………
(Publisher - Address) : ………………………………………
මිල : …………………………………………………
(Price - Local/ Freign) : ………………………………………
දිනය : වෙළුම : අංකය :
(Date) : (Vol) : (No/Issue) :
අවුරුද්ද : මාසය : දිනය :
(Year) : (Month) : (Date) :
මිලදී ගැනිමක්/ පරිත්‍යාගයක්/ හුවමාරුවක්
(Subscription/ Gift/ Exchange)
වෙනත් කරුණු
(Remarks)

සඟරා ලේඛනයේ සටහන් තබා ගැනීමෙන් අනතුරුව එම සඟරා, සඟරා අංශය වෙත යැවීම සිදු කෙරේ. සඟරා නාම අකාරාදී පිළිවෙල සඟරා අංශයේ සඟරා පුවරු මත ප්‍රදර්ශනය කිරීමේ පිළිවෙලයි. මෙහිදී සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා වලින් ඇති සඟරා යනුවෙන් වෙන් කිරීමක් සිදු නොවේ.

පුස්තකාලයට ඇණවුම් කර නොලැබුණු සඟරා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මේ සඟරා සඳහා වර්ෂය මුලදී ම දායක මුදල් ගෙවා ඇති හෙයින් නොලැබුණු සඟරා පිළිබඳව ඒ ඒ කාලසීමාවන් ඇතුළත දන්වා යැවීම අවශ්‍ය වේ. එමෙන්ම එවා නොමැති සඟරා කලාප වල මුදල් ආපසු ගැනීමට කටයුතු කළ යුතුය.

එමෙන්ම තවත් ආකාරයක සූචියක් ලෙස දැක්විය හැක්කේ සඟරා ලිපි සඳහා සම්පාදනය කරනු ලබන අනුක්‍රමණිකාවයි. මෙහිදී වෙන වෙනම සඟරා නාමය යටතේ පළ වූ ලිපි සඳහා පාඨක ප්‍රවේශය පහසු කරලීම සඳහා පුස්තකාලය විසින් අනුක්‍රමණිකා සම්පාදනය කරනු ලැබේ. සඟරා ලිපි අනුක්‍රමණිකාව, කර්තෘ නාම අනුක්‍රමණිකාව හා විෂය අනුක්‍රමණිකාව වශයෙන් කොටස් 3 ක් යටතේ සම්පාදනය කළ හැකිය. ඒ සඳහා ප්‍රලේඛන සේවාවන් පිළිබඳ දැනුමක් ඇති අය පුස්තකාලයේ සිටීම ද අවශ්‍ය වේ. (Harrod, 1977, p.866)

පුස්තකාල තාක්ෂණික සේවා ලෙස හඳුන්වනු ලබන්නේ තිරයෙන් පිටුපස සිදු කරනු ලබන මෙම ක්‍රියාවලිය යි. එය සාර්ථක පාඨක සේවාවක් සැපයීමට මෙන්ම පුස්තකාල කළමණාකරණයට ද පහසු කරවයි.

## ආශ්‍රිත මූලාශ්‍ර


Brown, Lesley ed. (1993). The New Shorter Oxford English Dictionary on historical principles: vol.1: A-M, 4th ed. Oxford: Oxford University Press.

Clason, W. E. Comp. (1976). Elsevier's Dictionary of Library Science, Information and documentation: in six languages: English/ American/ French/ Spanich/ Italian/ Dutch and German. London: Elsevier Scientific Publishing Company.

Commonwealth universities year book 1997 - 98: a directory to the universities of the commonwealth and handbook of their Association: Vol 1. (1999). London: Association of Commonwealth Universities.

Ferguson's Sri Lanka Directory 1995 – 96. (1997). 126th ed. The Associated Newspapers of Ceylon. Colombo.

Francis, Wormal and Wright, C. E. ed. (1958). The English Library before 1700: studies in its history, London: University of London.

Galvin, Thomas J. (1978). Reference Services and Libraries. Encyclopaedia of Library and Information Science: Vol. 25, New York: Marcel Dekker. Pp. 210 - 216.

Grogan, Denis. (1979). Practical reference work. London: Clive Bingley.

Harrod, Leonard Montague. (1977). The Librarian's Glossary and reference book: of craft a 4th rev. ed. London: Andre Deutsch.

Jayasooriya, Sumana (1992). University Libraries of Sri Lanka, Library News. Jul. - Sept., 13(3), pp. 12 – 16.

Singh, Sewa. Ed. (1988). Librarianship and Library Science education: a collection of essays in honour of Dr. J. S. Sharma, New Delhi: Ess Ess publications.

Srivastava, Shyam Nath and Verma, Subash Chandra. (1980). University libraries in India: their organization and administration. New Delhi: Sterling Publishers pvt. Ltd.

Thompson, Elizabeth H. (prepared). (1971). ALA Glossary of Library terms: with a selection of terms in related fields, Illinoice: American Library Association.

Thompson, James. (1970). An introduction to university library administration, London: Clive Bingley.

Thompson, Lawrence S. (1981). University Libraries, medieval. Encyclopaedea of library & Information Science: Vol. 32, New York: Marcel Dekker, pp. 151 – 176.

Wheitby, H. A. ed. (1997). British Librarianship a, mnd information science 1971 – 1975, London: The Library Association.

කොරයා, ඊශ්වරී. (1969). පුස්තකාල. ලංකාවේ අධ්‍යාපනය : ක්‍රි.පූ. සවැනි සියවසේ සිට අද දක්වාඃ සියවස ප්‍රකාශනඃ III කාණ්ඩයඃ අධ්‍යාපනය හා සහාය සේවා, කොළඹ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය, (1181 - 1192) පි.

කොරයා, ඊශ්වරී සහ (වෙනත් අය). (1995). පුස්තකාල හා ජනතාවඃ සමරු සංග්‍රහය, කොළඹඃ මහජන පුස්තකාලය.

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2000). පුස්තකාල ඉතිහාසයඃ පුස්තකාල ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයකි. දළුගමඃ කර්තෘ.

# ථෙරවාද බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනයෙහි ලා පාලි වංස කතාවල උපයෝගීතාවය පිළිබඳ විශ්ලේෂණාත්මක විමසුමක්

ආචාර්ය ප්‍රදීපා විජේතුංග

## හැඳින්වීම

බෞද්ධ සංස්කෘතිය යන්නෙන් අප අදහස් කරනුයේ බෞද්ධ චින්තනයේ ආභාෂය නිසා ජන ජීවිතයේ භෞතික හා අධ්‍යාත්මික සංවර්ධනය සිදු වූ ආකාරයත් ඒ මඟින් කලා හා සාහිත්‍යය නිර්මාණ විෂයෙහි ලද දායකත්වයත්ය (කරුණාදාස, n. d.). භාරතයේ ක්‍රි. පූ. හයවන සියවසේ දී පමණ බිහි වූ මුල් බුදු සමය බුද්ධ පරිනිර්වාණයෙන් සියවසකට පමණ පසුව නිකාය දෙකකට[1] වෙන්වන අතර මුල් පිරිස ථෙරවාදි නමින් ප්‍රකට විය. ථෙරවාද බුදු සමය දැනට පැතිර පවතින්නේ ශ්‍රී ලංකාව[2], සහ බුරුමය, තායිලන්තය, ලාඕසය, කම්බෝජය, වියට්නාමය යන අග්නිදිග ආසියානු රටවලය.

වංස යන පදය මුල දී කුලය පිළිබඳ පේලිය හෝ පරම්පරාව යන තේරුම දීම සඳහා යොදා ගත් අතර පසුව එය ජාතියේ ඉතිහාසය යන තේරුම දීම සඳහා යොදාගෙන ඇත (විමලවංස හිමි, 2013). සංස්කෘත ආදි වෙනත් සාහිත්‍යධරයන් විසින් සීමාමානක සහිතව යොදාගත් වංස යන සාහිත්‍යාංගය, ජාතියක හෝ දේශයක සංස්කෘතික-සමාජික-ආර්ථික හා රාජ්‍යතන්ත්‍රික විග්‍රහයන් හඳුන්වා දෙන පාරිභාෂිකයක් කරගන්නා ලද්දේ ලාංකික වංසකථාකරුවන්ය (ධම්මරතන හිමි 2009).

ථෙරවාද බෞද්ධ සංස්කෘතිය යනුවෙන් මෙම රචනා සන්දර්භය තුල අදහස් කරනුයේ මහින්දාගමනයෙන් පසුව ලංකාවේ සමාජීය, ආර්ථික සහ ආගමික සංස්කෘතීන් තුල ඇති වූ වෙනස්කම් ය. මේ වෙනස්කම් අධ්‍යයනයෙහි ලා පාලි වංස කථාවල උපයෝගීතාවය පරීක්ෂා කිරීමේ දී, පළමුව එම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද ක්‍රමවේදය පිළිබඳව කෙටියෙන් දක්වා ඇති අතර සාහිත්‍යය ගවේෂණයක් තුළින් එම විෂයට ආදාළව පෙර සිදුකරන ලද අධ්‍යයනයන් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කර ඇත. අනතුරුව වංස කථා පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කර ථෙරවාද

බෞද්ධ සංස්කෘතියට අදාළ අංග පිළිබඳව එම වංසකථා තුළින් පැහැදිලි වන්නේ කෙසේදැයි නිදසුන් දක්වා ඇත. අනතුරුව ථෙරවාද බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනය කිරීමෙහි ලා වංසකථාවල උපයෝගීතාවය පිළිබඳව ඒවායේ විශ්වසනීයත්වය අනුසාරයෙන් අවධානය යොමුකොට නිගමනයකට එළඹී ඇති අතර අවසානයේ මෙම රචනාව සඳහා ආශ්‍රිත ග්‍රන්ථාවලිය හාවඩ් ශෛලියෙන් ඉදිරිපත් කොට ඇත.

## ක්‍රමවේදය

ආගමික අධ්‍යයනයන් සිදුකිරීමේ මූලික ක්‍රම දෙක වන පාඨ ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සහ සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක අධ්‍යයනය අතරින් මෙහි දී උපයෝගී කොට ගෙන ඇත්තේ පාඨ ග්‍රන්ථ අධ්‍යයනයි. එයට ප්‍රධාන හේතුව වූයේ රචනාව නිම කිරීම සඳහා ලැබී ඇති කාල ප්‍රමාණය ක්ෂේත්‍ර අධ්‍යයනයක් සඳහා ප්‍රමාණවත් නොවීමයි. අධ්‍යයනය සඳහා පාඨ ග්‍රන්ථ තෝරා ගැනීමේ දී, කොළඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ඇති ග්‍රන්ථ එකතුන් සහ අන්තර්ජාලය ප්‍රධාන වශයෙන්ම භාවිත කරන ලදී. මෙම ලිපි ලේඛන සියල්ල ද්විතියක මූලාශ්‍ර ගණයට අයත් වන අතර ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සැලකෙන පාලි භාෂාවෙන් ලියැවුණු වංසකථා යොදා ගෙන නොමැත. එයට මූලිකම හේතුව වූයේ ලංකාවේ පුස්කොළ පොත් නාමාවලියෙහි දැක්වෙන මුල් පාලි කෘති (සෝමදාස, 1959) දැනට සොයා ගැනීමේ අපහසුවය.

## සාහිත්‍ය ගවේෂණය

නිබන්ධනය සඳහා සාහිත්‍යය ගවේෂණය කිරීම;

1. පාලි වංස කථා
2. ඒවායින් හෙළිවන ථෙරවාද බෞද්ධ සංස්කෘතිය සහ
3. ඓතිහාසික කරුණු අධ්‍යයනයෙහි ලා වංසකථාවල විශ්වාසනීයත්වය පිළිබඳව, යන මාතෘකා තුන යටතේ සිදු කරන ලද අතර සාහිත්‍ය කෘති විශ්ලේෂණය කිරීමේදී, ඓතිහාසික ලේඛන විශ්ලේෂණය (Belanger 2006, MHMC 2012) සහ ප්‍රාථමික මූලාශ්‍ර විශ්ලේෂණය කිරීම

(Taylor…et.al. 2016) යන අංශ දෙක පිළිබඳව ලියැවී ඇති නිර්ණායකයන් භාවිතා කරන ලදී.

ශ්‍රී බුද්ධදත්ත නාහිමියන් (1966) වංසකථා 24 ක් පිළිබඳව කරුණු දක්වා ඇති අතර, ධම්මරතන හිමියන් (2009) වංසකථා 13 ක් සහ පාලි වංසකථාවල ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳව විග්‍රහ කොට ඇත. මලලසේකරයන් ද (1965) දීපවංසය සහ මහාවංසය ඇතුළු සමහර වංසකථා පිළිබඳව තොරතුරු දක්වා ඇති අතර මෙම කෘති තුන පාලි වංසකථා පිළිබඳව ගවේෂණය කරන ලදී.

ලක්වැසියන්ගේ සමාජ සංවිධානය සහ කුල භේදය, ගෘහ ජීවිතය, ජනාවාස, අධ්‍යාපනය, රාජ්‍යය පරිපාලනය සහ ආගම පිළිබඳව දීපවංසය, මහාවංසය ඇතුළු තවත් ඓතිහාසික මූලාශ්‍ර ආශ්‍රයෙන් ගයිගර් (1969) මනා විශ්ලේෂණයක් කර ඇති අතර වෙත්තමුණි (2009) මහාවංසය ආශ්‍රයෙන් සිංහල ජන ජීවිතය පිළිබඳව පුළුල් විග්‍රහයක් කර ඇත. රාහුල හිමියන් ද (1962) පැරණි කෘතීන් ඇසුරින් ථෙරවාද බෞද්ධ සංස්කෘතිය පිළිබඳව විග්‍රහයක් කර ඇත. පාලි වංසකථා වල මුල් කෘතීන් පරිශීලනය කිරීමට නොහැකි වුවත්, මෙම ග්‍රන්ථ ආශ්‍රයෙන් ථෙරවාද බෞද්ධ සංස්කෘතියෙහි අංග ලක්ෂණ පිළිබඳව අධ්‍යයනයක් කර දැක්වීමට හැකියාවක් ලැබුණි. මහාවංසයේ සිංහල සංස්කරණය (2015) ද ඒ සඳහා බෙහෙවින් උපකාර විය. කාලය සීමිත වීම නිසා අනෙකුත් පැරණි වංසකථා අධ්‍යයනය කිරීමට ඉඩ නොලැබුණ නමුත් බොහෝ පැරණි  වංසකථා මහාවංසයේ දැක්වෙන කරුණු මූලාශ්‍ර කොට ගෙන ලියැවී ඇති නිසා විෂයානුබද්ධ කරුණු පිළිබඳව එතරම් අඩුපාඩුවක් වුවා යැයි සිතිය නොහැකිය.

පාලි වංසකථා, විශේෂයෙන්ම දීපවංසයෙ හි සහ මහාවංසයෙ හි විශ්වාසනීයත්වය පිළිබඳව අදාළ සාහිත්‍ය කෘතීන් වල මත දෙකක් දක්නට ලැබේ. සමහර උගතුන්ගේ (Franke 1907, සහ Kern 1896) මතය වූයේ දීපවංසය සහ මහාවංසය යන කෘති දෙකම ප්‍රබන්ධ කථා හා ප්‍රාතිහාර්යන් පිළිබඳ ගෙතුණු මිථ්‍යාවන් මිස විශ්වාසනීයත්වයක් ඇති ඓතිහාසික මූලාශ්‍ර ලෙස සැලකිය නොහැකි බවයි. එනමුදු Geiger (1930, 1960), Windisch (1917 - 1920) සහ Perera (1979) වැන්නන් පවසන්නේ ප්‍රාතිහාර්යන් පිළිබඳ පුවත් ඉවත් කළ විට එම වංසකථා තුලින් අගනා

ඓතිහාසික තොරතුරු හෙළිකර ගත හැකි බවයි. කෙසේ වුව ද මහාවංසය සහ දීපවංසය පිළිබඳව විශ්ලේෂණාත්මක කෘති බොහෝමයක් සම්පාදනය කර ඇතත් අනෙකුත් වංසකථා පිළිබඳ එවන් අවධානයක් යොමු වී ඇති බවක් නොපෙනේ.

## පාලි වංසකථා

පාලි වංසකථා පිළිබඳ අධ්‍යයනයෙහි දී ඒවායේ කර්තෘ, රචනා වූ යුගය, අන්තර්ගතය සහ මූලාශ්‍ර සංක්ෂිප්ත වගුවකින් පහත දක්වා ඇත.

**වගු 1 - පාලි වංසකථා පිළිබඳ සංක්ෂිප්තයක්**

| වංසකථාව | කර්තෘ | රචනා වූ යුගය | අන්තර්ගතය | මූලාශ්‍ර |
|---|---|---|---|---|
| **දීපවංසය** | ආචාර්ය පරම්පරාවක සාමූහික ව්‍යායාමයක ප්‍රතිඵලයක් | ක්‍රි. ව. හතරවැනි සියවසේ දී | විජය රජුගේ පටන් මහසෙන් රජුගේ යුගය අවසානය දක්වා | සිංහල මහාවංසට්ඨකතා වල රාජාවලිය, පුඤ්ඤපොත්ත සහ වෙනත් මූලාශ්‍ර |
| **මහාවංසය** | අනුරාධපුරයේ දික්සඳ සෙනෙවි පිරිවෙනෙහි විසූ මහානාම හිමියන් | ක්‍රි. ව. පස්වැනි සියවසේ දී | පරිච්ඡේද 01 සිට 37 දක්වා කොටස ක්‍රි. පූ. 543 විජය රජුගේ සිට ක්‍රි. ව. 302 මහසේන රජු දක්වා වසර 845 කාලය ආවරණය කරයි. | දීපවංසය, සිංහල මහාවංසට්ඨකතා වල |
| **මහාබෝධි වංසය** | උපතිස්ස හිමියන් | දසවැනි සියවසෙහි පමණ | මහාබෝධි ශාඛාව සහ ධාතූන් වැඩම කිරීම. පූජනීය වෘක්ෂය රෝපණය කිරීම සහ බෝධි පූජා ආරම්භ කිරීම ආදිය | සිංහල මහාබෝධිවංසට්ඨකතාවල මහාවංසය සහ සමන්තපාසාදිකාව |

| | | | | |
|---|---|---|---|---|
| **ථූපවංසය** | වාචිස්සර හිමියන් | දස වන සියවසේ දී | රුවන්වැලි මහාසෑය පිළිබඳව | චෛතියවංසට්ඨකතාව, මහාවංසය, මහාවංස ටීකාව සහ සමන්තපාසාදිකාව |
| **දාඨා වංසය** | පළමුවන ධර්මකීර්ති හිමියන් | (ක්‍රි. ව. 1197-1200) | වාම දළදාව කිත්සිරිමෙවන් රජ සමයේ දී ලංකාවට වැඩම කිරීම | සිංහලෙන් ලියා තිබුණු දළදා වංශයක් |
| **ධාතුවංසය**[4] | කතුවරයා ගැන කිසිදු තොරතුරක් නැත | දහවැනි හෝ එකොළොස් වැනි සියවසේ දී | බුදුන් වහන්සේගේ ලලාට ධාතුව සහ තවත් ධාතු පිළිබඳ ඉතිහාසය දැක්වේ | සිංහල ධාතුවංසය |
| **ඡකේසධාතු වංසය** | කර්තෘ නොදැක් වේ. | කාලය නොදැක් වේ. | බුදුරදුන් වේළුවනයෙහි වැඩ වසන සමයේ දී රහතන් වහන්සේලා සයනමකට කේශ ධාතු ප්‍රදානය කල අන්දම සහ ඒවා නිධන් කර චෛත්‍යය සයක් ඉදි කළ අන්දමත් මෙහි සඳහන් වේ | එවැන්නක් සඳහන් නොවේ |
| **හත්ථවන ගල්ල විහාරවංසය (අත්තනගලු වංසය)** | කර්තෘනාමය සඳහන්ව නැති නමුත් දඹදෙණි රාජ සමයේ වැඩ සිටි හිමි නමක් | දඹදෙණි රාජ සමයේ | සිරිසඟබෝ රජතුමාගේ චරිතය, අත්තනගලු සෑය පිළිබඳ විහාරය පිහිටවූ තැන් සිට ප්‍රතිසංස්කරණය කළ රජවරුන්ගේ තොරතුරු | එවැන්නක් සඳහන් නොවේ[5]. |
| **සාසනවංස දීපය** | ආරියවංසාලංකාර විමලසාර තිස්ස නායක හිමියන් | බුද්ධ වර්ෂ 2423 දී (1880 දී පමණ) | ලක්දිව අමරපුර නිකාය පිහිටුවීමේ ඉතිහාසය දැක්වේ. | එවැන්නක් සඳහන් නොවේ |
| **කල්‍යාණී වංස** | කතුවරයා කවරෙක්දැයි | ක්‍රි. ව. 1830 දී | රාමඤ්ඤ රටෙන් උපසම්පදාව ලබා | එවැන්නක් සඳහන් |

| | | | | |
|---|---|---|---|---|
| **ගුණරතන තිස්ස සාසන වංසය** | නොදනී. | පමණ | ලක්දිවට පැමිණි කල්‍යාණිවංස නිකාය පිහිටුවා වදාළ කතළුවේ ගුණරතනතිස්ස මාහිමි ප්‍රමුඛ නිකායේ ඉතිහාසයයි. | නොවේ |
| **ජිනවංසදීප** | මොරටුවේ මේධානන්ද මහා ස්ථිවිරපාදයන් වහන්සේ | ක්‍රි. ව. 1917 දී | ගාථා 2000 කින් පමණ බෝධිසත්ව සහ බුද්ධ චරිතය පිළිබඳ කරුණු දක්වා ඇත | එවැන්නක් සඳහන් නොවේ |

**මූලාශ්‍ර** : (අභයගුණවර්ධන, 1993), (පියදස්සී හිමි, 2009), (මලලසේකර, 1965), (ධම්මරතන හිමි, 2009), (ශ්‍රී බුද්ධදත්ත හිමි, 1966), (මහාවංසය, 2015), (රාහුල හිමි, 1962), (Geiger, 1969), (Jayawardhana, 1991/ 1992)

ලාංකික හිමිවරුන් විසින් ලියන ලද ඉහත දැක් වූ වංසකථා වලට අමතරව පාලි වංසකථා අතර වැදගත්කමක් උසුලන, විදේශිය වංසකථා කිහිපයක් ද ඇත. එනම් ග්‍රන්ථවංසය[6], සාසනවංසදීපිකා[7], සහ ජිනකාලමාලි[8]

## පාලි වංසකථා වලින් හෙළිවන ථෙරවාද බෞද්ධ සංස්කෘතිය

ථෙරවාද බුදු දහම ජන ජිවිතයේ සෑම අංගයක් කෙරෙහිම බලපෑමක් ඇති කරත් මෙහි දැක්වෙන්නේ ඉතාම වැදගත් වුණු සිද්ධීන් සමහරකට නිදසුන් පමණි. මහාවංසය සියවස් ගණනාවක් පුරා ඇති වූ පරිණාමය වාර්තා කර ඇති හෙයින් ද අනෙක් බොහෝ වංසකථා මහාවංසය මූලාශ්‍ර කොටගෙන ලියැවී ඇති හෙයින් ද බොහෝමයක් නිදසුන් මහාවංසයෙන් ගෙනහැර දක්වා ඇත. වරහන් තුළ දැක්වෙන්නේ එම සිද්ධියට අදාළ මහාවංස (2015) පරිච්ඡේදය සහ ගාථා අංකයයි.

මහින්දාගමනයෙන් පසුව බොහෝ දෙනා අළුත් ආගම කෙරෙහි ඉමහත් ගෞරවයක් දැක් වූ අතර පොදු කටයුතු සෑම එකක් ම පාහේ ආගමට සම්බන්ධ විය (රාහුල හිමි, 1962). මිහිඳු හිමියන් විසින් මුල්ම ධර්ම දේශනා පැවැත් වූ අතර (14 පරිච්ඡේදය) ඉන් පසුව නොයෙක් ආකාරයට මෙය පැතිර ගිය බවට සාක්ෂි ඇත. උදා:- අරියවංස සූත්‍රය දේශනා කිරීම (36:38). බුදු සමය ස්ථාපිත කිරීමෙන් පසුව පැවති මුල්ම ආගමික උත්සවය ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩමවාගෙන ඒමයි (වෙත්තමුණි, 2008). මෙය

මහාවංසයේ 18 වන පරිච්ඡේදයෙන් ද මහාබෝධිවංසයෙන් ද විස්තර කෙරේ. ඊට පසුව බෝධි පූජා පිළිබඳව කිහිප පොළකම සාක්ෂි දැක්වේ. උදා:- දුටුගැමුණු (28:01), භාතිය (34:58) සහ ධාතුසේන (38:55) යන රජවරුන්ගේ බෝධි පූජා, ගිරි භාණ්ඩ පූජාව (34:81) සහ ගංගා රෝහණ පූජාව (37:190-198, 51:80-81, 52:80) වැදගත් පූජා විය. අද දක්වා පැවැත්වෙන දළදා උළලේ ආරම්භය වාර්තා වන්නේ කිත්සිරිමෙවන් රජ සමයේ (37:92-98) දීය. මහා විජයබාහු (72:198), හතරවන විජයබාහු (86:15) මෙන්ම අනෙකුත් බොහෝ රජවරු ද උත්කෘෂ්ඨ ලෙස දළදා පූජා පැවැත් වූ බව මහාවංසයෙහි මෙන්ම දඨාවංසයෙහි ද දැක්වේ. බුද්ධෝත්පත්තිය සැමරීම වස් වෙසක් උත්සවය ගෞරව බහුමානව පවත්වා ඇත. දුටුගැමුණු (32:35), භතිකාභය (34:59), වසභ (35:100), වෝහාරික තිස්ස (36:40), ජෙට්ඨතිස්ස (36:130) සහ ගෝඨාභය (36:109) යන රජවරු වෙසක් උත්සවය සැමරූ අන්දම ඒ ඒ පරිච්ඡේද වල දැක්වේ. වස් සමය අවසානයේ පැවැත්වෙන කඨින පූජාව එකල ද පැවැත්වුණු බවට මහාවංසය නිදසුන් සපයයි (44:48, 83:99-105).

රජවරුන් විසින් විහාර ආරාම තනවා පූජා කිරීම මිහිඳු මාහිමියන්ගේ සම්ප්‍රාප්තියේ සිටම පැවැතිණි. දුටුගැමුණු රජතුමාගේ මිරිසවැටිය (26), ලෝවාමහාපාය (27) සහ රුවන්වැලි මහාසෑය (28-32 පරිච්ඡේද) විචිත්‍රවත් ලෙස මහාවංසය දක්වා ඇති අතර ථූපවංසයෙහි, ථූපාරාමය, මිරිසවැටිය, මහියංගන යන ස්ථූප ගොඩනැංවීම පිළිබඳ දැක්වේ. කාවන්තිස්ස රජ සමයේ දී ලලාට ධාතුව නිදන් කොට සේරුවාවිල මහා චෛත්‍යය කර වූ අන්දම ධාතුවංසයෙහි සඳහන් වන අතර ගෝඨාභය රජතුමා අත්තනගලු සෑය ඉදිකිරීම පිළිබඳ හත්ථවනගල්ල විහාරවංසයෙන් දැක්වේ. ගිහි ජනතාව ද ථෙරවාද බුදුදහම අනුව යමින් නොයෙක් පුණ්‍ය කර්ම වල යෙදුන අතර (35:30-31, 36-29), පින් රැස්කිරීම ගිහි ජීවිතයේ වැදගත් අංගයක් විය. ජෙට්ඨතිස්ස රජතුමා යුද්ධයෙන් පරාජිතව දිවි නසා ගැනීමට පෙර තම බිසවට සංදේශයක් එවමින් ඉල්ලා සිටියේ පැවිදි වී අභිධර්මය දේශනා කරමින් රජුට පින් දෙන ලෙසයි (42:109). එමෙන්ම කරන ලද පුණ්‍යකර්ම පින් පොත්වල සඳහන් කිරීම ද සිරිතක්ව පැවතී ඇත. උදා:- දුටුගැමුණු රජතුමාගේ අවසන් මොහොතේ දී ඔහුගේ පින් පොත කියවීම (32:27-56) දුගී, මගී, යාචකාදීනට දන් දීම ද ගිහි ජීවිතයේ වැදගත් අංගයක් විය. මහා සිළු මහාතිස් රජ වෙස් වලාගෙන කෙත්වතු වල වැඩ කර උපයා

ගත් දෙයින් දන් දුන් බවත් (34:2-10) පෙරහන්කඩ දාන, ගිලන් වැටුප් (35:75), මස්කොමඩු දාන (35:7) දුන් බවත් සඳහන් වේ. සංඝයා වෙනුවෙන් නිත්‍ය දාන ශාලා පිහිටුවා දිනපතා දන්දීම සෑම රජ කෙනෙක්ම සිදුකරන ලද අතර සිවුරු පූජා (46:16), පහන් පූජා (83:41, 96: 61-62) මල් පූජා (34 පරිච්ඡේදය) මෙන්ම ප්‍රිය වස්තු පූජාව ද (84:56) එකල ජනතාවගේ දන්දීම පිළිබඳ වූ භක්තිය සහ ආශාව විදහාපායි. සංඝමිත්තා තෙරණිය සමඟ තවත් මෙහෙණින් වහන්සේලා එකොළොස් නමක් මෙහි පැමිණ මෙහෙණි සසුන පිහිට වූ බවත් (19:64) භික්ෂුණින් සඳහා ආරාම පූජා කරන ලද බවත් සඳහන් වුවත් (39:43, 46:37, 49:25) ඔවුන්ගේ කටයුතු පිළිබඳව වැඩි විස්තරයක් මහාවංසය ඉදිරිපත් නොකරයි.

ලංකාවේ ප්‍රථම නිකාය භේදය ඇති වූ අන්දම පිළිබඳව මහාවංසය සාක්ෂි සපයයි. ඉතාමත් පූජනීය ලෙස වැඳුම් පිදුම් ලද මහාවිහාරවාසී භික්ෂු පරපුර වළගම්බා රජ සමයේ දී (33:82) දෙකඩ වී භික්ෂූන් **500** ක් පමණ මහාවිහාරයෙන් වෙන්ව අභයගිරියෙ හි වාසයට ගියහ (33:97-101). මෙම සමයේ දී දඹදිවින් ලංකාවට පැමිණි වජ්ජිපුත්‍ර නිකායට අයත් ධම්මරුචි නම් තෙරනමක් අභයගිරිය විසින් පිළිගන්නා ලදුව, ඔවුන් ධම්මරුචි නිකාය[9] නමින් ප්‍රසිද්ධ විය. ගෝඨාභය රජු දවස ඇති වූ අර්බුද නිසා උස්සිලියාතිස්ස නම් භික්ෂුවක් තුන්සියයක් පමණ තවත් භික්ෂූන් රැගෙන දක්ෂිණගිරි විහාරයට ගිය බවත් මහසෙන් රජතුමා ජේතවන විහාරය කරවා ඔවුනට පූජා කරන ලද බවත් සඳහන් වේ (35:32-35). සාගල මහතෙරුන්ගේ නමින් මේ නිකාය සාගලීය නම් වූ අතර ජේතවනාරාමය ඉදිකිරීමෙන් පසුව ඔවුන් එහි විසූ නිසා ජේතවනික ලෙස ද ප්‍රසිද්ධ විය. වෝහාරිකතිස්ස (36:41), ගෝඨාභය (36:111-112), මහසෙන් (35:32-35) යන රජවරු වරින්වර වෛතුල්‍යවාදය විනාශ කරන ලද බව ද වාර්තා වේ. මෑත යුගයේ දී යම් යම් නිකාය බිහි වූ අන්දම සාසනවංසදීපය සහ කල්‍යාණිවංස ගුණරතනතිස්ස සාසනවංසය යන වංසකථා මඟින් දැක්වේ.

මහින්දාගමනයට පෙර සිට සාක්ෂරතාව පැවති බව, විජය රජුට මෙහෙසියක් ගෙන්වා ගැනීම පිණිස මදුරාපුරයට හසුන් යැවීමෙන් (7:51) සහ රාජ්‍යය භාර ගැනීමට විජය රජුගේ සොහොයුරු කැඳවීමට හසුනක් යැවීමෙන් (8:3) පැහැදිලි වේ. නමුත් ලංකාවේ බුදු සසුන පිහිටුවීමෙන් පසුව බෞද්ධ භික්ෂුව මුල් වූ අධ්‍යාපන ක්‍රමයක් ඇරඹුණු බව දැකිය

හැකිය. විවිධ ධර්ම දේශනා මගින් විනයක් ලබා දීම මිහිඳු හිමියන් විසින් ආරම්භ කරන ලද අතර (14:65), (15:179,215-220) ඒ හිමියන් විසින් සිංහල භාෂාවෙන් ත්‍රිපිටකය සඳහා අට්ඨකථාවක් ද කළ බව සඳහන් වේ (37:230). ඒ හැරුණු විට භික්ෂූන්වහන්සේලා විවිධ රජවරුන්ගේ පුතුනට අධ්‍යාපනය ලබා දී ඇත (36:116, 79:75, 38:19-20, 91:81). මුඛ පරම්පරාවෙන් පැවත ආ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම වැදගත් සන්ධිස්ථානයක් වන අතර (33:100-101) එය පාලි භාෂාවෙන් සිංහලයට ද නැගූ බව (37.175) කියවේ. මහාවිහාරයට ඉන්දියාවෙන් පැමිණි බුද්ධඝෝෂ හිමියන් විසින් විශුද්ධිමග්ගය (37:23) ඇතුළු පාලි සාහිත්‍යය කෘති රැසක්ම ලංකාවට දායාද කරන ලදී. (37:229-230,245) මෙරට පැරණි විෂය මාලාවට ධර්මය පමණක් නොව අනෙක් ශාස්ත්‍රයන් ද  අයත් වූ බව පෙනේ. උදාඃ- වෛද්‍ය ශිල්පය, පරාක්‍රමබාහු රජතුමා (73:46) සහ බුද්ධදාස රජතුමා මිනිසුන්ට මෙන්ම සතුන්ට ද ප්‍රතිකාර කළ බවත් (37:113-137) දුටුගැමුණු රජතුමාට ඇත් වෙදකු සිටි බවත් (25:34) මහාවංසයේ දක්වයි.

පැරණි බෞද්ධ භික්ෂුවගේ කාර්යභාරය පිළිබඳ විමසීමේ දී ඔවුන් ගෘහ නිර්මාණ ශිල්පීන් ලෙස ද කටයුතු කළ බව සඳහන් වේ. උදාඃ- දුටුගැමුණු රජතුමා රහතන් වහන්සේලා අටනමක් ලවා ලෝවාමහාපායේ සැලසුම පිළියෙළ කළ බවත් (27:9-10) මහා සෑය නිර්මාණයෙහි භික්ෂූන් ද සහාය වූ බවත් (30:21,30) එසේම තීරණාත්මක අවස්ථාවල දී රජවරුන්ට බුදුසසුන සහ රට ආරක්ෂා කර ගැනීම සඳහා සහය වී ඇති බවත්, එපමණක් නොව රජවරුන්ගේ නොමනා ක්‍රියා ඉදිරියේ අප්‍රසාදය දැක්වීමත් සිදුවිය. උදාඃ- භික්ෂූන් පත්තනිකුජ්ජනයෙන් දෙවන දායෝපතිස්ස රජුට දඬුවම් කිරීම (43:32) රජවරුන් අතර අර්බුද විසඳීමටත් (24:50) රජවරුන් තෝරාගැනීමටත් භික්ෂූන් වහන්සේලා මැදහත් වී ඇත (33:17-18). එපමණක් නොව යුද්ධ කිරිමේදීත් දුටුගැමුණු රජතුමා භික්ෂූන් සමඟ ගිය බව දැක්වේ (25:). කෙසේ වුවත්, බුද්ධාගම රජයේ ආගම වූ දා සිට එහි ඇති අල්පේච්ඡතාව සුන් වී ගොස්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ආගම දේශපාලනය සහ සමාජ වගකීම් රැසක් කරට ගත් පූජක සංවිධානයක් බවට කෙමෙන් පෙරලුන බව රාහුල හිමි පවසයි (1962).

මිහිඳු හිමියන් ලංකාවට වැඩිය අවධියේ ගොඩනැගිලි එතරම් දියුණු තත්වයක නොපැවති බවට පෙනේ. උදාඃ- මහතෙරණුවන්ට වැඩ සිටීමට

කඨිනමින් ආරාමයක් ගොඩනැගීමේ දී මැටි ගින්නෙන් වේලා ගැනීම සහ (15:222) ධර්ම දේශනා සඳහා ස්ථානයක් නොවුයෙන් ඇත් හළ පිරිසිදු කර ගැනීම (14:62). නමුත් මහින්දාගමනයෙන් පළමු වසර තුලදී ම මහාවිහාරය, සඳගිරිය, ථූපාරාමය, ශ්‍රී මහා බෝධිය රෝපණය, ඉසුරුමුණි විහාරය, තිසා වැව, පළමු සෑය, වෙස්සගිරි විහාරය, උපාසිකා වෙහෙර, හත්ථාල්හක මෙහෙණවර, මහාපාලී බත්හල, දඹකොළ විහාරය, තිස්ස විහාරය, ප්‍රාචීන විහාරය යන කර්මාන්තයන් දේවානම්පියතිස්ස රජතුමා විසින් කර වූ බව සඳහන් වේ (20:18-27). මේ අනුව ථෙරවාද බුදු සමයේ සම්ප්‍රාප්තිය ගොඩනැගිලි ඉදිකිරීම් කෙරෙහි විශාල බලපෑමක් කළ බව පෙනේ. ධාතුන් වහනසේලා තැන්පත් කර තැබීම සඳහා ධාතු ශාලා හෙවත් ධාතුඝර (37:15, 46:29, 78:25) නිර්මාණය, උපෝසථ ගෘහ (15, 37:34, 30:35, 51:70, 36:17, 17-207), නාන පොකුණු (54:51, 78:45-46, 78:82) වැසිකිලි (78:37, 43, 82) ඇතුළු බොහෝ ගොඩනැගිලි බෞද්ධ සිද්ධස්ථාන සම්බන්ධව ගොඩනැගුණු බව පෙනෙතත් සාමාන්‍යය ජනතාවට සම්බන්ධ ගොඩනැගිලි පිළිබද එතරම් තොරතුරු නොදැක්වේ. මලලසේකරයන් (1965) පවසන්නේ ප්‍රජා පාලකයන්ගේ ඉතිහාසය, ඔවුන්ගේ ක්‍රියා, සහ ශාසනයේ උන්නතිය උදෙසා ඔවුන්ගේ දායාද ආදිය දැක්වුවත් ඒ සඳහා සහය වූ ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය ප්‍රජාවගේ එදිනෙදා ජීවන ප්‍රවෘත්ති කිසිවක් දක්වා නොතිබීම මහාවංසයෙහි අඩුවක් බවයි.

## ඓතිහාසික මූලාශ්‍ර ලෙස පාලි වංසකථා වල විශ්වසනීයත්වය

මහින්දාගමනයෙන් පෝෂණය ලද එක් රචනා කලාවක් ලෙස වංසකථා සැලකිය හැකි අතර ලංකාවේ දී රචනා වූ වංසකථා ලංකාවටම ආවේණික වූ රටාවකින් බිහි වූ බවත් ඉන්දියාවේ පැවති වංසකථා පුද්ගල පරම්පරා පිළිබඳ කීමට පමණක් සීමා වූ බවත් ලක්දිව වංසකථා වල විෂය ක්ෂේත්‍රය ඊට වඩා පුළුල් වූ බවත් දක්නට ඇත (ධම්මරතන, හිමි 2009). පියදස්සී හිමියන් තව දුරටත් පවසන්නේ ලංකාවේ වංසකථා පූජනීය වස්තු මුල් කොටගෙන ශාසනික, දේශපාලනික ඉතිහාසය පැවසීමේ අරමුණින් රචනා වී ඇති බවත් එහෙයින් ශාසනික ඉතිහාසය මෙන්ම කලා ශිල්පයන්ගේ තතු අධ්‍යයනය කරන්නන් හට ද මහත් ප්‍රයෝජනවත් නිසා ඉන්දියාවේ වංසකථා වලට වඩා වැදගත්කමක් ලංකාවේ වංසකථා වලට හිමි ව ඇති බවත්ය.

වංසකථාවල විශ්වාසනීයත්වය පිළිබඳව ලාංකික (Perera, 1979) මෙන්ම යුරෝපීය උගතුන් ද (Franke, 1907) විටින් විට සාකච්ඡා කර ඇත. සමහර උගතුන් එසේ ප්‍රබල ලෙස වංසකථා ප්‍රතික්ෂේප කරන්නේ ඒවායේ දැක්වෙන තොරතුරු කිසිදු ඓතිහාසික මූලාශ්‍රයක් මත පදනම් නොවී හුදු ජාතක කථා වැනි මාධ්‍ය වලින් උපුටාගෙන ඇති බව දක්වමිනි. උදාः- Franke (1907) ට අනුව දීපවංසය, මහාවංසය සහ සමන්තපාසාදිකාවේ කිසිදු ඓතිහාසික වැදගත්කමක් නැත. (Smith, 1920) උද්ධෘතය (Perera, 1979) ක්‍රි. පූ. 160 ට පෙර ඓතිහාසික තොරතුරු විශ්වාස කළ නොහැකි යයි පවසයි. ගයිගර් (1930) ද තම ලිපිය තුළින් මහාවංසයේ විශ්වාසනීයත්වය පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇති අතර මහාවංසයේ ඇතැම් සිදුවීම් සත්‍ය බව සැලකීම අපහසු බව ප්‍රකාශ කරයි. ලංකා ඉතිහාසයේ පැරණිම යුගය පිළිබඳ මහාවංසය සහ දීපවංසයේ එකඟතාවයක් නොමැති බවත්, මහාවංස කතුවරුන්ට ප්‍රිය වූ රජවරුන් ගැන දීර්ඝව විස්තර කරන බවත් ඇතැම් රජවරු පිළිබඳ කිසිත් නොදැක්වෙන බවත් පවසයි (Geiger, 1930). එසේම අලගක්කෝණාර සිරකරුවකු ලෙස චීනයට ගෙනයාම, හෝ පෘතුගීසි ආක්‍රමණ පිළිබඳව සඳහන් නොවේ. ශාසනිකව වැදගත් වන සිද්ධීන් පිළිබඳව මහාවංසයේ සඳහන් නොවන බව ශ්‍රී බුද්ධදත්ත නාහිමියන් ද පවසයි. නිදසුනක් ලෙස ෆාහියන් හිමියන් ලක්දිවට පැමිණීම, මහානාම රජු චීනයට දූත පිරිසක් යැවීම, සිංහල භික්ෂුණීන් පිරිසක් චීනයට ගොස් එහි මෙහෙණි සසුන පිහිටවීම, රාමඤ්ඤ රටෙන් සංඝ පිරිස් දෙකක් මෙරටින් උපසම්පදාව ලබාගෙන ගොස් එරට උපසම්පදාව පැතිරවීම යන කරුණු එම රටවල ඓතිහාසික ලේඛනවල සටහන්ව ඇතත් අපගේ වංසකථාවල ලියැවී නැත. එමෙන්ම ඇතැම් ආවාසිදායක තොරතුරු පිළිබඳ කිසිදු සටහනක් නොතිබෙන බවත් (Geiger, 1930) සඳහන් කරයි. උදාः- පරාක්‍රමබාහු රජතුමා ඉන්දියාවේ දී ලද යුද පරාජය එරට සෙල්ලිපි වල සඳහන් වුවත් මහාවංසයේ නොදැක්වෙන බව.

ගයිගර් (1930) මෙවැනි අඩුලුහුඩුකම් පෙන්වා දුන්නත් පවසන්නේ, වංසකථා දෙස පර්යේෂකයන් බැලිය යුත්තේ විමර්ශනාත්මකව බවයි. විශේෂයෙන් පැරණි යුග පිළිබඳ තොරතුරු, ප්‍රබන්ධ කථා වලින් ගහණ වුවත් දේවානම්පියතිස්ස රජ සමයේ සිට මහාවංසයේ විශ්වාසනීයත්වය

වැඩිවන බවත් එම යුගයට අයත් අශෝක රජුගේ ධර්ම ප්‍රචාර කටයුතු මෙන්ම බෝධි ශාඛාව ලංකාවට වැඩම කිරීම ආදිය සාංචි ස්ථූපයෙන් ලැබුණු පුරාවිද්‍යාත්මක සාක්ෂි වලින් සහ කැටයම් වලින් තහවුරු වන බවත් ඔහු පවසයි. මහාවංසය නිසා දිවයිනේ ඉතිහාසයේ පැරණිම අර්ධ-වෘත්තාන්තික කාලයන්හි සිට වර්තමානය දක්වා ඇතුළත් වන වංශකථාවක් ලංකාවට අයිතිව ඇති බවත් කාශ්මීර රාජතරංගණිය හැරුණු විට ඉන්දියාවේ ද මීට සම කළ හැක්කක් සමහර විට නොතිබෙන්නට පුළුවන් බවත් ඔහු පවසයි (ගයිගර්, 1969).

ජෝර්ජ් ටර්නර් විසින් 1837 දී ඉංග්‍රිසි අකුරෙන් ලියන ලද පාලි ගාථා ද සහිතව පරිවර්තනය කරන ලද මහාවංසය, 19 වන සියවස අගභාගයේ දී ආසියාවේ පැරණි සංස්කෘතීන් පිළිබඳ පර්යේෂකයන්ට හැරවුම් ලක්ෂයක් වූ බව Windisch (1917-1920) පවසා ඇත. දීපවංසය, මහාවංසය, ඇතුළු තවත් වංස කථා 19 වන සියවසේ සිට ඉංග්‍රීසි, ජර්මන්, ලතින්, ප්‍රංශ වැනි යුරෝපීය භාෂාවන්ට පරිවර්තනය කර ඇති අතර වංසකථා මෙසේ පරිවර්තනය කරන්නට හේතු වූයේ ඒවායේ දැක්වෙන බොහෝමයක් තොරතුරු පුරාවිද්‍යාත්මක සාක්ෂි මඟින් තහවුරු වූ නිසාය යන්න Berkwitz (2007) ගේ මතයයි. (Copleston 1892, David 1903, Kern 1896, Lassen 1874, iy Norman 1908, උද්ධෘතය (Perera, 1979) වැනි යුරෝපීය ජාතිකයන් ද ඉතිහාසය සහ බෞද්ධ සංස්කෘතිය අධ්‍යයන කිරිමෙහි ලා වැදගත් මුලාශ්‍රයක් ලෙස වංසකථාවල වැදගත්කම දක්වා ඇත. Berkwitz (2007) පවසන්නේ හින්දු පුරාණයන්ට ද වඩා ථෙරවාද වංසකථා වඩාත් යථාර්ථවාදීව කරුණු දක්වා ඇති නිසා ඓතිහාසික ලේඛන ලෙස ඉතා වටිනා බවයි. Skilling (1997) පවසන්නේ දීපවංසය සහ මහාවංසය යන දෙකෙහි ලංකාවේ ථෙරවාදය පිහිටුවීමේ සිට අද දක්වා තොරතුරු ඇතුළත් වන අතර වෙනත් කිසිදු රටක මෙවැනි දීර්ඝ කාලයක් ආවරණය කරන ඓතිහාසික ලේඛන නොමැති බවයි. Hazrag (1981) අනුව චූලවංසය, ලංකාව සහ බුරුමය අතර තිබුණු සංස්කෘතික ආගමික සම්බන්ධතා පිළිබඳ වටිනා තොරතුරු දක්වා ඇති අතර එම තොරතුරු සෙල්ලිපි වැනි සාධක මගින් තහවුරු වන නිසා චූලවංසය විශ්වාස කටයුතු මුලාශ්‍රයකි. එමෙන්ම පාලි ජිනකාලමාලිය ද ලංකාවත් සියමත් අතර තිබුණු ආගමික සම්බන්ධතා පිළිබඳ වැදගත් තොරතුරු සපයන බව

Hazra (1981) ගේ අදහසයි. මහාවංසයේ කාල නිර්ණය ක්‍රමය පුදුමයකට මෙන් සම්පූර්ණයෙන් නිවැරදිබවත්, මෙවැනි නිරවද්‍යතාවක් ඇති වෙන කිසිදු කෘතියක් බ්‍රාහ්මණ සමයෙහි හෝ සංස්කෘත භාෂාවෙහිවත් නොමැති බවත්, මලලසේකරයන් (1965) පවසයි. භරතසිංහ උපාධ්‍යාය ද මහාවංසයේ දක්වා ඇති සිද්ධි හා කාල නිර්ණායකයන් භාරතයේ ද ඓතිහාසික සිද්ධීන් නිශ්චය කර ගැනීම සඳහා අතිශයින් උපකාර වන බවත්, භාරත ඉතිහාසයට වෙනත් කෘතියකින් එබඳු සහයෝගයක් නොලැබෙන බවත් පවසයි (භරතසිංහ 1948, උද්ධෘතයඃ ධම්මරතන, හිමි 2009).

බොහෝ විදේශීය ලේඛකයන් ථෙරවාද බෞද්ධ ඉතිහාසය සහ සංස්කෘතිය අධ්‍යයනයෙහි ලා වංසකථාවල උපයෝගීතාවය දක්වා ඇති අතර ශ්‍රී ලාංකික උගතුන් ද ඒ පිළිබඳ විවිධ අදහස් දක්වා ඇත. ශ්‍රී බුද්ධදත්ත නාහිමියන් (1966) දක්වන අන්දමට මහා ප්‍රජාපතී මෙහෙණින්වහන්සේගේ පටන් මහසෙන් රජ සමය දක්වා පැවති භික්ෂුණී ආචාර්ය පරම්පරාව දීපවංසයේ අටලොස්වන පරිච්ඡේදයෙන් දැක්වෙන අතර අන් කිසිම අටුවා පොතක හෝ ඉතිහාස පොතක ඒ පිළිබඳ සඳහන් නොවේ. මහාවංසයේ ද සඳහන් නොවන රෝහණ ප්‍රදේශය පිළිබඳ ඓතිහාසික තොරතුරු ධාතුවංසයේ සඳහන් වේ. (ධම්මරතන හිමි, 2009). ශ්‍රී බුද්ධදත්ත නාහිමි පවසන්නේ මහාවංසය වනාහි සිංහලයන්ගේ උදාරත්වය පෙන්වන ඓතිහාසික ග්‍රන්ථයක් බවත් සංක්ෂේපයෙන් වුවත් අවිච්ඡින්න රාජ පරම්පරාවක් අවුරුදු දෙදහසකට වැඩි කලක් පැවති සැටි පෙන්වන ඉතිහාස ග්‍රන්ථ ඇත්තේ ලෝකයේ ජාතීන් අතරින් කිහිපයකට පමණක් බවත්ය. (ශ්‍රී බුද්ධදත්ත හිමි, 1966).

ඉතිහාසය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම ආරම්භ වූ මුල් කාලයේ දී ඕනෑම කෘතියක් විද්‍යාත්මක ප්‍රමිතියට අනුකූල නොවන්නේ නම් එය ඉතිහාසය ලෙස පිළිනොගැනුණි. මේ අනුව පාලි වංස කථා ඉතිහාසය ලෙස පිළිගැනීමට මුල් යුගයේ උගතුන් මැලි වුණි (Perera, 1979). නමුත් මහාවංසය ලංකාවේ වීර කාව්‍යයක් ලෙසත් එය නූතන ආකෘතියේ ඉතිහාසයක් නොවන බවත් පිළිගෙන ඇත (Geiger 1930 සහ Mendis 1930, උද්ධෘතය (Perera, 1979). ඒ අනුව මෙම වංසකථා, විද්‍යාත්මක

ඓතිහාසික රචනා (Scientific Historiography) ලිවීම ආරම්භ කිරීමට පෙර තිබූ සම්ප්‍රදායක් ලෙස සැලකීමට පටන් ගති (Perera, 1979).

## නිගමනය

ඉහත කෙරුණු සාකච්ඡාවට අනුව ථෙරවාද බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනය කිරීමෙහි ලා පාලි වංසකථාවල, විශේෂයෙන්ම දීපවංසය සහ මහාවංසයේත් ඒවා මූලාශ්‍ර කොට ගත් අනෙක් වංසකථා වලත්, උපයෝගීතාවය අතිමහත් බවට විවාදයක් නොමැත. එහෙත්, යම් යම් සිද්ධීන් වංසකථා වලින් එතරම් විස්තර නොකෙරෙන බව ඉහත සාකච්ඡාවේදී පැහැදිලි විය. ඇතැම් විට මෙම වංසකථා බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් රචනා කිරීමේ දී ඔවුන්ට එතරම් අදාළ නොවන ගිහි ජීවිතය, දේශපාලනික කරුණු වැනි දෑ අත්හැරියා වන්නට ඇත. එහෙයින් ථෙරවාද බෞද්ධ සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයන් සම්පූර්ණ වීමට නම් වංසකථා වලට අතිරේකව ඒ ඒ කරුණු පිළිබඳව ලියැවුණු තවත් ලේඛන උදා:- රසවාහිනිය, නිකාය සංග්‍රහය සහ ඉතිහාසය පිළිබඳ ලියැවුණු ලිපි ලේඛනත් පුරාවිද්‍යාත්මක සාක්ෂිත් යොදාගත යුතු බව නිගමනය කළ හැකිය.

## පාදක සටහන්

1. වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් ඉදිරිපත් කළ දස කරුණු විනය විරෝධී යයි යන මතය මත මහතෙරවරු දෙවන සංගෘහිය පවත්වා ඔවුන් නෙරපා හරින ලදී. එසේ නෙරපන ලද දස දහසක් පමණ වූ භික්ෂු පිරිස මහාසාංඝික නමින් නිකායක් පිහිටුවා ගත් අතර මුල් පිරිස ථෙරවාදි නමින් ප්‍රකට විය.
2. ක්‍රි. පූ. තුන්වන ශතවර්ෂයේ මැද අවධියේ ලංකාවට වැඩම කළ මිහිඳු හිමියන් විසින් බුද්ධාගම මෙහි ගෙන එන ලද බව සම්මත මතයයි. මහාවංශයේ දහතුන්වන සහ දහහතරවන පරිච්ඡේද වලින් මේ පිළිබඳ විස්තර කරයි.
3. මහාවංසය කොටස් හතරකින් යුක්ත බවත් මහසේන රජ සමය අවසානයෙන් පසුව ක්‍රි. ව. 302 කිත්සිරිමෙවන් රජ සමයේ සිට ලියැවුණු කොටස් චූලවංශය ලෙසත් Geiger (1930) දක්වයි. නමුත් ශ්‍රී බුද්ධදත්ත හිමියන් (1966) පවසන්නේ එසේ බෙදා වෙන් කිරීමට කිසිදු හේතුවක් නොමැති බවත්, එකම හේතුව වන්නට ඇත්තේ මහාවංසයේ 37 වන පරිච්ඡේදය අවසානයේ එහි කතුවරයා ''මහාවංසො නිඨිතො'' යනුවෙන් ලියා තැබීම බවත්ය.

4. ග්‍රන්ථය ආරම්භක ගාථා වලින් ධාතුවංසය බව දැක්වෙන අතර අවසාන ගාථා වලින් ලලාට ධාතුවංසය ලෙස හැඳින්වේ (ධම්මරතන හිමි, 2009).

5. නමුත් ශ්‍රී බුද්ධදත්ත හිමිට අනුව (1966) එහි ඇති එක් ගාථාවකින් පෙර ලියූ වංසකතාවක් තිබුණු බව කියැවේ.

6. ග්‍රන්ථකාරක ආචාර්යවරුන්ගේ නම් දැක්වෙන පිටු 26 කින් යුතු කුඩා ග්‍රන්ථයක් වන අතර දාහත්වන සියවසේ දී පමණ (විමලවංස හිමි, 2013), බුරුමයේ නන්දපඤ්ඤ නැමැති තෙරුන් වහන්සේ විසින් ලියන ලද බව කියැවේ (ශ්‍රී බුද්ධදත්ත හිමි, 1966). 1886 දී එංගලන්තයේ පාලි පොත් සමාගම් සඟරාවේ පළව ඇති අතර ඇතැම් කරුණු පිළිගත නොහැකි බව ශ්‍රී බුද්ධදත්ත හිමියන් පවසයි (1966). ධම්මරතන හිමියන්ට (2009) අනුව ත්‍රිපිටකයට අයත් මූලික ග්‍රන්ථ වෙන වෙනම බෙදා කර්තෘ, කාලය ආදිය ද සහිතව අටුවා ටීකා පිළිබඳ විවරණයක් කර ඇති අතර ත්‍රිපිටක ධර්ම සාහිත්‍යයේ ඉතිහාසය අධ්‍යයනය කරන්නන් හට වඩාම ප්‍රයෝජනවත් වේ.

7. බු. ව. 2406 දී පමණ බුරුමයේ පඤ්ඤසාමි කවිධජ මහතෙරුන් විසින් බුරුම බසින් තිබුණු ශාක්‍යවංසය පාලියට නැගීමෙන් සම්පාදනය වුවකි. 1897 දී එංගලන්තයේ දී මුද්‍රණය වී ඇති බුරුම බසින් ලියූ සාසනවංස දීපිකාවක් ඇතත් එය විදේශිකයන්ට ප්‍රයෝජනයට ගත නොහැකි නිසා පාලි භාෂාවෙන් ද එය ලියූ බව සඳහන් වේ (ශ්‍රී බුද්ධදත්ත හිමි, 1966).

8. මහාවංසය, මෙම වෙන්වීම ගැන සඳහන් කරතත් ධම්මරුචි නිකාය ගැන සඳහනක් නොකරන අතර ඒ බව පැහැදිලි වන්නේ නිකාය සංග්‍රහයෙන් සා හියුං සාං හිමියන්ගේ වාර්තා වලිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ

අභයගුණවර්ධන, (1993)

කරුණාදාස, වයි. (n.d.). බුදු සමය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයඃ ඓතිහාසික පසුබිම හා වර්තමාන පරිමාණය. පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රථම උපාධි ප්‍රදානෝත්සවයේ දී පැවැත්වූ දේශනය.

ගයිගර්, විල්හෙල්ම්. (1969). මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය. කොළඹඃ ගුණසේන.

ධම්මරතනහිමි, උතුරාවල. (2009). පාලි සාහිත්‍යය ඉතිහාසය (1)ඃ වංස කථා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මහාවංසය. (2015). දෙවන සිංහල සංසංකරණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රාහුල හිමි, වල්පොල. (1962). ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය: අනුරාධපුර යුගය. කොළඹ: ගුණසේන.

විමලවංස හිමි, බද්දේගම. (2013). බෞද්ධ සාහිත්‍යය. සංශෝධිත මුද්‍රණය. කොළඹ: සමයවර්ධන.

සෝමදාස, කේ. ඩී. (1959). ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය: ප්‍රථම භාගය. කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

ශ්‍රී බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1960). ථෙරවාද බෞද්ධ දර්ශනය ප්‍රථම හා දෙවන භාගය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ශ්‍රී බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1966). පාලි සාහිත්‍යය (සම්පූර්ණ පොත). කොළඹ: රත්න.

මලලසේකර. (1965)

හරතසිංහ. (1948)

පියදස්සි හිමි. (2009)

වෙත්තමුණි. (2009)

## References

Belanger, Claude (2006). Anaysing and historical document. http://faculty.marianopolis.edu/c.belanger/quebechistory/howtoanal yzean historicaldocument

Berkwitz, (2007).

Copelston, R.S. (1892). The verification of the ancient chronicles and histories of Ceylon. *Journal of Royal Asiatic Society* (C.B.). XII, 43. pp. 162-172.

Frank, R.O. (1907). Dīpavamsa and Mahāvamsa in Wiener Zeitschrift für die kunde des Morgenlandes in: Perera, Frank (1979). The early

Buddhist historiography of Ceylon. PhD Thesis. University of Gottingen, Germany.

Geiger, Wilhelm. (1930). The trustworthiness of the Mahavamsa. *The Indian Historical Quarterly*. VI (2). pp. 205-228.

Geiger, Wilhelm. (1969). The Mahavamsa as the greatest chronicle of Ceylon. Colombo. Ceylon Government Information Departement.

Hazra, Kanai Lal. (1981). History of Theravada Buddhism in south East Asia with Special reference to India and Ceylon. New Delhi. Munshilal Manoharlal.

Jayawardhana, Somapala. (1991/1992). Ven.Vacissara: the author of Thupavamsa, *Journal of the Royal Asiatic Society,* 36.pp. 154-156.

Lassen, C. (1847-1861). Indische Alterthuskunde, 4 vols. Bonn. In: Perera, Frank (1979). The early Buddhist historiography of Ceylon. PhD Thesis. University of Gottingen, Germany.

Mndis, G.C. (1930). An historical criticism of the Mahavamsa. Unpublished thesis submitted to Univeristy of London. In: Perera, Frank (1979). The early Buddhist historiography of Ceylon. PhD Thesis. University of Gottingen, Germany.

MHMC, (Montreal Holocaust Memorial Centre) (2012). Exploring the evidence: the Holocaust, Cambodian Genocide and Canadaian Intervention: Critical analysois of a historical source. http://www.mhmc.ca/media_library/files/50ca46cfe202b.pdf

Perera, Frank. (1979). The early Buddhist historiography of Ceylon. PhD Thesis. University of Gottingen, Germany.

Skilling, Peter. (1997). The advent of Theravada Buddihism to Mainland South-East Asia, Journal of the International Association of Buddhist Studies. Vol. 20 (1). pp. 93-108.

Smith, D.E. (1920). South Asian politics and religion.

Taylor, Molly et. al. (2016). How to analyse a primary source. https://apps.carleton.edu/curricular/history/resources/study/primary/

Windisch, E. (1917-1920). Geschichte der Sanskrit – philology und indischen Altertumskunde, 2 vols. Strassburg. (Grundriss der Indo-Arischen Philologie und Altertumskunde I, 1b) in: Perera, Frank (1979). The early Buddhist historiography of Ceylon. PhD Thesis. University of Gottingen, Germany.

# සිව්වැනි කාර්මික විප්ලවය සමයේ අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ භූමිකාව පිළිබඳ විමර්ශනාත්මක ඇගයුමක්

අයි. ඩී. කේ. එල්. ප්‍රනාන්දු,

## සංක්ෂේපය

සිව්වන කාර්මික විප්ලවයේ කුඨප්‍රාප්තියත් සමඟින් මානව තොරතුරු අවශ්‍යතා මෙන්ම ගෝලීය තොරතුරු පරිසර පද්ධතියෙහි මායිම් පුළුල් වීමේ අවශ්‍යතාව නූතන සමාජයේ අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. වත්මන් ව්‍යාපාරික ලෝකය, ව්‍යවසායකයින්, සේවා සපයන්නන් ආදී ව්‍යාපාරික පරිසර පද්ධතියේ (Business Ecosystem) සියලු පාර්ශවකරුවන් මෙන්ම, තොරතුරු සන්නිවේදනයේ පාර්ශවකරුවන් මෙකී සිව්වැනි කාර්මික විප්ලවයත්, එහි බලපෑමත් පිළිබඳව ඉතා සංවේදීව කටයුතු කරයි. "අධ්‍යයන පුස්තකාලය විශ්වවිද්‍යාලයේ හදවතයි" යන්න, වර්තමාන පාඨක අරමුණු හමුවේ තවදුරටත් එසේ නොවන අතර, "ශාස්ත්‍රීය පුස්තකාල තවදුරටත් ප්‍රධාන තොරතුරු සපයන්නා ලෙස ඒකාධිකාරී පාලනය භුක්ති විඳින්නේ ද නැත. වෘත්තිය වශයෙන්, අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය යනු මෑත අතීතයේ අධ්‍යයන පුස්තකාලවල පරිවර්තනය පිළිබිඹු කරන වේගයෙන් වෙනස් වන වෘත්තියක් ලෙසින් හඳුනාගෙන ඇත. එබැවින් සීඝ්‍ර ලෙස වෙනස්වන තොරතුරු පරිසර පද්ධතියේ සාධකත්, ගෝලීයකරණය තුළින් මතු වූ තර්ජනාත්මක සාධකත් හමුවේ අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ භූමිකාව කෙසේ විය යුතු ද යන්න තිරසාර පුස්තකාල සංවර්ධනාත්මක දෘෂ්ටිකෝණයක් තුළින් මෙම විවරණය මතුකර දක්වයි. එබැවින් කිසියම් රටක මනාපැවැත්ම සඳහා වැදගත් මෙහෙයක් සපුරාලන අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ නූතන භූමිකාව පිළිබඳව සැකැවින් විග්‍රහ කිරීම මෙම ලිපියෙහි මූලික අරමුණ වේ.

**යොමු පද:** සිව්වැනි කාර්මික විප්ලවය, අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය, අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ පරිණාමය, අධ්‍යයන පුස්තකාලය, තිරසාර පුස්තකාල සංවර්ධනය

## හැඳින්වීම

සිව්වැනි කාර්මික විප්ලවය යන සංකල්පය, ලෝක ආර්ථික සංසදයේ (World Economic Forum) නිර්මාතෘ හා විධායක සභාපති වන ක්ලවුස් ෂ්වාබ් (Klaus Schwab) විසින් නිර්මාණය කරන ලද්දකි. Schwab (2016) ට අනුව, මෙහි ''විප්ලවය'' යන වචනයෙන් අදහස් කරන්නේ හදිසි හා රැඩිකල් වෙනසකි. ලෝක ඉතිහාසය පුරාවට ම විවිධ යුගයන් හි කාර්මීකරණය තුළින් විප්ලවීය මෙන්ම ගෝලීය සමාජ-ආර්ථික වපසරියේ විවිධ වෙනස්කම් ඇති කොට ඇත. එය, මානව ජීවන රටාව, කාර්මික නිෂ්පාදනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති වල පොදු ක්‍රම, භෞතික, ඩිජිටල් සහ ජීව විද්‍යාත්මක පරිසරය තුළ විශාල වශයෙන් වෙනස්කම් සිදු කරන ක්‍රියාකාරී සාධකයක් බවට පත්ව ඇත (Schwab, 2016). පළමු කාර්මික විප්ලවය, අපගේ ජීවිත ආර්ථිකය, ගොවිජන හා හස්ත කර්මාන්ත ආර්ථිකයේ සිට කර්මාන්ත හා යන්ත්‍ර නිෂ්පාදනයෙන් ආධිපත්‍යය දැරූ යුගයක් දක්වා වෙනස් කළේය. දෙවන කාර්මික විප්ලවය තුළ තෙල් හා විදුලිය මහා පරිමාණ නිෂ්පාදනයට යොදා ගනිමින් සමාජීය ක්‍රියාවලීන් පහසු කරගන්නා ලදී. තෙවන කාර්මික විප්ලවයේ දී නිෂ්පාදනය ස්වයංක්‍රීය කිරීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරන ලදී. මෙසේ ක්‍රමිකව කාර්මීකරණයත් සමග සිදු වූ නව තාක්ෂණයන් හා නව ක්‍රමයන් ලෝකයට හඳුන්වා දීම තුළ, සමාජ ව්‍යුහයේ හා ආර්ථික පද්ධතිවල ප්‍රබල වෙනස්කම් සිදුකිරීම ඇති කරනු ලැබී ඇත. (Schwab, 2016).

සෑම කාර්මික විප්ලවයක්ම බොහෝවිට වෙනම සිදුවීමක් ලෙස සලකනු ලැබුව ද, ඒවා එක්ව, ඊට පෙර විප්ලවයේ නවෝත්පාදනයන් මත පදනම් වූ සිදුවීම් මාලාවක් ලෙස වඩා හොඳින් වටහා ගත හැකිය (Ahmat & Adauwiyah Abu Hanipah, 2018). කෙසේ වෙතත්, සිව්වැනි කාර්මික විප්ලවයේ විෂය පථය පූර්ව කාර්මීකරණයන්ට වඩා පුළුල් සංකල්ප ඔස්සේ පැතිරී ඇත. ඒවා නවීන ජාලගත යන්ත්‍ර සහ පද්ධතීන් භාවිතය ප්‍රචලිත වීමත් සමඟ මානව අවශ්‍යතා වෙනස් වීම මගින් එකී සංකීර්ණත්වය ලබාගෙන ඇත. නව තාක්ෂණයන් බිහි වීම සහ ඒවා අතර අන්තර්ක්‍රියා භෞතික, ඩිජිටල් සහ ජීව විද්‍යාත්මක ඒකක ඔස්සේ පැතිරෙමින් සිව්වැනි කාර්මික විප්ලවය පෙර විප්ලවයන්ට වඩා වෙනස් මුහුණුවරක් ගනු ලැබීය.

මෙම විප්ලවීය පරිසරය තුළ නැගී එන තාක්ෂණයන් සහ ඒ මත පදනම් වූ පුළුල් නවෝත්පාදනයන් පෙර පැවති ඒවාට වඩා වේගයෙන් හා පුළුල් ලෙස වෙනස්වීමේ ලක්ෂණ පෙන්නුම් කරයි. මෙහි ඍජු බලපෑමක් ලෙස, පුද්ගලයන් තම ජීවිත සක්‍රීය කිරීමට සහ කළමනාකරණය කිරීමට ජාලගත තාක්ෂණය (Network Technologies) භාවිතයෙන් ඩිජිටල් වසම් (Digital Domains) සහ නොබැඳි යථාර්ථය (Offline Reality) අතර ගමන් කරන ලෝකයක් නිර්මාණය කර ගනිමින් පවතී. ප්‍රමුඛ පර්යේෂකයන් තර්ක කරන්නේ සිව්වන කාර්මික විප්ලවය රජය සහ ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම තුළින් අනාගතය හැඩගස්වනු ඇති බවයි (Xu, M. David, & Hi Kim, 2018). ගෝලීය තොරතුරු තාක්ෂණය හා පුස්තකාල සේවාවන් මෙසේ සීඝ්‍ර ලෙස පරිණාමනය වන සමාජයක් වෙත පිරිනැමීම සැබවින්ම අභියෝගාත්මක කර්තව්‍යයකි.

ලෝකයේ පුස්තකාල පරිණාමයේ පසුගිය අර්ධ දශකයක පමණ යුගය පිළිබඳ සැලකීමේ දී, Ahmat & Adauwiyah Abu Hanipah (2018) පෙන්වා දෙන පරිදි බක්ලන්ඩ්, ගොර්මන් සහ ගොර්මන් (1992) විසින් ඉදිරිපත් කළ තුන් පියවර ආකෘතිය වැදගත් වේ . ඔහුට අනුව;

i. පළමුවෙන්ම, කඩදාසි අඩුවෙන් භාවිත කිරීමට පටන් ගත් පුස්තකාලවල ස්වයංක්‍රීයකරණ පද්ධතියක් ඇතිවීම දැක්විය හැක. එය 1960 දශකයේ අග භාගයේ යන්ත්‍ර කියවිය හැකි නාමාවලි (MARC) සංවර්ධන ක්‍රියාවලිය සමඟ ආරම්භ විය. 1990 ගණන්වල පුස්තකාලවල මාර්ගගත පොදු ප්‍රවේශ නාමාවලිය, එසේත් නැතිනම් මාර්ගගත සූචිය (Online Public Access Catalogue - OPAC) සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පද්ධති මෙන්ම මුද්‍රිත පූර්වගාමීන් වෙනුවට වෙබ් පාදක දර්ශක ඇති කිරීම පිළබඳව වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් අතර පුළුල් ලෙස සාකච්ඡා ආරම්භ විය.

ii. දෙවනුව, සංයුක්ත තැටි, පූර්ණ-පෙළ දත්ත සමුදායන්, අන්තර්ජාලය සහ වෙබ් අඩවි සංවර්ධනය කිරීමත් සමඟ 1990 දශකයේ මුල් භාගයේ ආරම්භ වූ විද්‍යුත් පුස්තකාලවල ආධිපත්‍යය ඇතිවිය. මෙම යුගය තුළ, 1960 දශකයේ සිට භාවිත කරන ලද සමහර ස්ථාපිත තාක්ෂණය කඩාකප්පල් (Disruption) වෙමින් පැවතුණි. නිදසුනක්

ලෙස, කැසට් පටිවල ගබඩා කර තිබූ ප්‍රතිසම ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් මගින් ප්‍රතිස්ථාපනය කිරීමට ඇරඹුනු අතර මාධ්‍ය තොරතුරු අන්තර්ජාලය තුළ වඩාත් පහසුවෙන් ලබා ගත හැකි හා ලාභදායී සේවාවක් බවට පත්විය.

iii. තෙවනුව, තාක්ෂණයේ දියුණුවත් සමඟ, වඩාත් සංකීර්ණ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා හා වඩා වැඩි වේගයකින්, කාර්යක්ෂමතාවයකින් ක්‍රියා කිරීම සඳහා තාක්ෂණය යොදාගැනීම සිදුවුණි. නව තාක්ෂණික මෙවලම් නිර්මාණය කරමින් දත්ත, වදන්, ශබ්දය සහ රූප සැකසීම සඳහා ප්‍රබල විශේෂාංග උපයෝගී කරගැනීම ද එම දත්ත හා තොරතුරු වේගයෙන් හා කාර්යක්ෂම ලෙස දුරස්ථ පාර්ශවයන්ට සපායාදීම තුළ අන්‍යෝන්‍ය සහයෝගීතාවන් වැඩිදියුණු විය.

මින්පසු එළැඹෙනුයේ මෙකී සිව්වැනි කාර්මික විප්ලව යුගයයි. එහි බලපෑමක් ලෙස තොරතුරු මූලාශ්‍ර අලුතින් හඳුන්වාදීමත් එසේ නව තොරතුරු හා එකී මූලාශ්‍ර සමාජකරණයේ සීඝ්‍රතාවය ඉහළ වීමත් නිසා, බොහෝ සාම්ප්‍රදායික තොරතුරු ආයතනයන්හි (Conventional Information Centers) භූමිකාවේ මායිම් වෙනස් වීම ඇරඹීම නොවැළැක්විය හැකි වී තිබේ (Knight, 2017). මෙසේ සීඝ්‍ර ලෙස වෙනස්වන තොරතුරු සමාජ වපසරික, විශ්වවිද්‍යාලයක් වැනි නිරතුරු වෙනස්වන තොරතුරු අවශ්‍යතා ඇති උසස් අධ්‍යාපනික ආයතනයන්හි පුස්තකාලාධිපතිත්වය සාකච්ඡාවට ගැනීම ඉතා කාලීන මෙන්ම අත්‍යවශ්‍ය කර්තව්‍යයක් බව පෙනීයයි. එබැවින් වෙනස්වන තොරතුරු අවශ්‍යතා ඇති සිව්වැනි කාර්මික විප්ලව සමයේ උසස් අධ්‍යාපනික ආයතනයන්හි පුස්තකාලාධිපතිත්වයේ භූමිකාව කෙසේ වෙනස්විය යුතු ද යන්න පිළිබඳ සොයාබැලීම මෙම විමර්ශනාත්මක අධ්‍යයනයේ අරමුණයි.

## අධ්‍යයන පුස්තකාලය

අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය යන්න හැඳිනීමට පළමුව, අධ්‍යයන පුස්තකාලයක් යන්න හැඳිනගැනීම වැදගත් වේ. අධ්‍යයන පුස්තකාලය යන්න විවිධ කර්තෘන් විසින් විවිධාකාරයෙන් නිර්වචනයට බඳුන් කර ඇත. Curzon & Quinonez-Skinner (2010) විසින් හඳුන්වා දී ඇති පරිදි, "


අධ්‍යයන පුස්තකාල සෑමවිටම පාහේ උසස් අධ්‍යාපන ආයතනයක් හා බද්ධව පවතින අතර ඒ සඳහා රජය විසින් හෝ එකී පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයන් විසින් ප්‍රතිපාදන සලස්වනු ලබයි. එසේම මෙම උසස් අධ්‍යාපන ආයතන විසින් විවිධ මට්ටම් වල උපාධි පිරිනැමීම සිදුකරනු ලබයි" (පි. 11). මෙසේ තෘතීය අධ්‍යාපනික මට්ටමේ උපාධි පිරිනමන ආයතනයට අනුබද්ධිත ව පවතින හේතුවෙන් ම, ඇමරිකානු පුස්තකාල සංගමය (American Library Association, 2009) සිය පුස්තකාල වර්ගීකරණයෙහි අධ්‍යයන පුස්තකාල වෙන්ව වර්ගීකරණය කර ඇත. උක්ත වර්ගීකරණයේ දී ඇමරිකානු පුස්තකාල සංගමය විසින් මතු දැක්වෙන ලක්ෂණ අධ්‍යයන පුස්තකාල සතු ව තිබිය යුතු බව දක්වා ඇත;

1. මුද්‍රිත හෝ වෙනත් හෝ මේ දෙවර්ගයෙන්ම සමන්විත වූ පුස්තකාල ද්‍රව්‍ය (කිසියම් වර්ගීකරණයකට අනුව) සංවිධානාත්මකව ගොනුකොට පැවතීම.
2. එසේ තැම්පත්කොට ඇති පුස්තකාල ද්‍රව්‍ය, ගණුදෙනුකරුවන්ගේ තොරතුරු, සංස්කෘතික, විනෝදාත්මක හෝ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම හා අර්ථ නිරූපණය කිරීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩලයක් සිටීම.
3. එකී කර්යය මණ්ඩලය මගින්, සේවාදායකයින්ට සේවා ලබා ගත හැකි ස්ථාපිත කාලසටහනක් පවත්වා ගෙන යාම හා;
4. එවැනි එකතුවක්, කාර්ය මණ්ඩලයක් සහ අධ්‍යයන කාලසටහනකට (Academic Calendar) සහාය වීමට අවශ්‍ය භෞතික පහසුකම් පවත්වා ගෙන යාම යන්නයි.

මෙසේම අධ්‍යයන පුස්තකාලයක පොදු මෙහෙවරක් (Mission) ද දක්වා ඇත. Curzon & Quinonez-Skinner (2010) පෙන්වා දෙන පරිදි,

> ''අධ්‍යයන පුස්තකාලවල පරමාර්ථය වන්නේ එකතුන් නඩත්තු කිරීම, සේවා සැපයීම සහ පරිශීලක අධ්‍යාපනය ලබා දීම තුළින් ඔවුන්ගේ මව් ආයතනයේ අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා සහාය වීමයි. ඉගැන්වීම, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා සහාය ලබා දීම අධ්‍යයන පුස්තකාලවල කේන්ද්‍රීය අරමුණ වේ. පුළුල්, පොහොසත් හා විවිධාකාර වූ පුස්තකාල වලින් පර්යේෂණ හා ඉගැන්වීමේ න්‍යාය පත්‍රය බෙහෙවින් පොහොසත් කර ඇති ඔවුන්ගේ ආයතනවල අධ්‍යයන ව්‍යවසායේ සාර්ථකත්වයට අධ්‍යයන පුස්තකාල අත්‍යවශ්‍ය වේ'' (පි. 11).

ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනය (IFLA, 2019) මගින් ප්‍රකාශිත සංඛ්‍යාලේඛන අනුව, 2019 වසර වනවිට ලොව පුරා අධ්‍යයන පුස්තකාල 78,716 ක් වාර්තා වන අතර වසර 2016 දී ශ්‍රී ලංකාවේ මෙම අගය 59 ක් වී තිබේ (රූපය 1). ගෝලීය අධ්‍යයන පුස්තකාල ප්‍රමාණය 2016 වසරේ දී 17,000 ක් පමණ වන අතර (Curzon & Quinonez-Skinner, 2010) එය වර්තමානය වන විට පස් ගුණයකට ආසන්න අගයක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව සලකා බලන විට, අධ්‍යයන පුස්තකාල ලොව පුරා ව්‍යාප්තව පවතින පොදු සමාජීය අවශ්‍යතාවක් බව ඉස්මතු වේ.




A B

**රූපය 1:** මුළු අධ්‍යයන පුස්තකාල ගණන (A. ලෝකයේ , B. ශ්‍රී ලංකාවේ)
මූලාශ්‍රය: (IFLA World Library Map, 2019)

එසේම අධ්‍යයන පුස්තකාලයක් යනු නිරතුරුව ම නව පර්යේෂණ කටයුතු සඳහා සහාය දක්වන ආයතනයක් සේම එකිනෙකට වෙනස් මෙන්ම බෙහෙවින් සමාන තොරතුරු අවශ්‍යතා ඇති පාර්ශවකරුවන් ගැවසෙන පරිසරයකි. එලෙසින් අධ්‍යයන පුස්තකාලය උසස් අධ්‍යාපන ආයතනයක මූලිකාංගයකි. ඇතැම් විට "අධ්‍යයන පුස්තකාලය විශ්වවිද්‍යාලයේ හදවතයි" යන විරුදාවලියට අධ්‍යයන පුස්තකාලය හිමිකම් දැරුව ද, ඇමරිකානු පුස්තකාල සංගමයේ දුහිතෘ සංගමයක් වන විද්‍යාල හා පර්යේෂණ පුස්තකාල සංගමය (Association of College and Research Libraries, 2010) මගින් හුවා දක්වන පරිදි, "අධ්‍යයන පුස්තකාලය විශ්වවිද්‍යාලයේ හදවතයි" යන්න, එළෙමෙන් පවතින පාඨක අරමුණු හමුවේ තවදුරටත් එසේ නොවන වගයි. Knight, (2017) පවසන පරිදි, "

ශාස්ත්‍රීය පුස්තකාල තවදුරටත් ප්‍රධාන තොරතුරු සපයන්නා ලෙස ඒකාධිකාරී පාලනය භුක්ති විඳින්නේ නැත. අධ්‍යයනායතනය තුළ ඔවුන් දැන් ක්‍රියාශීලීව හා නිරන්තරයෙන් ඔවුන්ගේ පරිශීලකයින් වෙත අවධානය යොමු කිරීම සඳහා තරඟ කළ යුතු කාලය එළඹ ඇත යන්නය” (පි. 294). එබැවින් අධ්‍යයන පුස්තකාලයන්හි සිදුවන හා සිදුවිය යුතු වෙනස්කම් කුමක් ද යන්නත්, එහි විවිධ පාර්ශවකරුවන් හා ඔවුන් උසස් අධ්‍යපන ආයතනයක් තුළින් අපේක්ෂිත අරමුණු කෙබඳු ද යන්නත් දැනුවත්ව සිටීම වත්මන් යුගයේ අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ භූමිකාවේ දිශානතිය නිර්මාණය කරන සාධකයකි.

විද්‍යාල හා පර්යේෂණ පුස්තකාල සංගමය (Association of College and Research Library - ACRL) මගින්, “අධ්‍යයන පුස්තකාලයේ වටිනාකම” මැයෙන් ප්‍රකාශිත ඔවුන්ගේ වාර්ථාවේ ප්‍රධාන පාඨක/පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා අනාවරණය කර ඇත. ඒවා සැකැවින් පහත පරිදි සාරාංශගත කළ හැක.




**රූපය 2:** උසස් අධ්‍යාපනයේ පාර්ශවකරුවන් හා ඔවුන් විසින් උසස් අධ්‍යාපනය මගින් *අපේක්ෂිත අරමුණු*


මූලාශ්‍රයඃ (Association of College and Research Libraries, 2010) හි ඇතුළත් කරුණු මත පදනම් වී කර්තෘ විසින් සම්පාදනය කරන ලදී.

උක්ත රූපයේ දැක්වෙන සමාජීය ප්‍රවාහයන් උසස් අධ්‍යාපන ආයතන තුළින් සේම, එම ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පුස්තකාල මඟින් ද අපේක්ෂා කරන බව සැලකිය යුතුය. එබැවින් පෙර පරිදි අධ්‍යයන පුස්තකාලයේ වටිනාකම් දැන සිටීමට වඩා එම වටිනාකම් පුස්තකාලය තුළින් ප්‍රායෝගිකව පෙන්වා දීමේ වටිනාකම ගෝලීය මට්ටමින් පුස්තකාලයාධිපතිත්වයෙන් අපේක්ෂා කර ඇත (Association of College and Research Libraries, 2010).

මෙපරිද්දෙන් සමාජීය අවශ්‍යතා හා අරමුණු සාක්ෂාත් කරදෙනු වස්, අධ්‍යයන පුස්තකාලයක කාර්යභාරය අතිමහත් වේ. එසේම නූතන අධ්‍යයන පුස්තකාලයාධිපතිවරයාගේ භූමිකාව ස්වකීය සමාජය විසින් නිර්මාණය කරන්නක් වීමත්, එවන් වැදගත් ශ්‍රම සාධකයක් සතුව පැවරෙන වගකීමත් ඉමහත් වේ.

## අධ්‍යයන පුස්තකාලයාධිපතිවරයා

අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය යන්න මොරන් සහ ලෙනාඩ් විසින් නිර්වචනය කොට ඇත්තේ, විවිධ වර්ගවල සහ මට්ටම්වල උසස් අධ්‍යාපන ආයතන සමඟ සම්බන්ධිත පුස්තකාලවල සේවය කරන වෘත්තිකයකු ලෙස ය. එහෙත් ගෝලීය අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය, සෑමවිටම ඉහළ අධ්‍යාපනික සුදුසුකම් සමඟින් තීරණය වන අතර එම අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන් හට සහාය සේවක මණ්ඩලයක් ද එක්වී ඇත (Moran & Leonard, 2010). අධ්‍යයන පුස්තකාලවල කාර්ය මණ්ඩලයේ සේවය කරනු ලබන්නේ පුද්ගලයන්ගේ මිශ්‍රණයක් වන අතර පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන්ගේ සමස්ථය, මුළු සේවක සංඛ්‍යාවට සාපේක්ෂව කුඩා අගයකි (Curzon & Quinonez-Skinner, 2010). ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනය (IFLA, 2019) පෙන්වාදෙන පරිදි ගෝලීය අධ්‍යයන පුස්තකාල කාර්ය මණ්ඩල සංයුතිය 3 රූපය පරිදි වේ.




**රූපය 3:** පූර්ණ කාලීන පුස්තකාල සේවා නියුක්තිය (ගෝලීය)

මූලාශ්‍රය: (IFLA World Library Map, 2019)

මේ අයුරින්, පරිපාලන හා උපකාරක කාර්ය මණ්ඩල වල සහය ලබා දෙමින් අධ්‍යන පුස්තකාලයාධිපතීන්ගේ වෘත්තීය අවධානය වඩා ඵලදායීකරණයට නූතන සමාජය කටයුතු සම්පාදනය කොට ඇත. එකී වෘත්තීය රාමුවක් තුළ අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය වන දැනුම නිර්මාණය කරනු ලබන ක්‍රියාවලියේ මූලික ඒකකයක් බවට ද ලෝකය විසින් පිළිගෙන ඇත.

## නූතන අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ අපේක්ෂිත සංක්‍රමණය

පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සංස්කාරකවරයකු හා සුප්‍රකට රචකයකු වූ බෘස් රොසෙන්ස්ටයින්ගෙන් විශ්වවිද්‍යාල අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳව කළ විමසුමක දී ඔහු පහත පරිදි අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය විග්‍රහ කොට තිබුනේ මතු දැක්වෙන භූමිකා අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය සතුවිය යුතු බවත් මේවා එම ක්ෂේත්‍රයේ නවමු අවශ්‍යතා බවත්ය (Rosenstein, 2014). Rosenstein (2014) හා

Vassilakaki (2015) ට අනුව අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ නූතන භූමිකා සයකි, එනම්;

1. ගුරුවරයකු ලෙස (Librarian as a Teacher)
2. තාක්ෂණික විශේෂඥයෙකු ලෙස (Librarian as a Technical Specialist)
3. අධ්‍යයන පීඨය හා කාවැදුනු කොටස්කරුවකු ලෙස (Embedded Librarian)
4. තොරතුරු උපදේශකයෙකු ලෙස (Information Consultant)
5. දැනුම් කළමනාකරුවකු ලෙස (Knowledge Manager)
6. විෂය පුස්තකාලයාධිපතිවරයකු ලෙස (Subject Librarian)

අධ්‍යයන, පාසල් සහ මහජන පුස්තකාලයාධිපතිවරුන් පොදුවේ ගත් කල, ඔවුන් සියළුදෙනා සඳහා අඛණ්ඩ අධ්‍යාපන කාර්යභාරයක් පවතී. මෙකී ඉගෙනුම් භූමිකාව (වගකීම) ඉගැන්වීමේ පුස්තකාලයාධිපති සහ උපදේශන පුස්තකාලයාධිපතිත්වය වැනි යෙදුම් මඟින් හැඳින්විනි. ප්‍රධාන වශයෙන්ම මෙම වෘත්තිකයන් තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සඳහා වගකිව යුතු අතර අනෙක් ගුරුවරුන්ට ඉගැන්වීම සහ ඉගෙනුම් සඳහා සහාය දීම ද අපේක්ෂා කෙරේ.

තාක්ෂණික විශේෂඥයෙකු ලෙසින් පුස්තකාලයාධිපතිවරුනට ආයතනික නිධි (Institutional Repositories), ඩිජිටල්/ සංඛ්‍යාංක පුස්තකාල, පුස්කාල වෙබ් අඩවි, ස්වයංක්‍රීය පුස්තකාල සේවාවන්, පුස්තකාල කළමණාකරණ පද්ධති නිර්මාණ සහ නඩත්තු කරගෙන යාම මෙකී තාක්ෂණික වගකීම් අතරින් සමහරකි. ආයතනික නිධිය පිහිටුවීම මඟින් විශ්වවිද්‍යාලයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ නව පර්යේෂණ, නිමැවුමේ ආදියේ දෘශ්‍යතාව (Visibility) වැඩිකිරීම, ලබාගැනීමේ හැකියාව (Accessibility) ඉහල දැමීම මෙන්ම සුලභතාවය (Availability) ඇති කිරීම සේම ස්වයං ලේඛනාගාරයන් (Self-Archiving) පිළිබඳ කතුවරුන් පුහුණු කිරීම ද මේ යටතට ගැනේ. ඇතැම් උසස් අධ්‍යපනික පුස්තකාලයන් හි මෙතෙකින් ඔබ්බට යන තාක්ෂණික දැනුමක් පවා පුස්තකාලයාධිපතිවරුන්ගෙන් අපේක්ෂා කළ හැක. එවන් අවස්ථාවන්හි දී එකී තාක්ෂණික අවශ්‍යතා

සපුරාලීම තුල, පුස්තකාලයාධිපතිත්වය තාක්ෂණික විශේෂඥයෙකු ලෙසින් එම ආයතනයට අත්‍යවශ්‍ය චරිතයක් බවට පත්වේ.

මෑත වසරවල වැඩි වැඩියෙන් ජනප්‍රිය වී ඇති ආකෘතියක් (Model) වනුයේ, අධ්‍යයන පීඨය හා කාවැදුනු කොටස්කරුවකු ලෙස (Embedded Librarian) පුස්තකාලයාධිපතිවරුන් කටයුතු කිරීමයි (Vassilakaki, 2015). පුස්තකාලයාධිපතිවරුන් මෙහි ප්‍රධාන වශයෙන් සාකච්ඡා කරනුයේ අධ්‍යයන අංශ හා පීඨයේ පාඨමාලා සමඟින් පුස්තකාලය සම්බන්ධ වීමයි. පුස්තකාලවල සන්දර්භය තුළ පීඨයේ අවශ්‍යතා ගවේෂණය, පුස්තකාල දිශානතිය නිර්ණය කිරීම, පාඨමාලා ආශ්‍රිත පුස්තකාල සම්පත් වෙත ප්‍රවේශය, පන්ති මට්ටමින් උපදෙස් සැසි පැවැත්වීම, තොරතුරු සාක්ෂරතා පාඨමාලා පැවැත්වීම, මාර්ගගත (අන්තර්ජාලය ආශ්‍රිත තොරතුරු සේවාවන් හා දැනුවත් කිරීම් ලබා දීම, හා පුස්තකාලයත් එහි සියළු සේවාවන් පිළිබඳ උපදේශාත්මක අත්පත්‍රිකා, නිවේදන, ලේඛන සකසා බෙදා දීම ආදිය තුළින් පීඨ ක්‍රියාවලි සමඟ බද්ධව කටයුතු කිරීම වැනි ක්‍රියාකාරකම් අපේක්ෂා කරයි (Vassilakaki, 2015). මීට අමතරව පීඨයේ පොදු කටයුතු, සුභ සාධක ක්‍රියාවන් හා වෙනත් සාමාජීය කටයුතු හා සම්බන්ධ වීම ද ඉතා වැදගත් වේ. මෙතුලින් පීඨය හා ඉතා සුහදව හා සමීපව කටයුතු කරනා අත්‍යවශ්‍ය පිරිසක් බවට පුස්තකාලය හා එහි කාර්ය මණ්ඩලය නිරායාසයෙන්ම පත්වේ.

තොරතුරු උපදේශකයෙකු ලෙසින් පුස්තකාලයාධිපතිවරයා අධ්‍යයන පුස්තකාල සහ ව්‍යාපාර යන දෙකම ආවරණය කරයි. ව්‍යාපාර තුළ, පුස්තකාලයාධිපතිවරුන්ට ''විශේෂ තොරතුරු දඩයම්කරුවන්'' (Special Information Hunters) වැනි භූමිකාවක් භාර ගැනීමට සිදුවිය හැක. එසේම ව්‍යාපාර අංශයේ තොරතුරු උපදේශකයින් වශයෙන් පුස්තකාලයාධිපතිවරුන්ගේ සහාය සමාජයට අවශ්‍ය වේ. නවෝත්පාදනයන් පෝෂණය කිරීම, අභ්‍යන්තර හා බාහිර තොරතුරු සඳහා ප්‍රවේශය සැපයීම සහ තොරතුරු ඒකාබද්ධ කිරීම වැනි කටයුතුවල දක්ෂතා පෙන්වීම තුළ තොරතුරු උපදේශකයෙකු ලෙසින් පුස්තකාලයාධිපතිවරයා අධ්‍යයන ආයතනයන්ට සිය දායකත්වය දක්වයි.

Rosenstein (2014) විසින් දක්වන පරිදි, දැනුම කළමණාකරුවන්ගේ කාර්ය ප්‍රවාහය සැලකූ කල, අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන් තොරතුරු උපදේශක භූමිකාව අනුගමනය නොකළේ නම් ඔවුන්ගේ වෘත්තීන් වත්මන් තොරතුරු පරිසර පද්ධතියේ අවදානමට ලක්වන බවයි. ඉගැන්වීමේ හා පර්යේෂණයේ වේගවත් වෙනස්කම් තුළ දැනුම සහ දැනුම කළමනාකරණය යන යෙදුම් වටා ඇති අවිනිශ්චිතතාව සහ ව්‍යාකූලත්වය මෙයට හේතුවකි. කැනේඩියානු සමාගමක් විසින් තොරතුරු වෘත්තිකයන් සමඟ කළ සමීක්ෂණයකට අනුව අනාවරණය වූයේ එම රටේ දැනුම කළමනාකරණ වැඩසටහන් සම්බන්ධ ආයතන, සංවිධාන හා තොරතුරු වෘත්තිකයන්, එම ආයතන මට්ටමින් ජනනය කරනා තොරතුරු වල, තොරතුරු සැකැස්ම (Information Architecture) සැලසුම් කිරීම, තොරතුරු වර්ගීකරණ ක්‍රම සංවර්ධනය පිළිබඳ පූර්ණ වගකීම දැරිය යුතු බවයි (Rosenstein, 2014 හා Vassilakaki, 2015). මෙමගින් පැහැදිලි වන්නේ, ව්‍යාපාර, විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතනවල නිපදවන ලද දැනුම, තොරතුරු කළමනාකරණය කිරීමේ පූර්ණකාලීන නියෝජනය හා වගකීම් පුස්තකාලයාධිපතිවරුන් වෙත පැවරෙන බවයි.

Rosenstein (2014) විසින් පෙන්වන පරිදි, වෙනස්වන වගකීම් අවධාරණය කළ අතර විෂය පුස්තකාලයාධිපතිවරුන් විසින් කළ යුතු නව කාර්යභාරයන් ලෙස, ගුරුවරුන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සමඟ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම, පරිශීලකයින්ට සේවා සැපයීමේ නව ක්‍රම අනුගමනය කිරීම, තොරතුරු සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම, තොරතුරු සම්පත් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම, විෂයට අදාළ පීඨය සමග බැඳී කටයුතු කිරීම, අතථ්‍ය ඉගෙනුම් පරිසරයන් (Virtual Learning Environment) තුළ විෂය පුස්තකාලයාධිපතිවරුන් සම්බන්ධ වී කටයුතු කිරීමේ විශේෂ අවශ්‍යතාව මෙහි දී සාකච්ඡා වේ.

එක් පුස්තකාලයක පුස්තකාලයාධිපතිවරුන් තනිවම හෝ කණ්ඩායම් වශයෙන් ඔවුන් අභිමුව ඇති මෙකී අභියෝගයන්ට මුහුණදීම අතිශය දුෂ්කර කාර්යභාරයක් වේ. කෙසේ වෙතත්, වත්මන් දැනුම කේන්ද්‍ර කරගත් ලෝකයේ, අතීතයට වඩා අනාගතය සමඟ පෙළගැසීම වඩාත් සුදුසු බවත්, ඒ සඳහා පුස්තකාලයාධිපතිත්වය සතුව ඉහත කාර්යාවලීන්ගේ ශක්‍යතාවය,

නිපුණ බව හා වැඩිදුර ඉගනුම ද අනිවාර්ය වන බවත් විවිධ කතුවරුන් විසින් අවධාරණය කොට ඇත.

වෘත්තිමය වශයෙන්, අධ්‍යයන (ශාස්ත්‍රීය) පුස්තකාලයාධිපතිත්වය යනු මෑත අතීතයේ අධ්‍යයන පුස්තකාලවල පරිවර්තනය පිළිබිඹු කරන වේගයෙන් වෙනස් වන වෘත්තියක් ලෙසින් Moran & Leonard (2010) විසින් හඳුන්වා ඇත. තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ විවිධ පර්යේෂකයන් විසින් මෙකී වෙනස් වීම විවිධ ගවේශණයන් ඔස්සේ ලොවට අනාවරණය කර දී තිබේ. වේගවත් තාක්ෂණික දියුණුව නිසා භාවිතා වන දත්ත හා තොරතුරුවල ප්‍රමාණයත්, විවිධත්වයත් වැඩි වී තිබේ. මෙකී වෙනස පුස්තකාලයාධිපතිවරුන්ට ඔවුන්ගේ භූමිකාවන් වෙනස් කරගැනීමට නිරතුරුවම පෙළඹවීමක් ඇති කර ඇත. වැඩිවන ඉගෙනුම් කළමනාකරණ පද්ධතිවල ජනප්‍රියතාව, පර්යේෂණ සන්නිවේදනය කිරීමේ නව ක්‍රම සහ විද්‍යාත්මක ප්‍රකාශනවල පරිවර්තනය ද පුස්තකාලයාධිපතිවරු ඉදිරියේ නව අභියෝග ගොන්නට ඇතුළත් වී තිබේ (Vassilakaki, 2015). එබැවින්, නව ලොව විසින් අධ්‍යයන පුස්තකාලයාධිපති භූමිකාව සේවා සපයන්නන් ලෙස නොව,

1. විශේෂඥයින් (Specialists),
2. පර්යේෂකයින් (Researchers) සහ
3. සහයෝගීතාකරුවන් (Collaborators)

ලෙසින් වෘත්තීමය සංක්‍රමණයට ලක්කරමින් සිටී (Hart, 2018). මෙහි දී පුස්තකාල විඥාපන හා තොරතුරු තාක්ෂණික විෂයන්ගෙන් ඔබ්බට විහිදුනු නවමු විෂය ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් අපේක්ෂා කරයි. මෙවන් සමහරක් ක්ෂේත්‍ර ලෙස, පාර-දත්ත (Meta Data), භූගෝලීය තොරතුරු විද්‍යාව (Gographical Information Sciences - GIS), ඉංජිනේරු තොරතුරු, රසායනික තොරතුරු, ඩිජිටල් මානව ශාස්ත්‍ර (Digital Humanities) වැනි විශේෂඥ ක්ෂේත්‍ර හඳුනා ගෙන ඇත (Hart, 2018).

ඉහත සියලු ක්ෂේත්‍රයන්හි සම-දායකයකු ලෙසත්, ඍජු කොටස්කරුවකු ලෙසත් සම්බන්ධ වන පුස්තකාලයාධිපතිවරයා, නව දැනුම නිර්මාණ

කාර්යයේ, එසේත් නොමැතිනම් පර්යේෂණ ක්‍රියාවලියට ද දායක වීම සිදුකරයි. පුස්තකාලයාධිපතිවරයා ස්වකීය විශේෂඥ ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ තුළින් පුස්තකාල විද්‍යා හා තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍ර නව දැනුමින් පෝෂණය කරන අතර ම, ඔවුන් අනුබද්ධිත උසස් අධ්‍යාපනික ආයතන වල විශාල ලෙසින් සිදුකරගෙන යනු ලබන පර්යේෂණයන්ට ද දායක වේ. එයින් සමහරක් නම්, දැනුම නිර්මාණය කිරීම කාර්යාවලියට තොරතුරු සම්පත්, මූලාශ්‍ර සහ සේවා කළමනාකරණයට, ඉගැන්වීම, තොරතුරු සාක්ෂරතාවය, දත්ත කළමනාකරණය, විෂයාන්තර පර්යේෂණ, තොරතුරු විද්‍යාව පිළිබඳ ඇති දැනුම යෙදවීම ද ඇතුළත් වේ (Hart, 2018). උසස් අධ්‍යාපනික වපසරියක් තුළ නව දැනුම නිපදවීමේ කර්තව්‍ය සාර්ථක ලෙස සිදුකරනු වස්, පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟින් ඉතා සුහදව මෙන්ම සමීපව කටයුතු කළ යුතු වේ. විෂයමාලා සම්පාදනය, ඒවා සංස්කරණය මෙන්ම විෂයමාලා සමාලෝචනය කිරීමේ දී එම උසස් අධ්‍යාපන ආයතනයේ පුස්තකාලයාධිපතිවරයා ද සම්බන්ධ වී සිටීම අපේක්ෂා කරයි (Hart, 2018; Vassilakaki, 2015). මෙපරිද්දෙන් අධ්‍යයන පුස්තකාලයාධිපති භූමිකාව තවදු පුළුල් වේ. මෙය පුස්තකාලයාධිපතිවරුන් පීඨය හා කාවැදී කටයුතු කිරීමක් (Embedding Librarians to the Faculty) ලෙස හැඳින්වේ. එය අදාළ ආයතනයේ දියුණුවට මෙන්ම, ගෝලීය දැනුම් වපසරිය ප්‍රසාරණය කිරීම තුළින් ගෝලීය සංවර්ධනයට ද දායක වේ. මෙවන් නිර්වචනයන්, අපේක්ෂාවන් ගොන්නකින් සමාජය විසින් නිර්මාණය කරනා අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන් වෙත නිරතුරු පරිණාමයට ලක්වීමට සිදුවී තිබේ. එය සිව්වැනි ගෝලීයකරණයේ (Globalization 4.0) නැතහොත් සිව්වැනි කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ලෙසින් අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ සීමා ප්‍රසාරණයට යොමුකර ඇත.

## නූතන අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ අපේක්ෂිත පරිණාමය

වත්මන් සමාජ පැතිකඩෙහි විවිධ ප්‍රජා විද්‍යාත්මක භේදනයන් මඟින් විවිධ සමාජ පොකුරු (Social Clusters) නිර්මාණය වී ඇත. උසස් අධ්‍යාපන ආයතනයක් යනු මෙවන් සමාජීය ස්ථරයන් හි නියෝජනයක්, මනා නියැදියක් එක් පරිශ්‍රයක දී හමුවන සමාජ පැතිකඩකි. මෙය වෙනත් අන්

බොහෝ කරුණු මෙන්ම, පුස්තකාලයාධිපතිත්වයේ අවධානය යොමු විය යුතු විශේෂී එක් සාධකයකි, ඔවුන් නියෝජනය කරනා වයස් පරම්පාරව හා එම වයස් කාණ්ඩයන් විසින් පරිහරණය කරනු ලබන තාක්ෂණික දැනුම් මට්ටම, එසේත් නැතහොත් ඔවුන් නියෝජනය වන තාක්ෂණික පරම්පරාව පිළිබඳ නිරතුරු සැලකිලිමත් විය යුතු වේ.

Juchnevič (2014) ගේ අධ්‍යයනයක් තුළින් හුවා දක්වන පරිදි, මාක් ප්‍රෙන්ස්කිගේ මතයට අනුව සමාජය කණ්ඩායම් දෙකකට බෙදිය හැකිය. ඒවා නම්ः "ඩිජිටල් ලෝක සංක්‍රමණිකයන්" (Digital World Immigrants) සහ "ඩිජිටල් ලෝක ස්වදේශිකයන්" (Digital World Natives) ලෙසය. ප්‍රෙන්ස්කිට අනුව, මින් පළමු කණ්ඩායම වන්නේ ඩිජිටල් ලෝක සංස්ථාපිතයට හා ව්‍යාප්තියට පෙර උපත ලැබූ අය වන අතර, ඔවුන් එය වැඩිහිටි වියේ දී, සාමාන්‍යයෙන් රැකියාවේ දී හෝ අධ්‍යයන කාලය තුළ භාවිත කිරීමට ඉගෙන ගත් අතර බොහෝ විට ඔවුන්ගේ ජීවිතවල නව තාක්ෂණයන්හි අවශ්‍යතාවය අවබෝධ කර නොගනී. ඔවුන් අදහස් කරන්නේ එය නොමැතිව විශාල අපහසුතාවක් අත්විඳීමට සිදු නොවේය යන්නයි. එසේම දෙවන කණ්ඩායම, ඩිජිටල් ලෝකයේ ස්වදේශිකයන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් පුළුල් වීමෙන් පසු උපත ලැබූ අයයි; ඔවුන්ට මෙම තාක්ෂණයන් භාවිතා කිරීමේ තේරුම දැකීමටත් භුක්ති විඳීමටත් හැකි වේ. මෙසේ සමාජ සංයුතීන් හඳුනාගැනීම හා එමගින් ඇතිවන වෙනස්වීම් හඳුනා විශ්ලේෂණය කොට, ඔවුනට සුදුසු පරිදි නව පිවිසුම් ලබාගැනීම නූතන අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වයේ අපේක්ෂිත පරිණාමීය ලක්ෂණයකි.


සීග්‍ර ලෙසින් වෙනස් වන වැඩ කරන පරිසරය පිළිබඳව නූතන අධ්‍යයන පුස්තකාලයාධිපතිත්වය සංවේදී වීම තවත් එවන් අපේක්ෂිත සාධකයකි (Knight, 2017). අධ්‍යයන පුස්තකාලයාධිපතිවරුන් ඔවුන්ගේ පුස්තකාලවල වර්තමාන ප්‍රවණතා සහ භාවිතයන් මෙන්ම අනාගතයට සාපේක්ෂව ශක්තීන් සහ දුර්වලතා පිළිබඳව දැනුවත්ව සිටීමත් ඒ අනුව යමින් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණින් පුස්තකාලවල අනාගත දිශානතිය නිරතුරුවම සකස් කළ යුතුය. එසේම පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වයට මුහුණ දීමට සිදුවන බාහිර තර්ජන සහ අවස්ථාවන් ද, සමාජ, ආර්ථික හා තාක්ෂණික බලවේග ද ඔවුන්

වර්ගීකරණය කළ යුතුය. මෙසේ වෙනස් වන ස්වකීය වෘත්තීය වපසරිය, වැඩ කරන පරිසරය පිළිබඳ සංවේදී වීම තුළින් "වෙනස්විමේ ශූරයන්" (Change Champions) බවට පත්විය හැක (Knight, 2017). "වෙනස්වීමේ ශූරයන්" යනු "වෙනස්වීම් සමඟ ආරම්භ වී ඊට අනුරූපව ගමන් කරන පුද්ගලයින් වේ". මෙසේ "වෙනස්වීමේ ශූරයන්" බවට පත්වීම තුළ එළැඹෙන වෙනස්වීම් හමුවේ නොනැසී, නොසැලී ඉදිරියට යාමේ ජවය පුස්තකාලයාධිපතිවරුන් වෙත ළඟා කරගත හැක (Knight, 2017). එය ඉතා වැදගත් අපේක්ෂිත පරිණාමීය ලක්ෂණයකි.

අන්තර්ජාල යුගයේ පුස්තකාලයාධිපතිවරුන් සෑම විටම, ඔවුන්ගේ පරිශීලකයින්ගේ නව තොරතුරු පුරුදු සමඟ, වඩා ද්‍රව්‍යකරණය නොවූ වැඩ කරන පරිසරයක් සමඟ එකඟ විය යුතුය යන්න මෙල්චියොන්ඩාගේ මතය වේ (Melchionda, 2007). මේවා තොරතුරු තාක්ෂණයේ අඛණ්ඩ වර්ධනයත් සමගින් බිහි වී, පොදු ධනවාදී සමාජ ප්‍රවාහයන්ගේ නොමඳ බලපෑමට නතු වී වත්මන් ද්‍රාව්‍ය සමාජයේ (Liquid Society) පාරදෘශ්‍ය මායිම් හරහා පුද්ගල සන්තානයන් හි මතුවන තොරතුරු අවශ්‍යතා වේ. එබැවින්, තොරතුරු භූ දර්ශනයෙහි (Information Landscape) සිදුවන වෙනස්කම් මත පදනම් වී ජාලගත හා ඩිජිටල් තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම තවත් අපේක්ෂිත පරිණාමීය ලක්ෂණයකි (Melchionda, 2007). තව ද, එළැඹෙන යුගයේ පුස්තකාලයාධිපතිවරුන් සාම්ප්‍රදායික භූමිකාවන් සහ නව භූමිකාවන් අතර සම්බන්ධය හා සමබරතාවය හඳුනා ගැනීමත් රැක ගැනීමත් තුළින් ඔවුන්ගේ වෘත්තීය කාණ්ඩයට නොනැසී පැවතීමට සහ තොරතුරු සමාජයේ තීරණාත්මක හා වැදගත් කොටසක් ලෙස දිගටම කටයුතු කිරීමට අවකාශ සැලසෙනු ඇත (Melchionda, 2007).

එසේම, උසස් අධ්‍යාපනයේ පාර්ශවකරුවන් හා ඔවුන් විසින් උසස් අධ්‍යාපනය මගින් අපේක්ෂිත අරමුණු වලට (රූපය 2) සංවේදීව ක්‍රියාකිරීම සිව්වන වැදගත් පරිණාමීය සාධකයකි. උසස් අධ්‍යාපනයේ විවිධ පාර්ශවකරුවන් සිව් දෙනෙකු ඉහතින් දක්වන ලදී. එකී සිව්විධ මානයන්ගෙන් බලාපොරොත්තුවන අරමුණු කෙරේ සංවේදීව කටයුතු කිරීමට පුස්තකාලයාධිපතිවරුන් හට ඇති හැකියාව මෙහිලා සැලකේ.

ඉතා මෑතක දී ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනයෙ (IFLA) හි වත්මන් සභාපතිනිය, ආචාර්ය Glòria Pérez-Salmerón විසින් "යහපත් පුස්තකාලයාධිපතිවරයකු සහ තොරතුරු කළමණාකරුවකු වීමට පියවර 10 ක්" මැයෙන් පත්‍රිකාවක් ප්‍රකාශයට පත්කරන ලදී (රූපය 4).




**රූපය 4:** යහපත් පුස්තකාලයාධිපතිවරයකු සහ තොරතුරු කළමණාකරුවකු වීමට පියවර 10 ක්

මූලාශ්‍රය: Glòria Pérez-Salmerón, IFLA President, 2019

මෙහි දක්වා ඇති පියවර 10 එකී පරිණාමීය ලක්ෂණ යටතට ගැනිය හැක. ඒවා කෙටියෙන් මෙසේ වේ;

1. Empathy - පාඨක අවශ්‍යතා පිළිබඳ සංවේදීව කටයුතු කිරීම
2. Jargon - ඔබගේ පාඨකයන්ට තේරුම්ගත හැකි හා ඔවුන්ගේ තත්ත්වයට ගැළපෙන භාෂාවකින්, හා මට්ටමකින් සාක්ෂරතා මට්ටමකින් කටයුතු කිරීම.
3. Strategy - පරිශීලකයාගේ අවශ්‍යතා පිළිබඳ දෘෂ්ටිකෝණයකින් ඔබේ නිෂ්පාදන සහ සේවාවන් උපායමාර්ගික ලෙස සැලසුම් කරන්න
4. Legal framework - නීතිමය රාමුවට සහභාගී වන්න, නමුත් ප්‍රායෝගික වීමට අමතක නොකරන්න
5. Teamwork - එකමුතුකමින් වැඩකිරීම
6. Change - වැඩිදියුණු වීමේ මානසිකත්වයෙන් ඇතිව වැඩිදියුණු කළ හැකි දේවල් වෙනස් කරන්න
7. Evaluation - ප්‍රගතියේ දර්ශක සමඟ වැඩ කර සේවාවන් සැමවිටම ලාභදායී විය යුතු යැයි සිතන්න
8. Innovation - නිර්භීත වන්න! නිර්භීත වී නව්‍ය හා වටිනා හා ප්‍රායෝගික දේවල් යෝජනා කරන්න
9. Update - ඔබව, ඔබේ දැනුම යාවත්කාලීනව තබා ගන්න. කිසි විටෙකත් පුහුණුව නතර නොකරන්න, සෑම විටම වෘත්තීය ගැටළු පිළිබඳව දැනුවත් වන්න, නිතර ප්‍රවෘත්ති කියවන්න, අවධියෙන් සිටින්න
10. Happiness - සංතුෂ්ඨී පරමං ධනංඃ ඔබ වැඩ කරන ඕනෑම තැනක ඉතා සතුටින් සිටීමට උත්සාහ කරන්න.

උක්ත කරුණු දහය පාසල්, අධ්‍යයන හා විශේෂ පුස්තකාල ඇතුළු සියලුම තොරතුරු ආයතනයන් හි පුස්තකාලයාධිපතිත්වය වෙත, තොරතුරු වෘත්තිකයන් වෙත පනවාගත යුතු දස පනතක් වැනිය (The Ten Commandments for Information Professionals). මෙකී ගුණාංග

වෙනස්වන ලෝකයක නොනැසී පවතින වෘත්තිකයන් ලෙස පුස්තකාලයාධිපතිත්වය දියුණු කිරීමට ඉවහල් වේ.

දිනෙන් දින ඉහළ යන ගෝලීයකරණයෙන් පුස්තකාල ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝගයන්ට මුහුණ දී ඉන් ජයගත හැකි වන්නේ එක්සත් පුස්තකාල ක්ෂේත්‍රයක ගෝලීය ප්‍රතිචාරයෙනි. සම්බන්ධිත පුස්තකාල ක්ෂේත්‍රයකට අනාගතයේ අභියෝගයන්ට මුහුණ දිය හැකි ආකාරය ගවේෂණය කිරීම සඳහා IFLA හි ගෝලීය දැක්ම සාකච්ඡාව ලොව පුරා පුස්තකාල ක්ෂේත්‍රයේ නියෝජිතයන් දහස් ගණනකගේ එකතුවකින් හා අදහස් හුවමාරු කරගැනීම මගින් නිර්මාණය වූවකි. IFLA හි ගෝලීය දැක්ම මගින් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාල සඳහා වූ ''සාමූහිකත්වය තුළින් පුස්තකාල ක්ෂේත්‍රයට අනාගතයේ අභියෝගයන්ට මුහුණ දිය හැකි ආකාරය'' පිළිබඳ සමීක්ෂණ වාර්තාවේ ප්‍රතිචාරයන්ට අනුව පුස්තකාලයාධිපතිත්වය වෙත "පුස්තකාල පිළිබඳ දැක්මක්" ඉදිරිපත් කෙරුනි (IFLA, 2017). එම දැක්ම 1 වගුවේ පිඬු කොට ඇත;

**වගුව 1.** සාමූහිකත්වය තුළින් පුස්තකාල ක්ෂේත්‍රයේ අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආකාරය

| | |
|---|---|
| **පුස්තකාලවල මූලික අගයන්/ වටිනාකම් මොනවාද?** | *1. තොරතුරු වෙත ප්‍රවේශය*<br>*2. බුද්ධිමය නිදහස සහ තොරතුරු නිදහස*<br>*3. ජීවිත කාලය පුරාවටම ඉගෙනීම*<br>*4. විවිධත්වය සහ අන්තර්ග්‍රහණය*<br>*5. අනාගතය සඳහා කල් තබා ගැනීම* |
| **පුස්තකාල අතිශයින්ම උචිත වනුයේ කුමක් සඳහා ද?** | *1. තොරතුරු දැනුම සංවිධානය කිරීම*<br>*2. තොරතුරු හා දැනුමට ප්‍රවේශය ලබා දීම*<br>*3. පරිණාමනය සඳහා අවස්ථා ලබා දීම*<br>*4. නවෝත්පාදන හා නිර්මාණශීලිත්වය*<br>*5. ආරක්ෂිත අවකාශයන් සැපයීම* |

| | |
|---|---|
| **පුස්තකාල විසින් වැඩිපුර කළ යුත්තේ කුමක්ද?** | *1. සහයෝගීතාව සහ හවුල්කාරිත්වය සඳහා පුස්තකාල ස්ථානගත කිරීම*<br>*2. විවෘත ප්‍රවේශයට සහාය වීම*<br>*3. තොරතුරු සහ අන්තර්ජාලයට ප්‍රවේශය ලබා දීම*<br>*4. උද්දේශනය*<br>*5. අධ්‍යාපනය ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධනය* |
| **පුස්තකාල අඩුවෙන් කළ යුතු දේ මොනවා ද?** | *1. සුචිකරණය*<br>*2. යල් පැන ගිය පද්ධති සමඟ වැඩ කිරීම (පුස්තකාල කළමනාකරණ පද්ධති ඇතුළුව)*<br>*3. සෑම දෙයක්ම තමන් විසින්ම කිරීමට උත්සාහ කිරීම* |
| **සමාජයට ඇති ප්‍රධාන අභියෝග මොනවාද?** | *1. සියල්ලන්ටම හා ගුණාත්මකභාවයට අධ්‍යාපන ප්‍රවේශය*<br>*2. දේශගුණික විපර්යාස - ආහාර, ජලය සඳහා ප්‍රවේශය*<br>*3. ධනයේ විවිධත්වය*<br>*4. තොරතුරු හා තාක්ෂණය වෙත ප්‍රවේශය*<br>*5. මානව හිමිකම්* |
| **පුස්තකාලවලට ඇති ප්‍රධාන අභියෝග මොනවාද?** | *1. අගය නිරූපණය කිරීම*<br>*2. අරමුදල් සැපයීම*<br>*3. කාර්ය මණ්ඩලය නැවත සකස් කිරීම*<br>*4. තාක්ෂණයට අනුවර්තනය වීම*<br>*5. සේවාදායකයාගේ අපේක්ෂාවන් අවබෝධ කරගැනීම සහ සපුරාලීම* |
| **ප්‍රධාන වෘත්තීය අභියෝග මොනවාද?** | *1. තාක්ෂණික විපර්යාස සඳහා ප්‍රතිචාර දැක්වීම*<br>*2. කාර්ය මණ්ඩල බඳවා ගැනීම, නිපුණතා, නව නිපුණතා*<br>*3. නිර්මාණාත්මක චින්තනය වෙනස් ආකාරයකින් පැවැත්වීම*<br>*4. නව භූමිකාවන් හා අපේක්ෂාවන්ට අනුවර්තනය වීම* |

| | |
|---|---|
| **සාමූහිකව පුස්තකාල ක්ෂේත්‍රයකට ඉහත අභියෝගයන්ට මුහුණ දිය හැක්කේ කෙසේද?** | *1. සහයෝගීතාවය*<br>*2. ප්‍රමිති සකස් කිරීම සහ හොඳම භාවිතයන් හඳුනා ගැනීම (සහ බෙදාගැනීම)*<br>*3. සම්මන්ත්‍රණ, කාර්ය මණ්ඩල හුවමාරුව, සන්නිවේදනය හරහා විශේෂඥ දැනුම බෙදා ගැනීම*<br>*4. තොරතුරු හා අධ්‍යාපනයට ප්‍රවේශය පහසු කිරීම* |
| **සාමූහිකව පුස්තකාල ක්ෂේත්‍රයක ලක්ෂණ වේ** | *1. සහයෝගීතාවය සහ සාමූහිකත්වය*<br>*2. බෙදාගත් අගයන්*<br>*3. වෘත්තිකභාවය*<br>*4. නැවත සලකා බැලීම සහ ඇතුළත් කිරීම*<br>*5. සන්නිවේදනය* |
| **එක්සත් පුස්තකාල ක්ෂේත්‍රයක කේන්ද්‍රය වේ** | *1. සහයෝගීතාවය*<br>*2. සම්පාදනය*<br>*3. විවෘත වේදිකා, ප්‍රකාශන ආදිය සඳහා කැපවීම විවෘත කරන්න.*<br>*4. තොරතුරු දැන ගැනීමේ නිදහස සහ තොරතුරු සඳහා ප්‍රවේශය*<br>*5. විවිධාකම සහ අදාළත්වය කෙරෙහි අවධානය යොමු කරන්න* |

මූලාශයඃ (IFLA, 2017)

## නිගමනය

අප වේගයෙන්, පරිමාණයෙන්, සංකීර්ණතාවයෙන් වෙනස් වන සිව්වන කාර්මික පරිණාමයේ උදාව වෙත පිවිස ඇත. ගෝලීයකරණයේ විවිධ යුග මතින් අද දවස වන විට ගෝලීයකරණයේ 4.0 (Globalization 4.0) අවධියට අප පිවිස ඇත. මෙම අඛණ්ඩ වෙනස්වීම් ප්‍රවාහයේ පරිවර්තනීය බලය හමුවේ නොනැසී විසීමට පුස්තකාලයාධිපතිවරුන් විශේෂයෙන් සූදානම් වී සැරසිය යුතුව ඇත. මෙලෙසින් වෙනස්වන ලෝකය හමුවේ නොවෙනස් වී සිටීම පිණිස අධ්‍යයන පුස්තකායාධිපතිවරුන් විසින් වෙනස්වීම හඳුනා ගනිමින් ඉහතින් විග්‍රහ කළ විමූලික දැනුම, කුසලතා

සහ ආකල්ප පරිණාමයක් සිදුකිරීමට අවශ්‍යව ඇත. ලෝකය වෙනස්වන බව දැන ක්‍රියා කිරීම, වෙනස්වීමට කැමති වීම හා බිය නොවීම, පාර්ශවකරුවන් හා ඔවුන්ගේ සමාජ-ආර්ථික මෙන්ම දේශපාලන වටපිටාව පිළිබඳ මනා අවබෝධය, එකමුතුකම, දැනුම බෙදා හදාගැනීම වැනි සාධක මින් මූලික වේ.

## වැඩිදුර පර්යේෂණ කළ යුතු විෂය පථ

සිව්වන කාර්මික විප්ලවයේ පුස්තකාලවල සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම නව විෂයක් නොවූවද, ඒ ඒ රටවල් විසින් විවිධ තොරතුරු ආයතනයන්ට සාපේක්ෂව මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණවල නිරත වීම වඩාත් කාලෝචිත වේ. එහි දී අධ්‍යයන පුස්තකාලයාධිපති, අධ්‍යයන පුස්තකාලය, පුස්තකාලයේ පාර්ශවකරුවන්, සමාජ-ආර්ථික බලපෑම් වැනි විෂයන් ද, අනාගත තාක්ෂණය (Future Technologies), පිළිබඳව ද පර්යේෂණ පැවැත්වීමත්, වාර්තා කිරීමත් වැදගත් වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර

Ahmat, A., & Adauwiyah Abu Hanipah, R. (2018). *Preparing the Libraries for the Fourth Industrial Revolution (4th IR)*. *12*, 53–64.

American Library Association. (2009). Academic libraries. Retrieved August 13, 2019, from http://www.ala.org/tools/research/librarystats/academic

Association of College and Research Libraries. (2010). *Value of Academic Libraries: A Comprehensive Research Review and Report* (M. Oakleaf, Ed.). Retrieved from www.acrl.ala.org/value

Curzon, C. S., & Quinonez-Skinner, J. (2010). Academic Libraries. In *Encyclopedia of Library and Information Sciences* (pp. 11–22). https://doi.org/10.108/E-ELIS3-120044525

Hart, A. H. (2018). Academic Librarian and Practitioner Collaborative Research Model: A Diagrammatic Metaphor. In *Advances in*

*Library Administration and Organization*: *Vol. 39*. *Challenging the "Jacks of All Trades but Masters of None" Librarian Syndrome* (pp. 117–131). https://doi.org/10.1108/S0732-067120180000039009

IFLA. (2019). IFLA Library Map of the World. Retrieved August 13, 2019, from International Federation of Library Associations website: https://librarymap.ifla.org/map

IFLA, G. V. D. (2017). *Report of the IFLA Academic and Research Libraries Standing Committee: How a united library field can tackle the challenges of the future*. Retrieved from https://www.ifla.org/files/assets/gvsr/GV Report_IFLA Academic and Research Libraries Standing Committee.pdf

Juchnevič, L. (2014). Library roles in changing society. *Social Transformations in Contemporary Society*, *2*, 120–130. Retrieved from http://stics.mruni.eu/wp-content/uploads/2014/08/STICS_2014_2_120-130.pdf

Knight, A. J. (2017). Academic librarians as change champions: a framework for managing change. *Library Management*, *38*(6/7), 294–301. https://doi.org/10.1108/LM-03-2017-0031

Melchionda, M. G. (2007). Librarians in the age of the internet: their attitudes and roles. *New Library World*, *108*(3/4), 123–140. https://doi.org/10.1108/03074800710735339

Moran, B. B., & Leonard, E. (2010). Academic Librarianship. In *Encyclopedia of Library and Information Sciences* (3rd ed., pp. 1–37). CRC Press.

Rosenstein, B. (2014). *Emerging roles and possible futures for librarians and information professionals*. Retrieved from http://www.emeraldgrouppublishing.com/librarians/features/librarian_roles.htm

Schwab, K. (2016). *The Fourth indsutrial revolution*. Cologny/ Geneva, Switzerland: World Economic Forum.

Vassilakaki, E. (2015). A systematic literature review informing library and information professionals' emerging roles. *New Library World*, *116*(1/2), 37–66. https://doi.org/10.1108/NLW-05-2014-0060

Xu, M., M. David, J., & Hi Kim, S. (2018). The Fourth Industrial Revolution: Opportunities and Challenges. *International Journal of Financial Research*, *9*, 90. https://doi.org/10.5430/ijfr.v9n2p90

# පුස්තකාල හා තොරතුරු සාක්ෂරතා විෂය සඳහා සිදුකළ හැකි පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනා ගැනීම පිළිබඳ කෙටි විමසුමක්

යූ. ඒ. ලාල් පන්නිල, පී. ජී. නිශාන්ත

## හැඳින්වීම

අප සියලුදෙනා අපගේ එදිනෙදා ජීවිතයේ දී පර්යේෂණවලට මුහුණ දෙමු. බොහෝ මාතෘකා පිළිබඳ පර්යේෂණවල ප්‍රතිඵල පුවත්පත් ලිපි, පොත්, වාර්තා සහ රූපවාහිනී වැඩසටහන් ලෙස අපට ඉදිරිපත් කෙරේ. නිදසුනක් වශයෙන්, අපරාධ මට්ටමේ සංඛ්‍යා රූපවාහිනී ප්‍රවෘත්ති වාර්තා මගින් අප වෙත ඉදිරිපත් කරනු ලබන අතර ආහාර සහ සෞඛ්‍යය වැනි සමහර මාතෘකා සඟරා මෙන්ම රූපවාහිනී වැඩසටහන් ද ඉතා ජනප්‍රිය ය. මේ අනුව, විවිධ මාධ්‍ය හරහා අපි පර්යේෂණ ගැන දැකීමට, කියවීමට හා ඇසීමට පුරුදු වී සිටිමු. අප එය නොදැන සිටිය ද, පර්යේෂණ සොයාගැනීම් පිළිබඳව අපගේම තීන්දු තීරණ ගැනීමට අපි පුරුදු වී සිටිමු. අපි ආහාර හා සෞඛ්‍යය පිළිබඳ ආදර්ශය ගතහොත්, අපගෙන් බොහෝ දෙනෙක් සෞඛ්‍ය සම්පන්න ආහාර ගැනීම පිළිබඳ ඉදිරිපත් කර ඇති තොරතුරු සැලකිල්ලට ගෙන අපගේම ජීවිතයේ සන්දර්භය තුළ ආහාර පිළිබඳ අපගේම තේරීම් කර ඇත. අප විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු තක්සේරු කිරීම, පර්යේෂණයේ වලංගුභාවය සහ අදාළත්වය පිළිබඳව මතයක් ගොඩනඟා ගැනීම සහ සලකා බැලීම් මත පදනම්ව අපගේ නිගමන වලට එළඹෙති. මේ නිසා පර්යේෂණ ප්‍රතිඵල ආර්ථික සංවර්ධනයට පමණක් නොව පුද්ගල සංවර්ධනයටත් සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබයි.

පර්යේෂණය අර්ථ දැක්වෙන්නේ විශේෂිත කරුණක් හෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිත කිරීමේ ගැටළුවක් පිළිබඳව අධ්‍යයනය ප්‍රවේශමෙන් සලකා බැලීම ලෙස ය. ඇමරිකානු සමාජ විද්‍යාඥ අර්ල් රොබට් බබී පවසන පරිදි, "පර්යේෂණය" යනු නිරීක්ෂණය කරන ලද සංසිද්ධිය විස්තර කිරීමට, පැහැදිලි කිරීමට, පුරෝකථනය කිරීමට සහ පාලනය කිරීමට ක්‍රමානුකූල පරීක්ෂණයකි. අපට යමක් දැන ගැනීමට අවශ්‍ය වූ විට

පර්යේෂණ ආරම්භ වේ. අපගේ අවබෝධය වැඩි කිරීම කෙරෙහි පර්යේෂණ සැලකිලිමත් වේ. ගැටළු විසඳීමට සහ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු හා දැනුම පර්යේෂණ අපට සපයයි. පර්යේෂණ සමහර විට පිරිසිදු (හෝ මූලික) සහ ව්‍යවහාරික පර්යේෂණ වලට බෙදා ඇත. පර්යේෂණයට ප්‍රේරක හා අඩු කිරීමේ ක්‍රම ඇතුළත් වේ. පර්යේෂණයක් යනු යම් කරුණක් පිළිබඳව සුපරීක්ෂාකාරී ලෙස සෝදිසි කිරීමකි. නැතහොත් පුළුල් ලෙස අධ්‍යයනය කිරීමකි. නිශ්චිත අරමුණක් කරා උපක්‍රමශීලීව, ප්‍රායෝගිකව හා පරීක්ෂණ මාර්ගයෙන් ලබන අත්දැකීම් හා සොයා ගැනීම් මත යම් නිගමනයකට එළඹීම සඳහා කරනු ලබන උත්සාහය පර්යේෂණයක් ලෙස තවදුරටත් නිර්වචනය කළ හැකිය. පර්යේෂණයකින් වඩාත් ඵලදායී ප්‍රතිඵල ළඟා කර ගැනීමට නම් නිශ්චිත විෂය ක්ෂේත්‍රයක සැලසුම් කරගත් ව්‍යුහයක් මත විද්‍යානුකූල පිළිවෙලකට කටයුතු කිරීමට සිදුවේ. එහිදී පර්යේෂකයා සැමවිටම තමාට රුචි ක්ෂේත්‍රයක් තෝරාගෙන පූර්ව, නිගමන හා අගතීන්ගෙන් තොරව සිය කාර්යයේ නිරත විය යුතුය.

පර්යේෂණය ආරම්භයේ සිට අවසානය දක්වා ගමන් කරන සම්බන්ධිත ක්‍රියාකාරකම් මාලාවක් ලෙස දැකිය හැකිය. පර්යේෂණය සාමාන්‍යයෙන් ආරම්භ වන්නේ ගැටළුවක් හඳුනා ගැනීමෙන් පසුව පර්යේෂණ ප්‍රශ්න හෝ අරමුණු සැකසීමෙනි. මෙයින් ඉදිරියට යාම පර්යේෂකයා විසින් මෙම ප්‍රශ්නවලට හොඳම පිළිතුරු දිය යුත්තේ කෙසේද යන්න තීරණය කරන අතර එමඟින් පර්යේෂණ තොරතුරුවලට එකතු කිරීම සඳහා කුමන තොරතුරු රැස් කළ යුතු ද? එකතු කරන්නේ කෙසේද සහ එය විශ්ලේෂණය කරන්නේ කෙසේද යන්න තීරණය කරයි.

මේ ආකාරයෙන් විස්තර කර ඇති පර්යේෂණ ක්‍රියාවලියට රේඛීයතාව පිළිබඳ හැඟීමක් ලබා දී ඇතත්, පර්යේෂණ විමර්ශනය බොහෝවිට පුනරාවර්තන ක්‍රියාවලියක් වන අතර එමඟින් පර්යේෂණ පැවැත්වීමේ ක්‍රියාවලිය නව අදහස් බිහි කරනු ඇති අතර එමඟින් දත්ත රැස්කිරීමේ හා විශ්ලේෂණ අවධියට නැවත පෝෂණය වේ. පර්යේෂණ ක්‍රියාවලියේ මුල් අවධියේ දී ගනු ලැබූ තීරණ බොහෝ විට නැවත සලකා බලනු ලබන්නේ නව තීක්ෂණ බුද්ධිය හෝ මඟදී ඇති වන ප්‍රායෝගික ගැටළු සැලකිල්ලට ගනිමිනි.

පර්යේෂණ සොයාගැනීම් සැපයීමේ හැකියාව විශ්වවිද්‍යාල සහ පර්යේෂණ මධ්‍යස්ථාන වැනි දැනුම නිෂ්පාදකයින් අතර මූලික ක්‍රියාවලියකි. පර්යේෂණ නිමැවුම් යනු ඇගයීමේ මිනුමකි. ලෝකයේ විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නිරතුරුව පර්යේෂණ සිදුවෙමින් පවතී. ඒ ඒ විෂය ක්ෂේත්‍රවල සිදුකරන පර්යේෂණ වලින් ලොවට නව දැනුම් සම්භාරයක් නිරතුරව එකතු වේ. ඒ නිසා විශ්ව ඥානය පුළුල් වීම සඳහා පර්යේෂණවලින් අති විශාල පිටුවහලක් ලැබේ. ඒ අනුව සලකා බලන විට දීර්ඝ කාලයක සිට පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ ද විවිධ පර්යේෂණ සිදුවන අයුරු දැකිය හැකිය. එහෙත් එම ක්ෂේත්‍රයේ පර්යේෂණ කෙරෙහි පර්යේෂකයන්ගේ අවධානය යොමු වී වැඩි කලක් ගතවී නැත. වෙනත් විෂය ක්ෂේත්‍රවල මෙන්ම පුස්තකාල ක්ෂේත්‍රයේ ද පර්යේෂණ ක්ෂේත්‍ර ගණනාවක් හඳුනාගෙන ඇත.

ලොව සිදුවන විවිධ පර්යේෂණවල ස්වභාවය විමසා බැලිමේ දී කාලීන අවශ්‍යතා අනුව ඒවා වරින්වර වෙනස් වන අයුරක් දැකිය හැකිය. ඒ ඒ කාලවල ලොවේ විවිධ ක්ෂේත්‍රවල ඇතිවන ප්‍රබෝධයන්ට අනුව පර්යේෂකයන් ද එම ක්ෂේත්‍ර ඔස්සේ සිය පර්යේෂණ මෙහෙයවනු දැකිය හැකිය. එපමණක් නොව පර්යේෂණ සඳහා පර්යේෂකයින් මෙහෙයවනු ලබන ආයතන විසින් ද පර්යේෂකයින් විවිධ ක්ෂේත්‍ර සඳහා යොමු කිරීමේ දී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති අනුව ද පර්යේෂකයින් සිය පර්යේෂණ ක්ෂේත්‍ර තෝරාගනු දැකිය හැකිය.

පුස්තකාල විද්‍යා පර්යේෂණ දෙසට අවධානය යොමු කරන විට යුනෙස්කෝ (UNESCO) ආයතනය ජාත්‍යන්තර පුස්තකාල සංගම් සංවිධානය (IFLA) වැනි ආයතන විසින් ද කලින් කලට ඔවුන් අවධානය යොමුකර ඇති විෂය ක්ෂේත්‍ර වෙනස් කරනු දැකිය හැකිය. යුනෙස්කෝ ආයතනය වර්තමානයේ බොහෝ දුරට අවධානය යොමුකර ඇත්තේ ලෝක මතකය පිළිබඳව යි. IFLA ජාත්‍යන්තර ආයතනය අවධානය යොමුකර ඇත්තේ පුස්තකාල අධ්‍යාපනය වෙතටයි. මෙසේ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සිය ක්ෂේත්‍රයේ පර්යේෂණවල නියුතු විද්‍යාර්ථීන් යොමු කරන ක්ෂේත්‍ර කලින් කලට සහ උදාවන තත්ත්වයන් අනුව වෙනස් කරනු දැකිය හැකිය.

පුස්තකාල අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ ඇත්තේ කෙටි ඉතිහාසයක් වුව ද නූතන යුගය වන විට පුස්තකාල අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීමට විවිධ ආයතන ඉදිරිපත්ව සිටී. 1960 දශකය වන විට ඇරඹී ශ්‍රී ලංකාවේ පුස්තකාල අධ්‍යාපනය අද වන විට පශ්චාත් උපාධි පාඨමාලා දක්වා ව්‍යාප්තව ඇත. එහෙත් පුස්තකාල අධ්‍යාපනය සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමක පර්යේෂණ තවමත් සිදුවේ ද යන්න ගැටළුවකි. කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, (NILIS) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, වැනි ආයතන විසින් පුස්තකාල අධ්‍යාපනය සම්බන්ධයෙන් පර්යේෂණ පවත්වන ආයතන ලෙස දැක්විය හැකිය. මෙම පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත්කරනු ලබන්නේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය විසින් පළකරනු ලබන පර්යේෂණ සඟරාව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් පළකරනු ලබන සඟරාව ඇතුළු දේශීය පර්යේෂණ සඟරා වලයි. මීට අමතරව ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මඟින් පළකරනු ලබන සඟරාවල ද මෙම පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්වෙයි. අමතරව කොළඹ විශ්වවිද්‍යාලය හා කැළණිය විශ්වවිද්‍යාලය වැනි උසස් අධ්‍යාපන ආයතන මඟින් පශ්චාත් උපාධි මට්ටමේ පර්යේෂණ සිදුකරයි. මේවා බොහෝ දුරට පුද්ගලික පර්යේෂණ ස්වභාවයක් උසුලයි. මෙම පර්යේෂණ පොදුවේ ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධනය කෙරේ සැලකිය යුතු බලපෑමක් කරනු ලබයි. මේ අනුව ලංකාවේ ද පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ තවමත් සංවර්ධනය වෙමින් පවත්නා තත්වයක් මත වුව ද විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පර්යේෂණ සිදුකරනු දැකිය හැකිය. මෙම පර්යේෂණ මේ වන විට වඩාත් ඵලදායී ලෙස පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීම කෙරේ ක්ෂේත්‍රයේ නියුතු විද්වත්හු සිය අවධානය යොමු කර තිබීම අනාගතයෙහි මෙම ක්ෂේත්‍රයෙහි වර්ධනයට ඉවහල් වනු ඇත. පර්යේෂණ පිළිබඳ දක්නට ඇති තැන්වල ප්‍රධාන පර්යේෂණ වර්ග තුනක් හඳුනාගෙන ඇත.

- විශ්ලේෂණාත්මක පර්යේෂණ
- අත්හදාබැලීම් පර්යේෂණ
- ඓතිහාසික පර්යේෂණ

මෙයින් වර්තමානයේ බොහෝ පර්යේෂකයින් යොමු වී ඇති අංශයක් ලෙස දක්නට ලැබෙන්නේ යම් ගැටළුවක් මූලික කරගෙන කරනු ලබන පර්යේෂණ වෙතටයි. පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණයන් හි නිරත පර්යේෂකයින්ට පුස්තකාල හා විඥාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

- පුස්තකාලයාධිපතීන්ගේ අධ්‍යාපනය
- පුස්තකාල සංවිධානය
- පුස්තකාල පාඨක ප්‍රජාව හා පාඨක අධ්‍යාපනය
- සමාජය තුළ පුස්තකාලයේ කාර්යභාරය
- විඥාපන සේවාව හා විඥාපන තාක්ෂණය
- මිනිස් බලය සංවිධානය කිරීම
- පුස්තකාල වෘත්තිකභාවය
- පුස්තකාල ඉතිහාසය හා පුස්තකාලයාධිපතිත්වයේ ඉතිහාසය
- පුස්තකාලයාධිපතිත්වය හා පුස්තකාලයාධිපතිත්වයේ දර්ශනය
- පුස්තකාල ද්‍රව්‍ය ඇගයීම
- ප්‍රතිපත්ති පර්යේෂණ

## පුස්තකාලයාධිපතීන්ගේ අධ්‍යාපනය

පුස්තකාලයාධිපතීන්ගේ අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණ ක්‍ෂේත්‍ර පිළිබඳ විමසීමේ දී මේ සඳහා අදාළ කරගත හැකි පර්යේෂණ අංශ කිහිපයක්ම ඇත. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසුව පුස්තකාලයාධිපති තනතුර තෝරාගැනීම, පුස්තකාලයාධිපති තනතුර හා උපාධි අධ්‍යාපනය අතර සබඳතාව, අඛණ්ඩ අධ්‍යාපනය, පසු අධ්‍යාපනය ආදී ක්‍ෂේත්‍ර ගණනාවකම පර්යේෂණ මේ සම්බන්ධයෙන් සිදුකළ හැකිය. මේ ක්‍ෂේත්‍රවල පර්යේෂණ සිදුකිරීමෙන් පුස්තකාලයාධිපතීත්වය හා සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිය. මෙම පර්යේෂණ පොදුවේ ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධනය කෙරේ බලපෑමක් කරයි. පර්යේෂණ මඟින් සැපයෙන තොරතුරු සාධක, සංඛ්‍යා ලේඛන, හා අර්ථ කථන ප්‍රායෝගිකව පුස්තකාල සේවාවන් වැඩි දියුණු කිරීමට හා වඩාත් සියුම් ලෙස සැකසීමට පුස්තකාලයාධිපතිවරුන්ට උපකාරී වේ. එසේම

පර්යේෂණ කාර්ය වෘත්තීය තත්ත්වයට දියුණු කිරීමට ද මෙය එලදායී වේ. මේ නිසා ශ්‍රී ලංකාවේ ද පුස්තකාල වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණවල අවශ්‍යතාව කෙරෙහි වඩාත් අවධානය යොමු වී ඇත. ඒ සඳහා කොළඹ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වැනි ආයතන ඉදිරිපත් වී ඇත. මීට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය හා කොළඹ විශ්වවිද්‍යාලය අනුබද්ධ ජාතික පුස්තකාල හා විඥාපන ආයතනය (NILIS) එක්ව දිවයින පුරා විසිරී ඇති පාසල් ගුරු පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීමේ වැඩසටහනක් අරඹා ඇත. එහෙත් මෙම පුස්තකාලයාධිපතිවරු පුහුණුව උපාධි හෝ ඩිප්ලෝමාවකට සීමා නොකොට අඛණ්ඩ අධ්‍යාපනයකට යොමු කරවන වැඩසටහන් සම්පාදනය කිරීම හා ඒ කෙරෙහි උනන්දු කරවීමට බලපාන සාධක පිළිබඳ තොරතුරු ලබා ගැනීමට පර්යේෂණ දායක කරගත හැකිය.

## පුස්තකාල සංවිධානය

පුස්තකාල සංවිධානය සම්බන්ධයෙන් සිදුකරනු ලබන පර්යේෂණ සඳහා ක්ෂේත්‍ර 06 ක් පමණ හඳුනාගෙන ඇත. ඒ අතර පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳව පර්යේෂණ ක්ෂේත්‍රයේ දී මුද්‍රිත ද්‍රව්‍ය, විද්‍යුත් ද්‍රව්‍ය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය පිළිබඳව පර්යේෂණ මෙයට ඇතුළත් වේ. මෙම ක්ෂේත්‍රයේ තවත් අංශයක් ලෙස දැක්විය හැක්කේ පුස්තකාල එකතුව සම්බන්ධයෙන් කරනු ලබන ඉහත පර්යේෂණ වලට අමතරව එම එකතුන් කොතෙක් දුරට පාඨක අවශ්‍යතා ඉටු කරයි ද යන්න පිළිබඳව කරන පර්යේෂණයි. ඒ තුළින් ඒ ඒ පුස්තකාලය විසින් සිදුකරනු ලබන පාඨක සේවා පිළිබඳව ඇගයීමක් කළ හැකිය.

එසේම පුස්තකාල සංවිධානය සම්බන්ධයෙන් සලකා බලන විට අභ්‍යන්තර සංවිධානය පිළිබඳව ද පර්යේෂණ කළ හැකිය. එසේම මහජන සබඳතා හා පුස්තකාල සේවා ඇගයීම සම්බන්ධයෙන් ද පර්යේෂණ මගින් පුස්තකාල හා ප්‍රලේඛන සේවාවේ ප්‍රගතියට විශාල පිටුවහලක් ලබාගත හැකිය.

## පුස්තකාල පාඨක ප්‍රජාව හා පාඨක අධ්‍යාපනය

මේ යටතේ පර්යේෂණයන් හි නිරත විය හැකි ක්ෂේත්‍ර කිහිපයකි. එනම් පාඨක වර්ග, පාඨක අවශ්‍යතා, පාඨක චර්යා, පුස්තකාලයට එක් කළ යුතු ද්‍රව්‍ය, පුස්තකාලයට නොඑන පාඨකයන් සඳහා කළහැකි සේවා ආදිය පිළිබඳව පර්යේෂණ සිදුකළ හැකිය. මෙහිදී පාඨකයන්ගේ අන්තයෙන් කරන පර්යේෂණ වලදී පාඨක වර්ගය පිළිබඳ කරන අධ්‍යයන තුළින් පුස්තකාල සේවාවේ ප්‍රවර්ධනය සඳහා විශාල කාර්යභාරයක් කළ හැකිය. එහිදී ඒ ඒ පුස්තකාලයේ සේවා සැපයිය යුතු පාඨකයන් හඳුනා ගැනීමෙන්, ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පුස්තකාලයාධිපතිවරුන්ට තම සේවා සංවිධානය විධිමත් හා කාර්යක්ෂම එකක් බවට පත් කරගත හැකිය.

එසේම විශේෂයෙන් මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා පුස්තකාලයට පැමිණෙන පාඨකයන් සම්බන්ධයෙන් මෙන්ම නොපැමිණෙන පාඨකයන් සම්බන්ධයෙන් ද අධ්‍යයනය කිරීම වැදගත් වන නිසාය. එසේ නොපැමිණෙන පාඨකයන් සඳහා පුස්තකාලය මගින් සිදුකළ හැකි කාර්යයන් පිළිබඳව අවබෝධයක් ලැබීමට මෙන්ම එම කාර්යය විධිමත් කිරීම සඳහා ද මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ අවශ්‍යව ඇත.

## සමාජය තුළ පුස්තකාලයේ කාර්යභාරය

රටක සංවර්ධන කාර්ය සඳහා අත්‍යවශ්‍ය ආයතනය පුස්තකාලයයි. පුස්තකාලයක් සමාජයකට අවශ්‍ය කරන්නේ ඒ සමාජයේ සිටින පුද්ගලයන්ගේ බුද්ධිමය වර්ධනය සඳහා ය. එමනිසා පුස්තකාලයට සමාජය තුළ ඇති කාර්යභාරය අති මහත් ය. එමනිසා මෙම ක්ෂේත්‍රයේ අවධානය යොමු කළ යුතු පර්යේෂණ ක්ෂේත්‍ර කිපයක් හඳුනාගෙන ඇත. පුස්තකාලයකින් සේවා ලබාගන්නා පිරිස විවිධ විය හැකිය. එසේම ඔවුන් තොරතුරු ලබාගන්නා අවශ්‍යතා ද විවිධය. මේ නිසා සමාජයේ විවිධ අවශ්‍යතා සඳහා තොරතුරු සොයා එන පාඨකයින්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ගේ අභිමථාර්ථ ඉටු කරදීම පුස්තකාලයක මූලිකම කාර්යභාරයයි. ඒ නිසා එම තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීමට නිරතුරුව පර්යේෂණ සිදුකළ යුතුව ඇත. එපමණක් නොව, ශාස්ත්‍රීය කාර්යයන් සඳහා පුස්තකාලය යොදා ගැනීමේ දී එය කෙසේ කළහැකි ද යන්න

විමසීම සඳහා ද පර්යේෂණවල නිරතවම අවශ්‍ය වේ. මේ අනුව බලන කල සමාජය තුළ පුස්තකාලයේ කාර්යභාරය අතිවිශාල එකක් බැවින් ඒ සඳහා නිරතුරුව පර්යේෂණ කළ යුතුබව පෙනීයයි.

## පුස්තකාලයේ ඉතිහාසය හා පුස්තකාලයාධිපතිත්වයේ ඉතිහාසය

පුස්තකාල ඉතිහාසය වසර දහස් ගණනක් තරම් ඈතට දිව යයි. මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණයන් හි නිරතවන්නන් හට මේ සඳහා අති විශාල කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීමට සිදු වේ. මුල් යුගයේ පැවතියේ පුස්තකාල ආගමික ස්ථාන ඇසුරු කරගෙනයි. එම අවධියේ දී පුස්තකාල සම්පත් පරිහරණය බොහෝ දුරට පූජක පක්ෂයට පමණක් සීමා විය. වරක ඒවා ගබඩා ස්වරූපයක් ඉසිලූ අතර පුස්තකාලයාධිපති ද එම ගබඩාවල භාරකරුවෙක් ලෙස කටයුතු කර ඇත. එහෙත් මීළඟ යුගය උදාවන විට මෙම රැස්කොට ගබඩා කර සුරක්ෂිත කිරීමේ කාර්යය වෙනුවට අත්පත් කරගැනීමේ හා පරිහරණය කිරීමේ යුගය උදා විය. එහෙත් වර්තමානයේ පුස්තකාලය යනු ප්‍රවේශ ස්ථානයක් පමණක් බවට පත්ව ඇත. නූතන පුස්තකාල සංකල්පය තොරතුරු මධ්‍යස්ථාන ලෙසත්, පුස්තකාලයාධිපතිත්වය විඥාපන විද්‍යාඥයින් ලෙසත් පරිවර්තනය වී ඇත.

මේ නිසා පුස්තකාලයේ හා පුස්තකාලයාධිපතිත්වයේ සංවර්ධනය නූතන තාක්ෂණික පුස්තකාල නැතහොත් පොත් නැති පුස්තකාලය යන සංකල්පය දක්වා වර්ධනය සිදු වී ඇති ආකාරය පර්යේෂණ කළ හැකිය. මේ තුළින් මෙම ක්ෂේත්‍රයේ ගතික ස්වරූපයත්, වැඩෙන ස්වරූපයත් මනාව අවබෝධ කරගත හැකිවනු ඇත. ඒ නිසා පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණවල නිරත වූවන්ට ඉතාමත් තෘප්තිමත් ලෙස පර්යේෂණ කළහැකි ක්ෂේත්‍රයක් ලෙස මෙය හඳුන්වාදිය හැකිය. මේ තුළින් තොරතුරු බෙදා හැරීමේ සේවාවන් වර්ධනය කෙරේ ද මහත් පිටුවහලක් ලැබෙනු ඇත.

## පුස්තකාල වෘත්තිකභාවය

ඕනෑම සංවිධානයක් හෝ ආයතනයක් රඳා පවතින්නේ එම ආයතනයේ කළමණාකාරීත්වය මතයි. ආයතනයක කළමණාකාරිත්වය සඳහා ඉහළ සිට පහළ දක්වාම සංවිධානාත්මක රටාවක් අනුව ගොනු වූ සේවක පිරිසක් සිටිය යුතුය. මේ නිසා පුස්තකාල ක්ෂේත්‍රය සඳහා ද සේවකයන් නැතහොත් ශ්‍රම සම්පත ලබා ගැනීමේ දී පුස්තකාලයාධිපතිවරු වඩාත් සැලකිලිමත් විය යුතුය. ඒ නිසා පුස්තකාලය යනු සමාජයේ ඉතාමත් කාර්යබහුල මෙන්ම ඵලදායී ආයතනයක් බැවින් ඒ සඳහා සේවකයින් තෝරාගැනීම ක්‍රමානුකූලව රටාවකට අනුව පර්යේෂණාත්මකව සිදුකළ යුතුය. එබැවින් ඒ සඳහා මේ ක්ෂේත්‍රයේ නියුක්ත කරවීමට කුමන ආකාරයෙන් සේවකයන් (ශ්‍රමිකයන්) තෝරා ගත යුතු ද යන්න තීරණ ගන්නා පක්ෂයට පැහැදිලි කර ගැනීමට අවශ්‍ය පර්යේෂණ සිදුකළ යුතුව ඇත. එය ක්ෂේත්‍රයේ ඉදිරි ගමනට මහත් සේ ඵලදායී වනු ඇත. එසේම ඉහළ කළමණාකාරිත්වය සඳහා තෝරා ගන්නා පුස්තකාලයාධිපතිවරුන්ගේ සිට සාමාන්‍ය කම්කරුවා දක්වා මේ ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයන් තෝරා ගැනීමේ දී ඔවුන්ගේ ප්‍රතිරූපය සහ තත්ත්වය කෙරේ අවධානය යොමු කළ යුතුය. එබැවින් තීරණ ගන්නා පක්ෂයට එබඳු හඳුනා ගැනීමකට පර්යේෂණ මඟින් කරනු ලබන යෝජනා මහත් ඵලදායී වනු ඇත.

එපමණක් නොව මේ අංශයේම තවත් පර්යේෂණයට ලක්කළ හැකි ක්ෂේත්‍රයක් ලෙස මානව සම්පත පුස්තකාලයට විධිමත්ව යොදා ගන්නා ආකාරය පිළිබඳව පර්යේෂණ කළ හැකිය. නූතන පුස්තකාලය තාක්ෂණික අතින් ඉතාමත් ඉහළ ස්ථානයක පවතින ආයතනයකි. එබැවින් එම ආයතනයේ මිනිස් ශ්‍රමය හැසිරවීමට ක්‍රමානුකූල පර්යේෂණ මඟින් ක්‍රමවේද සොයාගත යුතුය. මේ නිසා මෙය පුස්තකාල ක්ෂේත්‍රයේ ඉතාමත් ඵලදායී ප්‍රතිඵල ළඟා කරදීමට සමත් පර්යේෂණ ක්ෂේත්‍රයක් ලෙස ද හැඳින්විය හැකිය.

## තොරතුරු තාක්ෂණය

තොරතුරු සන්නිවේදනයේ අධිවේගී මාර්ගයකට පිවිස සිටින නූතනයේ පුස්තකාල ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ද අති විශාල කාර්යභාරයක් ඇත. මෙම ක්ෂේත්‍රයේ අනාගත ප්‍රගමනයන් හා වර්ධනයන් හඳුනා ගැනීමට මේ ක්ෂේත්‍රයේ පර්යේෂණ රැසක් සිදුකළ යුතුව ඇත. සාම්ප්‍රදායික පුස්තකාලය යන අදහසින් බැහැරව මීළඟ සියවසේ උදාවන තොරතුරු තාක්ෂණයේ මහා විප්ලවීය වෙනසට මුහුණදීම සඳහා පර්යේෂණාත්මක හෙළිකර ගැනීම් රැසක් අවශ්‍යව ඇත. එනිසා පුස්තකාල අධ්‍යාපනයේ නියුතු පර්යේෂකයන්ට තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් සෙවිය යුතු අංශ රැසක් ඇත. පරිගණක තාක්ෂණය උපයෝගී කරගෙන සිදුකළ හැකි කාර්යයන් බොහෝය. එහෙත් පුස්තකාල ක්ෂේත්‍රයට තවමත් පරිගණකය නුහුරු නුපුරුදු මෙවලමක ස්වරූපය උසුලයි. එනිසා පරිගණකය ආශ්‍රිතව සිදුකළ හැකි තාක්ෂණික ක්‍රියාවලිය සම්බන්ධයෙන් පර්යේෂණ රැසක් සිදුකළ යුතුව ඇත.

## පුස්තකාල සම්පත් ඇගයීම (භාවිත කිරීම)

මේ සඳහා සංකල්ප දෙකක් ඇත. එනම් SWOT හා SMART යන සංකල්ප දෙකයි. සෙවීම, ගණනය කිරීම, භාවිතා කිරීම, අදාළත්වය සහ කාලය යන කරුණු ඔස්සේ මේ සඳහා පර්යේෂණ කළ හැකිය. මීට අමතරව ශක්තිය, දුර්වලතා, අවස්ථා සහ තර්ජන යන සංකල්ප ඔස්සේ ද පර්යේෂණ කළ හැකිය. ඒ තුළින් පුස්තකාලය වැනි වැඩෙන ආයතනයක තවදුරටත් වර්ධනය කළ යුතු අංශ පිළිබඳවත්, එසේ වර්ධනය සඳහා ඇති අවස්ථා පිළිබඳවත් පමණක් නොව දුර්වලතා ද ප්‍රතිපත්ති තීරණ ගන්නා අයට හෙළිදරව් කර දිය හැකිය. එය මේ ක්ෂේත්‍රයේ ප්‍රගමනයට අති විශාල වාසියකි. මෙසේ පුස්තකාල සම්පත් (එකතුන්) අගය කිරීම තුළින් ඒ ඒ ආයතනවල පුස්තකාල සඳහා සමතුලිත එකතුන් සකස් කර ගැනීමට හැකිවනු ඇත. එය මේ ක්ෂේත්‍රයේ ඵලදායීතාවට බෙහෙවින්ම ඉවහල් වේ.

## පුස්තකාලයාධිපතිත්වය හා පුස්තකාලයාධිපතිත්වයේ දර්ශනය

පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් ලෙස වර්ධනය වීම නිසා එයටම ආවේණික න්‍යායන් හා සංකල්ප බිහි වී ඇත. එහෙත් පුස්තකාලයාධිපති යන සංකල්පය සම්බන්ධයෙන් විවිධ මතිමතාන්තර සමාජය තුළ පවතී. වෘත්තීමය ක්ෂේත්‍රයක් ලෙස පුස්තකාලයාධිපතිත්වය පිළිගැනීමට තවමත් අනෙක් ක්ෂේත්‍රවල නිරතවූවෝ යම් මැලිකමක් දක්වති. එනිසා මේ සඳහා මෙම ක්ෂේත්‍රයේ නිරතවූවනට විශාල කාර්යභාරයක් සිදුකළ යුතුව ඇත. තම වෘත්තිය හැකියාවන් සමඟම වෘත්තීය ගෞරවය හා තත්වය කෙරේ ද අවධානය යොමුකළ යුතුව ඇත. ඒ සඳහා වර්තමාන පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරය කෙබඳු ද? එය කෙසේ සකස්විය යුතුද? යන්න විග්‍රහ කිරීමට අවශ්‍ය තොරතුරු සපයා ගත හැකිය. පොත් එකතුවක් රකින මුරකරුවෙකුගේ භූමිකාවෙන් බැහැර වී පාඨකයාට අවශ්‍ය තොරතුරු කරා ලෙහෙසියෙන් ළඟා වීමට ඉඩ සලසන සේවා සපයන්නෙකු බවට ද වර්තමානයේ පාඨකයා අරමුණු කරගත් පුස්තකාල සංවිධානය දක්වා පුස්තකාලයාධිපතිත්වය යොමු කල යුතුව ඇත. එස්. ආර්. රංගනාදන්ගේ පුස්තකාල නීති පහ ඇතුළත් දර්ශනයේ පවතින සදාකාලික අදාළත්වය, පුස්තකාලයාධිපතිවරයා හා තොරතුරු විශේෂඥයා අතර සම්බන්ධතාව පුස්තකාලයාධිපතිවරයා පිළිබඳ ප්‍රතිරූපය හා සමාජයේ පිළිගැනීම කෙසේද?, පුස්තකාලයාධිපතිත්වයේ විනය හා චර්යා ධර්ම කෙසේ සකස්විය යුතුද?, කඩදාසි ද්‍රව්‍ය පුස්තකාලයකින් විද්‍යුත් මාධ්‍ය පුස්තකාලයක් කරා පරිවර්තනයේ දී තොරතුරු විශේෂඥයෙකුගේ කාර්යභාරය කෙසේ සකස් විය යුතුද? ආදී ප්‍රශ්න වලට පිළිතුරු ලැබෙන්නේ විධිමත් පර්යේෂණ සිදුකිරීමෙනි. එනිසා මේ සම්බන්ධයෙන් විශාල පර්යේෂණ ප්‍රදේශ ඇති බව මනාව පැහැදිලි වේ. මෙම පර්යේෂණ පුස්තකාල ක්ෂේත්‍රයට ඉතා ප්‍රයෝජනවත් වේ. එසේ වනුයේ මෙමගින් නූතන සමාජයට විශාල සේවාවන් රැසක් සිදුකළ හැකි වීමයි.

## ප්‍රතිපත්ති සම්පාදනය

මෙය පොදුවේ පර්යේෂණ ක්ෂේත්‍රයේ දක්නට ඇති පර්යේෂණ විශේෂයකි. මෙමඟින් සැලසුම් නිර්මාණය කරන්නන් හට හා ප්‍රතිපත්ති තීරණ ගන්නා අයට විශාල වශයෙන් උපකාරී විය හැකිය. පුස්තකාල ක්ෂේත්‍රය

සම්බන්ධයෙන් ද මෙම පර්යේෂණ අතිශයින්ම වැදගත් වේ. තවමත් ශ්‍රී ලංකාවට පිළිගත් විඥාපන ප්‍රතිපත්තියක් නැත. එසේම මෙරට බොහෝ පුස්තකාලවලට ද එබඳු ප්‍රතිපත්ති මාලාවක් නොමැති වීම බලවත් පාඩුවකි. එබැවින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හැකිවන්නේ ඒ සඳහා පර්යේෂණ සිදු කිරීමෙන් පසුවයි. පුස්තකාලය නිරතුරුව වෙනස්වන ආයතනයක් නිසා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී බෙහෙවින්ම කල්පනාකාරී විය යුතුය. එනිසා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පෙර ඒ සඳහා පර්යේෂණ ගණනාවක් කිරීමට සිදුවේ. එමඟින් පුස්තකාල ක්ෂේත්‍රයේ වර්ධනයන් රැසක් සිදුකර ගත හැකිවනු ඇත. මෙසේ සලකා බලන විට ශ්‍රී ලංකාවේ විඥාපන ප්‍රවර්ධනයට මේ සෑම ක්‍ෂේත්‍රයකම පර්යේෂණ සිදු කළයුතුව ඇති බව පෙනීයයි.

## Reference

Huber, Jeffrey T. (1995). Library and information studies education for the 21st century practitioner, journal of Library Administration, 20 (3/4) pp 119-130.

Gilchrist, A. (1982). System design and planning, Handbook of special Librarianship and information work, L.J. London: Aslib. Pp 9-35.

Slater, Margaret. (1990). Qualitative research methods in library and information studies ed. by Slater Margaret, London, Library association, pp 107-127.

Ranganathan, S.R. (1998). Library Administration, Sarada Ranganadan Endowment, Bangalore.

Bryman, A. (2008). *Social Research Methods,* 3rd edn. Oxford University Press, Oxford.

Punch, K.F. (1998). *Introduction to Social Research: Qualitative and Quantitative Approaches*. Sage Publications, London.

http://www.odi.org.uk/publications/220-bridging-research-policy-rapid-approach

රණසිංහ, පියදාස. (2009). උසස් උපාධි නිබන්ධ සම්පාදන උපදෙස්, සංස්කරණය - කැළණිය විශ්වවිද්‍යාලය, සමාජීය විද්‍යා පීඨය.

ජයසේන, අශෝකා. (2015).පර්යේෂණ ක්‍රමවිද්‍යා ප්‍රවේශය, ගොඩගේ, කොළඹ.

# තිරසර සංවර්ධනය සඳහා තොරතුරු සාක්ෂරතාව අත්‍යවශ්‍යද?

මනෝරි සමරකෝන්

## සංක්ෂිප්තය

මානව වංශ කතාවේ විවිධ යුග පසුකළ මිනිසා අද වන විට තොරතුරු යුගයකට පැමිණ ඇත. මිනිසාගේ පස්වන මූලික අවශ්‍යතාව බවට තොරතුරු පත්ව ඇති නූතනයේ තම අවශ්‍යතා සඵලදායීව ඉටුකරනු වස් තොරතුරකට උපක්‍රමික සම්පතක් ලෙස හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. රටක ආර්ථික වර්ධනය තීරණය කිරීමේ දී එම රටේ පවතින සම්පත් ප්‍රමාණය සුවිශේෂ වේ. වර්තමානයේ තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම පිළිබඳව කාගේත් අවධානය යොමු වී ඇත. තිරසර සංවර්ධනය පිළිබඳ තොරතුරු ජනතාව අතරට රැගෙන යාම එහි දී ඉතා වැදගත් ය. රටක සංවර්ධනයට තොරතුරු දැනුම සම්පතක් ලෙස යොදා ගැනීමත්, තොරතුරු සම්පත පවත්වා ගැනීම, බෙදා හැරීම හා යාවත්කාලීන කිරීම සඳහා පුස්තකාල ක්ෂේත්‍රය වැඩි දායකත්වයක් දක්වනු ලබයි. පුද්ගලයින් තුළ තොරතුරු සාක්ෂරතා කුසලතා සංවර්ධනය ඒ සඳහා අත්‍යවශ්‍ය සාධනයක් වී ඇත. පුද්ගලයෙකු තම තොරතුරු අවශ්‍යතා කොතෙක් දුරට ඉටුකර ගන්නේ ද යන්න තීරණය වනුයේ ඔහු සතු තොරතුරු සාක්ෂරතා කුසලතා අනුව ය. පුස්තකාල පිළිබඳ අන්තර්ජාතික සංගම් සංවිධානය (IFLA) ද තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට පුස්තකාල ක්ෂේත්‍රයේ කටයුතු කෙසේ විය යුතු ද යන්න පිළිබඳ අවධානය යොමු කර ඇත. තොරතුරු සාක්ෂරතාව තිරසර සංවර්ධනයේ ප්‍රධාන කුළුණකි. තිරසර සංවර්ධන තොරතුරු සාක්ෂරතාවයෙහි වැදගත්කම කොතෙක් ද යන්න මෙම ලිපියෙන් විග්‍රහ කෙරේ.

## තිරසර සංවර්ධනය හැඳින්වීම

තිරසර සංවර්ධනය වර්තමානයේ සාකච්ඡා වන ඉතාමත් වැදගත් මාතෘකාවක් බවට පත්ව ඇත. තිරසාර සංවර්ධනය යනුවෙන් අදහස් වනුයේ ස්වභාවික සම්පත් හා නොගැටෙන ආකාරයටත් පරිසරයට

තර්ජනයක් නොවන අයුරිනුත් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක් පවත්වාගෙන යා යුතු බවයි. මූලාරම්භ අවධියෙහි දී අදහස් කරන ලද්දේ,

| |
|---|
| **තිරසර සංවර්ධනය = ආර්ථික සංවර්ධනය + පාරිසරික සංවර්ධනය** |

යනුවෙනි. වර්තමානය වන විට වඩාත් පුළුල් අර්ථකථනයක් යටතේ තිරසර සංවර්ධනය සංකල්පය ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් අනුව අවධානය යොමු කර ඇත. එනම්,

- සමාජ
- ආර්ථික
- පාරිසරික යනුවෙනි.

ලෝක පාරිසරික හා සංවර්ධනය පිළිබඳ කොමිසම තිරසර සංවර්ධනය නිර්වචනය කරනු ලබනුයේ,

> " වර්තමාන පරම්පරාව විසින් භාවිත කරන අතරම අනාගත පරම්පරාවට ද ලොව පාරිසරික සම්පත් හා ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සිදු කෙරෙන සංවර්ධනය තිරසර සංවර්ධනය වේ."
>
> (පතිරගේ, 2011)

යනුවෙනි.

වර්තමානයේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් ගන්නා විවිධ පියවරයන් තුළින් නැවත මිනිසුන්, සතුන් මෙන්ම පරිසරයට ද අහිතකර බලපෑම් ඇති වේ. සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය උපකරණයක් ලෙස තොරතුරු සාක්ෂරතාවය දැක්විය හැකි ය. තොරතුරු පිළිබඳව දැනුවත් වීම මූලික වශයෙන් අත්‍යවශ්‍ය වූ කාරණයකි.

ලෝක පරිසරයට දැඩි ලෙස හානි සිදුවෙමින් මානව ක්‍රියාකාරකම් සිදුවීම දිනෙන් දින ඉහළ යාම හේතු කොට ගෙන එය අවම කිරීම සඳහා කළ උත්සහයක් ලෙස තිරසර සංවර්ධනය සරලව හඳුන්වා දිය හැකි ය.


සියලුම රටවල් මේ සඳහා අවධානය යොමු කර ඇත්තේ අනාගත පරම්පරාවේ අවශ්‍යතාවයන් හා අපේක්ෂාවන් විනාශ නොකර වර්තමාන පරම්පරාවේ අවශ්‍යතා මුදුන්පත් කර ගැනීමේ අභිලාශයෙනි.

නූතන විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව පරිසරය අමතක කොට සිදුකළ නොහැකි ය. තිරසර සංවර්ධනයේ දී පහත සඳහන් කාරණා පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

i. සම්පත් සීමිත බව
ii. සංවර්ධනයේ උපරිම සීමාවක් ඇති බව
iii. පරිසරය ක්‍රියා කිරීම බව

මිනිසා සංවර්ධන කටයුතු වලදී පරිසරය ගැන අඩු අවධානයක් දී කටයුතු කිරීම තුළ නොයෙක් ගැටලුවලට මේ වන විට මුහුණ දී ඇත. ගෝලීය උණුසුම වැඩි වීම, ගොඩබිම් යටවීම, අම්ල වැසි, සාගර ජලය අපවිත්‍ර වීම, පරිසර දූෂණය, මානුෂික වාසභූමි අහිමි වීම ඒ අතර කිහිපයකි. ජනගහනය ඉහළ යාමත් සමඟම ඉවක් බවක් නොමැතිව පාරිසරික සම්පත් භාවිත කිරීමට යාමෙන් එය මානව සංවර්ධනයට සෘජු බලපෑමක් කරනු ලැබ ඇත. මේ නිසා පාරිසරික වශයෙන් මානව වර්ගයාගේ පැවැත්මට අහිතකර ආකාරයේ ගැටලු සහගත තත්ත්වයන් ඇති වී තිබෙන බැව් ඉතා පැහැදිලි කරුණකි.

උක්ත සඳහන් කළ ආකාරයට තිරසර සංවර්ධනයක් කරා ලඟා විය හැක්කේ ආර්ථික, පාරිසරික හා සාමාජික ක්ෂේත්‍රයන්හි අරමුණු ඉටු කර ගැනීමේ දී සමබරව පවත්වා ගෙන යාමෙනි.




(පතිරගේ, 2011)

තිරසර සංවර්ධන අරමුණු කරා යන ගමනේ දී පුස්තකාල වල කාර්යභාරය සුවිශේෂී වේ. සාක්ෂරතා මට්ටම ඉහළ නංවමින් මිනිසුන් දැනුවත් කිරීමේ කාර්යභාරය පැවරී ඇත්තේ පුස්තකාල වලට ය.

ඒ ඒ මට්ටමේ ජන කොටස් වලට දැනුම සම්ප්‍රේෂණය කිරීම විශේෂයෙන් මහජන පුස්තකාලයන්ට සිදු කළ හැකි ය.

තිරසර සංවර්ධන අරමුණු 17ක් ඉටු කර ගැනීම සඳහා කටයුතු කරමින් ඇත.

1. දුප්පත්කම තුරන් කිරීම
2. කුසගින්න නැති කිරීම
3. යහපත් සෞඛ්‍යය හා යහ පැවැත්ම
4. ගුණාත්මක අධ්‍යාපනය
5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා කාන්තාවන් සවිබල ගැන්වීම

6. පිරිසිදු ජලය හා සනීපාරක්ෂක පහසුකම්
7. සැමට දැරිය හැකි විශ්වාසදායක නවීන බල ශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම
8. තිරසාර ආර්ථික සංවර්ධනය, සැමට ඵලදායී සහ යෝග්‍ය රැකියා
9. නවෝත්පාදන හා යටිතල පහසුකම් ගොඩනැගීම
10. අසමානතාව අඩු කිරීම
11. තිරසර, පහසු ආරක්ෂිත නගර නිර්මාණය සහ ප්‍රජාව පදිංචි කරවීම
12. තිරසර පාරිභෝජන හා නිෂ්පාදන රටාවන් තහවුරු කිරීම
13. හදිසි කාලගුණ වෙනස්වීම් වලට අනුව කටයුතු කිරීම
14. සාගර, නාවික සම්පත්, මුහුදු සංරක්ෂණය කිරීම
15. වනාන්තර, භූමිය, ගස්වැල් ආරක්ෂා කිරීම
16. සාධාරණ සාමකාමී සමාජයක් ස්ථාපිත කිරීම
17. ගෝලීය පුනර්ජීවයක් ඇති කිරීම

මේ සියලුම කාරණා පිළිබඳව පුද්ගලයින් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය කරුණක්ව පවතී. ජනතාව තොරතුරු සාක්ෂරතා කුසලතාවලින් සන්නද්ධ කළ හැකි නම් මෙම අරමුණු කරා ලඟ කර ගැනීම එතරම් අපහසු නොවනු නොඅනුමාන ය.

## තොරතුරු සාක්ෂරතාව

මූලික අවශ්‍යතාවලින් තෘප්තිමත් ඉතා සරල ජීවන රටාවකට අතීත මිනිසා හිමිකම් කියන්නට විය. කාලීනව ඇති වූ විවිධ සංවර්ධනයන් තුළින් පෝෂණය ලබමින් සපැමිණ අද වන විට දැනුම පදනම් කරගත් සමාජයක් බිහිව ඇත. තොරතුරු වලින් තොරව කිසිදු විෂය ක්ෂේත්‍රයක පැවැත්මක් අපේක්ෂා කළ නොහැක. තොරතුරු අවශ්‍යතාවය නිවැරදිව නිර්වචනය කර ගෙන තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති හැකියාව තොරතුරු සාක්ෂරතාව ලෙස හඳුන්වා දිය හැකි ය.

> "පුද්ගලයෙකු සතු දැනුම් මට්ටම වෙනස් කළ හැක්කා වූ යමක් සහ මෙම වෙනස සිදු කිරීමට හැකියාව ඇති අරමුණු වල භෞතික නිරූපණයක් ද තොරතුරු ලෙස නිර්වචනය කළ හැකි ය."
>
> (අමරවීර, 2005)

පාඨකයා සහ තොරතුරු මූලාශ්‍ර සම්බන්ධ කරන සම්බන්ධීකාරකයා වනුයේ තොරතුරු අවශ්‍යතාවන් ය. එහෙයින් පාඨකයා සහ තොරතුරු මූලාශ්‍ර නිවැරදිව සම්බන්ධ වීමට පුද්ගලයින් සතුව තොරතුරු සාක්ෂරතා කුසලතා පැවතිය යුතුවේ. තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පුද්ගලයකුට අභිප්‍රේරණය, කාලය, කුසලතා, තොරතුරු සඳහා ප්‍රවේශය, තීරණ ගැනීමේ අවශ්‍යතාව, නව අදහස් සොයා යාමේ අවශ්‍යතාව, වෘත්තීය අවශ්‍යතාව, රුචිකත්වය දක්වන ක්ෂේත්‍ර වැනි සාධක ගණනාවක් බලපානු ලැබේ.

එම විවිධ වූ අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේ දී විවිධ මූලාශ්‍ර වලින් තොරතුරු ලබා ගැනීමට, ඇගයීමට හා භාවිත කිරීමට ඇති හැකියාව තොරතුරු සාක්ෂරතාවය යනුවෙන් නිර්වචනය කළ හැකි ය. තොරතුරු බිහි වන මූලාශ්‍රයන් ප්‍රාථමික, ද්විතීය හා තෘතීය ගණයට අයත් වේ. තොරතුරු මූලාශ්‍රයන් අතරින් තම අවශ්‍යතාවයන්ට නිවැරදිවම ගැලපෙන මූලාශ්‍රය සොයා ගැනීම ඉතා අපහසු වූ කාර්යයකි.

එදිනෙදා කටයුතු වලට මෙන්ම අධ්‍යයන පර්යේෂණ හා වෘත්තීය අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය නිවැරදිම තොරතුරු කවරේ ද? ඒවා අත්පත් කර ගන්නේ කෙසේද?, එම තොරතුරු ඇතුළත් මූලාශ්‍ර මොනවා ද?, ඒවා ඉතාමත් ඉක්මනින් ලබා ගන්නේ කෙසේද?, එම තොරතුරු අවශ්‍ය පරිදි නැවත සංවිධානය කරන්නේ කෙසේද? ආදී කාර්යයන් ඇතුළත් පරාසය සඳහා අවශ්‍ය කුසලතා සමූහය තොරතුරු සාක්ෂරතා කුසලතා ලෙස හඳුන්වා දිය හැකි ය.

"ඉගෙන ගන්නේ කෙසේද? යන්නට ඇති සමාන පදයක්" ලෙස ඕස්ට්‍රේලියානු පාසල් පුස්තකාල සංගමය විසින් තොරතුරු සාක්ෂරතාවය හඳුන්වා දී ඇත. තවදුරටත් විස්තර කරන්නේ නම් ඇමරිකානු පුස්තකාල සංගමය හඳුන්වා දෙන පරිදි පෞද්ගලිකව සත්‍ය ගවේෂණය කිරීමට හා දක්ෂ ලෙස අදහස් ප්‍රකාශ කිරීමට පුද්ගලයින් සතු බලය තොරතුරු සාක්ෂරතාව ලෙස විස්තර කළ හැකි ය. එය පුද්ගලික සවිබල ගැන්වීමකි.

තොරතුරු සාක්ෂරතාව සහිත පුද්ගලයාට දැනුම සංවිධානය වී ඇති ආකාරය පිළිබඳ දැනුමක් පවතින අතර තොරතුරු හඳුනා ගැනීමට සහ තොරතුරු සොයා ගැනීමට කාර්යක්ෂම ලෙස භාවිත කිරීමට හැකි අතර

ඔවුන් ස්වයංව ඉගෙන ගනිමින් ඕනෑම අරමුණක් වෙනුවෙන් තොරතුරු සොයා ගැනීමට තොරතුරු සාක්ෂරතාව (Information Literacy) සහිත පුද්ගලයාට හැකි බව ඇමරිකානු පුස්තකාල සංගමය විසින් පැහැදිලි කර ඇත. තොරතුරු යුගය තුළ රඳා පැවැත්මේ කුසලතාවයක් වශයෙන් ද මෙය හැඳින්වේ. යාවජීව අධ්‍යාපනයේ පදනම තොරතුරු සාක්ෂරතාවය වේ. තවද, තොරතුරු සාක්ෂරතාව පුළුල් අධ්‍යාපනික අරමුණකි. එහි අවසානය වන්නේ ස්වයං ඉගෙනුමට ඇති හැකියාවන් සංවර්ධනය වීමය. එනම්, ස්වාධීනව අධ්‍යයනයෙහි යෙදීමයි. යම් පුද්ගලයෙකු තොරතුරු සාක්ෂරතා කුසලතා ප්‍රගුණ කර ඇත් ද ඔහු තුළ යාවජීව අධ්‍යාපනයේ පදනම වර්ධනය වී ඇති බැව් තවදුරටත් පැහැදිලි කළ හැකි ය. තොරතුරු සාක්ෂරතා කුසලතා පිළිබඳව විවිධ පුද්ගලයින් අදහස් දක්වා ඇති අතර එක් වර්ගීකරණයක් පහත පරිදි විස්තර කර දිය හැකිය.




(Bundy, 2004)

යනුවෙනි. තොරතුරු සාක්ෂරතා කුසලතා ප්‍රගුණ කිරීම සඳහා විවිධ මොඩියුල හඳුන්වා දී ඇත. Big Six, PLUS , EMPOWERING 8 ඒ සඳහා උදාහරණ කිහිපයකි.

## සය විධ ප්‍රධාන කුසලතා පිළිබඳ එළඹුම (Big Six Skills)

සය විධ ප්‍රධාන කුසලතා (Big Six) යනු තොරතුරු සාක්ෂරතාව පිළිබඳ විෂය මාලාවක්, තොරතුරු ගැටළු විසඳීමේ ක්‍රියාවලියක් හා තොරතුරු අවශ්‍යතා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමේ ක්‍රමෝපායක් සඳහා වන කුසලතා සමූහයක් වේ. මයිකල් අයිසන් බර්ග් (Michal Eisen Berg) සහ බොබ් බර්කෝප්පටස් (Bob Berkowitze) විසින් මෙම එළඹුම නිර්මාණය කර ඇත. තොරතුරු ගැටළුවක් විසඳීමේ හෝ තීරණයක් ගැනීමේ හෝ කාර්යයක් ඉටු කිරීමේ අවස්ථාවක සිටින පුද්ගලයින්ට මෙවැනි මොඩියුල මහෝපකාරී වේ.

සාර්ථක ලෙස තොරතුරු ගැටලු විසඳීම සඳහා උපයෝගී වන මෙම කුසලතා 06 පහත සඳහන් පරිදි වේ.

1. කාර්යය විග්‍රහය (Task Definition)
   - කාර්ය විග්‍රහ කිරීම (තොරතුරු ගැටලුව)
     - ගවේෂණය කළ යුතු ප්‍රශ්නය සකස් කර ගැනීම
     - ගවේෂණය කිරීමට නියමිත ගැටලුව අනුව තොරතුරු අවශ්‍යතා හා විශ්ලේශණය කිරීම.
   - කාර්යය අවසන් කිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු හඳුනා ගැනීම.

2. තොරතුරු සෙවීමේ ක්‍රමෝපායන් (Information Seeking Strategies)
   - සියලු මූලාශ්‍ර අතරින් හොඳම මූලාශ්‍ර තෝරා ගැනීම.

3. සොයා ගැනීම හා ප්‍රවේශය (Location & Access)
   - මූලාශ්‍ර සොයා ගැනීම මූලාශ්‍ර තුළින් අවශ්‍ය තොරතුරු සොයා ගැනීම.

4. තොරතුරු භාවිතය (Use of Information)
   - කියැවීම, ඇහුම්කන් දීම, දැකීම, ස්පර්ශ කිරීම ආදිය මඟින් අදාළ තොරතුරු උකහා ගැනීම.

5. සංස්ලේෂණය (Synthesis)
   - විවිධ මූලාශ්‍ර වලින් ලබාගත් තොරතුරු සංවිධානය කිරීම හා ඉදිරිපත් කිරීම. ඒ සඳහා සටහන් ලියා ගැනීම, සටහන් සකස් කිරීම, ප්‍රස්තාරමය වැඩසටහන් මඟින් තොරතුරු සංවිධානය.
6. ඇගයීම (Evaluation)
   - ක්‍රියාවලිය විනිශ්චය කිරීම හා ප්‍රතිඵලය විනිශ්චය කිරීම.

මෙලෙස තොරතුරු සාක්ෂරතා කුසලතා අත්පත් කර ගැනීම පුද්ගලයින්ට මෙන් ම රටක් ලෙස සංවර්ධනය සඳහා ඉතා වැදගත් වන කරුණකි.

## තොරතුරු සාක්ෂරතාව හා තිරසර සංවර්ධනය

තොරතුරු සාක්‍ෂරතා කුසලතා සංවර්ධනය ආර්ථික, සමාජයීය, සංස්කෘතික ආදී වූ සෑම අංශයක ම සංවර්ධනයට හේතු වනු නොඅනුමාන ය. එනම් තිරසර සංවර්ධනය සඳහා හේතුවනු නිසැක ය. රටක් ලෙස ශ්‍රී ලංකාව ද තිරසර සංවර්ධන අරමුණු වෙත ගමන් කරමින් සිටින මෙවන් යුගයක තවදුරටත් තොරතුරු සාක්ෂරතා කුසලතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය. මිනිසුන් තිරසර සංවර්ධනය පිළිබඳ දැනුමින් සන්නද්ධ කළ යුතුය. තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ උපදේශන සේවා පැවැත්වීම ඉතා වැදගත් වේ. එහි ලා පුස්තකාලවල කාර්යභාරය සුළුපටු නොවේ. ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා තොරතුරු වෙත ප්‍රවේශය සඳහා ඇති අවස්ථා ඉහළ නැංවීම පුස්තකාල වලට සිදු කළ හැකි ය. තොරතුරු සාක්ෂරතා කුසලතා ඇති කිරීම තුළින් ස්වයංව අධ්‍යයන කටයුතු කර ගත හැකි පුද්ගලයින් බිහි වේ.

## තොරතුරු සාක්ෂරතාව හා තිරසර සංවර්ධනයේ සමාජ පැතිකඩ

මෙහි දී ප්‍රශස්ත සමාජයක් පවත්වා ගැනීම සඳහා ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු කර ගැනීම, නිදහසේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීම, සමාජ ගැටුම් නොමැති තත්ත්වයක් පවත්වා ගැනීම ඊට ඇතුළත් ය. ආදායම් බෙදීයාමේ විෂමතාව අවම කිරීමට නම් සමාජය තුළ වෙසෙන සාමාජිකයින් දැනුම ආකල්ප කුසලතාවලින් පරිපූර්ණ විය යුතුය. මේ

අනුව සඵලදායී පුද්ගලයකු බිහි කිරීම සඳහා තොරතුරු සාක්ෂරතා අද්විතීය කාර්යයක් ඉටු කරනු ලබන්නේ ය.

## තොරතුරු සාක්ෂරතාව හා තිරසර සංවර්ධනයේ ආර්ථික පැතිකඩ

මෙහි දී ආර්ථික ස්ථායීතාවයත් ආර්ථික වෘද්ධියත් ඇති කර ගැනීම සඳහා පවතින සම්පත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස භාවිතා කළ යුතු වේ. ආර්ථික සම්පත් උපරිම ඵලදායීතාවක් ලැබෙන ලෙස භාවිත කිරීමට නම් ආර්ථිකයක් තුළ වෙසෙන සජීවී වූ (ජීවී ශ්‍රමිකයන්) එකම සම්පත වන මානව සම්පත අනෙක් සම්පත් භාවිතා කිරීමේ දී අදාළ අරමුණු ඉටු වන ලෙසට ක්‍රියා කරවීමට යෝග්‍ය මානව සම්පතක් බිහි කර ගත යුතුය. එම මානව සම්පත බිහි කර ගැනීමට තොරතුරු සාක්ෂරතාව අද්විතීය කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එවිට පවතින සම්පත් අනාගත භාවිතයට සුරක්ෂිත කරමින් වර්තමානයේ ජාතික නිමැවුමක් බිහි කිරීමට හැකි වේ.

## තොරතුරු සාක්ෂරතාව හා තිරසර සංවර්ධනයේ පාරිසරික පැතිකඩ

පාරිසරික හානි වළක්වා ගනිමින් සම්පත්වල සුරක්ෂිතභාවය ඇති කිරීමත් අරමුණු කර ගනිමින් ආර්ථික සංවර්ධනයක් අත්පත් කරගත යුතු වේ. පරිසරයේ ඇති වටිනාකම හා පරිසරය හා මිනිසා අතර ඇති සබඳතාව පැහැදිලිව සන්නිවේදනය කළ යුතු වේ. එනම් වර්තමානයේ අප විසින් සම්පත් පරිභෝජනය කරමින් අනාගත පරම්පරාවට ද සුරක්ෂිත කර ගනිමින් පරිසර හානි අවම කිරීමත් පරිසරයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීමත් වේ. සාක්ෂරතා සමාජයක් ස්ථාපිත කිරීම තුළ මෙම කාරණය හොඳින් සාධනය කර හැකිය.

තිරසර සංවර්ධනයේ ආර්ථික වර්ධනය සමඟ ජනතාවගේ භෞතික ජීවන තත්ත්වය ඉහළ යාමට හා පාරිසරික සුරක්ෂිතභාවයක් ඇති කිරීමට විවිධ වූ සාධක යොදා ගනු ලැබුව ද තොරතුරු සාක්ෂරතාව තිරසර සංවර්ධනයේ වැදගත් පදනමක් ලෙස සැලකීම යුක්ති සහගත බැව් උක්ත සියලුම කරුණු වලින් අනාවරණය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

අමරවීර, ජේ. ඒ. (2005). තොරතුරු සහ තොරතුරු ගවේෂණය, පුස්තකාල විද්‍යා ලේඛන සමුච්ඡය, පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

අමරසිරි, ජී. ඩී. (2004). තොරතුරු සාක්ෂරතාව, කර්තෘ, මඩපාත.

කුමාරපේලි, තිසර. (2016). තිරසර සංවර්ධනය හා සන්නිවේදනය, ගොඩගේ, කොළඹ

පතිරගේ, පොඩිමැණිකේ. (2011). සංවර්ධන ආර්ථික විද්‍යාව න්‍යායන් සහ සංකල්ප, ගොඩගේ, කොළඹ.

විජේසුන්දර, චන්දිමා ගයත්‍රි. ( 2012). තිරසර සංවර්ධනය හා කාන්තාව, ගොඩගේ, කොළඹ.

Andrett, Susie. (2005). Information Literacy: A Practitioner’s Guide, Chandos Publishing, Oxford.

Bundy, Alan ed. (2004) Australian and New Zealand information literacy framework: Principles, Stand read and Practice, Australian & New Zealand institute for information literacy, Adelaide.

Crawford, S. (1978). Information needs and usesග *Annual re-view of Information Science and Technology* 13: 61-81

Kawatra, P. S. (1992). Library user Studies: A Manual for Libraries and Information Scientist, Jaico Publishing, Bombay.

Kawatra, P. S. (2000). 2000 PLUS: Library and Information System in the twenty first century, Crest Publishing, New Delhi.

Laloo, Bikika Tariang. (2002). Information needs, Information Seeking Behavior and User, Ess Ess Publication, New Delhi.

Moore, Penny. (2002). Information Literacy: What’s it all about@ Wellington: New Zealand Council for Educational Research.

Nasreen, Munira. (2006). Information needs and Information Seeking behavior of media Practitioners in Karachi, Department of Library and Information Science, University of Karachi.

Nichilos, D. (2000). Assessing Information needs: Tools techniques and concepts for the Internet age, ASLIB Information Management, London.

Ranaweera, P. (2010). Information Literacy Programme Conducted by Universities in Sri Lanka, *Journal of University Librarians Association of Sri Lanka*, Vol.14 (Issue 1).

Wijetunge, Predeepa & Alahakoon, U, *Empowering 8: the Information Literacy model developed in Sri Lanka to underpin changing education paradigms of Sri Lanka*. Sri Lanka Journal of Librarianship & Information Management volume 1, No. 1 pp. 31-41 31 https://sllim.sljol.info/articles/abstract/10.4038/sllim.v1i1.430/. Accessed on 13-8-2019.

# A Biblometric Analysis on Research Output of the University of Peradeniya in Web of Science

R. Maheswaran

## Abstract

This study analyzed the growth of research publications in the University of Peradeniya. A total of 2308 records were downloaded from Web of science database for the period of twenty seven years. The findings revealed that USA has the maximum number of contribution with 284 records, having a global citation score of 8452 and a local citation score of 242. In the ranking of authors, that Dissanayake MAKL has published the maximum number of publications with 61 records, having a global citation score of 1070 and a local citation score of 160. Further Contribution of journals, preference of publication, keywords used etc were also analyzed in this paper. The study also applied histograph analysis using histice based on Local Citation Scores (LCS).

Keywords: Scientometrics, Histcite, Web of Science, Local Citation Scores (LCS)

## Introduction

The University of Peradeniya is the oldest and the largest residential State University in Sri Lanka, funded by the University Grants Commission. Though it was established as the University of Ceylon in 1942, its precursor, The Ceylon University College, Colombo, was founded in 1921 as a part of the University of London's overseas academic network. The University of Peradeniya hosts nine faculties

(including the newly added Management faculty), three postgraduate institutes, 10 centres, 73 departments, and teaches about 12,500 undergraduate students and 8,200 postgraduate students in the fields of Medicine, Agriculture, Arts, Science, Engineering, Dental Sciences, Veterinary Medicine and Animal Science, Management and Allied Health Science. There are about 1,200 academic staff members involved in teaching and research endeavours in this University. It claims to have the largest government endowment by a higher education institution in Sri Lanka, based on its large staff and faculties/departments. *Scientometrics* a study, measuring the, "Quality" of science where emphasis is placed on investigations where the mechanisms of science are studied by statistical methods. This paper analyzes the research output of University of Peradeniya using scientometric tools.

## Objectives

The objectives of the study are:

- To analyze the year wise publication of research output in University of Peradeniya.
- To find out the prolific authors in University of Peradeniya.
- To find out the document wise distribution of publication.
- To analyze the extent of International Collaboration
- To analyze the journal wise distribution of publication.
- To analyze the keywords used by the researchers.
- To create a histograph based on Local Citation Scores

## Methodology

The data for the study were retrieved from web of science database which is a scientific and indexing service maintained by Thomson Reuters. The research productivity of University of Peradeniya was analyzed. The following search strategy has been used to extract data.
ADDRESS-ABS-KEY ("Univ Peradeniya")

The bibliographic details such as authors, document types, collaboration etc were analyzed using Histcite which is a software package used for bibliometric analysis and information visualization.

## Analysis

A total of 2308 records were published by the by researchers in the University of Peradeniya from the year 1989-2015. The research output was analyzed using various scientometric indicators.

## Year wise distribution of publications

**Table 1: Year wise Distribution of University of Peradeniya research output**

| S. No | Publication Years | Records | TLCS | TGCS |
|---|---|---|---|---|
| 01 | 1989 | 60 | 47 | 610 |
| 02 | 1990 | 69 | 77 | 897 |
| 03 | 1991 | 52 | 46 | 580 |
| 04 | 1992 | 52 | 50 | 747 |
| 05 | 1993 | 41 | 30 | 587 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | 1994 | 47 | 29 | 650 |
| 07 | 1995 | 50 | 18 | 506 |
| 08 | 1996 | 36 | 16 | 395 |
| 09 | 1997 | 31 | 45 | 928 |
| 10 | 1998 | 54 | 49 | 876 |
| 11 | 1999 | 45 | 50 | 723 |
| 12 | 2000 | 65 | 66 | 1287 |
| 13 | 2001 | 50 | 48 | 817 |
| 14 | 2002 | 57 | 86 | 1101 |
| 15 | 2003 | 84 | 73 | 1502 |
| 16 | 2004 | 88 | 85 | 1478 |
| 17 | 2005 | 100 | 93 | 1410 |
| 18 | 2006 | 87 | 94 | 1522 |
| 19 | 2007 | 105 | 64 | 1296 |
| 20 | 2008 | 161 | 113 | 1794 |
| 21 | 2009 | 149 | 87 | 1257 |
| 22 | 2010 | 140 | 75 | 898 |
| 23 | 2011 | 145 | 95 | 859 |
| 24 | 2012 | 154 | 86 | 3758 |
| 25 | 2013 | 141 | 43 | 339 |
| 26 | 2014 | 162 | 31 | 439 |
| 27 | 2015 | 83 | 4 | 10 |
| | **Total** | **2308** | **1600** | **27266** |

Table 1 shows the year wise distribution of research output in the University of Peradeniya. A total of 2308 records were published

during the period 1989 - 2015. The highest number of publications is in the year 2014 with 162 records with a global citation score of 439, and a local citation score of 31 which is followed by 161 records in the year 2008 with a global citation score of 1794 and a local citation score of 113. The table clearly shows that publication output of University of Peradeniya is varying consistently every year, which indicates a fluctuating trend.

## Ranking of authors based on publications

**Table 2: Contribution of top ten authors to University of Peradeniya research output**

| S. No | Authors | Records | TLCS | TGCS |
|---|---|---|---|---|
| 01 | Dissanayake MAKL | 61 | 160 | 1070 |
| 02 | Rajapakse RPVJ | 58 | 44 | 439 |
| 03 | Dissanayake CB | 53 | 58 | 355 |
| 04 | Buckley NA | 51 | 94 | 849 |
| 05 | Rajapakse RMG | 47 | 68 | 425 |
| 06 | Dawson AH | 46 | 61 | 700 |
| 07 | Tilakaratne WM | 45 | 29 | 676 |
| 08 | Karunaratne V | 44 | 70 | 474 |
| 09 | Sangakkara UR | 42 | 18 | 185 |
| 10 | Gunatilleke IAUN | 39 | 84 | 773 |

Table 2 presents the ranking of top ten authors in the University of Peradeniya research output. The study found out that totally 5567authors contributed to University of Peradeniya research output. It is clearly noticed from the table that Dissanayake MAKL has

published the maximum number of publications with 61 records, having a global citation score of 1070 and a local citation score of 160, followed by Rajapakse RPVJ with 58 records, having a global citation score of 439 and a local citation score of 44.

## Journal wise distribution of publications

**Table 3: Contribution of top ten journals to University of Peradeniya research output**

| S. No | Journals | Records | TLCS | TGCS |
|---|---|---|---|---|
| 01 | Journal of the National Science Foundation of Sri Lanka | 95 | 20 | 86 |
| 02 | Clinical Toxicology | 43 | 22 | 117 |
| 03 | Phytochemistry | 34 | 42 | 590 |
| 04 | Current Science | 29 | 11 | 80 |
| 05 | Solid State Ionics | 27 | 39 | 466 |
| 06 | Transactions of the Royal Society of Tropical Medicine and Hygiene | 27 | 51 | 364 |
| 07 | Journal of Oral Pathology & Medicine | 25 | 23 | 383 |
| 08 | American Journal of Tropical Medicine and Hygiene | 24 | 26 | 408 |
| 09 | Electrochimica Acta | 21 | 61 | 393 |
| 10 | Journal of Dental Research | 20 | 02 | 48 |

Table 3 reveals the contribution of top ten journals in University of Peradeniya research output. The study found out that the research carried out by the university was published in 956 journals. It is clearly seen from the table that the journal “Journal Of The National

Science Foundation Of Sri Lanka" stands first with 95 records, having a global citation score of 86 and a local citation score of 20 which is followed by the journal "Clinical Toxicology" with 43 records, having a global citation score of 117 and a local citation score of 22.

## Document wise distribution of publications

**Table 4: Document wise Distribution of Records in University of Peradeniya**

| S. No | Document Type | Records | TLCS | TGCS |
|---|---|---|---|---|
| 01 | Article | 1868 | 1362 | 23100 |
| 02 | Meeting Abstract | 123 | 07 | 15 |
| 03 | Article; Proceedings Paper | 97 | 90 | 1276 |
| 04 | Review | 73 | 80 | 2275 |
| 05 | Letter | 48 | 11 | 91 |
| 06 | Note | 39 | 30 | 354 |
| 07 | Editorial Material | 29 | 18 | 139 |
| 08 | Bibliography | 12 | 00 | 02 |
| 09 | Biographical-Item | 09 | 00 | 00 |
| 10 | Book Review | 03 | 00 | 01 |
| 11 | Correction | 02 | 00 | 00 |
| 12 | News Item | 02 | 01 | 03 |
| 13 | Discussion | 01 | 00 | 06 |
| 14 | Reprint | 01 | 00 | 01 |
| 15 | Review; Book Chapter | 01 | 01 | 03 |
| | **Total** | **2308** | **1600** | **27266** |

Table 4 provides the distribution of publication on University of Peradeniya research by document types. It is clearly noticed from the table that the major source of publication in University of Peradeniya research comes in the form of Journal articles contributing to 1868 records, having a global citation score of 23100 and a local citation score 1362, and it is followed by Meeting Abstract with 123 records with a global citation score of 15 and a local citation score of 7.

## International colloboration

**Table 5: Country Wise Collaboration of Publications**

| S. No | Country | Records | TLCS | TGCS |
|---|---|---|---|---|
| 01 | USA | 284 | 242 | 8452 |
| 02 | UK | 278 | 264 | 8625 |
| 03 | Japan | 277 | 213 | 6000 |
| 04 | Australia | 218 | 207 | 5346 |
| 05 | Canada | 89 | 56 | 4253 |
| 06 | Peoples R China | 77 | 65 | 4192 |
| 07 | Sweden | 76 | 104 | 4110 |
| 08 | Germany | 72 | 74 | 2993 |
| 09 | India | 64 | 59 | 4522 |
| 10 | Denmark | 52 | 59 | 3849 |

Table 5 depicts the extent of top ten International collaboration of University of Peradeniya with other countries. It is clearly observed from the table that USA has the maximum number of contribution with 284 records; having a global citation score of 8452 and a local citation score of 242 which is followed by UK with 278 records,

having a global citation score of 8625and a local citation score of 264.

## Frequency of keywords

**Table 6: Frequency of Keywords in University of Peradeniya research output**

| S. No | Word | Records | TLCS | TGCS |
|---|---|---|---|---|
| 01 | SRI | 719 | 549 | 5254 |
| 02 | LANKA | 629 | 496 | 4540 |
| 03 | EFFECT | 96 | 72 | 885 |
| 04 | SPECIES | 91 | 97 | 1359 |
| 05 | LANKAN | 89 | 54 | 713 |
| 06 | BASED | 83 | 133 | 701 |
| 07 | ORAL | 75 | 59 | 1219 |
| 08 | POISONING | 73 | 112 | 1269 |
| 09 | ANALYSIS | 69 | 48 | 4037 |
| 10 | GROWTH | 68 | 28 | 335 |

Table 6 presents the top ten keywords used by the researchers in their publications. It is clearly seen from the table that the word “Sri” has been used in 719 records by the researchers with a Global citation score of 5254 and a Local citation score of 549, followed by the word “Lanka” in 629 records with a global citation score of 4540 and a Local citation score of 496.

## Histograph of University of Peradeniya research output

An attempt can be made to develop histograph for University of Peradeniya research output using histcite software, for which 2308 papers have been included and references have been quoted in the papers also. The collection is exported to software and shows 2308 papers and 28866 cited references with LCS 1600 and GCS 27266 during the period 1989 – 2015. Figure 1 illustrates 20 most highly cited papers in the stem cell research in Singapore based on their LCS. The important node 806 has five citation links, which is followed by 120 with four citation links,

| S. No | Paper No | Title | LCS | GCS |
|---|---|---|---|---|
| 01 | 120 | Amerasinghe FP, 1990, J Med Entomol, V27, P789 | 09 | 40 |
| 02 | 161 | Amerasinghe FP, 1991, Am J Trop Med Hyg, V45, P226 | 07 | 45 |
| 03 | 206 | Peiris JSM, 1992, T Roy Soc Trop Med H, V86, P307 | 08 | 47 |
| 04 | 214 | Amerasinghe PH, 1992, J Med Entomol, V29, P577 | 09 | 37 |
| 05 | 231 | Warnakulasuriya KAAS, 1992, Community Dent Oral, V20, P364 | 08 | 29 |
| 06 | 418 | Konradsen F, 1997, T Roy Soc Trop Med H, V91, P127 | 07 | 33 |
| 07 | 423 | Amerasinghe FP, 1997, J Med Entomol, V34, P290 | 08 | 17 |
| 08 | 429 | Ashton PMS, 1997, J APPL ECOL, V34, P915 | 07 | 73 |
| 09 | 448 | Hemingway J, 1998, Med Vet | 09 | 140 |

| | | | | |
|---|---|---|---|---|
| | | Entomol, V12, P1 | | |
| 10 | 495 | Atapattu DN, 1999, Mycopathologia, V145, P113 | 07 | 07 |
| 11 | 575 | Condit R, 2000, Science, V288, P1414 | 11 | 445 |
| 12 | 617 | Ratnayake R, 2001, J Nat Prod, V64, P376 | 08 | 29 |
| 13 | 677 | Dissanayake MAKL, 2002, Mater Res Bull, V37, P867 | 12 | 41 |
| 14 | 687 | Ileperuma OA, 2002, Electrochim Acta, V47, P2801 | 12 | 69 |
| 15 | 694 | Jayathilaka PARD, 2002, Electrochim Acta, V47, P3257 | 11 | 122 |
| 16 | 701 | Eddleston M, 2002, Lancet, V360, P1163 | 11 | 165 |
| 17 | 727 | Jayathilaka PARD, 2003, Solid State Ionics, V156, P179 | 13 | 47 |
| 18 | 760 | Dissanayake Makl, 2003, J Power Sources, V119, P409 | 09 | 77 |
| 19 | 774 | Kularatne Sam, 2003, Trop Med Int Health, V8, P803 | 13 | 30 |
| 20 | 806 | Buckley NA, 2004, J Toxicol-Clin Toxic, V42, P113 | 11 | 48 |

## Conclusion

The application of quantitative measures to scientific research has highlighted the contribution of countries, institutions, journals and also individual researchers. In the productivity analysis of University of Peradeniya research output during the period 1999-2015, it was found out that a total of 2308 records were published during the

given period.The findings obtained in this study may be useful for prospective students, researchers and research policy makers in the institution.

## References

Heilig, Leonard, and Stefan VoB. "A Scientometric Analysis of Cloud Computing Literature." *IEEE Transactions on Cloud Computing* 1, no. 1 (2014): 99.

Sagar, Anil et al., "Scientometric Mapping of Tsunami Publications: A Citation Based Study." *Malaysian Journal of Library and Information Science* 15, no. 1 (2010): 23-40.

"Mapping of Research Output of Food and Nutrition Literature in India." *International Journal of Information Dissemination & Technology* 4, no. 4 (2014).

Poornima, A., M. Surulinathi, N. Amsaveni, and M. Vijayaragavan. "MappingPoornima, A., N. Surulinathi, N. Amsaveni, and M. Vijayaragavan. "Mapping the Indian Research Productivity of Food Science and Technology: A Scientometric Analysis." *Food Biology* 1 (2011):

Thulasi, K., and SubbiahArunachalam. "Mapping of cholera research in Indian using HistCite." *Annals of Library and Information Studies* 57, no. 3 (2010): 310-326.

Balasubramani, R., and C. Murugan. "Mapping of Tapioca (Sago) research in India: A scientometric analysis." (2011)

"University of Peradeniya." University of Peradeniya. https://en.wikipedia.org/wiki/University_of_Peradeniya.

# ග්‍රන්ථ විචාර

කර්තෘ - දයා හේවාපතිරණ

**ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව**

ප්‍රකාශක - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012
පිටු - 582
මුද්‍රණය - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
මිල - සඳහන් ව නැත

බෞද්ධ සිතුවම් කලාව උසස් අරමුණු පෙර දැරිව ශ්‍රද්ධාව හා භක්තිය පෙරටු කොට මානව සමාජය තුළ අධ්‍යාත්මික ගුණදහම් වර්ධනය කිරීම අරමුණු කොට බිහි වූ කලා මාධ්‍යයකි. බෞද්ධ කලාකරුවා උත්සහා දරා ඇත්තේ ස්වකීය සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාවටත් ප්‍රඥාවෙන් ආධ්‍යාත්මික විමුක්තියටත් සමීප කරවීමටයි. එවැනි උසස් අරමුණු පෙරදැරිව වසර දෙදහස් ගණනක් තිස්සේ යුගයෙන් යුගය දිවයින පුරා බිහි වූ විහාර දහස් ගණනක් දිවයින පුරා දක්නට හැකිය. එම විහාරරාමවල දක්නට ඇති බෞද්ධ චිත්‍රකලා සම්ප්‍රදාය පිළිබඳව දිගුකලක් තිස්සේ වරින්වර අවධානය යොමුකල විවිධ විද්වතුන් විවිධ මානයන් ඔස්සේ පොත්පත් පර්යේෂණ ලිපි ලේඛන රාශියක් පාඨක ලෝකයට දායාද කර ඇත. එම ලිපි ලේඛන අතරට එක්ව ඇති නවතම පර්යේෂණාත්මක ග්‍රන්ථය වනුයේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රකාශනයක් ලෙස ආචාර්ය දයා හේවාපතිරණ මහතා විසින් එළි දක්වා ඇති අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය විසින් ද පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමැතිය ලත් ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව නැමති ග්‍රන්ථය යි.

ලක්දිව බෞද්ධ සිතුවම් කලාව සම්බන්ධයෙන් මෙතෙක් අවධානයට ලක් නොවූ අංශ කිහිපයක් කෙරෙහි හේවාපතිරණ මහතා මෙම ග්‍රන්ථයෙන් අවධානය යොමුකර ඇත. පරිච්ඡේද හතක ඒ හතර ප්‍රමාණයේ පිටු 568 ක් පුරා දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක වල වෙහෙර විහාර ආවරණය වන පරිදි අතිවිශාල තොරතුරු සම්භාරයක් මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර ඇත. සිතුවම් කලාවේ මූලික ලක්ෂණ පිළිබඳව මෙම කෘතියෙහි පළමුවන පරිච්ඡේදයෙන් විග්‍රහ කර ඇත. හෙල කලාකරුවා ඉන්දියානු ආභාෂය තම

නිර්මාණ සඳහා ලබා ගත්ත ද ස්වාධීන චින්තන ධාරාවක් ඔස්සේ දේශීය සැදැහැතියන් සෞන්දර්යාත්මකව මෙන්ම ආධ්‍යාත්මිකව පෝෂණය කර ඇති අයුරු කතුවරයා විසින් විග්‍රහ කර ඇත. දේශීය සිත්තරුන් හා ඔවුන් විසින් සිය නිර්මාණ සඳහා යොදාගත් මාධ්‍ය පිළිබඳව මෙන්ම ශ්‍රී ලාංකික කලාකරුවන්ගේ දැනුම් සම්භාරය, සිය නිර්මාණවල ගුණාත්මක බව වර්ධනය කිරීමට යොදාගෙන ඇති ආකාරය පිළිබඳව ද අවධානය යොමුකර ඇත. ඈත අතීතයේ සිට විසිවන සියවස දක්වා තරම් දීර්ඝ කාල පරිච්ඡේදයක් මෙරට බෞද්ධ විහාරාරාම චිත්‍ර ශිල්පීන් සිය නිර්මාණ සඳහා ප්‍රධාන වශයෙන් උපයෝගී කරගනු ලැබූ ජාතක කථා පිළිබඳවත් බුදුරුව හා බෝසත් නිර්මාණයේ දී යොදාගෙන ඇති විවිධ මුද්‍රා පිළිබඳවත් මෙම ග්‍රන්ථයෙහි හොඳින් පැහැදිලි කර ඇත. විශේෂයෙන් චිත්‍ර කලාව විෂයයක් ලෙස හදාරන පාසල් සිසුන්ට හා විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්හට මෙම කෘතියේ එන එම තොරතුරු ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව ග්‍රන්ථයේ දෙවන පරිච්ඡේදය වෙන් වන්නේ අනුරාධපුර හා පොළොන්නරු අවධීන්හි එනම් සම්භව්‍ය අවධිය ලෙස සැලකෙන අවධියේ මෙරට විහාර චිත්‍ර කර්මාන්තය පිළිබ විග්‍රහ කිරීමටයි. අනුරාධපුරයේ වෙස්සගිරිය, ජේතවනාරාමය, මිහින්තලය, පොළොන්නරුවේ දිඹුලාගල, පුල්ලිගොඩ. දකුණේ හම්බන්තොට සිතුල්පව්ව, කරඹගල ලෙන, නැගෙනහිර ගොනාගොල්ල, ඌව පළාතේ කොටියාගල, මධ්‍යම පළාතේ හිඳගල, සීගිරිය, කන්දලම ලෙන් චිත්‍ර, මහියංගනය වැනි දිවයිනේ ස්ථාන රාශියක සම්භව්‍ය යුගයට අයත් පැරණි බෞද්ධ චිත්‍ර පිළිබඳව විග්‍රහයක් කරන අතර කතුවරයා තම පර්යේෂණාත්මක තොරතුරු තහවුරු කරනු වස් මෙතෙක් මෙම විෂයය සම්බන්ධයෙන් ඇති ග්‍රන්ථවල එකම ග්‍රන්ථයක දක්නට නොමැති ආකාරයේ චිත්‍ර ඵලක සමූහයක් සිය ග්‍රන්ථයට ඇතුලත් කර තිබීම ප්‍රසංශනීය කරුණකි. විශේෂයෙන් මෙම චිත්‍ර ඵලක ඉතාමත් උසස් ශිල්පීය ඡායාරූප ශිල්පියෙකුගේ උත්සාහයක ප්‍රතිඵල බව මෙහිදී සඳහන් කල යුතුය. මෙම ඡායාරූප ආචාර්ය දයා හේවාපතිරණ මහතා සහ ඔහුගේ පුතණුවන් විසින්ම ලබාගත් ඡායාරූප බව සඳහන් වේ. විශේෂයෙන් මෙම පරිච්ඡේදයට බොහෝ කලා ඉතිහාසඥයන් අවධානය යොමු නොකළ අංශයක් කෙරෙහි කතුවරයා අවධානය යොමුකර ඇත. එනම් අපේ සම්භව්‍ය අවධියේ සිටම දක්නට ලැබුන පුස්කොල පොත් සඳහා භාවිතා

කළ කලාවයි. පුස්කොල පොත් අභ්‍යන්තරයේ සහ ඒවායේ කම්බවල ඇඳි චිත්‍ර බෞද්ධ සිතුවම් කලාවේ ඉතාමත් සුවිශේෂී චිත්‍ර ලෙස පෙන්වා දිය හැකිය. පුස්කොල පොත් කම්බා පිළිබඳව සිදුකර ඇති විග්‍රහය සහ එයට ඇතුලත් කර ඇති ඡායාරූප පුස්කොල ලේඛන සංස්කෘතිය පිළිබඳව නූතන සමාජය නොදැන සිටි කරුණු රැසක් පිළිබඳව අවබෝධය ලබාදීමට සමත්වනු නිසැකය. මේ නිසා මෙම ග්‍රන්ථයේ ඇති මෙම තොරතුරු අනිවාර්යයෙන් ම පාසල දරුවන් මෙන්ම ගුරු භවතුන්ගේ ද අවධානයට යොමු විය යුතු ය.

මෙහි හතර වන පරිච්ඡේදය වෙන්වන්නේ මහනුවර අවධියේ විහාරාරාම චිත්‍ර සම්බන්ධවයි. ක්‍රි. ව. දාහත්වන සියවසේ සිට රාජධානියක් වශයෙන් මහනුවර රාජධානිය සංවර්ධනය වීමත් සමඟම ඇති වූ බෞද්ධ පුනරුදයේ එක් අංශයක් කියාපාන සාධකය ලෙස බෞද්ධ විහාර සිතුවම් කලාව පෙන්වා දිය හැකිය. පාතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි වැනි බටහිර ආක්‍රමණ හේතුකොට ගෙන මෙරට බුදුසමයට ඇති වූ සම්බාධක නිසා බෞද්ධ විහාරාරාම සිතුවම් කලාව ද යම් පසුබෑමකට ලක්විය.  එහෙත් උඩරට රාජධානියේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ වැනි රජවරුන් විසින් සිදුකල පුනරුත්ථාපන කටයුතු පිළිබඳව මෙම කෘතියේ පැහැදිලි කර ඇත. බෞද්ධ සිතුවම් කලාව විහාර චිත්‍ර වලින් ඔබ්බට ගොස් වෙනත් අංශ කෙරෙහි යොමු වූ ආකාරය පිළබඳව මෙහි විවරණය කර ඇත. කතුවරයා මෙම පරිච්ඡේදයෙන් මහනුවර රාජධානි සමයට අයත් විහාරස්ථාන 45 ක් පිළිබඳව ඡායාරූප සාධක සහිතව ඉදිරිපත්කර ඇති තොරතුරු මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අනාගත පර්යේෂකයින්ට අත්වැලක් සැපයීමක් ලෙස පෙන්වා දිය හැකිය. මහනුවර අවධියේ මෙරට සිටි ප්‍රකට සිත්තරුන් වූ දෙවරගම්පල සිල්වත්තැන, හිරිආලේ නෛදෙ, දේවින්ද්‍ර මූලාචාරි, දෙවුන්දර අන්දිරිස්, නිලගම පටබැන්ද, පිහිබඳ මෙන්ම මහනුවර විහාර චිත්‍ර සම්ප්‍රදායේ විශේෂිත ලක්ෂණ පිළිබඳව ද මෙහි සිව්වැනි පරිච්ඡේදයෙහි විස්තරයක් සපයා ඇත. දළදා මාලිගාව, දෙගල්දොරුව, ගල්මඩුව විහාරය ලේවැල්ලේ ගංගාරාමය, සූරියගොඩ රජමහා විහාරය හිඳගල විහාරය, මාතලේ ගුරු බැබිල පුරාන විහාරය වැනි මධ්‍යම පළාතේ මහනුවර අවධියේ විහාර චිත්‍ර පිළිබඳ සපයා ඇති තොරතුරු ඡායාරූප මෙම ග්‍රන්ථයට ඉතා ඉහළ වටිනාකමක් සපයා ඇත.

ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව නැමති ග්‍රන්ථයේ පස්වන පරිච්ඡේදය වෙන් වන්නේ මහනුවර රාජධානි සමයේ දකුණු ලංකාවේ විහාර සිතුවම් කලාව වර්ධනය වූ ආකාරය ඉදිරිපත් කිරීමටයි. මහනුවර අවධියේ දකුණේ බිතුසිතුවම් ව්‍යාප්ත වූ විහාරාම අතර මුල්ගිරිගල, දොඩන්දූව, කතළුව කරගම්පිටිය සුබෝධාරාමය, මිරිස්ස සමුද්‍රගිරි විහාරය, වේරගම්පිට විහාරය, ගලපාත විහාරය වැනි ප්‍රකට විහාරස්ථාන පිළිබඳව මෙන්ම මහනුවර රාජධානි සමයේ විහාර සිතුවම් සහිත අප්‍රකට විහාර පිළිබඳව ද කතුවරයා සිය අවධානය යොමුකර තිබීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. මාතර හිත්තැටිය රජමහා විහාරයේ ධර්ම ශාලාවෙහි දක්නට ඇති පිරිත් මණ්ඩපය සහ ධර්මාසනය මහනුවර යුගයේ දකුණු ලංකාවේ දක්නට ඇති විශේෂයෙන් දකුණට ආවේණික වූ මෝස්තර සහිත සිතුවම් කිහිපයකි. මේ සිතුවම් පිළිබඳව බොහෝ කලා ඉතිහාසඥයන්ගේ අවධානය යොමුව නැත. මෙම ග්‍රන්ථයේ එවැනි ස්ථාන රාශියක් උදාහරණ සහිතව දක්වා ඇත. ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහිම විහාරස්ථානවල දක්නට ඇති විහාර සිතුවම් පමණක් නොව ඒ ආශ්‍රිත බෞද්ධ සිතුවම් බොහොමයක් පිළිබඳව මෙම ග්‍රන්ථයෙහි අවධානය යොමුකර ඇත.

ආචාර්ය දයා හේවාපතිරණ මහතාගේ මෙම ග්‍රන්ථයෙහි හයවන පරිච්ඡේදය යොදාගෙන ඇත්තේ විසිවන හා විසිඑක්වන සියවස්හි එනම් යටත් විජිත අවසන් භාගයේ සහ නිදහසින් පසු ලංකාවේ විහාර සිතුවම් කලාව පිළිබඳව සහ එයට දායකත්වය සැපයූ කලාකරුවන් පිළිබඳව සිදුකරන විවරණය සඳහාය. නිදහසට පෙර මෙරට දේශිය කලා කටයුතු කෙරෙහි තිබූ බාධක මඟහරවා ගනිමින් දේශිය සිත්තරුන් සිදුකල මෙහෙය මෙහි අවධානයට යොමුකර ඇත. එසේම දේශපාලන වශයෙන් අනුග්‍රාහකත්වයක් හිමි නොවූ එම අවධියේ බටහිර බලපෑම් නිසාදෝ සම්ප්‍රදායික සිතුවම්වල දක්නට වූ අධ්‍යාත්මික දෘෂ්ටිකෝණයෙන් බැහැර චිත්‍ර කලාවක් ස්ථාපිත වන අයුරු මෙහි පෙන්වා දී ඇත. කැළණි රජමහා විහාරය, බෙල්ලන්විල රජමහා විහාරය, බොරැල්ල ගෝතමී විහාරය වැනි විහාරස්ථානවල සිතුවම් නිර්මාණයේ දී සෝලියස් මෙන්ඩිස්, ජෝර්ජ් කීට්, එම්. සාර්ලිස්, එස්. පී. චාර්ල්ස්, එල්. ටී. පී. මංජු ශ්‍රී වැනි ශිල්පීන් කල මෙහෙය මෙහි අවධානයට යොමුකර ඇත. කැළණි රජමහා විහාරය, බෙල්ලන්විල රජමහා විහාරය, බොරැල්ල ගෝතමී විහාරය වැනි

විහාරස්ථානවල සිතුවම් ඡායාරූප අනුසාරයෙන් ඉදිරිපත් කරමින් අතීත සිතුවම් හා ඒ සංසන්දනය කිරීමේ අවස්ථාව පාඨකයාට ලබා දී තිබීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මෙහි අවසන් පරිච්ඡේදය වෙන් කර ඇත්තේ මෙරට දෘෂ්‍යකලා සම්ප්‍රදායේ ප්‍රමුඛතම අංශය වූ දිවයින පුරා විසිරී ඇති දස දහස් ගණනක් වූ විහාර සිතුවම් සංරක්ෂණය සම්බන්ධවයි. මෙම අති පෞරාණික ඇතැම් සිතුවම් වසර දහස් ගණනක් තිස්සේ  අව්වැසිවලට නිරාවරණය වීමෙන් මෙන්ම විවිධ විනාශකාරී දෙස්විදෙස් බලවේග වලට හසුවීමෙන් විනාශ මුඛයට යමින් පවතී. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය මෙන්ම විද්වතුන්ගේ අධීක්ෂණය ද අත්‍යාවශ්‍ය වේ. එසේම වර්තමාන පරපුරට මෙම අඟනා සංස්කෘතික දායදය පිළිබඳව දැනුවත් කිරීමට මෙවැනි පොත්පත් පමණක් නොව නූතන තාක්ෂණය යොදාගනිමින් නව අංශ කෙරෙහි අවධානය යොමුකළ යුතු කාලය එළඹ ඇත. එය අපගේ සම්භාව්‍ය සිතුවම් කලාව ලෝකවාසීන්ට විවරකර දීමට ද හැකිවනු ඇත. ඒ සඳහා හේවාපතිරණ ඇදුරුතුමන් ගත් උත්සාහයන් පිළිබඳව ද මෙම ග්‍රන්ථයේ පෙරවදනෙහි දක්නට ලැබේ.

විශේෂයෙන් හේවාපතිරණ මහතාගේ මෙම කෘතිය වඩාත් විද්වතුන්ගේ අවධානය යොමුවිය යුත්තේ එහි අන්තර්ගතය කෙරෙහි පමණක් නොව ඔහු විසින් වෙහෙසකර උත්සාහයකින් රට පුරා වෙහෙර විහාර වලට ගොස් ඒවායේ ඇති සිතුවම් ඉතාමත් ක්‍රමානුකූලව මෙන්ම තාක්ෂණය ද උපයෝගී කරගනිමින් ඡායාරූපයට නඟා තිබීමයි. විශේෂයෙන් මෙම ග්‍රන්ථයෙහි භාෂාව පිළිබඳව ද සැළකිය යුතුය. ඒ අනුව ඉතාමත් සරල බස් වහරක් මෙම කෘතිය රචනයට යොදාගෙන තිබීම නිසා පාසල් දරුවන්ගේ සිට ඕනෑම පාඨකයෙකුට එක හුස්මට කියවිය හැකි ග්‍රන්ථයකි. එසේම මෙම ග්‍රන්ථයෙහි පිට කවරය අපේ දේශීය සිතුවම් සම්ප්‍රදායේ විශිෂ්ඨතම සිතුවම් ලෙස සැළකෙන සීගිරි සිතුවම් පසුබිමකින් සමන්විතව ඉතා උසස් නිමාවකින් අලංකරණය කර ඇත. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මෙහි මුද්‍රණ කටයුතු සිදුකර ඇති අතර එයද ප්‍රශංසනීය මට්ටමක පවතී. මෙම විෂය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් හා විශේෂයෙන් දෘෂ්‍ය කලා විෂයය හදාරන සිසුන් ඇතුළු පොදුවේ සියලු පාඨකයන්ට එක සේ මෙම ග්‍රන්ථය පරිහරණය කළ හැකි අතර

උසස් පර්යේෂණ මට්ටමේ විද්‍යාර්ථීන්ට මෙහි එන ඇතුළත් කර ඇති ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය බෙහෙවින්ම ඵලදායී විය හැකිය. එම දීර්ඝ ලේඛනය විමර්ශණය කිරීමෙන් හා මෙහි ඇති වටිනා ඡායාරූප නිරීක්ෂණයෙන් මේ සඳහා කතුවරයා කළ කැපකිරීම තේරුම්ගත හැකිය. එහෙත් මිලක් නියම කර නොමැති මෙම ග්‍රන්ථය ආචාර්ය දයා හේවාපතිරණ මහතාගේ අමිල උත්සාහයක් වන අතර එය අදටත් වඩා අනාගත ලෝකයට බෙහෙවින්ම ඵලදායී කෘතියක් වනු ඇත.

**යූ. ඒ. ලාල් පන්නිල**
***B.A. Hons. (Peradeniya,) MSSc (Lib. Sc.) Kelaniya***

# පද අනුක්‍රමණිකාව


අනුක්‍රමණිකා, 22, 58, 149, 150, 151, 153, 154, 155, 156
අනුක්‍රමණිකාකරණය, ix, 57, 65, 149, 153, 157, 158
අනුක්‍රමණිකා ප්‍රභේද, 149
ආයුර්වේදය, 15
ඇංග්ලෝ - ඇමෙරිකානු සූචිකරණ, 113, 118
කාර්මික විප්ලවය, ix, 159, 203, 204, 205
ගෝලීයකරණය, 133, 216, 223
ඩිජිටල්කරණය, 125
ඩිවි දශම වර්ගීකරණය, 80
තොරතුරු සමුද්ධරණය, 77
දැනුම සමාජය, 128, 134
දේශීය වෛද්‍ය විද්‍යාව, 19
පර්යේෂණ මූලාශ්‍ර, vii, 13, 16
පරිග්‍රහණ, 171, 172, 176, 177, 178, 181
පාථක අධ්‍යාපනය, 25, 43, 231, 233
පුස්කොළ, vii, 13, 14, 15, 16, 17, 18, 19, 20, 22, 23, 163, 164, 165, 167, 200
යහපාලන රාජ්‍ය සංකල්පය, viii, 89, 111
යාවජීව අධ්‍යාපනය, 29
යුනෙස්කෝ, 67, 69, 229
රුහුණ විශ්වවිද්‍යාල, vii, xi, 1, 2, 3, 5, 6, 8, 9
වර්ගීකරණය, 16, 53, 54, 57, 63, 64, 80, 81, 84, 149, 171, 178, 179, 207, 218
විඥාපන විද්‍යාව, viii, xii, xiii, xxvii, 11, 51, 52, 53, 55, 56, 57, 58, 71, 76, 81, 84, 85, 123, 149, 160, 171, 211, 230, 234
විමර්ශන, ix, 46, 58, 66, 71, 72, 106, 118, 119, 137, 138, 139, 140, 142, 143, 144, 157, 159
විමර්ශන මූලාශ්‍ර, 58, 106, 140
ශබ්ද කෝෂ, 14, 137, 138, 139, 140, 141, 142, 143, 144, 145, 146, 147, 148
ස්වයං අභිප්‍රේරණය, 131
සංඛ්‍යාංක ද්‍රව්‍ය, 116
සංලේඛ, 151, 154
සමාජ බුද්ධිය, 131
සාධිකාරී, 14, 54, 57, 108, 117, 118, 119, 139, 147
සූචිකරණය, viii, 3, 53, 62, 63, 65, 80, 81, 84, 113, 114, 115, 118, 119, 120, 149, 171, 172, 178, 222